# ආඛ්‍යාන narrations

*open access, refereed journal*
ISSN 2478-0642 | Volume 06 | Issue 01| 2021




**Center for Indigenous Knowledge and Community Studies (CIKCS)**
**Sabaragamuwa University of Sri Lanka**

ආඛ්‍යාන narrations

*open access, refereed journal*

ISSN 2478-0642
Volume 06 | Issue 01| 2021
Sabaragamuwa University of Sri Lanka

**Attribution-NonCommercial-ShareAlike**
**CC BY-NC-SA**
Legal Code: https://creativecommons.org/licenses/by-nc-nd/4.0/legalcode

**Editorial Board**

Jayaprasad Welgama –Editor in Chief
BA Hons, MA, PhD

Sarath Ananda
BA Hons, M.Phil, PhD

Manoj Ariyarathne
BA Hons, MA, PhD

Hiniduma Sunil Senevi
BA Hons, MA, PhD

E. P. N. Udaya Kumara
BSc (sp), Msc, PhD

A. H. Lareena
B.A, M.A, PhD

Prabath Galagamage
BA Hons, M.A, M.Phil

**Reviewers**

Prof. Emer. Kalinga Tudor Silva
Prof. H.M.D.R Herath
Prof. Premakumara De Silva
Dr. Sumudu Premachandra

Submit your academic papers to jwelgama@gmail.com or gprabath@gmail.com

**Center for indigenous Knowledge and Community Studies**
**Sabaragamuwa University of Sri Lanka**

**Cover Page**

Sathsara Illangasinghe

**සෙල් චිත්‍ර මගින් සමාවෘත අර්ථ ; ශ්‍රී ලංකේය ආදිවාසීන්ගේ සෙල් චිත්‍ර පිළිබඳ දෘශ්‍යමය විශ්ලේෂණයක්**

සත්සර ඉලංගසිංහ

**සංස්කෘතික ගෝලීයකරණයෙහි සංරචකයන් සහ සමකාලීන ශ්‍රී ලංකා සමාජයේ ගෝලීයකරණ ප්‍රවණතා**

සමිත උදයංග

**Community Studies - An analysis in the identification of the marginalised communities, and the need for equitable treatment**

M.S.M. Hussain

**පසන් ගායන සම්ප්‍රදාය සහ එහි ප්‍රබන්ධ ලක්ෂණ**

ඉරංගා සමින්දනී වීරක්කොඩි

**විෂ්ණු දේව වන්දනය හා බැඳුණු චේෂ්ටා පිළිබඳ සමාජ හා මානව විද්‍යාත්මක අධ්‍යයනයක්: තම්මැන්නාගල ශ්‍රී විෂ්ණු දේවාලය ඇසුරෙන්**

එම්.ඒ.දිශාන් මදුශංඛ - තිඹිරිවැව සිරි සුමන - නාලක ජයසේන

ආඛ්‍යාන narrations
**Volume 06 | Issue 01 | January - June 2021 | Article 01**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# සෙල් චිත්‍ර මගින් සමාවෘත අර්ථ: ශ්‍රී ලංකේය ආදිවාසීන්ගේ සෙල් චිත්‍ර පිළිබඳ දෘශ්‍යාමය විශ්ලේෂණයක්

සත්සර ඉලංගසිංහ[1]
sathsarailangasinghe@gmail.com

**සාර සංක්‍ෂේපය**

ආදි මානවයින් විසින් ගොඩනගන ලද සෙල් චිත්‍ර වනාහි පූර්ව සාක්‍ෂර සමාජයක නිෂ්පාදිත කලා විශේෂයකි. ඒවා ලෝකයේ බොහෝ මහද්වීපවලින් හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවෙන් ප්‍රාග් ඓතිහාසික මානව හා සත්ත්ව අවශේෂ හමුවුවද බලංගොඩ මානවයා දිවිගෙවූ කිසිදු ලෙනක චිත්‍ර සටහන් හමු නොවේ. එහෙත් කුරුල්ලන්ගල, හක්බෙලිකන්ද, කන්දේගම, දොරවක කන්ද, නැව්ගල, බුදුගල ආදී ස්ථානවලින් හමුවන සෙල් චිත්‍ර ශ්‍රී ලංකාවේ විසූ ආදි මානවයෙකු විසින් කළා යැයි සැලකිය හැකි නිර්මාණ සාධක වෙයි. මීට අමතරව ස්ථාන ගණනාවකින් ශ්‍රී ලංකාවේ විසූ ආදිවාසීන් විසින් කළ සෙල් චිත්‍ර සටහන් හඳුනාගත හැකිය.  ඒවා නැගෙනහිර වෙරළබඩ කලාපයේ වැඩි වශයෙන් හා අනෙක් ප්‍රදේශවලද ව්‍යාප්තව පවතී. ශ්‍රී ලංකාවේ පිහිටි ගුහා චිත්‍ර ස්ථාන කිසිවක් මෙතෙක් විද්‍යානුකූල ක්‍රමවේදයකට අනුව කාල නිර්ණය කොට නොමැති වුවද එම ස්ථානවල පිහිටීම, නිර්මාණ විලාසය ඓතිහාසික සාධක හා කැණීම් සාධක ආදිය පදනම් කරගෙන පී.ඊ.පී. දැරණියගල සෙල් චිත්‍ර කාණ්ඩ කිහිපයකට වර්ග කර ඇත.  යක්ෂ, නාග, රාක්ෂ, දේව, නිට්ටැවුන්, කම්පොත්තන්, මුක්කරුවන්, වැද්දෝ, මුල් කාලීන සිංහලයෝ ආදීන් ශ්‍රී ලංකාවේ විසූ පූර්වජ මානවයින්ය. පර්යේෂණයේදී එකී සියලු ජන කොට්ඨාශ හැඳින්වීම පිණිස  "ආදිවාසීන් " යන භාෂිතය භාවිත කරනු ලැබේ. ශ්‍රී ලාංකේය ආදිවාසීන් විසින් ඇඳින ලද සෙල් චිත්‍ර සටහන්වල  නොයෙක් සංකේත, හැඩතල, නිරූපණ, හඳුනාගත හැකි නොහැකි රූප, ආදිය හඳුනාගත හැකිය. මේවා විවිධ ප්‍රමාණයෙන් ,විවිධ වර්ණයෙන් , විවිධ ස්ථානවල, විවිධ ප්‍රදේශවල, දක්නට ලැබේ. මෙම චිත්‍ර සටහන් ගොඩ නැගිම පුද්ගල කේන්ද්‍රීය ක්‍රියාවලියකි. එක් එක් ආදිවාසියා සතු නිර්මාණ ශබ්‍යතාවය (දෘශ්‍ය සාක්ෂරතාවය), අපේක්ෂිත අරමුණු, හැඟවිමේ ක්‍රියාවලිය , ප්‍රකාශන විලාශ  ආදියට සාපේක්ෂව මෙම සෙල් චිත්‍ර සටහන් මගින් සංජානනය කෙරෙන අර්ථ හා හැඟවීම් විවිධ වෙයි. සෙල් චිත්‍ර මගින් තීව්‍ර කෙරෙන අර්ථ හා හැඟවීම් හඳුනාගැනීම පිණිස මෙහිලා සංඥාර්ථවේදී ප්‍රවේශය  *( Semiotic approach )* යොදා ගැනිණි. සෙල් චිත්‍රවල සංඥාර්ථවලින් ගම්‍යමාන කෙරෙන අර්ථ මගින් ; ආදිවාසියා දිවිගෙවන සමාජ තත්ත්වය,  සංස්කෘතික, දේශපාලනික ප්‍රවේශ මෙන්ම ආදිවාසියා සතු  අනන්‍යතාවය හඳුනාගත හැකිය.

[1] කථිකාචාර්ය, චිත්‍ර කලා අධ්‍යයනාංශය, දෘශ්‍ය කලා පීඨයල සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

**මුඛ්‍ය පද :** අනන්‍යතාව, දෘශ්‍යමය සංඥාර්ථ, ශ්‍රී ලාංකේය ආදිවාසීන්, සමාවෘත අර්ථ, සෙල් චිත්‍ර.

**පර්යේෂණ ගැටලුව :** ශ්‍රී ලංකේය ආදිවාසීන්ගේ සෙල් චිත්‍ර මගින් සමාවෘත අර්ථ මොනවාද?

**උපන්‍යාසයः** ශ්‍රී ලංකේය ආදිවාසීන්ගේ සෙල් චිත්‍රවල නිරූපිත සංඥා දෘශ්‍ය විශ්ලේෂණයකට ලක්කිරීමෙන් එහි අර්ථ මැනැවින් වටහාගත හැකිය. ඒවා මගින් සමාවෘත අර්ථ වනුයේ සමාජ ආකල්ප හා පවුල පිළිබඳ සංකේත චාරිත්‍ර විධි ප්‍රේමය හා ලිංගිකත්වය සොබාදහම පිළිබඳ ආකල්ප සතුන් හා බැඳි සබඳතාවය ඇදහිලි හා විශ්වාසය ආදියයි . ඒවා මගින් ඔවුනට ආවේණික අනන්‍යතා ලක්ෂණ තීව්‍ර කරයි.

**ක්‍රමය හා ක්‍රමවේදයः**

ක්ෂේත්‍ර ගවේෂණයේදී ලෙන් වෙත ප්‍රවේශ වී සාකල්‍යයෙන්ම ඒවා නිරීක්ෂණය කර ලබාගන්නා දත්ත, ලිඛිත මූලාශ්‍රවල ඉදිරිපත්කර ඇති දත්ත (චිත්‍ර සටහන් ඡායාරූප හා විස්තර) , ක්ෂේත්‍රයේ ප්‍රාමාණිකයින් හමුවී සම්මුඛ සාකච්ඡා මගින් ලබාගත් දත්ත විධිමත් **ක්‍රමය**කට සකස් කෙරිණි. සජීවීව ප්‍රාථමික මූලාශ්‍රය ගවේෂණය කරමින් එක්රැස් කරගත් දත්ත අනෙක් ලිඛිත මූලාශ්‍රද ඇසුරුකොටගෙන විශ්ලේෂණයකට බඳුන් කෙරිණි.

ශ්‍රී ලාංකේය ආදි මානවයින් විසින් අඳින ලද සෙල් චිත්‍ර සටහන්වල නොයෙක් සංකේත, හැඩතල, නිරූපණ, හඳුනාගත හැකි හා නොහැකි රූප ආදිය එහි දැකිය හැකිය. මේවා විවිධ ප්‍රමාණයෙන් , විවිධ වර්ණයෙන් දක්නට ලැබේ. මෙම චිත්‍ර සටහන් ගොඩ නැගීමේ දී එක් එක් ආදිවාසියා සතු නිර්මාණ ශක්‍යතාවය (දෘශ්‍ය සාක්ෂරතාවය ), අපේක්ෂිත අරමුණු, හැඟවීම් සංඥාර්ථ, ප්‍රකාශන විලාශය යනාදිය පුද්ගලානුබද්ධ, පුද්ගල කේන්ද්‍රිය හා සාපේක්ෂ ක්‍රියාවලියකි. මෙම සෙල් චිත්‍ර සටහන් මගින් සංජානනය කෙරෙන අර්ථ හා හඳුනාගැනීම පිණිස පර්යේෂණයේදී භාවිත **ක්‍රමවේදය** ලෙස **සංඥාර්ථවේදී භාවිතය** *( Semiotic approach )* යොදා ගැනිණි. සෙල් චිත්‍ර මගින් ගම්‍යමාන කෙරෙන අර්ථ හා ඒවා පෙනී සිටින සමාජ, සංස්කෘතික, දේශපාලනික ප්‍රවේශ හා ආදිවාසියා සතු සංස්කෘතික අනන්‍යතාවය හඳුනාගැනිම පිණිස සංඥාර්ථවේදී ප්‍රවේශය වඩා උචිත විශ්ලේෂණ ක්‍රමවේදයකි.

සල්ස්මන්ට අනුව මානවයා යථාර්ථය සමග සම්බන්ධ වනුයේ යම්කිසි භාෂාවක් මගිනි. (Salzman, 1998). භාෂාවක් යනු ( දෘශ්‍යමය භාෂාව ) සංවිධිත සංඥා පද්ධතියක් වන අතර ක්‍රමික සන්නිවේදනාත්මක පද්ධතියක් ලෙසද සැලකිය හැකිය. භාෂාවේ ඇති මෙම සංඥා මගින් විවිධ සංස්කෘතික ලක්ෂණ නියෝජනය කරයි (Salzman, 1998). රිසාගර්ට අනුව භාෂාව හා සංස්කෘතිය අතර අවියෝජනීය සම්බන්ධයක් වන අතර එය යම් ජන සමාජයකට සාපේක්ෂව ස්වාධීනව පවතී (Risagar, 2006). ඒ අනුව සෙල් චිත්‍ර නැමැති දෘශ්‍ය භාෂාත්මක සංඥා පද්ධතිය විශ්ලේෂණය මගින් ඒවා නිෂ්පාදිත සංස්කෘතිය හා එහි අනන්‍යතාවය තීව්‍ර කර ගත හැකිය. කිසිදු විටක එක් සංඥාවකට හුදෙකලා පැවැත්මක් නැත. එකී සංඥාවල අර්ථ ජනනය කරනුයේ එයට අදාළ සංස්කෘතික හා සමාජ සන්දර්භයකදී පමණි. කිසියම් සංඥාවක් සංජානනය වනුයේ එම සංඥාවට අදාළ පූර්ව අත්දැකීම් හා භාවිත ඥානය ඇසුරෙනි .ඒ අනුව සෙල් චිත්‍රයක් දැකීමෙන් යම්කිසි සංඥාවක් සංජානනය වනුයේ එකී සංඥාවට අදාළ පූර්ව අද්දැකීම් හා භාවිත ඥානය අනුවය.

එබැවින් සෙල් චිත්‍ර දැක සංඥා ගොඩනැගීම පුද්ගල කේන්ද්‍රීය ක්‍රියාවලියක් වෙයි. සංඥාව හා සංකල්පය අතර සම්බන්ධතාවය පුද්ගල සංජානනය මත රඳා පවතී. එබැවින් සංඥාවේ සංජානනීය ක්‍රියාවලිය මත අර්ථකථන ගෙතීම රඳා පවතී.ඒ අනුව එකම සංඥාවට විවිධ සමාජ සන්දර්භ තුළ විවිධ අර්ථකථනයන් ජනනය කෙරේ. මෙකී අදහස මැනවින් තීව්‍ර කෙරෙන චාල්ස් පියර්ස් (Peirce, 1991) විසින් ඉදිරිපත් කළ **සංඥාර්ථවේදී ත්‍රිකෝණය** (Semiotic Triangle) පිළිබඳ අදහස සෙල් චිත්‍ර විශ්ලේෂණයේදී භාවිත කෙරිණි.




## ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය හා ප්‍රාග් ඓතිහාසික චිත්‍ර

ශ්‍රී ලංකාවෙන් ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා අතීතයට දිවෙන සංස්කෘතියක පුරාවිද්‍යාත්මක සාධක හමුව තිබේ (Deraniyagala,1954,p.114). බලංගොඩ සංසකෘතියට අයත් හස්ති, ගවර, සිංහ, ව්‍යාඝ්‍ර, හිපපොටේමස් වැනි සත්ත්ව හා මානව අවශේෂ සොයාගෙන ඇත (දැරණියගල,1992). කිතුල් බෙලිලෙන, කුරුවි බටදොඹලෙන, කෑගල්ල, අළුලෙන, පාහියාගල වැනි ස්ථාන බලංගොඩ මානවයාගේ නිත්‍ය නවාතැන්ය. ආසියාවේ පැරණිම නවීන ලක්ෂණ සහිත මානව අවශේෂ හමුව ඇත්තේ ශ්‍රී ලංකාවෙනි (කුලතිලක,2008,47පි.).

ශ්‍රී ලංකාවෙන් ප්‍රාග් ඓතිහාසික මානව හා සත්ත්ව අවශේෂ හමුවුවද බලංගොඩ මානවයා දිවිගෙවූ කිසිදු ලෙනක සෙල් චිත්‍ර හමු නොවේ. ශිරාන් දැරණියගල (දැරණියගල,1992,22පි.) දක්වන අන්දමට ලංකාවේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර ක්‍රමයක් ඉතිරිව නැත. එහෙත් කැණීම් සිදුකොට ස්ථිර ලෙස කාලය නිර්ණය කර නොමැති වුවද කුරුල්ලන්ගල, දොරවක, බුදුගල, නැවිගල, ඌරාකන්ද, හක්බෙලිකන්ද, කන්දේගම ආදී ස්ථානවල පාෂාණ සීරුම් හා චිත්‍ර සටහන්වල හැඩතල හා සංකේත ලෝකයේ ප්‍රාග් මානවයින්ගේ චිත්‍ර හා

සසැඳීමේදී ඒවා ලංකාවේ දිවි ගෙවූ අතීත මානවයින් විසින් නිම කළ චිත්‍ර සටහන් බව පැහැදිලිය.

## බලංගොඩ මානවයාගේ චිත්‍ර

බලංගොඩ මානවයාගේ අවශේෂ හමුවූ ඔවුන්ගේ නිත්‍ය නිවන්ත වූ ගල්ලෙන්වල කිසිදු චිත්‍රයක් හමු නොවේ. රාවණා ඇල්ල ගුහාවේ ප්‍රාග් ඓතිහාසික නිධියෙන් හමුවූ මිනිස් හිස් කබලේ එක් පැත්තක් රතු ගලින් පාටකර තිබූ බව සඳහන් වේ (දැරණියගල,1992,22පි.). පාහියංගල ලෙනෙන් ගුරුගල් ආලේප කළ මිනී ඇට සැකිල්ලක් හමුව තිබේ (දැරණියගල,1992,22පි.). ඒ අනුව බලංගොඩ මානවයා වර්ණ තනාගැනීමේ හා තැවරීමේ තාකක්ෂණය පිළිබඳ අවබෝධයෙන් යුතු අයකු බව පැහැදිලිය. එකී ශබ්‍යතාව හිමි බලංගොඩ මානවයා ඇඳි සෙල් චිත්‍ර දක්නට නොලැබීම උභතෝකෝටිකයකි. චිත්‍ර නොඇන්දා හෝ ඇඳි චිත්‍ර මැකී ගියා හෝ විය හැකිය. බලංගොඩ මානවයාගේ නිත්‍ය නවාතැන් වූ කිතුල්ගල, බෙලිලෙන, කුරුවිට බටදොඹලෙන, පාහියංගල, බෙලිගල්ගේ බඹරකොටුව, කැගල්ල අළුලෙන වැනි ස්ථාන නිරීක්ෂණයේදී ඒවායේ චිත්‍ර ඇඳීමට තරම් සුදුසු සුමට පාෂාණ පෘෂ්ඨයක් නැති බව පැහැදිලි විය. නැගෙනහිර වෙරළබඩ කලාපයෙන් හමුවන ආදිවාසී සෙල් චිත්‍ර ඇඳි පාෂාණ පෘෂ්ඨය ඇඟිල්ලෙන් පවා ඇඳිය හැකි සුමට බවින් යුක්තය. බලංගොඩ මානවයා දිවිගෙවූ ලෙන්වල එතරම් සුමට පෘෂ්ඨයක් නැති නිසා සෙල් චිත්‍ර නොඇන්දා විය හැකිය. පාහියංගල, කිතුල්ගල බෙලිලෙන, කුරුවිට බටදොඹලෙන, බෙලිගල්ගේ බඹරබොටුව වැනි බලංගොඩ මානවයා දිවිගෙවූ ලෙන් තෙතමනය නිසා පාෂාණ පෘෂ්ඨය මතින් දිය සීරාවක් ඉතා කුඩා දිය ඇල්ලක ආකාරයට ඇද හැලේ. තෙතමනය නිසා පාෂාණ පෘෂ්ඨය තුළින් මතුවන දිය සීරාව නිසා පාෂාණ පෘෂ්ඨය මත සායම තැවරුවද ගැලවී වැටීමේ අවකාශය වැඩිය. ඒ අනුව බලංගොඩ මානවයා චිත්‍ර ඇඳ තිබුණද ඒවා විනාශ වී මැකීයාමේ සම්භාවිතාව වැඩිය. චිත්‍ර ඉතිරිව තිබිණි නම් පසුකාලීනව ඉදිකල ලෙන් විහාරවල අභිනව ඉදිකිරීම් නිසාද චිත්‍ර මැකි ගියා විය හැකිය.

## ශ්‍රී ලාංකේය ආදිවාසීන්

ශ්‍රී ලංකාවේ ''ආදිවාසී'' යන පදය බහුතරයක් භාවිතා කරනුයේ වැද්දන් හැඳින්වීමටය. යම් රටක හෝ මහද්වීපයක මුල්ම පදිංචිකාර දේශජ ජනයා හැඳින්වීම පිණිස ඉංග්‍රීසි භාෂාවේ භාවිත කරන (Aborigines) ඇබොරිජින් යන පදයේ සිංහල අරුත ලෙස ආදිවාසී යන පදය භාවිත කෙරේ. ආදිවාසී යන පදය පොදු අරුතකට මිස නිශ්චිත ජන කොට්ඨාශයක් හැඳින්වීම පිණිස භාවිත කිරීම උචිත නොවන බව බොහෝ විද්වතුන්ගේ මතයයි. චන්ද්‍ර ශ්‍රී රණසිංහ( රණසිංහ,2009,13පි.), ඊ.එම්. රත්නපාල (රත්නපාල,2009,68පි.), ආදීහු පෙන්වා දෙන්නේ වැද්දන්ව ආදිවාසීන් ලෙස හඳුන්වනුයේ වැද්දා යන පදය ගර්හිත පදයක් යැයි සලකමින් බවයි. එහෙත් වැද්දන් තමන් වැද්දන් බව හඳුන්වාගන්නේ මහත් අභිමානයෙනි. වැද්දන් පිළිබඳ ලියූ බොහෝ ලේඛකයින් හඳුන්වා ඇත්තේ වැද්දෝ යන පදයෙනි. ලංකාවේ සිටි එකම ආදිවාසීන් වැද්දන් පමණක් නොවේ. පුරාතනයේ සිට මෙරට දිවි ගෙවූ ආදාවාසී ජන කොට්ඨාශ කිහිපයකි. විජයාවතරණයට පෙර සිට ශ්‍රී ලංකාවේ දිවි ගෙවූ ම්ලේච්ඡ ගෝත්‍ර ගණනාවක් පිළිබඳ ලිඛිත හා ජනශ්‍රැති මූලාශ්‍රය ගණනාවක් හමුවේ. මහාවංශය ගෙන හැර දක්වන යක්ෂයින් හා නාගයින් (

මහාවංශය,2002, 38,59,60 පිටු.), පොලිනීසියානු දූපත්වල සිට මෙරටට සංක්‍රමණය වූවායැයි සැලකෙන නිට්ටෑවෝ , ජනප්‍රවාදයන්හි කියවෙන කම්පොත්තෝ මෙරට දිවි ගෙවූ පැරණිම ම්ලේච්ඡ ජන කොට්ඨාසයන්ය. පර්යේෂණයේ දී ''ආදිවාසී'' යන පදය භාවිත කරනුයේ වැදි ජනතාව හැඳින්වීමට නොව පොදු අරුතින් ලංකාවේ දිවිගෙවූ මෙම සියලු ජන කොට්ඨාස නියෝජනය වන පරිදිය.

යක්ෂ, නාග, නිට්ටෑවෝ, කම්පොත්තෝ, වැද්දෝ, සිංහලයෝ ආදී ජනවර්ග අතීතයේ සිට ශ්‍රී ලංකාවේ දිවිගෙවූ බව වාර්තා වේ. ඔවුන් අතරින් වැද්දන් සෙල් චිත්‍ර ඇඳිබව පැහැදිලිව හඳුනාගත හැකිය. ගල්ලෙන් හා ගුහා ආශ්‍රිතව නිට්ටෑවුන් දිවි ගෙවුවද (විජේසේකර,2003, 13 පි.) ඔවුන්ගේ සෙල් චිත්‍ර පිළිබඳ වාර්තා නොවේ. ශ්‍රී ලංකාවෙන් හමුවන ආදිවාසී සෙල් චිත්‍ර සටහන් සියල්ලම වැද්දන්ගේ නොවූවද ඉන් බහුතරය වැද්දන්ගේ බව පිළිගත හැකිය.

## ආදිවාසී සෙල් චිත්‍ර හැඳින්වීමේ නාමය

ලංකාවේ බොහෝ ලෙන් හා ගුහාවලින් හමුවන අර්ධ සංකේතාත්මක චිත්‍ර හැඳින්වීම පිණිස භාවිත කරන නාමයන් ගණනාවකි. මෙම නාමයන් පිළිබඳ බොහෝ ගැටලු පැන නගී.

## ප්‍රාථමික ගුහා චිත්‍ර

''ප්‍රාථමික ගුහා චිත්‍ර'' මෙම චිත්‍ර හඳුන්වන එක් නාමයකි ( බිනරගම,2008,13පි. ).මෙම චිත්‍ර යම් ප්‍රාථමික ජන කොට්ඨාසයන් විසින් නිෂ්පාදනය කළද ඒවාගේ යම් කලාත්මක වටිනාකම්, උසස් ගුණාංග හා ලක්ෂණ මෙන්ම ආකල්පද හඳුනාගත හැකිය. නිර්මාණාත්මක ගුණාංග, සරලීකරණය, සංකේත භාවිතය, නිර්ව්‍යාජ දිවි පැවැත්ම හා අවංක දෘශ්‍ය ප්‍රකාශන ලෙස මේවා ඉදිරිපත් වේ. එහෙයින් මේවා ප්‍රාථමික චිත්‍ර නොවෙයි. ප්‍රාථමික චිත්‍ර යන නාමයෙන් එම චිත්‍ර ප්‍රාථමික බවක් ගම්‍ය කරයි. එහෙත් වඩාත් උසස් පින්තාරුමය ගුණාංග විශද නොකළද, මෙම චිත්‍රය යම් නිර්මාණාත්මක බවකින් යුත් චිත්‍ර ක්‍රමයකි. එහෙයින් මේවා හැඳින්වීම පිණිස ''ප්‍රාථමික ගුහා චිත්‍ර'' යන නාමය අනුචිතය.

## ප්‍රාග් ඓතිහාසික චිත්‍ර

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර ඉතිරිව නොමැති වුවද මෙරට දිවි ගෙවූ ප්‍රාග් මානවයකු විසින් කරන ලදැයි සැලකිය හැකි පාෂාණ සීරුම් චිත්‍ර ස්ථාන කිහිපයක් හමුවේ. එහෙත් නිශ්චිත ලෙසම විද්‍යාත්මක ක්‍රමයකට කාල නිර්ණය කර තහවුරු කර නොමැති බැවින් මෙම චිත්‍ර හැඳින්වීම පිණිස ''ප්‍රාග් ඓතිහාසික චිත්‍ර'' ලෙසින් හැඳින්වීම අනුචිතය.

## වැදි ගුහා චිත්‍ර

ලංකාවෙන් හමුවන අර්ධ සංකේතාත්මක චිත්‍ර බහුතරයක් වැද්දන් විසින් කළ ඒවා බව පැහැදිලිය. එහෙත් එම සියලුම චිත්‍ර වැද්දන් විසින් කළ ඒවා නොවේ. ලංකාවේ ලෙනම ප්‍රදේශය ආශ්‍රිතව නිට්ටෑවුන් කම්පොත්තන්ද දිවිගෙවූ අතර ඔවුන්ද , හේන් වගාකළ මුල්කාලීන සිංහලයන්ද මෙම චිත්‍ර ඇන්දා විය හැකිය. පුංචි කිරිඅම්මා ගල්ගෙයි ඇඳ තිබූ රූප වැද්දන් ඇඳි ඒවා නොවන බව වැද්දන්ම ප්‍රකාශ කළ බවත්, එම චිත්‍ර අරළු ගෙඩි අහුලාගෙන යාමට පැමිණි

දෙමළ මිනිසුන් විසින් අඳින ලද ඒවා විය හැකි බවත් සෙලින්මාන් යුවල විස්තර කරති ( සෙලින්මාන්,2009,466පි. ). ඒ අනුව මෙම චිත්‍ර වැද්දන් විසින්ම පමනක් අඳින ලද  චිත්‍ර නොවන බැවින් ''වැදි ගුහා චිත්‍ර'' යන නාමයද උචිත නොවේ.

## ආදිවාසී සෙල් චිත්‍ර

ක්‍රි.පූ. 543 දී පමණ විජය ලංකාවට පැමිණ ජනාවාස පිහිටුවා ගැනීමට පෙර බලිතරු, රාවණ  වැනි ප්‍රබල රජවරුන් පාලනය ගෙන ගිය බව ජනශ්‍රැතිවල කියැවේ. ලිඛිත මූලාශ්‍රයවලට අනුව යක්ෂ, නාග, රාක්ෂ, දේව යන ගෝත්‍රික ජන කණ්ඩායම් මෙරට දිවිගෙවා තිබේ. මහාවංශයට අනුව විජයගෙන් සිංහලුන්ද, විජයට දාව කුවේණියගේ දරුවන්ගෙන් වැද්දන්ද ( මහාවංශය,2002, 53 පි.),  පානම ආශ්‍රිතව නිට්ටැවුන්, කම්පොත්තන්, මුක්කරුවන් වැනි ප්‍රාථමික ජන කොට්ඨාශයන්ද, දිවිගෙවූ බව කියැවේ. එකී සියලුම ගෝත්‍රික, ම්ලේච්ඡ, ශිෂ්ටාචාරගත වූ, නොවූ සියලුම ජන කොට්ඨාස මෙරට දිවි ගෙවූ ආදිවාසීන්ය. එකී ලේඛන මූලාශ්‍රය, වංශකතා ඉතිහාසයට හා ජනශ්‍රැති ඉතිහාසයට සාක්ෂි දරමින් බලංගොඩ මානවයාගේ සිට අද දක්වා පුරාවිද්‍යාත්මක සාධක මතුකරමින් පවතී. අදට ශේෂව ඇති සෙල් චිත්‍ර මින් කවර හෝ ජන කොට්ඨාසයකට අයත් ශ්‍රී ලංකාවේ දිවි ගෙවූ ආදිවාසීන් විසින් කරන ලද නිර්මාණයි. ඔවුන් සියල්ල ලංකාවේ දිවි ගෙවූ ආදිවාසීන්ය. එනිසා මෙම චිත්‍ර සටහන් හැඳින්වීම පිණිස භාවිත කළ හැකි උචිතම නාමය වනුයේ ''ආදිවාසී චිත්‍ර'' යන්න බව යෝජනා කළ හැකිය. මේවා ලෙන්, ගුහා, කුහර, පැතලි ගල් තලා, ශිඛර ඇසුරුකොටගෙන පවතින හෙයින් එම සියල්ලටම පොදු අරුතින් ''සෙල් චිත්‍ර'' යන නාමය භාවිතා කළ හැකිය. එබැවින් මෙම චිත්‍ර ''ලාංකේය ආදිවාසී සෙල් චිත්‍ර'' යන පොදු අරුතින් මෙම පර්යේෂණයේදී හඳුන්වනු ලැබේ.

## ආදාවාසී සෙල් චිත්‍රවල කාල නිර්ණය

ශ්‍රී ලංකාවේ පිහිටි ගුහා චිත්‍ර ස්ථාන කිසිවක් මෙතෙක් විධිමත් විද්‍යානුකූල ක්‍රමවේදයකට අනුව කාලනිර්ණය කොට නැත. එහෙත් ස්ථානවල පිහිටීම, නිර්මාණ විලාසය, ඓතිහාසික සාධක හා කැණීම් සාධක ආදිය පදනම් කොටගෙන පී.ඊ.පී. දූරණියගල ලංකාවේ ගුහා චිත්‍ර කාණ්ඩ කිහිපයකට වර්ගකොට තිබේ (Nandadewa , 1992 , p.340).

1. ප්‍රාග් ඓතිහාසික - දොරවක, මොලගොඩ, නැවිගල

2. ආදි ඓතිහාසික - උඩරාකන්ද, පදවිගම්පොල

3. පූර්ව ඓතිහාසික- බුදුගල, දිඹුලාගල

4. ඓතිහාසික - ඇඬියාගල, බිල්ලෑව, ගොනාගොල්ල, මණ්ඩාගල

5. පශ්චාද් ඓතිහාසික - ගමකන්ද ගල්ගේ, හිඟුරාන, පිහිලේගොඩ ගල්ගේ, මුදුනතලාව ගල්ගේ

ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ගුහා චිත්‍ර මෑත කාලයේ විසූ වැද්දන් විසින් කළ ඒවා වියහැකි බවද, ගුහා චිත්‍ර කාණ්ඩ දෙකක් මෙම වැදි චිත්‍ර ගණයට අයත් නොවන බවද ශිරාන්

දූරණියගල දක්වා ඇත ( දැරණියගල,1992,27පි.). හෙතෙම ඉදිරිපත් කළ වැදි චිත්‍ර ගණයට අයත් නොවන කාණ්ඩ දෙක ඉහත පී.ඊ.පී. දූරණියගල වර්ග කළ චිත්‍ර ස්ථාන කාණ්ඩයන්හි මුල් ''ප්‍රාග් ඓතිහාසික, ආදි ඓතිහාසික'' කාණ්ඩ විය හැකිය. එහෙත් එම කාල නිර්ණය කිරීම් ස්ථාර නොවනුයේ ඒවා ක්‍රමවත් විද්‍යාත්මක ක්‍රමයකට සිදුකර නොමැති හෙයිනි.

## පර්යේෂණයේ අරමුණු

ශ්‍රී ලංකාවේ ආදිවාසී චිත්‍ර පිළිබඳව ඇති මූලාශ්‍රය පරිශීලනයේදී එකී පර්යේෂණ ක්ෂේත්‍රයට (ලෙන් වැඩබිම) ප්‍රවේශ නොවී ලිඛිත මූලාශ්‍රය ආශ්‍රයෙන්ම කළ බව පැහැදිලිය. පර්යේෂණයේ මූලික අරමුණ සැබෑ චිත්‍ර පිහිටි ලෙන් වැඩබිම වෙත ප්‍රවේශ වී සැබෑ චිත්‍ර හා ඒවාගේ තත්ත්වය ගවේෂණය කර එම චිත්‍ර සටහන්වල නිරූපිත සංඥා මගින් සමාවෘත අර්ථ මොනවාද? යන්න හඳුනා ගැනීමයි.

## මූලාශ්‍රය

ශ්‍රී ලංකාවේ ආදිවාසී චිත්‍ර අධ්‍යයනය කිරීම පිණිස සපයා ගතහැකි ශාස්ත්‍රීය ලේඛන ඇත්තේ අතළොස්සකි. ඒවා ගවේෂණ වාර්තා, පාලන වාර්තා, පෞද්ගලික සංවාද, අප්‍රසිද්ධ ලේඛන ආදිය පදනම් කොටගෙන සැකසූ ලේඛනයන්ය. එම ලේඛන පරිශීලනයේදී හැඟී යන්නේ චිත්‍ර පිහිටි වැඩබිම වෙත ප්‍රවේශ නොවී ලිඛිත මූලාශ්‍රය ආශ්‍රයෙන්ම පමණක් සකස්කල සාහිත්‍ය මූලාශ්‍රය බවයි. ආදිවාසී සෙල් චිත්‍ර පිළිබඳවම පළ වූ ශාස්ත්‍රීය ග්‍රන්ථ ද්වයක් හමුවේ. රාජ් සෝමදේව විසින් ඉංග්‍රීසි භාෂාවෙන් 2012 දී PGIAR ප්‍රකාශනක් ලෙස මුද්‍රිත **Rock paintings and Engraving Sites in Sri Lanka** ග්‍රන්ථය හා සත්සර ඉලංගසිංහ විසින් 2017 දී ස්ටැම්ෆර්ඩ් ලේක් ප්‍රකාශනක් ලෙස මුද්‍රිත **ශ්‍රී ලාංකේය ආදිවාසී සෙල් චිත්‍ර** එම ග්‍රන්ථද්වය වේ. බොහෝ චිත්‍ර කලා ඉතිහාස ග්‍රන්ථවල මුල්පිටු කීපයක් හෝ පරිච්ඡේදයක් ආදිවාසි සෙල් චිත්‍ර පිළිබඳ සරල හැඳින්වීමක් දක්වා තිබේ. ඒවාද ද්විතීයික මූලාශ්‍රයන්ගෙන් උපුටාගත් කරුණු බව සනාථ වේ. ශ්‍රී ලංකාවේ චිත්‍ර පිළිබඳ ලියූ බොහෝ ලේඛකයින් ප්‍රථම මූලාශ්‍රය ලෙස භාවිතා කර ඇත්තේ බී.ඩී.නන්දදේව හා සේනක බණ්ඩාරනායකගේ ලේඛනයන්ය (Bandaranayake, 2006; Nandadewa,1992).

## ලිඛිත මූලාශ්‍රය

මෙරට දිවි ගෙවූ ප්‍රාග් මානවයින්ගේ, ආදිවාසීන්ගේ සෙල් චිත්‍ර කලාවක් පිළිබඳ ලිඛිත මූලාශ්‍රය හමු නොවේ. යක්ෂ, නාග, රාක්ෂ, දේව වැනි ප්‍රාථමික ජන කණ්ඩායම්, නග්න නිට්ටැවුන්, කම්පොත්තන් හා මුක්කරුවන්, වැද්දන් මුල්කාලීන සිංහලයින් මෙරට දිවි ගෙවූ ආදිවාසීන්ය. ඔවුන් මෙරට දිවිගෙවූ බවට ලිඛිත හා ජනශ්‍රැති මූලාශ්‍රය හමු වුවද ඔවුන්ගේ සෙල් චිත්‍ර කලාවක් පිළිබඳ විස්තර හමු නොවේ. නොයෙක් පුරාවිද්‍යාත්මක ගවේෂණ වාර්තාවල ආදිවාසී චිත්‍ර සටහන් පිහිටි ස්ථාන පිළිබඳ සඳහන් කර ඇත. 1910 දී ජෝන් ස්ටීල් උතුරුමැද කලාපයේ කළ පුරාවිද්‍යාත්මක කැණීම්වලදී හමුවූ ආදිවාසී චිත්‍ර ස්ථාන පිළිබඳ වාර්තා කර ඇත (Nandadewa,1992,p.345). බිල්ලෑව, තන්තිරිමලේ හා ආඬියාගල එම චිත්‍ර ස්ථානයන්ය. 1914 දී ෆෙඩ්රික් ලුවිස් ගේ පුරාවිද්‍යා වාර්තාවල නැව්ගල පිහිටි ආදිවාසී චිත්‍ර සටහන පිළිබඳ වාර්තා

වේ (Nandadewa,1992,p.345). 1919 දී ජී.එෆ්.ආර්. බ්‍රවුනිංග් ගේ පුරාවිද්‍යා වාර්තාවල දොරවක ආදිවාසී චිත්‍ර සටහන් පිළිබඳ වාර්තා වේ (Nandadewa, 1992, p.345). 1924 දී හෙනන්නේගල හා දික්ගල්ගේ යන ස්ථානවලින් ආදිවාසී චිත්‍ර සටහන් හමුවූ බව ආර්.එල්. ස්පිට්ල් වාර්තාකර ඇත (Nandadewa, 1992, p.345). 1929 දී සගමන් කන්ද ආදාවාසී චිත්‍ර පිහිටි ස්ථානයක් බව සී.එෆ්. වින්සර් වාර්තා කර ඇත (Nandadewa,1992,p.345). 1911 දී ගමකන්ද ගල්ගේ, පුංචිකිරිඅම්මා ගල්ගේ හා පිහිලේගොඩ ගල්ගේ තිබූ ආදිවාසී චිත්‍ර සටහන් පිළිබඳ සෙලිග්මාන් යුවල වාර්තා කර ඇත (Nandadewa,1992,p.345). 1993 දී ආසියාතික පුරාවිද්‍යා ගවේෂකයකු වූ කේ. සිංග්යෝගේ වාර්තාවලද ආදිවාසී ගුහා චිත්‍ර පිළිබඳ වාර්තා වේ. හතරැස් ගල්ගේ, දඹගල, බුදුන්ගේහෙල, වෙට්ටඹුගල ආදිය එම ස්ථානයන්ය (Shigyo,1999,p.101).ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී යුගයේ දී පුරාවිද්‍යාව සම්බන්ධව පිහිට වූ දෙපාර්තමේන්තුවේ පාලන හා ගවේෂණ වාර්තාවලද ආදිවාසී සෙල් චිත්‍ර සටහන් පිහිටි ස්ථාන පිළිබඳ තොරතුරු හමුවේ එච්.සී.පී. බෙල්ගේ පුරාවිද්‍යා වාර්තාවල මෙවැනි චිත්‍ර ස්ථාන පිළිබඳ යම් සටහන් හමුවේ. මේවාද ආදිවාසී චිත්‍ර සටහන් සම්බන්ධව ලිඛිත මූලාශ්‍රය ලෙස භාවිත කළ හැකිය. කොනත්තේගොඩගල හා අරංගොඩගල ආදිවාසී චිත්‍ර ස්ථාන පිළිබඳ බෙල් වාර්තා හමුවේ (Nandadewa,1992,p.345). කෝමාරිකා ලෙන, මණ්ඩාගල, කිරිපොකුණ, ගනේගම, බඹරගස්තලාව, කඳුරු පොකුණ, මහලෙනම එලිය, ලුනාටුගල්ගේ, තෙළඹුකෙම ගල්ගේ, මුදුනතලාව ගල්ගේ, හිඟුරාන, මිනාදූමුගල්ගේ ආදී ආදිවාසී චිත්‍ර ස්ථාන ගණනාවක් පී.ඊ.පී. දැරණියගලගේ පුරාවිද්‍යා වාර්තාවලින් (1957-63) හමුවේ. සමන්ගල, රතුගල්යාය, ඒ.සී. කැම්ප්ලෙන ආදී ආදිවාසී චිත්‍ර ස්ථාන පිළිබඳ එල්ලාවල මේධානන්දගේ පුරාවිද්‍යා ගවේෂණවලදී අනාවරණය වී ඇත (මේධානන්ද, 2008,171,193,214පි.) 1933 දී එස්. පරණවිතාන මොලගොඩ චිත්‍ර ස්ථානය පිළිබඳවද, 1959 දී සී.ඊ. ගොඩකුඹුර රජගල චිත්‍ර ස්ථානය පිළිබඳවද වාර්තාකර ඇත (Nandadewa,1992,p.345). 1963 දී එස්.ජේ. කදිරගාමර් ලෙනම තිබූ චිත්‍ර සටහන්ද, 1971 දී එල්.ඒ. ආදිත්‍ය බුදුගල චිත්‍ර සටහන්ද, 1982 දී ජී.ජී. පුංචිහේවා උමාගේ කන්ද චිත්‍ර සටහන්ද, පිළිබඳව කළ වාර්තා හමුවේ ( Nandadewa,1992,p.345). 1983 දී ඌරාකන්ද පිහිටි චිත්‍ර ස්ථාන පිළිබඳ වාර්තා කරනුයේ ඩබ්.එම්. විජේපාල විසිනි( Nandadewa,1992,p.345). හුලංනුගේ චිත්‍ර ස්ථානය පිළිබඳ 1984 දී රෝලන්ඩ් සිල්වාද, කනගරායන්කුලම් චිත්‍ර ස්ථානය පිළිබඳ 1984 දී එච්.එච්. සිරිසෝමද, අළුගල්ගේ චිත්‍ර සටහන් පිළිබඳ 1984 දී ධර්මසිරිද වාර්තා කර ඇත (Nandadewa,1992,p.345). 1984 දී එල්.කේ. කරුණාරත්න ගොනාගොල්ල චිත්‍ර ස්ථානය පිළිබඳවද, 1986 දී එස්. සෙනෙවිරත්න විසින් පදවිගම්පොල චිත්‍ර ස්ථානය පිළිබඳවද, 1986 දී කේ. මංජු ශ්‍රී විසින් කොටියාගල චිත්‍ර ස්ථානය පිළිබඳවද වාර්තා කර ඇත (Nandadewa,1992,p.345).

### ද්විතීයික මූලාශ්‍රය

යුරෝපීය හා ලාංකේය ගවේෂකයින්ගේ වාර්තාවලදී හමු වූ ආදිවාසී චිත්‍ර ස්ථාන හා චිත්‍ර සටහන් ප්‍රථම මූලාශ්‍රයයෙන් උපුටාගෙන බී.ඩී. නන්දදේව නාමලේඛනයක් හා වගුවක් ආකාරයට ඉදිරිපත් කර ඇත. ප්‍රථම මූලාශ්‍රයවල ඇති ඉපැරණි බව නිසා ඒවා සොයා ගැනීම අපහසු වුවද, ප්‍රථම මූලාශ්‍රයයේ කරුණු හා රූප සටහන් නිවැරදිව හා නිරවුල්ව උපුටා ඇති

හෙයින් නන්දදේවගේ ලේඛනය ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රයයක් ලෙස භාවිත කළ හැකිය. එකී මූලාශ්‍රයයෙහි දක්වා ඇති සියලුම ආදිවාසී චිත්‍ර ස්ථාන පුරාවිද්‍යාත්මක ගවේෂණ, වාර්තා වලදී හමුවූ ඒවාය.

මෙම ලේඛන ඇසුරු කොටගෙන ආදිවාසී චිත්‍ර ගවේෂණයේදී පැනනගින ගැටලු ගණනාවකි. බී.ඩී. නන්දදේවගේ මූලාශ්‍රය ලේඛනයේ ගොනාගොල්ල හා රජගල කන්ද චිත්‍ර ස්ථානයනිහි නාමයන් මාරුකොට ඉදිරිපත් කර ඇත (Nandadewa,1992,p.345). ඉන් පසුකාලීනව ලියූ ලේඛන සියල්ලෙහිම චිත්‍ර ස්ථාන දෙකෙහි නාම ප්‍රථම මූලාශ්‍රයයේ මෙන්ම මාරුකර භාවිතා කර තිබේ (Hapuarachchi,2003,p.57, බිනරගම,2008,38පි. ). ආදිවාසී චිත්‍ර ස්ථානයන් වෙත ළඟාවීමට සපයා ඇති දත්ත හා තොරතුරු ප්‍රමාණවත් නොවේ. උමාගේ කන්ද පිහිටි ස්ථානය දක්වා ඇත්තේ ''ගල්ඔය නිම්නයේ ඇතින් කොහොඹාන ප්‍රදේශයේ '' ලෙසිනි. එහෙත් ගල්ඔය නිම්නය හා කෙහාඹාන ප්‍රදේශයට අයත්ව විශාල භූමි ප්‍රදේශයක් පිහිටා ඇති අතර සියුම් විස්තර තොරතුරු නොමැතිව චිත්‍ර ලෙනක් සොයා ගැනීම ඉතා අපහසුය. බී.ඩී. නන්දදේව චිත්‍ර නාමාවලයේ අඩංගු පළාත්, දිස්ත්‍රික්ක හා ග්‍රාමයන් පිළිබඳ විස්තර ඉතා පැරණි හෙයින් එම ස්ථාන සොයාගැනීම ඉතා අපහසුය. අතීතයේ දී නැගෙනහිර වෙරළබඩ විශාල ප්‍රදේශයක් මඩකලපුව දිස්ත්‍රික්කයට අයත් වූ අතර වර්තමානයේ දී එම ප්‍රදේශ අම්පාර දිස්ත්‍රික්කයට අයත්ය. පැරණි නම්වලින් හැඳින්වූ ගුහා, ලෙන් හා ප්‍රදේශ වර්තමානයේ විවිධ නම්වලින් හඳුන්වයි. වර්තමානයේ ප්‍රදේශවාසීන් දොරවක හඳුන්වනුයේ ඇතුපනේ, ඒබිඩිගල ලෙන යන නම්වලිනි. බිල්ලෑව වර්තමානයේ හඳුන්වනුයේ භාරත නාග ලෙන ලෙසිනි.

**දෘශ්‍ය මූලාශ්‍රය (ගවේෂණ මූලාශ්‍රය)**

**ක්ෂේත්‍ර ගවේෂණය**

මෙම පර්යේෂණයේ ක්ෂේත්‍ර ගවේෂණය සිදුවනුයේ ප්‍රථම මූලාශ්‍රය වන චිත්‍ර පිහිටි ලෙන හෝ ගුහාව වෙත ප්‍රවේශ වීමෙනි. ආදිවාසී චිත්‍ර ලෙනේ සැබෑ චිත්‍ර සටහන් සජීවීව දැක ( සාකල්‍යයෙන්ම අත්විඳ) ඒවා නිවැරදි ලෙසම ලෙනේ පිහිටා ඇති ආකාරයට වාර්තා කිරීම සිදු වේ. ගවේෂණයේදී චිත්‍ර පිහිටි වැඩබිම් රාශියක් වෙත ප්‍රවේශවීමට හැකිවිය.

**පාෂාණ සීරුම් චිත්‍ර ස්ථාන**

යම් තියුණු ආයුධයකින් පාෂාණ පෘෂ්ඨය වැර යොදා හූරා රේඛාව මතුකළ චිත්‍ර සටහන් ස්ථාන ගණනාවක් ගවේෂණයේදී හමුවිය.

**පාෂාණ බිත්තිය මත සායමෙන් ඇඳි චිත්‍ර ස්ථාන**

පාෂාණ බිත්තිය මත සායමෙන් ඇඳි චිත්‍ර ස්ථාන ගණනාවක් ගවේෂණයේදී හඳුනාගත හැකි විණි. පාෂාණ බිත්තිය මත රේඛාත්මකව සුදු පැහැයෙන් හා ඒකවර්ණයෙන් එම චිත්‍ර සටහන් ඇඳ තිබිණි.

### හඳුනාගත නොහැකි වූ චිත්‍ර ස්ථාන

ප්‍රථම මූලාශ්‍රයවල සඳහන්වනු කෙතරම් ගවේෂණය කලද හඳුනාගත නොහැකි වූ චිත්‍ර ස්ථානද කිහිපයක් දක්නට ලැබේ.

### අභිනවයෙන් සොයාගත් චිත්‍ර ස්ථාන

එකී ගවේෂණවලදී මෙතෙක් ප්‍රකාශයට පත් නොවූ අභිනවයෙන් සොයාගත් චිත්‍ර ස්ථාන රාශියක්ද හමුවිණි. මේවා සියල්ල ප්‍රකාශයට පත් කෙරිණි.

### මූලාශ්‍රයවල සඳහන් ආදිවාසී චිත්‍ර ස්ථාන

1986 දී බී.ඩී. නන්දදේව සම්පාදනය කළ චිත්‍ර ස්ථාන ලේඛනය (1986) 1992 දී නැවත වගුවක් ආකාරයට ඉදිරිපත් කර ඇත. එය ආදිවාසී චිත්‍ර ස්ථාන සම්බන්ධව ඇති එකම එකතුවයි. ආදිවාසී චිත්‍ර පිළිබඳව පසුකාලීනව ලියැවුණු සෑම ලේඛනයකම මූලාශ්‍රය වී ඇත්තේ මෙම නන්දදේවගේ ලේඛනයයි. නන්දදේව 1992 දී ඉදිරිපත් කල වගුවේ චිත්‍ර ස්ථාන හතළිස් එකක් අඩංගුය. චිත්‍ර ස්ථානය අනාවරණකරු, වර්ෂය හා තොරතුරු සඳහන් මූලාශ්‍රයද වගුවේ දක්වා ඇත.

| | | | |
|---|---|---|---|
| 1. | කොනත්තේගොඩගල | 2. | අරංගොඩගල |
| 3. | තන්තිරිමලේ | 4. | බිල්ලෑව |
| 5. | ආඬියාගල | 6. | පුංචිකිරිඅම්මා ගල්ගේ |
| 7. | පිහිලේගොඩ ගල්ගේ | 8. | ගමකන්ද ගල්ගේ |
| 9. | නැව්ගල | 10. | දොරවක |
| 11. | හෙනන්නේගල | 12. | මලයඩිකන්ද |
| 13. | දික්ගල්ගේ | 14. | සංගමන්කන්ද |
| 15. | මොලගොඩ | 16. | කෝමාරිකාලෙන |
| 17. | මණ්ඩාගල | 18. | කිරිපොකුණ |
| 19. | ගනේගම | 20. | බඹරගස්තලාව |
| 21. | කඳුරු පොකුණ | 22. | මහලෙනම |
| 23. | රජගල | 24. | කුඩුම්බිගල |
| 25. | ලෙනම | 26. | ලුනාටුගල්ගේ |

| | | | |
|---|---|---|---|
| 27. | තෙලඹුතෙම ගල්ගේ | 28. | මුදුනතලාව ගල්ගේ |
| 29. | හිඟුරාන | 30. | මීනාදමූ ගල්ගේ |
| 31. | දිඹුලාගල | 32. | බුදුගල |
| 33. | මලයඩිකන්ද | 34. | හවල එලිය |
| 35. | උමාගේ කන්ද | | |
| 36. | ඌරාකන්ද | 37. | හුලංනුගේ |
| 38. | කොන්ගරයන්කුලම් | 39. | අලු ගල්ගේ |
| 40. | ගොනාගොල්ල | 41. | පදවිගම්පොල |

## අභිනවයෙන් සොයාගත් ආදිවාසී චිත්‍ර ස්ථාන

මෙතෙක් අනාවරණය නොවුණු, ලේඛණගත නොවුණු, පර්යේෂක විසින් ගවේෂණය කර සොයාගන්නා ලද අභිනව ආදිවාසී චිත්‍ර ස්ථාන ගනාවක් ලේඛනගතකර ඇත.

**පර්යේෂක විසින් අභිනවයෙන් අනාවරණය කළ ආදිවාසී චිත්‍ර ස්ථාන**

| | | | |
|---|---|---|---|
| 1. | තාපසගල | 2. | හේනානිගල |
| 3. | හඳගල | 4. | වැරැල්ලගල |
| 5. | ලිහිණියාගල ලෙන | 6. | මුත්තාකඩ ලෙන |
| 7. | නුවරගල | 8. | කුඩුම්බිගල |
| 9. | මගුල්දමන | 10. | රබ්බිඩිගල ලෙන |
| 11. | වක්ලෙන-ගිරා පොකුණු හෙල | 12. | ගල්කඩ |
| 13. | තුඹස්ලෙන- බෝවත්ත ගල්ගේ | 14. | වැල එල්ලූගොඩ කන්ද |
| 15. | බෝවත්ත ගල්ගේ පිටුපස | 16. | පුළුකුණාව |
| 17. | බෝවත්තගල්ගේ ඉදිරිපස | 18. | තොප්පිගල |
| 19. | කුටීර ලෙන-බෝවත්තගල්ගේ | 20. | පන්නල්ගම |
| 21. | බුද්ධංගල | 22. | උතුරු පව්ව |

23. නැල්ල ගෙල

24. නයිපෙන ලෙන-කණකෙකිණියන්ගේ

25. දික් ලෙන- කණකෙකිණියන්ගේ ගෙල

26. ආලෝක ලෙන-පංසල් කන්ද

27. කුටීර ලෙන- පංසල් කන්ද

28. මුළුතැන්ලෙන- පංසල් කන්ද

29. ශාස්ත්‍රවෙල

30. නන්දාගල

31. වැරැල්ලගල

32. මුත්තාකඩලෙන

33. කුටුම්බිලෙන-ගිරාපොකුණ හෙල

34. වක්ලෙන-බෝවත්ත ගල්ගේ

35. තුඹස් ගල්ගේ පිටුපස

36. බෝවත්ත ගල්ගේ පිටුපස

37. බෝවත්ත ගල්ගේ ඉදිරිපස

38. කුටීරලෙන- බෝවත්ත ගල්ගේ

39. ඩැකියුලා ගල්ගේ

40. යකින්න ගල්ගේ

41. මාරපානම්

මුල් කාලීනව වාර්තාගත හා අභිනවයෙන් සොයාගත් චිත්‍ර ස්ථානද සැලකූ විට ශ්‍රී ලංකාවේ ආදිවාසී ගුහා චිත්‍ර ස්ථාන අසූහතක් පමණ හඳුනාගත හැකිය. යම් විට මෙහිදී එකම චිත්‍ර ස්ථානය පැරණි නාමයකින් ලේඛනගත වූවාද විය හැකිය.

**ශ්‍රී ලංකාවේ ආදිවාසී චිත්‍ර සටහන් හමුවූ ස්ථාන නාමාවලිය**

| | චිත්‍ර පිහිටි වැඩබිම | ලෙන් ගණන | අයත් දිස්ත්‍රික්කය | අනාවරණකරු | ප්‍රසිද්ධ කළ ලේඛනය | ප්‍රසිද්ධ කළ වර්ෂය හා දිනය |
|---|---|---|---|---|---|---|
| 01 | කෝමාරිකා ලෙන-තන්තිරිමලේ | 1 | අනුරාධපුරය | ජෝන් ස්ටීල් | JRASCB22(63) | 1910 |
| 02 | වරිච්චි ලෙන-තන්තිරිමලය | 1 | අනුරාධපුරය | ජෝන් ස්ටීල් | JRASCB22(63) | 1910 |
| 03 | ආඬියාගල | 2 | අනුරාධපුරය | ජෝන් ස්ටීල් | JRASCB22(63) | 1910 |
| 04 | බිල්ලෑව | 2 | අනුරාධපුරය | ජෝන් ස්ටීල් | JRASCB22(63) | 1910 |
| 05 | ඔච්චප්පු කල්ලු | 1 | අනුරාධපුරය | එල්ලාවල මේධානන්ද | උ.නැ.බෞ.උ | - |
| 06 | තාපසගල | 1 | අනුරාධපුරය | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 07 | හඳගල | 1 | අනුරාධපුරය | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 08 | ලිහිණියාගල ලෙන | 1 | අනුරාධපුරය | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2009-11-15 |
| 09 | මඩවල | 1 | අනුරාධපුරය | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 10 | කොනත්තේගොඩගල | 1 | මඩකළපුව | එච්.සී.පී. බෙල් | ASCAR | 1897 |
| 11 | දිඹුලාගල | 1 | පොළොන්නරුව | එස්.ඩබ්. කරුණාරත්න | ASCAR | 1897 |
| 12 | නුවරගල | 1 | පොළොන්නරුව | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 13 | මඟුල්දමන | 1 | පොළොන්නරුව | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 14 | අක්වක්ගුහාව-හක්බෙලිකන්ද | 1 | පොළොන්නරුව | චින්තක විජේතුංග | - | - |
| 15 | ත්‍රිකෝනගුහාව-හක්බෙලිකන්ද | 1 | කුරුණෑගල | චින්තක විජේතුංග | - | - |
| 16 | කොන්ගරයන්කුලම් | 2 | කුරුණෑගල | එම්.එම්. සිරිසෝම | AC-6 | 1984 |
| 17 | දොරවක | 3 | කෑගල්ල | පී.එෆ්.ආර්. බ්‍රවුනිංග් | CALR 4(4) | 1919 |
| 18 | මුක්කුගල්ලෙන-උඟුරාකන්ද | 1 | කෑගල්ල | ඩබ්.එච්. විජේපාල | AC-6 | 1983 |
| 19 | රබ්බිඩිගල ලෙන | 1 | කෑගල්ල | ඩබ්.එච්. විජේපාල | AC-6 | 1983 |
| 20 | මොලගොඩ | 1 | කෑගල්ල | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 21 | පදවිගම්පොල | 3 | කෑගල්ල | එස්. පරණවිතාන | ASCAR | 1933 |
| 22 | බුදුගල | 3 | කෑගල්ල | එස්. සෙනෙවිරත්න | ප්‍රසිද්ධ නොකල | 1986 |
| 23 | කොණ්ඩගල | 1 | රත්නපුරය | දයානන්ද බිනරගම | දිවයින | 2005 |
| 24 | මඟුල් මහා විහාරය-සිතුල්පව්ව | 1 | හම්බන්තොට | ටී.එම්.සී.කේ. බණ්ඩාර | - | - |
| 25 | පුංචිකිරිඅම්මා ගල්ගේ | 1 | මොණරාගල | සෙලිග්මාන් යුවල | The Veddas | 1911 |
| 26 | බුදුන්ගේ හෙල | 1 | මොණරාගල | කේ. සිංග්යෝ | RARC | 1999 |
| 27 | මණ්ඩාගල | 1 | මොණරාගල | පී.ඊ.ජී. දුරණියගල | SZ(30)1 | 1963 |
| 28 | නැවිගල | 1 | මොණරාගල | එෆ්. ලීවිස් | JRASCB 23(67) | 1914 |
| 29 | ගල්කඩ | 1 | මොණරාගල | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 30 | මයිල්ල කන්ද (කොටියාගල) | 1 | මොණරාගල | කේ. මංජු ශ්‍රී | ප්‍රසිද්ධ නොකල | 1986 |
| 31 | අළුගල්ගේ | 1 | මොණරාගල | ධර්මසිරි | AC-6 | 1984 |
| 32 | දෙවනියංකුඹුර (උස්සාගල) | 1 | මොණරාගල | සෙනරත් වික්‍රමසිංහ | කෞතුකාගාරය 7 | 2001 |
| 33 | වෙට්ටම්ඹුගල | 1 | මොණරාගල | කේ. සිංග්යෝ | RARC | 1999 |
| 34 | වැලඑල්ලූගොඩ කන්ද | 1 | මොණරාගල | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | 14 |
| 35 | අරංගොඩගල | 1 | මඩකලපුව | එච්.සී.පී. බෙල් | ASCAR | 1897 |
| 36 | පුළුකුණාව | 1 | මඩකලපුව | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 37 | තොප්පිගල | 1 | මඩකලපුව | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 38 | මාරපානම් | 1 | මඩකලපුව | ඩබ්.ඩබ්.යූ. බංඩාර | සිළුමිණ | 2010-03-14 |
| 39 | පන්නල්ගම | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 40 | ගමකන්ද ගල්ගේ | 1 | අම්පාර | සෙලිග්මාන් යුවල | The Veddas | 1911 |
| 41 | රජගලකන්ද | 1 | අම්පාර | සී.ඊ. ගොඩකුඹුර | ASCAR | 1959 |
| 42 | සමන්ගල | 1 | අම්පාර | එල්ලාවල මේධානන්ද | උ.නැ.බෞ.උ | - |
| 43 | ගොනාගොල්ල | 1 | අම්පාර | එල්.කේ. කරුණාරත්න | කල්‍යාණි | 1984 |
| 44 | උතුරුපව්ව | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 45 | නැල්ල | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 46 | පිහිලේගොඩ ගල්ගේ | 1 | අම්පාර | සෙලිග්මාන් යුවල | The Veddas | 1911 |
| 47 | ඒ.සී. කැම්ප් ලෙන | 1 | අම්පාර | එල්ලාවල මේධානන්ද | උ.නැ.බෞ.උ | - |
| 48 | ණයිපෙනලෙන-හෙල කනකෙකිනියන්ගල | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 49 | දික්ලෙන-කනකෙකිනියන්ගල | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 50 | ගනේගම | 1 | අම්පාර | පී.ඊ.පී.දැරණියගල | ASCAR | 1857 |
| 51 | මලයඩිකන්ද | 1 | අම්පාර | එල්ලාවල මේධානන්ද | උ.නැ.බෞ.උ | - |
| 52 | හිඟුරාන | 1 | අම්පාර | පී.ඊ.පී.දැරණියගල | ASCAR | 1857 |
| 53 | ආලෝක ලෙන-පන්සල්කන්ද | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ප්‍රසිද්ධ නොකල | - |
| 54 | කුටීර ලෙන-පන්සල්කන්ද | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ප්‍රසිද්ධ නොකල | - |
| 55 | මුළුතැන්ලෙන-පන්සල්කන්ද | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ප්‍රසිද්ධ නොකල | - |
| 56 | රතුගල්යාය | 1 | අම්පාර | එල්ලාවල මේධානන්ද | උ.නැ.බෞ.උ | - |
| 57 | තරුලෙන්ගල (හුලංනුගේ) | 1 | අම්පාර | රෝලන්ඩ් සිල්වා | AC-6 | 1984 |
| 58 | ශාස්ත්‍රවෙල | 2 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ප්‍රසිද්ධ නොකල | - |
| 59 | ස්ත්‍රී පුරගලකන්ද | 3 | අම්පාර | සීවලී මනතුංග | ජා.ප්‍ර.ස | 2004 |
| 60 | හවල එළිය | 1 | අම්පාර | - | ROAM | - |
| 61 | කුඩුම්බිගල | 1 | අම්පාර | ඒ.ඩී. රඹුක්වැල්ල | JRASCB8(2) | 1963 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 62 | කඳුරුපොකුණ | 1 | අම්පාර | පී.ඊ.පී.දැරණියගල | ASCAR | 1957 |
| 63 | මහලෙනගම එළිය | 3 | අම්පාර | පී.ඊ.පී.දැරණියගල | ASCAR | 1957 |
| 64 | ලෙනම | 3 | අම්පාර | එස්. කේ. කදිරගාමර් | JRASCB8(2) | 1963 |
| 65 | බඹරගස්තලාව | 1 | අම්පාර | පී.ඊ.පී.දැරණියගල | ASCAR | 1957 |
| 66 | කිරිපොකුණ | 1 | අම්පාර | පී.ඊ.පී.දැරණියගල | SZ26(1) | 1951 |
| 67 | නන්දාගල | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | සිළුමිණ | 2010-03-14 |
| 68 | හේනානිගල | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ප්‍රසිද්ධ නොකල | - |
| 69 | හෙනන්නේගල | 1 | අම්පාර | ආර්.එල්. ස්පිටල් | Wild Ceylon | 1924 |
| 70 | උමගේ කන්ද | 1 | අම්පාර | ජී.ජී. පුංචිහේවා | The Island | 1982 |
| 71 | වැරැල්ලගල | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ප්‍රසිද්ධ නොකල | - |
| 72 | ලුනාටුගල්ගේ | 1 | අම්පාර | පී.ඊ.පී.දැරණියගල | - | - |
| 73 | තෙළඹුකෙම ගල්ගේ | 1 | අම්පාර | පී.ඊ.පී.දැරණියගල | ප්‍රසිද්ධ නොකල | |
| 74 | මීනාදැමූගල්ගේ | 1 | අම්පාර | පී.ඊ.පී.දැරණියගල | - | - |
| 75 | දික් ගල්ගේ | 1 | අම්පාර | ආර්.එල්. ස්පිටල් | Wild Ceylon | 1924 |
| 76 | මුත්නාකඩ ලෙන | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 77 | කුටුම්බිලෙන-ගිරාපොකුනුහෙල | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 78 | වක් ලෙන-ගිරාපොකුණුහෙල | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 79 | තුඹස් ලෙන-බෝවත්ත ගල්ගේ | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 80 | බෝවත්ත ගල්ගේ පිටුපස | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 81 | බෝවත්ත ගල්ගේ ඉදිරිපස | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 82 | කුටීර ලෙන-බෝවත්ත ගල්ගේ | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 83 | නුගගස ලෙන-බෝවත්ත ගල්ගේ | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 84 | බුද්ධංගල | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 85 | ඩැකියුලා ගල්ගේ | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 86 | යකින්න ගල්ගේ | 1 | අම්පාර | සත්සර ඉලංගසිංහ | ආ.සෙ.චි. | 2017 |
| 87 | සංගමන්කන්ද | 1 | අම්පාර | ඩී.එෆ්. වින්සර් | ASCAR | 1929 |

1992 දී ඩී.බී. නන්දදේව ඉදිරිපත්කළ වගුවේ හා 2012 දී රාජ් සෝමදේව ඉදිරිපත්කළ වගුවේ අඩංගු වූ ආදිවාසී චිත්‍ර ස්ථාන ද මෙම වගුවේ අඩංගු කර ඇත.

ආ.සෙ.චි. - ශ්‍රී ලාංකේය ආදිවාසීන්ගේ සෙල් චිත්‍ර

උ.නැ.බෞ.උ - උතුරු පළාත් සහ නැගෙනහිර පළාතේ සිංහල බෞද්ධ උරුමය

ජා.පු.ස. - ජාතික පුරාවිද්‍යා සමුළුව

AC - Ancient Ceylon, Journal of the Archaeological Survey Department of Sri Lanka

ASCAR - Archaeological Servey and Literary Register

JRASCB - Journal of the Royal Asiatic Society , Ceylon Branch

ROAM - Regisste of Ancient Monuments

SZ - Spolia Zeylanica



මූලාශ්‍රවල සඳහන් ආදිවාසී චිත්‍ර ස්ථාන



අභිනවයෙන් සොයාගත් ආදිවාසී චිත්‍ර ස්ථාන

## කාල වකවානු හඳුනාගැනීම

ආදිවාසී සෙල් චිත්‍ර විහාර බිතු සිතුවම් සම්ප්‍රදායට පෙර, සමකාලීනව මෙන්ම පසුකාලීනව මෙරට පැවති චිත්‍ර ක්‍රමයක් බවට සාධක හමුවේ. පසුකාලීනව ජනශූන්‍ය වූ ලෙන් විහාරවලද ආදිවාසී චිත්‍ර දැකගත හැකිය. එහෙයින් ආදිවාසී සෙල් චිත්‍ර ක්‍රමිකව අනවරතව ගලා ආ

යාවත්කාලීන වන චිත්‍ර ක්‍රමයක් බව තහවුරු වේ. වර්තමානයෙහිද ආදිවාසීන් පාෂාණ මත චිත්‍ර සටහන් ගොඩ නගා ඇත. ආදිවාසී චිත්‍ර එක් කාල පරිච්ඡේදයකට සීමා නොකර බිතු සිතුවම් සම්ප්‍රදාය මෙන්ම අනවරතව ගලාගිය චිත්‍ර ක්‍රමයක් ලෙස සැලකීම වඩාත් උචිතය. බිතු සිතුවම් සම්ප්‍රදායේ හා ආදිවාසී සෙල් චිත්‍ර ක්‍රමයේ කාල වකවානු විශ්ලේෂණයට බඳුන් කළ හැකිය. ශ්‍රී ලංකාවේ පිහිටි ආදිවාසී සෙල් චිත්‍ර පී.ඊ.පී. දැරණියගල විසින් ඒවාගේ පිහිටීම, වස්තු විෂය හා තාක්ෂණය ආදිය උපයෝගී කොටගෙන කාණ්ඩ කිහිපයකට වර්ග කර ඇත. ආදිවාසී සෙල් චිත්‍රවල ස්වභාවය, සායම තැවරීමේ ගුණාංග හා හැඩතල ,සායමේ අඩංගු ද්‍රව්‍ය, ඒවා මිශ්‍රකළ ආකාර, යොදාගත් උපකරණ, එක්කළ ද්‍රව්‍ය, වර්ණ සපයාගත් ආකාරය, හීරීමේ හා තැවරීමේ විධික්‍රමය ආදි දේ සියුම්ව විශ්ලේෂණය කළ හැකිය. එකී කරුණු ,දෘශ්‍ය සාධක , අංග හා ලෝකයේ වෙනත් මහද්වීපවලින් හමුවූ කාල නිර්ණය කළ සෙල් චිත්‍ර සමඟ දෘශ්‍ය විශ්ලේෂණය කිරීමෙන් එම චිත්‍ර අයත්වන කාණ්ඩ කිහිපයකට වර්ග කළ හැකිය. එසේ කාණ්ඩ කිරීම නිර්ණය කල විද්‍යාත්මක ක්‍රමයක් නොවුවද සෙල් චිත්‍ර විශ්ලේෂණයේ දී මෙන්ම අධ්‍යයනයේදී වඩාත් පහසුවක් සැලසේ.

**බිතු සිතුවම් සම්ප්‍රදායේ හා ආදිවාසී සෙල්චිත්‍ර ක්‍රමයෙහ් කාල වකවානු හඳුනා ගැනීම**

| කාල වකවානුව | බිතු සිතුවම් සම්ප්‍රදාය | ආදිවාසී සෙල් චිත්‍ර ක්‍රමය |
|---|---|---|
| ප්‍රාග් ඓතිහාසික යුගය | | කුරුල්ලන්ගල, කන්දේගම, හෙනන්නේගල |
| ශිලා යුගය | | දොරවක,හක්බෙලිකන්ද, ඌරාකන්ද |
| ක්‍රි.පූ.3 | මහින්දාගමනයෙන් පසු ඇති වූ කටාරම් | ලෙන් සම්ප්‍රදාය |
| ක්‍රි.ව.5 | සීගිරිය | නැවිගල, මගුල්දමන, මඩවල |
| ක්‍රි.ව.5-9 | කරඹගල, ගොනාගොල්ල, හිඳගල දිඹුලාගල, බණ්ඨක චෛත්‍යය-මිහින්තලය ධාතු ගර්භය-මහියංගනය | දිඹුලාගල |
| ක්‍රි.ව.10-12 | පුල්ලිගොඩ, කොටියාගල, පිදුරංගල, විද්‍යාදර ගුහාව, තිවංක පිළිමගෙය | ගොනාගොල්ල, මණ්ඩාගල, බිල්ලෑව |
| ක්‍රි.ව. 15<br>ක්‍රි.ව. 17 | හඳගල | ගමකන්ද ගල්ගේ, උස්සාල |
| ක්‍රි.ව. 18 | දඹුල්ල, දෙගල්දොරුව, රිදීවිහාරය, කරගම්පිටිය-සුබෝධාරාමය,බෝතලේ විහාරය | බුදුන්ගේ හෙල, කණකෙකිණියන්ගේ හෙල පිහිල්ගොඩ ගල්ගේ |

ප්‍රාග් ඓතිහාසික යුගය

ප්‍රාග් ආදිවාසී යුගය

ආදිවාසී යුගය

පශ්චාත් ආදිවාසී යුගය

## ශ්‍රී ලංකේය ආදිවාසීන්ගේ සෙල් චිත්‍රවල දෘශ්‍යමය සංඥා මගින් සමාවෘත අර්ථ

### සමාජ ආකල්ප

ශ්‍රී ලංකාවේ දිවි ගෙවූ පූර්වජ මානවයින් කිහිප දෙනෙක්, කුඩා කණ්ඩායමක් , කුටුම්භයක් ලෙස දිවි ගෙවූ බව කැණීම් සාධකවලින් සනාථ වේ. මෙය ප්‍රාග් ඓතිහාසික මානවයාගේද, ආදිවාසියාගේද පොදු ලක්ෂණයකි. එහෙත් ශ්‍රී ලංකාවේ දිවි ගෙවූ ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා හෝ ආදිවාසියා ශික්ෂණයකින් හෙබි පුළුල් ලෙස සමාජගත වූ සත්වයකු බව විශ්ලේෂණය නොවේ. නමුත් පවුල, කණ්ඩායම හා ගෝත්‍රය පිළිබඳ ඔවුන් වඩාත් සැලකිලිමත් විය. ඒවාගේ පැවැත්ම, නායකත්වය හා අවශ්‍යතාවයන් පිළිබඳ වඩා ක්‍රියාකාරී විය.

ශ්‍රී ලංකාවේ විසූ පූර්වජයින්ගේ සිට පැවත එන ආදිවාසී ජන කොට්ඨාශයක් වූ වැද්දන්ගේ ශික්ෂණයෙන්, ශිෂ්ටත්වයෙන් යුතු ගුණාංග සදාචාරවත් බව ආදිය හඳුනාගත හැකි බව සෙලිග්මාන් යුවල විස්තර කරයි (සෙලින්මාන්,2009,55පි.). වැද්දන් ස්වකීය කුටුම්භයට මෙන්ම අනෙකුත් සාමාජිකයිනටද භක්ත්‍යාදරව සැලකූ බව කියැවේ. එහෙයින් ඔවුන් සතුව පවතින යම් ගුණාංග ශිෂ්ටාචාරගත සමාජයක අංගයන් බව පැහැදිලිය.

### පවුල පිළිබඳ සංකේත

වැද්දන්ගේ දැකගත හැක්කේ ඒකභාර්යා සේවනයකි. ඔවුන්ගේ සමාජයේ මූල කේන්ද්‍රය කුටුම්භය වන අතර වැදි පිරිමින් ඔවුන්ගේ බිරිඳට හා දරුවනට වඩා ළෙංගතුය. වැද්දන්ගේ සමාජය පුරුෂ කේන්ද්‍රීයවුවද කාන්තාවන් හට ගෞරවය හා වරප්‍රසාද හිමිය. පුරුෂ කේන්ද්‍රීය වැදි සමාජයේ වැදි පුරුෂයිනට ප්‍රමුඛතාවය හිමිවන බැවින් කුටුම්භයේ ප්‍රධානතම සංකේත වනුයේ පුරුෂයාය. සෙල් චිත්‍ර සඳහා පුරුෂයාගේ රුව වැඩි වශයෙන් භාවිත කර ඇත. ස්ත්‍රී රුව චිත්‍රණය කර ඇත්තේ දුලබ වශයෙනි. පවුල සංකේතවත් කරමින් පුරුෂයා, ස්ත්‍රිය හා දරුවන් ගොඩනගන ලද චිත්‍ර සටහන් හමු වේ. යම් විට පියකු හා දරුවකු, සතකු අරා සිටින චිත්‍ර සටහන්ද හඳුනාගත හැකිය. හතරැස් හැඩයට ගොනු කළ මානව රූ යුගලයෙන් සැමියා හා බිරිඳ සංකේතවත්ව යෙදුවා විය හැකිය. ඒවායෙන් පවුලේ සාමාජියින් අතර වන සමීප සම්බන්ධතාව සංකේතවත් කරයි.



1. කුටුම්භ ජීවිතය, ගිරා පොකුණු හෙල.



2. කුටුම්භ ජීවිතය, බුදුන්ගේ හෙල.



3. කුටුම්භ ජීවිතය, ගිරා පොකුණු හෙල.



4. කුටුම්භ ජීවිතය, තන්තිරිමලේ.

**ප්‍රේමය හා ලිංගිකත්වය**

ප්‍රේමය හා ලිංගිකත්වය පිළිඹිබු කරන ආදිවාසී චිත්‍ර සටහන්ද හමු වේ. පෙමින් වෙළුණු වැළඳගත් පෙම්වත් යුවලක් කුටියක් තුළ හිඳින ආකාරය සංකේතවත්ව නිරූපණය කර ඇත. ඔවුන් පෙම්වතුන් හෝ අඹු සැමියන් විය හැකිය. නිදහස් අවකාශයේ සැරිසරන පෙම්වත් යුවල ආදිවාසීන්ගේ වස්තු විෂයක්ව ඇත. තන්තිරිමලේ හා බුදුන්ගේ හෙල මේ ආකාරයේ චිත්‍ර හමුවේ. එසේ චිත්‍රණය කළේ ආදිවාසීන්ගේ කාල්පනික සිතුවිල්ලක් හෝ අත්දැකීමක් විය හැකිය. දෙවෙනියන්කුඹුර ලෙනෙහි ඔරු පැදයන පෙම්වතුන් යුවල ඉතා අලංකාරව ගොඩනගා ඇත. ඔරුවක නැග ඔවුනටම වෙන්වූ ලොවක් වෙත පියනගයි. ඔරුවේ පිරවූ බඩු බාහිරාදියද සමග දුර බැහැර ගමනක නිරත බව හැඟෙයි. එයින් පෙම්වත් යුවලගේ බලාපොරොත්තු හා අපේක්ෂාවන් පිළිබඳ අදහසක් ද්වනිත කරයි.







5. පෙම්වත් යුවල, දෙවෙනියන්කුඹුර හෙල

6. ලිඟුව , අලු ගල්ගේ

7. ලිඟුව , කණකෙකිණියන්ගේ

**සොබාදහම පිළිබඳ ආකල්ප**

ලිංගිකත්වය පිළිබඳ යම් සංකේතයක්ද චිත්‍රණය කර ඇත. පුරුෂයින්ගේ ලිඟුව පැහැදිලිව නිරූපණය කර ඇතත් මිනිසුන්ගේ මෛථූනය අවස්ථා නිරූපිත චිත්‍ර සටහන් මෙතෙක් හමුව නැත. බුදුන්ගේ ගෙල, පංසල් කන්ද, වෙට්ටඹුගල, ආදී ස්ථානවල හස්ථි මෛථූනය අවස්ථා නිරූපණය කර තිබේ. එම සතුන්ගේ ජවය, ක්‍රියාකාරීත්වය, වෙහෙසකාරී බව මැනරවින් පිළිඹිඹු වේ. සතුන්ගේ ලිංගික චර්යා පිළිබඳ නිරීක්ෂණයෙන් හා අවබෝධයෙන් එම චිත්‍ර සටහන් ඉදිරිපත් කර ඇත. ඒවා නිර්මාණාත්මක මෙන්ම සංකේතාත්මකය. සත්ව මෛථූන්‍ය මගින් මිනිසුන්ගේ මෛථූනය පිළිබඳ හැඟීමක් සකේතවත් කළාද විය හැකිය



8. හස්ථි මෛථූනය , පංසල් කන්ද.





9. හස්ථි මෛථූනය , බුදුන්ගේ හෙල.





10. හස්ථි මෛථූනය නිර්මාණාත්මකව

ගොඩනගා ඇති අයුරු





11. හස්ථි මෛථූනය, වෙට්ටඹුගල

සොබාදහම ස්වකීය ප්‍රාණය මෙන් සැලකූ ආදිවාසියා සොබාදහමෙහිම අංගයක්ද විය. හෙතෙම සොබාදහමේ නිත්‍ය ගලායාමට හානිකර වූ අභියෝගයක් වූ කිසිදු ක්‍රියාදාමයක නිරත නොවීය. තුරුලතා, වනසතුන් හා ගලායන ජලය ඔවුන්ගේ දිවියේ අංගයක් වී ඇත. ආදිවාසියා නිරන්තර සොබාදහම හා සහසම්බන්ධතා දැක්වූ බව පැහැදිලි වන කරුණකි.

ආදිවාසීන්ගේ මූලික අවශ්‍යතා වන නිවස්න, ඇඳුම් පැළඳුම්, ආහාරපාන ආදී සියල්ල සපයා ගන්නේ සොබාදහමෙනි. වඩා වැදගත් වනුයේ ඒවා සපයා ගැනීමේදී කිසි විට සොබාදහමට හානි නොකිරීමයි. ආහාර පිණිස දඩයම් කළ සත්ත්වයාගේ සමෙන් විළිවසා ගැනීම පිණිස ඇඳුම සකසා ගත් අතර සත්ත්ව අස්ථි කැබලි ආයුධ හා පළඳනාවන් ලෙස භාවිත කළහ. ස්වභාවික ගුහා හා ලෙන් ස්වකීය නිවස්න ලෙස භාවිත කළද ඒවාට කිසිදු අයුරකින් හානිකිරීමක් සිදු නොකළහ. ආදිවාසීන් සොබාදහමෙන් ලබාගත් හා භාවිත කළ කිසිවක් ගුහා හා ලෙන්, ජලය, තුරුලතා කිසිවක් චිත්‍ර ඇඳීමේ දී ඔවුන්ගේ වස්තු විෂය වී නැත. එහෙත් ඔවුන් පරිභෝජනය පිණිස භාවිත කළ සතුන්, මී වද, දඩයම් නොකළ සතුන් සෙල් චිත්‍ර සඳහා වස්තු විෂය බවට පත්ව ඇත.

**සතුන් හා බැඳි සබඳතාවය**

ආදි මානවයාගේ ප්‍රධානතම කර්තව්‍ය වූ දඩයම හා බැඳුණු ප්‍රධානතම අංගය වූයේ සතුන්ය. ආදිවාසියා හා සතුන් අතර වනුයේ අත්‍යන්ත බැඳීමකි. ආදිවාසීන්ගේ ආරක්ෂකයා වූයේ සුනඛයින් කිහිප දෙනෙකි. දඩයම සඳහා සුනඛයින්වද කැටුව යාම ඔවුන්ගේ සිරිතකි (විජේසේකර,2003,පි.61). ආදිවාසීන් දඩයම් කරනුයේ ආහාර සපයාගැනීම පිණිසම නොවේ. ආහාර පිණිස භාවිත කරන ගොයා, මුවා, ඉත්තෑවා, ගෝනා, වැනි සතුන් හැරුණු විට ආහාරයට නොගන්නා වෙනත් සතුන්ද දඩයම් කරයි. ආදිවාසීනට අභියෝගයක් වන සතුන් අතර අලියා, කොටියා, වළහා ප්‍රධාන වේ.

ආදිවාසී ගුහා චිත්‍ර සඳහා භාවිත කර ඇත්තේ තෝරා ගත් සතුන් පිරිසකි. මුවා, ගෝනා, වැනි සිව්පා සතුන්ද, ඉදිබුවා, ඉත්තෑවා වැනි උරගයින්ද, නොයෙක් කෘමීන් වර්ගද ඔවුන්ගේ වස්තු විෂයක් වී ඇත. චිත්‍රණය සඳහා සත්ත්වයින් කාණ්ඩයක් පමණක් තෝරා ගැනීම සුවිශේෂී වේ. ආදිවාසිනට අභියෝගයක් වූ අලියා, කොටියා වැනි සතුන් මිනිසා ඇඳි ප්‍රමාණයට වඩා කුඩාවට ඇඳ තිබේ. එයින් ආදිවාසියාගේ බලය හා අභිමානය පිළිබඳ අදහසක් ගම්‍ය කරයි. සතුන් අරා සිටින මිනිසුන් මගින් සතුන්ව හීලෑකරගත් බව හා සතුනට වඩා තමා උසස් බව ආදි හැඟීම් නිරූපණය කරනවා විය හැකිය. සතුන් වෙන්ව, තනි තනි වශයෙන්, රංචු වශයෙන්, විවිධ ක්‍රියාකාරී අවස්ථා, මෛථුන අවස්ථා, දඩයම් අවස්ථා ආදිය නිරූපණය කරයි. කිඹුලා, මුගටියා වැනි සතුන් දුලභව දක්නට ලැබේ. සිංහයා, ව්‍යාඝ්‍රයා වැනි සතුන්ගේ පාෂාණ සිරුම් චිත්‍ර සටහන් හමුවේ. මොණරා වැනි පක්ෂීන්ද ඉතා දුලබව දක්නට ලැබේ.



12. මුවා , බිල්ලෑව.



13. පක්ෂි රූව, කුරුල්ලන්ගල.



14. හංගොටුව , ගනේගම.



15. හස්ථියා , ගනේගම.



16. හංගොටුව හා මී වද , නැල්ල.



17. හස්ථියාඅරා සිටින ආදිවාසියා හා කොටියා , කිරි පොකුණ



18. ආදිවාසීන් මී පැණි එක්කාසු කිරීමට භාවිත කරන හංගොටුව, යකාකට හා මී වද ආදිය , අවම අංග භාවිත කරමින් නිර්මාණාත්මකව ගොඩනගා ඇති ආකාරය .

ආහාර එක්රැස් කර ගැනීම ආදිවාසීන්ගේ දිවියේ ප්‍රමුඛ ක්‍රියාවලියකි. ඔවුනට අවශ්‍ය ආහාර එක්රැස් කර ගැනීමේදී නොයෙක් ක්‍රියාවලි භාවිත කරන අතර ආදිවාසීන්ගේ ආහාර කල්තබා ගැනීම පිළිබඳව නොසිතන බැවින් ආහාර එක්රැස් කර ගැනීම දෛනික ක්‍රියාවලියක් බවට පත්වෙයි. ආදිවාසියා ඔවුන්ගේ මූලික ආහාරයක් වූ මී පැණි එක්කාසු කිරීම පිණිස මුව හමෙන් සකසා ගත් "මලුදම" නම් භාජනය සෙල් චිත්‍ර සටහන්වල සුලභව දක්නට ලැබේ. වෘත්තාකාර හැඩයකට ගොඩ නගන ලද මලුදමෙහි සංකේත සංඥා ලෙස නරඹන්නාට සංජානනය කෙරෙයි. මලුදම හෙවත් හංගොටු ආදිවාසීන් විසින් අඳින ලද සෙල්චිත්‍ර සටහන් අතර වැඩිම ප්‍රමාණයක් භාවිත කරන ලද සංකේතයක් වී තිබේ. උතුරු පව්ව, තන්තිරිමලේ, හඳගල, කණකෙකිණියනගේ හෙල, ගනේගම ගල්ගේ, බුදුන්ගේ හෙල, උතුරු පව්ව-සක්ලෙන ආදී ස්ථාන ගණනාවක හංගොටුව හෙවත් මලුදම චිත්‍ර සටහන් හඳුනාගත හැකිය. නැල්ල සෙල් චිත්‍ර ස්ථානයේ විශාල ලෙන් පෘෂ්ඨය පුරාම නිර්මාණය කර ඇත්තේ හංගොටුව හෙවත් මලුදම පමණි. ඒවා විවිධ ආකාරයෙන් හා විවිධ ප්‍රමාණයෙන් නිර්මාණාත්මකව හා සංකේතාත්මකව ගොඩනගා තිබේ. හංගොටු හා මලුදමට අමතරව හතරැස් හැඩය මත තිත් තබමින් අඳින ලද හැඩය මී වද විය හැකිය. ආදීවාසීන් ස්වකීය පරිභෝජනයේ දී වඩාත් රුචි අංගයක් ලෙස මී වද විස්තර කෙරේ. ඊට අමතරව ආදිවාසීන්ගේ ආහාර අතර ප්‍රමුඛව භාවිත කරන මාංශයක් වනුයේ තලගොයා ය. ආදිවාසීන් වඩාත් රුචි වූ මාංශයක් හිමි සත්ත්වයා වු තලගොයාගේ හැඩය සෙල් චිත්‍ර අතර දුලභව භාවිත කර තිබේ. තලගොයා ඉහළින් සිට බැලූ විට දර්ශනය වන ආකාරයෙන් නිර්මාණය කර තිබේ.

ආදිවාසියා ස්වකීය ආහාර ගැනීමේ ක්‍රියාවලිය සඳහා භාවිත කරන ලද මෙවලම් හා සතුන් පර්වත පෘෂ්ඨයක දෘශ්‍යමය සංකේත ලෙස ඉදිරිපත් කර තිබේ. මෙම දෘශ්‍යමය මෙවලම් වන සංකේතාත්මක රූ සටහන් වනාහි නරඹන්නාට නොයෙක් සංඥාවන් ගම්‍යමාන කරන ප්‍රබල අංගයන් ය. එයින් නරඹන්නාට සංජානනය කරනුයේ ප්‍රමුඛ සන්නිවේදන ක්‍රියාවලියකි. ආදිවාසීන්ගේ ආහාර රටාවේ සංකේත මගින් තත්කාලීන නරඹන්නා වෙත සංජානනය කෙරෙනුයේ ආදිවාසියාගේ පරිභෝජන රටාව පිළිබඳ හැඟවීමකි. සරල, සොබාදහමෙන් සපයාගත් , සොබාදහමේ තුල්‍යතාවය රැකෙන පරිභෝජන රටාව පිළිබඳ නිර්ව්‍යාජ ප්‍රකාශනයකි. සොබාදහමට එදිරි නොවුණු සොබාදහමට ආබද්ධ වූ එයින් ම යැපුණු සරල පරිභෝජන රටාව පිළිබඳ සෙල් චිත්‍ර මගින් හඟවන දෘශ්‍යමය සංඥාර්තයන් සමුදාය තත්කාලීන මානවයාට ද ස්වකීය පරිභෝජන රටාව පිළිබඳ නැවත සිතා බැලිය යුතු සංජානනීය හැඟවීමක් ඉදිරිපත් කරයි.

**ඇදහිලි හා විශ්වාසය**

වැද්දන්ගේ ඇදහිලි හා විශ්වාසයන් සියල්ල පදනම් වී ඇත්තේ මළවුන්, යකුන් ඇදහීම හා ඒ පිළිබඳ වූ දැඩි විශ්වාසය ඇසුරිනි (සෙලින්මාන්,2009,217පි ). මළ වැද්දන්ගේ භූතාත්මයක් වන නෑ යකුන් පිනවීමට යකුන් පිදීම සිදුකරයි (සෙලින්මාන්,2009,217-219පිටු). ඔවුන් නෑ යකුන්ද සමග කතරගම දෙවියන් අදහයි. පිළිම වන්දනය, බිලිදීම, පැන් පූජාව ආදී කිසිවක් ඔවුන්ගේ ඇදහිලි තුළ දක්නට නොලැබේ.

වැද්දන්ගේ කලා ශිල්ප පිළිබිඹු කරන ඇදහිලි හා විශ්වාස රාශියකි. පූජා නැටුම්, යාදිනි, ගී, ගායනා ඒවා අතර ප්‍රමුඛ වේ. පැණි කැඩීමේ දී, ගර්භණී ස්ත්‍රීන් වෙනුවෙන්, කිරි අම්මා වෙනුවෙන් කරන යාදිනි ඔවුන් අතර වඩාත් ප්‍රචලිතය. ඒවා ඉතා ළයාන්විතව ගොරහැඩි හඬින් ගායනා කරයි. වැදි ගී ඔවුන්ගේ ප්‍රභල ප්‍රකාශන මාධ්‍යයකි. ඒවා පොදු තේමා ඇසුරෙන් නිර්මිතය. වැදි සමාජයේ සියලු කලා අංග ගොඩනැගී ඇත්තේ ඇදහිලි හා විශ්වාස පදනම් කරගෙනය. ඔවුන්ගේ විශ්වාසය වනුයේ ස්වකීය පැවැත්ම හා අනන්‍යතාව රඳා පවතිනුයේ ඇදහිලි හා විශ්වාසය මත බවයි. එහෙයින් ආදිවාසීන් එකී ඇදහිලි හා විශ්වාස නොවෙනස්ව පවත්වාගෙන යාමට උනන්දු වෙයි.

**යන්ත්‍ර මන්ත්‍ර ආහාර එක්රැස්කර ගැනීම හා දඩයම**

මුල්කාලීන වැද්දන් යන්ත්‍ර මන්ත්‍ර භාවිතා නොකළද පසුකාලීනව සිංහලයන්ගේ ඇසුර සමඟ ආරක්ෂක මන්ත්‍ර භාවිත කර ඇත (සෙලින්මාන්,2009,273පි.). ඔවුන් ඒවාගෙන් බලාපොරොත්තු වූයේ ආරක්ෂාව, දඩයම හා ආහාර එක්රැස් කර ගැනීමයි. වළහා, අලියා, දිවියා, මී හරකා, පත්තෑයා වැනි ආදිවාසීන්ට අභියෝගයක් වන සතුන්ගෙන් මිදීම සඳහා මෙම මන්ත්‍ර භාවිත කර ඇත. අලියා, දිවියා, වළහා මෙන්ම මී හරකා යන සතුනට වෙන්වූ මන්ත්‍ර භාවිතා වේ. අල, බතල වැනි අල වර්ග ලබාගැනීම, මී පැණි කැඩීමේදී සාර්ථක වීම, ආහාර පහසුවෙන් එක්රැස් කර ගැනීම වෙනුවෙන් මන්ත්‍ර භාවිත වේ. මන්ත්‍ර පවසා කර්තව්‍ය ආරම්භ කළ විට එය සාර්ථක වන බව වැද්දන්ගේ අදහසයි.

ආදිකාලීන සිංහලයිනට සාපේක්ෂව වැද්දන්ගේ මන්ත්‍ර හමුවනුයේ ඉතා කලාතුරකිනි. ඒවාද සිංහලයන් ආශ්‍රයෙන් ලබාගත් දේවල්ය (සෙලින්මාන්,2009,272පි.) වැද්දන් යන්ත්‍ර භාවිත

නොකළද ආරක්ෂාව පිණිස දඩයම් කරන ලද සතුන්ගේ අස්ථි හෝ දන්ත කැබලි ගෙලෙහි හෝ ඉනෙහි පළඳියි. එයින් අදහස් කරනුයේ ආරක්ෂාව ලබාගැනීමයි. ආදිවාසී සෙල් චිත්‍ර අතර යන්ත්‍ර මන්ත්‍රවලට අදාළ වන සංකේත හා හැඩතලයන් දැකගත හැකිය. යම් විට ඒවා අවිඥ්ඥානිකව කළ චිත්‍ර සටහන් විය හැකිය.



19. ආදිවාසියා දුන්නෙන් විදීම







20.ආදිවාසියා දුන්නෙන් විදීම, හක්බෙලි කන්ද







21.බිල්ලෑව 22.නීලගිරිය 23.ගනේගම







24. බුදුගල පාෂාණ සීරුම් චිත්‍ර



25. හෙනන්නේගල

## චාරිත්‍ර විධි

ආදිවාසීන් විසින් රැකගත් චාරිත්‍ර විධි රාශියකි. ඒවා ඔවුන් සාම්ප්‍රදායික ලෙස රැකගත් පවුල හා බැඳි චාරිත්‍ර විධිය. කණ්ඩායමේ සෙසු සාමාජිකයිනට දක්වන ගෞරවය හා බැඳීම ඔවුන්ගේ චාරිත්‍ර වෘරිත්‍ර සමග බැඳී තිබෙන්නකි. අඹුදරුවන් පෝෂණය, නායකත්වයට ගරු කිරීම, සොබාදහම ආරක්ෂා කිරීමස ආදිය චාරිත්‍ර හා බැඳි මූලිකාංගයන්ය. ආහාර ගැනීමට පෙර

නෑ යකුන් පිදීම, යකුන්ගේ ආහාර කොටස් වෙන් කිරීම වැනි සාම්ප්‍රදායික ලෙස රඟෙන ආ චාරිත්‍ර විධි රාශියකි.

**නිගමනය**

ශ්‍රී ලංකාවෙන් ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා ඈතට දිවයන සංස්කෘතියක පුරා විද්‍යාත්මක සාධක හමුව තිබේ. ආසියාවේ පැරණිම නූතන මානව ලක්ෂණ සහිත අවශේෂ හා පැරණිම සත්ත්ව අවශේෂ ලංකාවෙන් හමුවුවද බලංගොඩ මානවයා දිවි ගෙවූ කිසිදු ලෙනක චිත්‍ර සටහන් හමු නොවේ. බලංගොඩ මානවයාගේ ගුහා චිත්‍ර නොමැති වුවද ලංකාවේ නැගෙනහිර වෙරළබඩ කලාපයේ වැඩිවශයෙන් හා අයෙක් ප්‍රදේශවලද ව්‍යාප්තව පවතින අර්ධ සංකේතාත්මක ගුහා චිත්‍ර ක්‍රමයක් හමුවේ. මේවා පාෂාණ සීරුම් චිත්‍ර හා සායමෙන් ඇඳි චිත්‍ර ලෙස වර්ග දෙකකින් හඳුනාගත හැකිය. මෙම ගුහා චිත්‍ර හැඳින්වීම පිණිස විවිධ නාමයන් භාවිත කළද ඒවා හැඳින්වීම සඳහා උචිත නාමය ''ආදිවාසී ගුහා චිත්‍ර'' යන නාමය බව නිගමනය කෙරේ. ආදිවාසී යන පදය මෙහිදී පොදු අරුතින් ලංකාවේ දිවිගෙවූ ප්‍රාග් ජන කොට්ඨාශ සියල්ල හැඳින්වීම පිණිස භාවිත කර ඇත.

ශ්‍රී ලංකාවේ බොහෝ ස්ථානවලින් පාෂාණ සීරුම් චිත්‍ර සටහන් හමුවේ. ඒවා විද්‍යාත්මක ක්‍රමයකට කාල නිර්ණය කර නැත. එහෙත් ඒවාගේ ස්ථාන කිහිපයක චිත්‍ර සටහන්, ලෝකයේ කාලය නිර්ණය කරන ලද ප්‍රාග් මානවයින්ගේ ගුහා චිත්‍ර හා දෘශ්‍ය සංසන්දනයේදී මෙරට විසූ ප්‍රාග් මානවයින්ගේ චිත්‍ර සටහන් බව නිගමනය කළ හැකිය.

සායමෙන් ඇඳි චිත්‍ර ස්ථාන බහුතරයක් මෙරට විසූ වැද්දන් විසින් කළ ඒවාය. එසේ නිගමනය කළ හැක්කේ ඒවාගේ නිරූපණය වනුයේ වැද්දන්ගේ දිවිය හා බැඳි අවස්ථා, සංකල්ප හා මෙවලම් ආදිය නිරූපණය වන හෙයිනි. ආදිවාසී ගුහා චිත්‍ර බිතු සිතුවම් සම්ප්‍රදායට පෙර, සමකාලීනව හා පසුකාලීනව බිහි වූ අනවරතව ගලායන චිත්‍ර ක්‍රමයක් වන අතර එය වෙනම චිත්‍ර කලා ධාරාවක් ලෙස අධ්‍යයනය කළ යුතු බව නිගමනය කෙරේ.

ශ්‍රී ලාංකේය ආදිවාසීන්ගේ සෙල් චිත්‍ර සටහන්වල නිරූපිත සංඥා දෘශ්‍ය විශ්ලේෂණයකට ලක් කිරීමෙන් එහි අර්ථ මැනවින් වටහාගත හැකිය. සමාජ ආකල්ප හා පවුල පිළිබඳ සංකේත චාරිත්‍ර විධි ප්‍රේමය හා ලිංගිකත්වය සොබාදහම පිළිබඳ ආකල්ප සතුන් හා බැඳි සබඳතාවය ඇදහිලි හා විශ්වාසය ආදිය සෙල් චිත්‍ර මගින් සමාවෘත අර්ථ බව නිගමනය කළ හැකිය. ඒවා මගින් ඔවුනට ආවේණික අනන්‍යතා ලක්ෂණ තීව්‍ර කරයි.

## ආශ්‍රිත මූලාශ්‍රය


Bandaranayake, Senaka, (2006) *The Rock and wall paintings of Sri Lanka* , pannipitya: Stamford Lake ( pvt ) Ltd,.

Bell , H.C.P. (1904) *Archeol logical survey of ceylon ,* North Central province Annual Report , XXXVI – 1904

Bal , Mieke , Bryson , Norman , (1991) " Semiotics and Art history ADiscussion Context and Senders", pp. 242 - 256.

බිනරගම, දයානන්ද, (2008)*බලංගොඩ මානවයා සහ අපේ ආදිවාසි වරිගේ ඇත්තෝ* , කොළඹ : එස් ගොඩගේ සහ සහෝදරයෝ.

බිනරගම, දයානන්ද,(2008) *ශ්‍රී ලංකාවේ ප්‍රාථමික චිත්‍රකලාව හා ප්‍රාථමික ලේඛණකලාව* , කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Daraniyagala , P.E.P. (1954) "Stone Age Ceylon " *Journal of the Royal Asiatic Society* , VO : III

දැරණියගල, ශිරාන්.(1992) *ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය* , කොළඹ : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

Growing, Lawrence, (1998) *Art A word History*, London : Dorlingkindrsly Limited .

Hapuarachchi, Ajantha,( 2003) *from spoken word to writing*, maradana : Rathna publishers.

කහඳගමගේ, පියසේන, (2008) *දිගාමඩුලු දනව්ව*, කොළඹ : එම්.ඩී. ගුණසේන සහ සමාගම.

කුලතිලක, සමන්ති. (2008) *මානව අතීතය III*, කොළඹ, : තරංජි ප්‍රින්ටස්.

මේධානන්ද, එල්ලාවල (2008) *නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල , බෞද්ධ උරුමය*, දයාවංශ ජයකොඩි සහ සමාගම.

Nadadewa., B.D., (1986 )" Rock Art Sites of Sri Lanka A Catalogue " , *Ancient Ceylon*, No – 06, Archeologycal Department.

Nandadewa, B.D. (1992 )" Rock Art sites of Sri Lanka", *Rock Art in the old world*, Indiragandi National Center for the ARTS.

නොක්ස් , රොබට්, (2003)*එදා හෙළ දිව* , අනුවාදය : ඩේවිඩ් කරුණාරත්න, කොළඹ : එම්. ඩී ගුණසේන සහ සමාගම.

Peirce, C. S. (1991). *Peirce on signs: Writings on semiotic*. UNC Press Books.

රත්නපාල, ඊ. ඇම්., (2009) *ශ්‍රී ලංකාවේ වැදි ජනයා* , වරකාපොළ : ආරිය ප්‍රකාශකයෝ .

සෙලිග්මාන්, සී.ජී., සෙලිග්මාන්, බී. ඉසෙඩ්,(2009) *වැද්දෝ* , පරිः චන්ද්‍ර ශ්‍රී රණසිංහ, කොළඹ : ෆාස්ට් පබ්ලිෂන් ( ප්‍රයිවට් ) ලිමිටඩ්.

Shigyo, K. (1999), *Ruins of Ancient Ruhuna cavitation,* Japan : Exploration club of Hosei University.

Salzmann,zdenek.(1999)*Languag,Culture and Society; An Introduction to lingustic Anthropolgy*, Avalon publishing, The University of michigon .

සිරිසේන ඇන්.කේ. (1961) *ලංකා ඉතිහාසය* , ගුණසේන සහ සමාගම කොළඹ.

Somadera, Raj., (2012) *Rock paintings and Engraving Sites in Sri Lanka*, Colombo : PGIAR Publication.

සෝමදේව , රාජ් , (2014) *ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය* , පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

විජේසේකර , නන්දදේව, (1987)*වැද්දන්ගේ විකාශන ක්‍රමය*, පරිවර්තනය : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,

විජේතුංග, සිරිසමන් (2005 ජූලි) *රජගලතැන්න* , පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

වෙත්තමුණි, විජයසිරි, (2009) *සරල සිංහල මහාවංශය* , කර්තෘ ප්‍රකාශන.

ආඛ්‍යාන narrations
**Volume 06 | Issue 01 | January - June 2021 | Article 02**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

# සංස්කෘතික ගෝලීයකරණයෙහි සංරචක සහ සමකාලීන ශ්‍රී ලංකා සමාජයේ ගෝලීයකරණ ප්‍රවණතා

සමිත උදයංග[2]

senithsrisami@gmail.com

## සාර සංක්ෂේපය

ජාතික වශයෙන් පැවති හුදෙකලාභාවය ඉක්මවා ආර්ථික, දේශපාලනික, සමාජීය සහ සංස්කෘතික වශයෙන් අන්තර්ජාතික ඒකාබද්ධතාවක් සහ හුවමාරු රටාවක් බිහි වීම ගෝලීයකරණය යනුවෙන් හඳුන්වනු ලැබේ. වර්තමානයේ කිසිදු සමාජයක අනන්‍යතාව, ජාතික රාජ්‍යයේ දේශ සීමාව පදනම් කොට ගෙන විග්‍රහ කළ නො හැකි ය. රාජ්‍ය සතුව දේශපාලනික ස්වාධිපත්‍යයක් පැවතියත්, සත්‍යයෙන් ම පුද්ගල චර්යා සහ අන්තර්ක්‍රියාවන්ගේ ස්වභාවය තීරණය කරනු ලබන්නේ ගෝලීය දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික සම්බන්ධතා මගින් ය. ජාතික රාජ්‍යයේ දේශ සීමාව අභිභවා, අන්තර්ජාතික වශයෙන් බහුවිධ සංස්කෘතික ලක්ෂණ සහිත සමාජ ගණනාවක් ඒකාබද්ධ වී සම්බන්ධතා ජාලයක් බිහි වීම ගෝලීයකරණයෙහි දී සිදු වේ. ගෝලීයකරණය අනවරත ක්‍රියාවලියක් වශයෙන් හඳුනා ගනු ලබන බැවින්, කිසිදු සමාජයකට මෙම ක්‍රියාවලියෙන් මුක්ත වී සිටිය නො හැකි බව ද අයෙක් ද තර්ක කරත්. විශේෂයෙන් ම අන්තර්ජාතික සංවිධානයන් සහ මූල්‍ය ආයතන විසින් ගෝලීය ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන අතර, කිසිදු ජාතික රාජ්‍යයකට ස්වාධීන හෝ හුදෙකලාව කටයුතු කළ නොහැකි ය. නිශ්චිත වශයෙන් ම විවිධ සාධක යටතේ වෙනත් රාජ්‍ය සමග සම්බන්ධතා පැවැත්වීමට සිදු වෙයි. ගෝලීයකරණය හේතුවෙන් තුන්වන ලෝකය යනුවෙන් හඳුනා ගනු ලබන රටවලට සිදු කෙරෙන බලපෑම අතිශය පුළුල් ය. ආර්ථික, දේශපාලන, සමාජ සහ සංස්කෘතික යනාදී සියලු ක්ෂේත්‍ර ආශ්‍රය කොට ගෙන ව්‍යාප්ත වන ගෝලීයකරණය, කිසියම් සමාජයක පුද්ගල චර්යා කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරයි. එහි දී සංවර්ධිත සමාජ හෝ යුරෝපානු සමාජවල පවතින ව්‍යුහීය ලක්ෂණ යුරෝපානු නොවන සමාජ වෙත විසරණය වීම බලවත් ගැටලුවක් වශයෙන් ද ඇතැමෙක් පෙන්වා දෙති. ගෝලීයකරණය හේතුවෙන් යහපත් ප්‍රතිඵල මෙන් ම අයහපත් ප්‍රතිඵල ද උද්ගත වෙයි. අද්‍යතන ජාතික රාජ්‍යවලින් ස්වාධිපත්‍ය වෙසෙසින් හීන වෙමින් පවතින බැවින්, ගෝලීයකරණය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ස්වකීය ප්‍රතිපත්ති රාමුවෙන් පරිබාහිරව පවතියි. මෙහි ප්‍රතිඵලය වන්නේ, ගෝලීය සම්ප්‍රදායන් කවර ආකාරයෙන් හෝ පිළිගැනීමට සිදු වීම ය. විශේෂයෙන් ම දියුණු වෙමින් පවතින සමාජ බොහෝමයක් දියුණු රටවල් මත රඳා පවතින බැවින්, ගෝලීයකරණය නාමයෙන් ව්‍යාප්ත වන යුරෝපීය සම්ප්‍රදායන්ට අනුගත වීමට සිදු වී තිබේ. එසේ ද වුවත් ඌන සංවර්ධිතභාවයෙන් විමුක්ත වීමට අවශ්‍ය සාධක ද ගෝලීයකරණය හේතුවෙන් ස්ථාපනය වන ආකාරයක් දක්නට ලැබේ. දේශපාලන, ආර්ථික යනාදී බහුවිධ ක්ෂේත්‍ර ආශ්‍රයෙන් ගෝලීය සම්ප්‍රදායන් ව්‍යාප්ත වීම ප්‍රමුඛ වුවත්, සංස්කෘතික ගෝලීයකරණය පුද්ගලයාගේ සමස්ත චර්යාව සමග ඍජුව ම සම්බන්ධ වී තිබේ. එ බැවින් මෙහි දී ශ්‍රී ලංකා සමාජය කෙරෙහි ගෝලීයකරණය විසින් සිදු කරනු ලබන බලපෑම විග්‍රහ කරනු ලැබේ.

**ප්‍රමුඛ පදඃ** ජාතික රාජ්‍ය ස්වාධීනතාව, බටහිරකරණය, සංවර්ධන විභවතා, සංස්කෘතික ගෝලීයකරණය

[2] කථිකාචාර්ය, සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

## 1. හැඳින්වීම

ජාතික රාජ්‍යයේ දේශ සීමාව අභිභවා, බහුවිධ ලක්ෂණ සහිත සමාජ අතර සම්බන්ධතා ජාලයක් වර්ධනය වීම ගෝලීයකරණය යනුවෙන් හඳුන්වනු ලැබේ. ජාතික රාජ්‍යයේ දේශසීමාව හෝ ස්වාධිපත්‍ය අද්‍යතන සමාජ ක්‍රමයන් තුළ විශේෂත්වයක් නො ගනියි (Dillon, 2014). කිසියම් සමාජ ක්‍රමයකට අයත් පුද්ගලයන්ගේ චර්යාව සහ අන්තර්සම්බන්ධතා තීරණය වන්නේ ගෝලීය වශයෙන් සම්මත ප්‍රතිපත්ති සහ මූලධර්ම පදනම් කොට ගෙන ය. සමාජීය වශයෙන් ගෝලීයකරණයෙහි බලපෑම අතිශය පුළුල් වූවක් වුවත්, මෙය ඒක දිශානතික ව්‍යුහයක් නොවේ. ගෝලීයකරණය, බහුවිධ දිශානතියක් සහිත ගතික ක්‍රියාවලියකි. 20 වන සියවස මුල් භාගයෙහි යුරෝපානු සමාජවල ඉස්මතු වූ දේශපාලන සහ ආර්ථික ප්‍රතිසංස්කරණ හේතුවෙන්, යුරෝපීය සමාජ හා සංස්කෘතිය ද වෙසෙසින් වෙනස්වීම්වලට භාජනය විය (Elliott & Lemert, 2014). ලිබරල්වාදී දේශපාලන දර්ශනය තුළ ආර්ථික දෘෂ්ටියක් ද පැවතිණ. දේශපාලනික වශයෙන් සමාජ තුළ සිදු කරනු ලබන ප්‍රතිසංස්කරණ කෙරෙහි ආර්ථික ව්‍යුහයේ ප්‍රතිසංස්කරණ ද අන්තර්ගත කොට පැවතිණ. ආර්ථිකමය වශයෙන් සමාජ ක්‍රමයක ප්‍රගතිය ස්ථාපනය කිරීමෙන් පමණක් දේශපාලනික ස්ථාවරත්වය ඇති කළ හැකි යැයි විශ්වාස කළ බැවින්, යුරෝපීය ජාතික රාජ්‍යයන් බෙහෙවින් ලිබරල්වාදී දෘෂ්ටියට මූලික ස්ථානයක් ලබා දුන් බව පෙනේ (Harvey, 2007; Stiglitz, 2004). එසේ ද වුවත්, රුසියාව ප්‍රමුඛ සමාජවාදී දැක්මක් අනුගමනය කළ රටවල් ලිබරල්වාදී දේශපාලන හා ආර්ථික දර්ශනය පිළිගනු නො ලැබිණ. ගෝලීය වශයෙන් ව්‍යුත්පන්න කණ්ඩායම් දෙකක් ධ්‍රැවීකෘත හෙවත් එකිනෙකට සම්බන්ධ කිරීම අපහසු වූ දේශපාලන-ආර්ථික දෘෂ්ටි දෙකක් පිළිගැනීම, පසුකාලීනව රටවල් අතර අර්බුදකාරී තත්ත්වයක් ඉස්මතු වීමට ද බලපෑම් කරන ලදි. එසේ ද වුවත්, 1980 දශකයේ නව ලිබරල්වාදී ප්‍රතිපත්ති ව්‍යාප්ත වීමත් සමග ම අන්තර්ජාතික වශයෙන් රාජ්‍ය අතර පවතින සම්බන්ධතා සහ පරායත්තතා තීව්‍ර වෙයි. මේ නිසා ගෝලීයකරණයෙහි මූලික ස්වභාවය ආර්ථික සහ දේශපාලනික සම්බන්ධතාවන් ආශ්‍රයෙන් උද්ගත වූ ස්වභාවයක් පෙන්නුම් කරයි.

ගෝලීයකරණයෙහි මූලික ලක්ෂණය වන්නේ, ජාතික රාජ්‍යයේ දේශසීමාව අබිබවා සම්බන්ධතා ජාලයක් වර්ධනය වෙමින් කිසියම් පරායත්තතාවක් ඇති කර ගැනීම ය. මෙම තත්ත්වය අඩු වැඩි වශයෙන් 15 වන සියවසේ සිට 19 සියවස අග භාගය දක්වා යටත්විජිතකරණ ක්‍රියාවලිය තුළ ද දක්නට ලැබේ. ජාතික රාජ්‍ය සංකල්පය බිහි වන්නේ ද ප්‍රබුද්ධත්ව සම්ප්‍රදාය බිහි වීමෙහි ප්‍රතිඵලයක් වශයෙනි. එසේ ද වුවත්, සමාජ ක්‍රම අතර අන්තර්සම්බන්ධතා වර්ධනය වීම ඓතිහාසික යුගවල දී ද සිදු විය. පුද්ගල චර්යා කෙරෙහි සුවිශේෂ බලපෑමක් ඇති කරමින්, අන්තර්පරායත්තාවක් වර්ධනය කරමින් ගෝලීයකරණ ක්‍රියාවලිය වඩාත් පුළුල් වන්නේ 20 සියවස මධ්‍ය භාගයෙන් පසුව ය. දේශපාලන, ආර්ථික, සමාජ සහ සංස්කෘතික ක්‍රියාවලියක් වශයෙන් ස්වාධිපත්‍යයක් සහිත සමාජ අතර කිසියම් අත් හළ නො හැකි සම්බන්ධතා ජාල රටාවක් බිහි වීම එයින් සිදු විය. මේ නිසා ඓතිහාසික යුගවල දී දක්නට ලැබුණු ගෝලීය සම්බන්ධතා ඇති වීමත්, වර්තමාන ගෝලීයකරණයත් අතර ආස්ථානික විසමතාවක් දක්නට ලැබේ. වර්තමානයෙහි දක්නට ලැබෙන ගෝලීයකරණ ක්‍රියාවලිය අතිශය සංකීර්ණ වූවක් වන අතර, පුද්ගලයාගේ චර්යාව හා සම්බන්ධ සියලු අංශ එමගින් ග්‍රහණයට ගෙන ඇත (Elliott & Lemert, 2014).

1980 දශකය අග භාගයෙහි දී ඉස්මතු වන ලෝක ආහාර අර්බුදය සහ ඛනිජ තෙල් අර්බුදය හේතුවෙන් බොහොමයක් යුරෝපීය සමාජවල, මෙතෙක් නො පැවති ව්‍යුහමය වෙනස්කම් ගණනාවක් ඇති කිරීමට දේශපාලන බල අධිකාරයන්ගේ අවධානය යොමු වේ (Harvey, 2007). නව ලිබරල්වාදී සම්ප්‍රදායක් වර්ධනය වන්නේ මෙම පසුබිම යටතේ ය. වෙළෙඳපොළ ක්‍රියාවලිය අතිශය තාර්කික වූවක් වන අතර, සංවර්ධනය සඳහා වෙළෙඳපොළට ස්වාධීනත්වයක් ලබා දිය යුතු බැවින් රාජ්‍යයේ මැදිහත්වීම සැලකිය යුතු මට්ටමකින් අවම කරනු ලැබිණ. චිලී වැනි ලතින් ඇමරිකානු සමාජවල නව ලිබරල්වාදී දේශපාලන ආර්ථික ප්‍රතිපත්ත මූලික වශයෙන් ක්‍රියාත්මක කිරීමට ඇමරිකාව විසින් ආධාර ලබා දෙන ලදි (Harvey, 2007). 80 දශකයෙහි ඉස්මතු වූ ඛනිජ තෙල් අර්බුදය සහ ආහාර අර්බුදය හේතුවෙන්, ජාතික රාජ්‍යයට තවදුරටත් ස්වාධීනව කටයුතු කළ නො හැකි බව ප්‍රත්‍යක්ෂ විය. මේ නිසා අන්තර්ජාතික වශයෙන් සම්බන්ධතාවක් වර්ධනය කර ගැනීම අත්‍යවශ්‍ය ක්‍රියාවක් බව ලෝක

රාජ්‍ය අවබෝධ කර ගනියි. නව ලිබරල්වාදී ප්‍රතිසංස්කරණයන් මගින් අන්තර්ජාතික සම්බන්ධතා වර්ධනය සඳහා අවශ්‍ය පසුබිම සකස් කරනු ලැබිණ. විශේෂයෙන් ම වොෂින්ටන් ප්‍රඥප්තිය මගින් ලෝක බැංකුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල, සංවර්ධිත රාජ්‍යයන් සහ ඌන සංවර්ධිත රටවල් අතර සම්බන්ධතාවක් ගොඩ නැගීමට අවශ්‍ය පදනම සකස් කරයි (Desai & Potter, 2011).

ප්‍රාග්ධනයේ ගෝලීය සංසරණය, සංවර්ධනයෙහි ප්‍රධාන ක්‍රියාකාරකමක් වශයෙන් ලෝක බැංකුව විසින් ද අවධාරණය කරන ලදි (Desai & Potter, 2011). ප්‍රාග්ධනය එක් රටක් තුළට ඒකාබද්ධ කිරීම හුදෙක් අර්ථ විරහිත ක්‍රියාවලියක් වන අතර, ප්‍රාග්ධනයට සංසරණය වීමට අවකාශය ලබා දීමෙන් රටවල් සංවර්ධනය කළ යුතු යැයි එහි දී අවධාරණය කරන ලදි. ගෝලීය වශයෙන් ස්ථාපනය වූ බහුජාතික සමාගම් බිහි වන්නේ මෙම ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් වශයෙනි. යුරෝපයට කේන්ද්‍රගතව පැවති, මහා පරිමාණ ව්‍යාපාරික ආයතන ගෝලීය ප්‍රාග්ධනය සමුච්චය කිරීම සඳහා ලෝකයේ විවිධ ප්‍රදේශවල ආයෝජන කටයුතු ව්‍යාප්ත කරන අතර, මේ තුළ අන්තර්ජාතික වශයෙන් ශ්‍රම විභජනයක් ද ඇති වෙයි. ජාතික රාජ්‍යයේ දේශ සීමාව අභිභවා පුද්ගලයන්, දැනුම, තාක්ෂණය සහ ආයතනික ව්‍යුහ ව්‍යාප්ත වීම ආරම්භ වීම තුළින් ගෝලීයකරණය වඩාත් තීව්‍ර වෙයි. ගෝලීයකරණය අවසාන නිෂ්ටාවක් හෝ පරමාර්ථයක් නොවන අතර, එය අන්තර්ජාතික වශයෙන් ස්ථාපනය වන ආර්ථික, දේශපාලන සහ සමාජ සම්බන්ධතාවන්ගේ ව්‍යුත්පන්න ප්‍රතිඵලයකි. ගෝලීයකරණයට නිශ්චිත නිර්වචනයක් ඉදිරිපත් කිරීම අපහසු වන්නේ එ බැවින් ය.

1980 දශකයෙහි ගෝලීය වශයෙන් ඇති වන අර්බුදවලට විසඳුමක් වශයෙන් ඉදිරිපත් වූ දේශපාලන හා ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් වශයෙන් ඉස්මතු වන ගෝලීයකරණය, තොරතුරු තාක්ෂණය සහ අන්තර්ජාලයේ ව්‍යාප්තියත් සමග තව දුරටත් පුළුල් වෙයි. මේ නිසා 21 වන සියවස ආරම්භ වන්නේ ගෝලීය සමාජ තත්ත්වයන් අවශ්‍යයෙන් ම අත් හළ නො හැකි, දේශීය සම්ප්‍රදායන්ට සම්බන්ධ වූ සාධකයක් වශයෙන් පිළිගනිමින් ය. කිසිදු සමාජයකට ගෝලීයකරණයෙන් විමුක්ත වීමට හැකියාවක් නොමැත. අන්තර්ජාතික දේශපාලන ආයතනයන් මගින් රාජ්‍යවල ස්වාධීන දේශපාලන ප්‍රතිපත්ති සකස් කිරීමට බලපෑම් කරන අතර, ගෝලීය මූල්‍ය ආයතනයන් විසින් දේශීය ආර්ථික ප්‍රතිපත්ති කෙරෙහි ද බලපෑම් කරයි. වර්තමාන ලෝකය තුළ රාජ්‍යවල සංවර්ධනය පැහැදිලිව ම අන්තර්රාජ්‍ය සහයෝගීතාවේ ප්‍රතිඵලයක්යැයි (Elliott & Lemert, 2014) ද නිර්වචනය කරන බැවින්, හුදෙකලා රාජ්‍ය සංකල්පය හෝ ස්වයංපෝෂිතභාවය හුදෙක් ම අර්ථ ශූන්‍ය විග්‍රහයක් බවට පත් වී තිබේ. එ බැවින්, ගෝලීයකරණය පුද්ගල ස්වච්ඡන්දතාව කෙරෙහි ද අවධානයක් නොමැතිව, පොදු අවකාශය මෙන් ම පෞද්ගලික අවකාශය ද සම්පූර්ණ වශයෙන් ග්‍රහණය කොට ගෙන ඇති බවක් පෙනේ.

සියලු ජාතික රාජ්‍ය, ස්වාධීනත්වයක් පවත්වා ගනිමින් එක ම අන්තර්ජාතික සම්බන්ධතා සහිත ජාලයක් යටතේ සංවිධානය වීම ගෝලීයකරණ ක්‍රියාවලිය යි (Eckes & Zeiler, 2003). ගෝලීයකරණය හුදෙක් සමාජ ව්‍යුහයට පමණක් නොව, ජීවන අවකාශය තුළ පුද්ගල චර්යාව කෙරෙහි ද බලපෑමක් ඇති කරයි. දේශපාලන, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික වශයෙන් පොදු වූ සමාජ ක්‍රමයක් තුළ පුද්ගලයා ස්ථානගත කිරීම ගෝලීයකරණයෙහි ප්‍රතිඵලයක් යැයි Eckes and Zeiler (2003) තර්ක කරති. 1960 දී මාෂල් මැක්ලූහන් විසින් විශ්වීය ගම්මානයක් පිළිබඳ තර්කය ඉදිරිපත් කොට තිබේ. එම විග්‍රහය අද්‍යතන සමාජ විද්‍යාඥයන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවත් (Castells, 2000), ගෝලීය වශයෙන් සියලු ප්‍රජාව එකීය මූලධර්ම පද්ධතියක් යටතේ සංවිධානය වීම ගෝලීයකරණය නිසා තීව්‍ර වී තිබේ. බොහෝ දුරට වර්තමාන සමාජවල, සමාජ පාලන උපක්‍රම ගෝලීය වශයෙන් සම්මත වූ මූලධර්ම අනුව සකස් වී තිබෙන අතර ඒවායෙහි විසමතා දක්නට ලැබෙන්නේ අතිශය අවම වශයෙනි. එයට හේතුව වන්නේ, ගෝලීයකරණය බුද්ධිමය ක්‍රියාවලියක් වීමත් එ මගින් විශ්ව සම්මත නියති ප්‍රමුඛ කොටගෙන තිබීමත් ය. මානව අයිතිවාසිකම් එ වැනි විශ්ව සම්මත මූලධර්මයක් ය. ගෝලීයකරණය හේතුවෙන්, ලෝක සමාජ මානව අයිතිවාසිකම් කෙරෙහි අවධානය යොමු කොට පුද්ගලයන්ගේ චර්යාව ඒ අනුව සකස් කිරීමට උත්සාහ ගෙන තිබේ. මේ නිසා සමාජගත ව්‍යුහයන් පමණක් නොව, පුදගලයාගේ පෞද්ගලික අවකාශය වෙත ද ගෝලීයකරණයෙහි බලපෑම ව්‍යාප්ත වී ඇත.

ඩේවිඩ් හාවී, ගෝලීයකරණය යනු කාලය සහ අවකාශයෙහි සංකෝචනය වීමක් වශයෙන් අර්ථ දක්වයි (Harvey, 2007). සියවසකට පමණ පෙර අන්තර්ජාතික වශයෙන් රාජ්‍ය අතර සම්බන්ධතා ගොඩ නැගීමෙහි දී කාලය සහ අවකාශය ප්‍රධාන සාධකයන් බවට පත් විය. සමාජ සම්බන්ධතා නිර්ණය කිරීමෙහි දී වුවත් කාලය සහ අවකාශය පිළිබඳ ප්‍රමුඛ අවධානයක් යොමු විය. පුද්ගල චර්යා නීර්ණය කරනු ලබන්නේ කාලයට සහ අවකාශයට සාපේක්ෂව ය. සංස්කෘතික සම්ප්‍රදාය වුවත් කාලය සහ අවකාශය අනුව වෙනස් ස්වභාවයක් ගනු ලබයි (Ember & Ember, 2015). සමාජවිද්‍යා න්‍යාය විග්‍රහවල දී වුවත්, පුද්ගල චර්යාව විග්‍රහ කරනු ලබන්නේ හෝ චර්යාත්මක රටා අර්ථකථනය කරනු ලබන්නේ ව්‍යුහීය අවකාශයට සහ කාලය පිළිබඳ අවධානයක් සහිතව ය (Parsons, 1971). එසේ ද වුවත් හාවී තර්ක කරන ආකාරයට වර්තමාන සමාජ ක්‍රමය තුළ පුද්ගලයාගේ බහුවිධ චර්යා තීරණය කිරීම සම්බන්ධයෙන් කාලයට සහ අවකාශයට තිබෙන වැදගත්කම සැලකිය යුතු මට්ටමකින් අවම වී තිබේ. ඩේවිඩ් හාවී දේශපාලන දර්ශනයක් සහිතව උක්ත විග්‍රහය ඉදිරිපත් කොට තිබේ. මේ නිසා නූතන සමාජවල දේශපාලන ක්‍රියාකාරීත්වය කෙරෙහි විශේෂයෙන් ම කාලය සහ අවකාශය හැකිළී යාම විශේෂයෙන් වැදගත් වී ඇති ආකාරය ඔහු පෙන්වා දෙයි.

ගෝලීයකරණය අන් කවර සාධකයකටත් වඩා ආර්ථික ක්‍රියාවලිය සමග සම්බන්ධ වෙයි. 1980 දශකයේ අන්තර්ජාතික වශයෙන් ජාතික රාජ්‍ය අතර උපරිජාතික සම්බන්ධතා වර්ධනය වන්නේ ආර්ථික ක්‍රියාවලියට සමගාමීව ය. රාජ්‍යවල දේශපාලනය, සමාජ තත්ත්වය සහ සංස්කෘතික දිශානති ද විශේෂයෙන් ආර්ථික ක්‍රියාවලිය සමග අනුයාත වේ. එ බැවින්, ගෝලීයකරණයෙහි දී අන්තර්ජාතික ආර්ථික සම්බන්ධතා වර්ධනය වීම විශේෂ අවශ්‍යතාවක් වශයෙන් පිළිගනු ලැබේ (Giddens, 2003; Mann, 1997; Mayo, 2005). අන්තර්ජාතික මූල්‍ය අරමුදල විසින් විග්‍රහ කරනු ලබන ආකාරයට, ගෝලීය වශයෙන් ආර්ථික අන්තර්පරායත්තතාවක් වර්ධනය වීම ගෝලීයකරණය මගින් සිදු වේ. ආර්ථික අන්තර්පරායත්තතාව, භාණ්ඩ නිෂ්පාදනය සහ සේවා සම්පාදනය කාර්යක්ෂම කරන අතර ම එහි ඵලදායීතාව ද ඉහළ නංවයි. ගෝලීය වශයෙන් ප්‍රාග්ධනය සංසරණය වීමත්, දියුණු තාක්ෂණික උපකරණ භාවිතයත් හේතුවෙන් ආර්ථික ගෝලීයකරණය ශක්තිමත් වේ. රාජ්‍යවල ආර්ථික සංවර්ධනය සඳහා, ගෝලීය වශයෙන් පවතින ආර්ථික අන්තර්පරායත්තතාව විශේෂයෙන් වැදගත් වෙයි (Stiglitz, 2004).

ගෝලීයකරණය හේතුවෙන් සමාජ ව්‍යුහය සහ සංස්කෘතික පද්ධති පුළුල් වශයෙන් වෙනස් වුවත්, ධනවාදී ආර්ථිකය සමග ගෝලීයකරණය දක්වන සම්බන්ධතාව විශේෂයෙන් වැදගත් වේ. ස්ටිග්ලිට්ස් (2004) තර්ක කරන ආකාරයට ගෝලීයකරණය යනු ධනවාදී ආර්ථික ප්‍රසාරණයෙහි ප්‍රතිඵලයකි. ධනවාදී ආර්ථික ක්‍රමයක් මගින් සමස්ත සමාජ ක්‍රියාවලිය ම ප්‍රාග්ධනය හා කවර ආකරයෙන් හෝ සම්බන්ධ වන ක්‍රියාවලියක් වශයෙන් අර්ථකථනය කරන අතර, ලාභ උත්පාදනය කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමු වේ. එ බැවින් ගෝලීයකරණය ද ධනවාදය ප්‍රසාරණය කිරීමේ උපක්‍රමයකි (Stiglitz, 2004). ධනවාදයෙහි ගෝලීය ප්‍රාසරණය මගින් ගෝලීය ධනවාදයක් වර්ධනය කරයි. ධනවාදයේ ගෝලීය ප්‍රසාරණය, තුන්වන ලෝක සමාජවල සමාජවාදී විප්ලවයන් සඳහා දායක විය හැකි බැවින් එය අවසාන විග්‍රහයෙහි දී සමානාත්මතා සමාජයකට හේතු වන බව කාල් මාක්ස් විසින් ද පෙන්වා දී තිබුණත් (Marx & Engels, 1967), පශ්චාත් මාක්ස්වාදීන් ධනවාදයේ ගෝලීය ප්‍රසාරණය යෝග්‍ය තත්ත්වයක් වශයෙන් නො පිළිගනියි (Luxemburg, 1951). ධනවාදයේ ගෝලීය ප්‍රසාරණය හේතුවෙන්, බොහොමයක් ඓතිහාසික සම්ප්‍රදායන් සහිත සමාජ ක්‍රමයන් තුළ පූර්වයටත්විජිත සම්බන්ධතා නැවත අර්ථකථනය වෙමින් වර්ධනය වීමක් දක්නට ලැබේ. මේ තත්ත්වය තුළ කාල් මාක්ස් අපේක්ෂා කළ ආකාරයෙන් සමානාත්මතා සමාජයක් වර්ධනය කිරීම අපහසු වෙයි. විශේෂයෙන් ම ධනවාදයේ ගෝලීය ප්‍රසාරණය රෝසා ලක්සම්බර්ග් ඍජුව ම ප්‍රතික්ෂේප කරයි. ගෝලීය වශයෙන් ධනවාදය ව්‍යාප්ත වීම, ගෝලීයකරණයෙහි එක් ප්‍රතිඵලයක් වන අතර එය සෑම අවස්ථාවක දී ම යහපත් නොවන බව රෝසා ලක්සම්බර්ග් තර්ක කරයි. ස්ටිග්ලිට්ස්, මෙයට සාපේක්ෂ වශයෙන් ධනවාදයෙහි ගෝලීය ව්‍යාප්තිය, ජාතික රාජ්‍යවල ස්වාධීනත්වයට හානිකර වුවත් යම්කිසි ආර්ථික ප්‍රගතියක් ඇති කිරීමට ද ඇතැම් අවස්ථාවල දී දායක වන බව පෙන්වා දී ඇත (Stiglitz, 2002). ගෝලීය වශයෙන් ධනවාදී ආර්ථික සම්ප්‍රදාය ව්‍යාප්ත කිරීම හුදෙක්

සංක්ෂිප්ත හා සරල ක්‍රියාවලියක් නොවන්නේ එහි සංවිධානාත්මක හා ව්‍යුහීය ගති ලක්ෂණයන් ද පවතින බැවින් ය. ආර්ථික ගෝලීයකරණයෙහි දී ලෝක බැංකුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල වැනි ගෝලීය මූල්‍ය ආයතන විසින් සිදු කරනු ලබන බලපෑම ප්‍රධාන වේ (Stiglitz, 2002, 2004).

ගෝලීයකරණයෙහි පවතින ආර්ථික දිශානතිය මෙන් ම දේශපාලන දිශානතිය ද විශේෂයෙන් වැදගත් වන්නේ, දෘෂ්ටිමය වශයෙන් දේශපාලන ප්‍රතිපත්ති කෙරෙහි එ මගින් බලපෑමක් සිදු වන බැවින් ය. ජාතික රාජ්‍යයේ ස්වාධිපත්‍යයට සහ ජාතික ප්‍රතිපත්තිවල ස්වභාවය මුළුමනින් ම විකෘත වීම කෙරෙහි ගෝලීයකරණය හේතු වන්නේය යන ප්‍රතිගෝලීයකරණවාදීන්ගේ මතවාදය Held (2004) ප්‍රතික්ෂේප කරයි. හෙතෙම තර්ක කරන්නේ, ගෝලීයකරණය හේතුවෙන් ජාතික රාජ්‍යවල දේශපාලනය හා රාජ්‍ය ප්‍රතිපත්තිය ලෝකය ගමන් ගන්නා නව දිශාවලට අනුකූලව හැඩ ගැසෙමින් නැවත නැවත සකස් වන බව ය. ගෝලීය දේශපාලන ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු නො කොට කිසිදු රාජ්‍යයකට හුදෙකලා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කළ නො හැකි ය. විශේෂයෙන් ම අන්තර්ජාතික වශයෙන් රාජ්‍ය විසින් සකස් කරනු ලබන ප්‍රතිපත්ති සහ නිර්මාණය කරනු ලබන දේශපාලන තීරණ, ජාතික රාජ්‍ය වෙත බලපෑම් කරයි. ජාතික රාජ්‍යවල විදේශ ප්‍රතිපත්තිය, ජාතික ප්‍රතිපත්තියට වඩා අවධානය යොමු වන ක්ෂේත්‍රයක් බවට පත් වී තිබෙන්නේ දේශීය ප්‍රතිපත්තිය, සැලකිය යුතු මට්ටමකින් විදේශ ප්‍රතිපත්තිවල බලපෑමට භාජනය වීම හේතුවෙන් ය. ගෝලීයකරණය නව ජාතික රාජ්‍යවල දේශපාලන ක්‍රියාකාරීත්වය බල ගන්වමින් ඉදිරියට ගමන් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ක්‍රියාවලියකි. එ මගින් රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලයට හානියක් සිදු කරනු නො ලැබේ. ස්වාධිපත්‍ය නැවත අර්ථකථනය කරමින් දේශපාලනික වශයෙන් මහජන හිතවාදී පාලන තන්ත්‍රයක් ඇති කිරීමට දේශපාලනික ගෝලීයකරණය හේතු වී ඇත. කෙසේ වෙතත්, ගෝලීයකරණය හුදෙක් ආර්ථික ක්ෂේත්‍රයට පමණක් සීමා නොවී, මානව චර්යාවේ වෙනත් දිශානති වෙත ද ගමන් කොට ඇත (Held, 2004).

ගෝලීයකරණ ක්‍රියාවලියෙහි දී, සමාජ ක්‍රමයන් අන්තර්ග්‍රහණය කර ගැනීම හා සම්බන්ධ මූලධර්ම කිහිපයක් Held (2004) විසින් පෙන්වා දෙනු ලැබේ. (අ) ගෝලීය වශයෙන් පවතින ජාල රටාවල ව්‍යාප්තිතභාවය (Extensity), (ආ) ගෝලීය අන්තර්සම්බන්ධතාවන්ගේ තීව්‍රතාව (Intensity), (ඇ) ගෝලීය හුවමාරුවීම්වල ප්‍රවේගය (Velocity), (ඉ) ගෝලීය අන්තර්සම්බන්ධතාවන් මගින් ඇති කරනු ලබන බලපෑම් ප්‍රවණතාව (Impact Propensity) යන මූලධර්ම, ගෝලීයකරණයෙහි ස්වභාවය තීරණය කිරීමට පදනම් වේ. ගෝලීය සම්බන්ධතා ජාල වඩාත් පුළුල් වීම ආර්ථික, දේශපාලනික හෝ සමාජීය වශයෙන් කිසියම් බලපෑමක් ඇති කිරීමට හේතු වේ. සම්බන්ධතා වර්ධනය වීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, සම්බන්ධතාවල ගුණාත්මකභාවය ද විශේෂයෙන් වැදගත් වේ. ජාතික රාජ්‍යයේ සමෘද්ධිය උදෙසා අන්තර්සම්බන්ධතා වැඩි වීම පමණක් ප්‍රමාණවත් නොවන අතර ඒවායෙහි ගුණාත්මකභාවය ද ඉහළ මට්ටමක පැවතිය යුතු ය. එ මෙන් ම ගෝලීය වශයෙන් සිදු කෙරෙන බහුවිධ හුවමාරුවීම්වල වේගය ඉහළ යාම ද අත්‍යවශ්‍ය සාධකයක් වශයෙන් හෙල්ඩ් අර්ථ දක්වා තිබේ. නවීන සමාජයන්හි පවතින අධි තාක්ෂණය හා අන්තර්ජාලය හේතුවෙන් අන්තර්සම්බන්ධතා ගොඩ නැගීම සහ එකී සම්බන්ධතාවල ගුණාත්මකභාවය වර්ධනය වීමේ ප්‍රවේගය ඉහළ මට්ටමකට පැමිණ ඇත. ධනවාදයේ ගෝලීය ප්‍රසාරණය ද නවීන තාක්ෂණය මගින් වේගවත් කොට ඇත. ගෝලීයකරණය හේතුවෙන් කිසියම් සමාජයක් වෙත සිදු වන බලපෑමේ ස්වභාවය ද ගෝලීයකරණය පිළිබඳ අර්ථකථනයක දී වැදගත් වෙයි. ගෝලීයකරණය ප්‍රතික්ෂේප කිරීම හෝ ගෝලීයකරණය අනවරත ක්‍රියාවලියක් වශයෙන් පිළිගැනීම හෝ තීරණය වන්නේ එහි ප්‍රතිඵලවල ප්‍රවණතාවට අනුකූලව ය. ආර්ථික සවර්ධනයෙහි දී ගෝලීයකරණය, දකුණු ආසියානු සමාජයට වැඩි ධනාත්මක බලපෑමක් සිදු කරනු ලබන බව අයෙක් පෙන්වා දෙත් (Sen, 1999). මේ නිසා ඍණාත්මක තත්ත්වයන් හා ධනාත්මක ප්‍රතිඵල අතර කිසියම් සාපේක්ෂ සංසන්දනයක් පැවතිය යුතු ය. කිසියම් සමාජයකට ගෝලීයකරණය හේතුවෙන් සිදුවන බලපෑම ක්‍රමානුකූලව තක්සේරු කිරීම එ මගින් පහසු කරනු ඇත.

ගෝලීයකරණය දේශපාලන සහ ආර්ථික දිශානතියක් සහිතව ආරම්භ වුවත් එහි බලපෑම සමාජ ක්‍රමයක් තුළ ජීවත් වන පුද්ගලයන් වෙත ඍජුව ම බලපෑම් කරයි. ඇන්තනී ගිඩ්න්ස් මෙම තත්ත්වය පුළුල් වශයෙන් විග්‍රහ කොට තිබේ. පුද්ගලයාගේ ආර්ථික හෝ දේශපාලන චර්යාව ද අවසාන විග්‍රහයෙහි දී සමාජ චර්යාවක් වන බැවින්, සමාජ චර්යා ප්‍රතිඅර්ථකථනය වීමට හෝ ගිඩ්න්ස් පෙන්වා දෙන ආකාරට ව්‍යුහකරණය වීම (Structuration) සඳහා ගෝලීයකරණය හේතු වී ඇත (Dillon, 2014; Giddens, 2003). ගෝලීයකරණය, ඇන්තනී ගිඩ්න්ස් පැහැදිලි කරන්නේ දේශීය සංසිද්ධිවල ස්වභාවය තීරණය වීම කෙරෙහි දේශීය සම්ප්‍රදායට කිසිදු සම්බන්ධයක් නොමැති දුරස්ථ ප්‍රදේශවල සංසිද්ධි විසින් බලපෑමක් සිදු කරනු ලබන, පුද්ගල අන්තර්ක්‍රියාවන්ගේ සහසම්බන්ධතාවක් වර්ධනය කරන සංකීර්ණ ක්‍රියාවලියක් වශයෙනි (Giddens, 1991b). පැරණි සමාජවල මානව සම්බන්ධතා, ධනය, බලය සහ සමාජ ඥානය ස්ථාපනය වී තිබුණේ කාලය සහ අවකාශය පිළිබඳ සංවේදීතාවක් හෝ සවිඥානිකත්වයක් ඇතිව ය. එසේ ද වුවත් වර්තමානය තුළ පුද්ගල සම්බන්ධතා, ධනය, බලය හෝ ඥානය, කාලය සහ අවකාශය පිළිබඳ සවිඥානිකත්වයක් සහිතව ස්ථාපනය වී ඇති බවක් නො පෙනේ. කාලය සහ අවකාශය හැකිළ යාම කෙරෙහි ගෝලීයකරණය මූලික වී ඇති බැවින් ස්ථාවර සමාජ ව්‍යුහ පිළිබඳව නූතන සමාජය තුළ සාකච්ඡා කළ නො හැකි ය. නවීන සමාජ තුළ දක්නට ලැබෙන්නේ අස්ථාවර සමාජ ව්‍යුහ සහ මානව සම්බන්ධතා ය. ගෝලීයකරණය හේතුවෙන් පුද්ගලයා තුළ ''ප්‍රතිචාරාත්මක පිළිගැනීමක්'' (Reflexivity) වර්ධනය වන බව ගිඩ්න්ස් පෙන්වා දී ඇත. එනම්, පුද්ගලයා ගෝලීයකරණය පිළිගනු ලබන්නේ එහි ප්‍රතිඵල පිළිබඳව ද සවිඥානිකත්වයක් සහිතව වන බව ය. ගෝලීයකරණය වෙනත් කිසියම් පාර්ශ්වයක් විසින් බලපෑම් සහිතව පතිත කරනු ලබන්නක් නොවන බව ගිඩ්න්ස් විශේෂයෙන් අවධාරණය කරයි. පුද්ගලයා විසින් පිළිගනු ලබන සියලු ම චර්යා මගින් ගෝලීයකරණ ක්‍රියාවලිය වර්ධනය වෙයි. ගෝලීයකරණය හුදෙක් ඒකීය ක්‍රියාවලියක් නොවේ, එය ගෝලීය ධනවාදී ආර්ථිකය, සංස්කෘතිය, අන්තර්ජාතික ශ්‍රම විභජනය, ජාතික රාජ්‍යයේ දේශපාලන චර්යාව සහ අන්තර්ජාතික යුද කටයුතු යනාදී සියලු අංශ කෙරෙහි ව්‍යාප්ත වූ සංකීර්ණ ක්‍රියාවලියකි (Giddens, 1991a, 2003).

ගෝලීයකරණ ක්‍රියාවලිය හුදෙක් ස්වයං පාලනයක් සහිත ක්‍රියාවලියක් වශයෙන් ඇතැම් සමාජවිද්‍යාඥයන් පැහැදිලි කළත් (Castells, 2000), එය සමාජ ව්‍යුහය සහ පුද්ගල මැදිහත්වීම සමග ද සම්බන්ධ වෙයි (Giddens, 1984). ඇන්තනී ගිඩ්න්ස් නූතන සමාජවල පුද්ගල ක්‍රියාකාරීත්වය විග්‍රහ කිරීම කෙරෙහි ව්‍යුහකරණය නමැති න්‍යායයක් භාවිත කරයි. මෙ තෙක් සමාජවිද්‍යා න්‍යාය තුළ ඓතිහාසික දාර්ශනික විග්‍රහ තුළ විභජනයක් දක්නට ලැබිණ. සමාජ ව්‍යුහය, පුද්ගල මැදිහත්වීම වියුක්ත ප්‍රපංච වශයෙන් සාකච්ඡා කිරීම (Durkheim, 1895) හෝ පුද්ගල මැදිහත්වීම හෝ ක්‍රියාකාරකයා විසින් දෙනු ලබන අර්ථය ව්‍යුහය කෙරෙහි බලපෑම් කිරීම සම්බන්ධ විග්‍රහය (Luckman, 1978; Weber, 1949) තුළ විභජනය හෝ සමාජ යථාර්ථය පිළිබඳ විශ්ලේෂණාත්මක ද්වයගාමීත්වය පැහැදිලිව දක්නට ලැබේ. ගිඩ්න්ස්ට අවශ්‍ය වූයේ යථාර්ථය පිළිබඳ ද්වයගාමී විග්‍රහයෙන් බැහැරව, පුද්ලගයාගේ ජීවන අවකාශය ආශ්‍රයෙන් චර්යා රටා පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කිරීම ය. මේ නිසා ව්‍යුහකරණය පිළිබඳ විග්‍රහය ඔහු ඉදිරිපත් කරයි. එයින් ප්‍රකාශ වන්නේ පුද්ගලයා නිරන්තරයෙන් ම තමා ජීවත් වන සමාජ ව්‍යුහය, ස්වකීය අවශ්‍යතාවලට අවශ්‍ය ආකාරයෙන් නැවත නැවතත් සකස් කරන බව ය. මෙම දෘෂ්ටිය ගෝලීයකරණය විග්‍රහ කිරීමෙහි දී විශේෂයෙන් වැදගත් වන්නේ, ගෝලීය ආචාර ධර්ම පද්ධති සහ සම්ප්‍රදාය පුද්ගලයා විසින් ස්වේච්ඡාත්මකව ග්‍රහණය කරගත යුතු යැයි දැක්වෙන බැවින් ය. එ බැවින් ගෝලීයකරණය යනු නෛසර්ගික ක්‍රියාවලියකි. ගෝලීයකරණ සන්දර්භයක් තුළ තාක්ෂණය, අන්තර්ජාලය ඇතුළු බොහෝ යටිතල ව්‍යුහ හුදෙක් භෞතිකමය වස්තූන් පමණක් නොවන අතර, ඒ මගින් ඇති කරනු ලබන **සමාජ-තාක්ෂණික උප පද්ධතිය** පුද්ගලයාගේ ජීවන අවකාශය මෙන් ම පුද්ගලයාගේ සමාජ චර්යාව කෙරෙහි ද අවශ්‍යයෙන් ම යම් බලපෑමක් ඇති කරයි (Fuchs, 2008). නූතන පුද්ගලයා, තාක්ෂණය මත පදනම් වූ සමාජ අවකාශයක් තුළ කටයුතු කරයි. සමාජ අවකාශය ද ස්ථාවර වූවක් නොවන අතර, ඉතා වේගයෙන් වෙනස් වන ව්‍යුහයකි. මේ නිසා පුදගල චර්යා ද ගෝලීයකරණයෙහි බලපෑම නිසා පෙර නොවූ විරූ ආකාරයෙන් වෙනස්වීම්වලට භාජනය වේ.

ගෝලීයකරණ ක්‍රියාවලිය වඩාත් වේගවත් වන්නේ සන්නිවේදන තාක්ෂණයෙහි සහ තොරතුරු තාක්ෂණයෙහි වර්ධනය වීමත් සමග ය. දේශපාලන, ආර්ථික, සමාජ සහ සංස්කෘතික යන සියලු අංශ සන්නිවේදන තාක්ෂණය මගින් මෙහෙයවීමේ තත්ත්වයකට පත්ව තිබේ. තොරතුරු තාක්ෂණයේ ව්‍යාප්තිය පුළුල් දේශපාලන සහ ආර්ථික කතිකාවක් නිර්මාණය කිරීමට ද හේතු වෙයි. මේ නිසා ගෝලීයකරණයෙහි දී අන් කවර සාධකයකටත් වඩා සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ දැනුම ව්‍යාප්ත වීම වැදගත් වේ (Castells, 2000). මැනුවල් කැස්ටල්ස් පෙන්වා දෙන්නේ, පුද්ගලයන් අතර සහ රාජ්‍ය අතර ජාලගත සම්බන්ධයක් වර්ධනය වීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම කෙරෙහි තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සියලු අංග හේතු වන බව ය. පරිගණක, වෙනත් ප්‍රධාන අන්තර්ජාල මෙහෙයුම් ආයතන යනාදියෙහි ඒකාබද්ධතාව හේතුවෙන් තොරතුරු සංසරණ වේගය වැඩි වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එක ම අතාත්වික ජාලයක් වෙත පුද්ගලයන් මෙන් ම බහුවිධ සමාජයන් ද ඒකාබද්ධ වේ. අද්‍යතන ගෝලීයකරණ ක්‍රියාවලිය සිදු වන්නේ බොහෝ දුරට සන්නිවේදන තාක්ෂණයේ දියුණුවට සමගාමීව ය. කැස්ටල්ස් මෙය දකින්නේ තොරතුරු ප්‍රාග්ධන සංසරණය වශයෙනි. මූල්‍යමය ප්‍රාග්ධනයට වඩා වර්තමානයේ ගෝලීයකරණය සඳහා අවශ්‍ය වන්නේ තොරතුරු ප්‍රාග්ධනය (Information Capital) යි. තොරතුරු ගතික ප්‍රපංචයක් වන බැවින්, එයට අයත් නොවන දෙයක් නැති තරම් ය. සංස්කෘතියට අන්තර්ගත වන සියලු ගතික තොරතුරු යටතේ විග්‍රහ කළ හැකි ය. මේ නිසා වර්තමාන ගෝලීය සංස්කෘතිය තුළ තොරතුරු ද මූල්‍යමය ලාභයක් උත්පාදනය කිරීම සඳහා භාවිත කළ හැකි ය. දශක කිහිපයකට පෙර පැවති සංස්කෘතික සම්ප්‍රදායන් මුළුමනින් ම මෙන් තොරතුරු හේතුවෙන් වෙනස් වී තිබේ. වෘත්තීමය සේවාවක් සඳහා වැටුප් වශයෙන් මුදල් ගෙවීම මුල්කාලීන ආර්ථික ක්‍රමයක් වුවත්, වර්තමානය වන විට භෞතිකමය මුදල් භාවිත කිරීම අවම වෙමින්, වෘත්තීමය සේවය අගය කිරීම සඳහා වෙනත් තොරතුරු තාක්ෂණික උපාය මාර්ග භාවිත කරයි. සාම්ප්‍රදායික බැංකු ක්‍රමයන් හා මූල්‍ය ආකෘති වෙනස් වෙමින් සේවය හෝ නිෂ්පාදන අගය මත පදනම් වූ අතාත්වික (Virtual) ආර්ථික සම්ප්‍රදායක් වර්ධනය වේ (Castells, 2010). මේ නිසා වර්තමාන වෙළෙඳපොළ ධනවාදය තුළ මුදල් සංසරණය වන්නේ අතාත්විකව ය. මුදලට හිමි සත්‍ය වටිනාකම සමස්තයක් වශයෙන් ම තීරණය වන්නේ ගෝලීය තොරතුරු වෙරළෙඳපොළ මූලධර්මවලට අනුව ය. එ බැවින්, තොරතුරු තාක්ෂණය පදනම් කොටගත් ගෝලීයකරණ ආකෘතිය ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ සමාජවල විප්ලවීය වෙනසක් ඉස්මතු කිරීමට හේතු වී තිබේ.

ගෝලීයකරණය ව්‍යාප්ත වන සමාජයක් ''අවදානම් සහගත සමාජයක්'' යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙය සාම්ප්‍රදායික සමාජවල පැවති ස්වාභාවික විපත් හෝ වෙනත් අභියෝගවලට වඩා වෙනස් ය. ගෝලීය සම්ප්‍රදායක් සමාජ ක්‍රමයක් තුළ ව්‍යාප්ත වන අවස්ථාවක් තුළ බොහෝ යහපත් තත්ත්වයන් ඉස්මතු වුවත්, පුද්ගලයා ගෝලීය මූලධර්මවල වහලෙක් බවට පත් වේ. ස්ථාවර සමාජ ව්‍යූහ ගෝලීයකරණය මගින් හකුළුවනු ලබන අතර, ව්‍යුහවල අස්ථාවරත්වය සමාජ ක්‍රමවල ගතිකත්වයට අනුව හැඩ ගස්වනු ලැබේ. මේ නිසා පුද්ගලයා නිරන්තරයෙන් ම මානසික පීඩනයකින් සිටින බව ඇතැම් සමාජ විද්‍යාඥයන් විසින් පෙන්වා දෙයි (Beck, 1992). උපයෝගී තාර්කිකත්වයක් සහිත සමාජ ක්‍රමයක පුද්ගලයා විසින් ගනු ලබන තීරණ සමග අවදානම් තත්ත්ව බැඳී තිබේ. අවදානම් ස්වභාවයෙන් විමුක්ත වීම කළ හැකි දෙයක් ද නොවේ. අනාගත ප්‍රතිඵල පුරෝකථනය කිරීමේ හැකියාවක් නොමැති බැවින්, බොහෝ අවස්ථාවල දී පුද්ගලයන් අවදානම පිළිබඳ සවිඥානික වේ. මෙ වැනි තත්ත්වයන් දේශපාලනික වශයෙන් භාවිත කිරීම ද ගෝලීය සමාජවල ප්‍රධාන ලක්ෂණයක් බව අර්ල්රික් බෙක් තර්ක කරයි. සංස්කෘතිකමය වශයෙන් ද පුද්ගලයන්ගේ සමාජ ආස්ථානය පිළිබඳ කිසියම් අවදානමක් ඇති කොට තිබේ. ගෝලීයකරණය හේතුවෙන් ඇතැම් සංස්කෘතික ලක්ෂණ වියුක්ත වීම වැනි අවදානම් තත්ත්ව බෙහෙවින් දක්නට ලැබේ. එසේ ද වුවත් අවදානම, පුද්ගලයා විසින් ගනු ලබන බහුවිධ තීරණ සමග සම්බන්ධ වී තිබීම විශේෂයෙන් අවධානයට ගත යුතු කරුණකි. එනම්, අනාගත අවදානම පිළිබඳ සවිඥානිකත්වයක් සහිතව පුද්ගලයා තීරණ නිර්මාණය කොට ඒ අනුව චර්යා රටා පවත්වන බවක් පෙනේ. ඇන්තනී ගිඩ්න්ස් සහ බෙක්, ''ප්‍රතිචාරාත්මකභාවය'' යනුවෙන් හඳුන්වන්නේ ද මෙ වැනි තත්ත්වයකි (Beck, Giddens, & Lash, 1994).

ආර්ථික, දේශපාලන, සමාජ සහ සංස්කෘතික යනාදී බහුවිධ ව්‍යුහ ආශ්‍රය කොට ගෙන ව්‍යාප්ත වන ගෝලීයකරණ යථාර්ථයේ විවිධ පැතිකඩ කිහිපයක් ඉහත පෙන්වා දෙන ලදි. විශේෂයෙන් ම ගෝලීයකරණය හේතුවෙන් වර්තමාන සමාජය පුළුල්ව වෙනස්වීම්වලට භාජනය වී ඇති ආකාරය එහි දී විග්‍රහ කරන ලදි. වත්මන් සමාජ අවකාශය තුළ ජීවත් වන පුද්ගලයන්ගේ චර්යා රටා කාලයට හා අවකාශයට සීමා වූවක් නොවන අතර එහි උපරිජාතිකභාවයක් සහ අන්තර්ජාතිකභාවයක් දක්නට ලැබේ. විවිධ සංස්කෘතිකාංග පිළිබඳව මෙතෙක් පැවති අර්ථ විග්‍රහ ගෝලීයකරණ සන්දර්භයක් තුළ භාවිතයට ගත නොහැකි වන්නේ ව්‍යුහමය වශයෙන් මෙන් ම සමාජ සංවිධානය තුළ ද වෙනස්කම් උද්ගත වී ඇති බැවින් ය. ශ්‍රී ලංකා සමාජය තුළ ද ගෝලීයකරණය හේතුවෙන් විවිධ වෙනස්කම් ඉස්මතු වී ඇත. එකී වෙනස්වීම් කෙතෙක් දුරට ශ්‍රී ලංකා සමාජයේ සංස්කෘතික පැවැත්ම සඳහා යෝග්‍ය වන්නේ ද යන ගැටළුව ද ඇතැම් විද්වතුන් විසින් ඉදිරිපත් කොට තිබේ.

## 2. ගෝලීයකරණය සහ සංස්කෘතික-ආර්ථිකයක් බිහි වීම

ගෝලීයකරණය දීර්ඝ ඉතිහාසයක් සහිත සංකල්පයක් වුවත්, අද්‍යතන යථාර්ථය පැරණි තත්ත්වවලට වඩා වෙනස් ස්වභාවයක් ගනියි. සමාජ ක්‍රම, ගෝලීය වශයෙන් පිළිගත් නියතවලට අනුව පෙළ ගැසීම හේතුවෙන් ඒවායෙහි ව්‍යුහමය වෙනසක් පමණක් නොව, පුද්ගල චර්යා පද්ධතිවල පරිවර්තනයක් ද සිදු වෙයි. සමාජ ව්‍යුහමය විපරිවර්තන සහ පුද්ගල චර්යාවේ වෙනස්වීම් කෙරෙහි බොහෝ දුරට සංස්කෘතික ගෝලීයකරණය මුල් වෙයි. ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික තත්ත්ව අන්‍යෝන්‍ය වශයෙන් වෙන් කළ හැකි සාධක නොවේ. ඒවා එකිනෙක සම්බන්ධ වී ඇත. එසේ ද වුවත්, කිසියම් සමාජ ක්‍රමයක සංස්කෘතික තත්ත්ව කෙරෙහි ඇති කරනු ලබන බලපෑම් සංස්කෘතික ගෝලීයකරණය යටතේ සාකච්ඡා කරනු ලැබේ. තාර්කීකරණය වූ සමාජ ක්‍රමයක් තුළ දේශපාලන, ආර්ථික යනාදී බලවේගවලට වඩා සංස්කෘතිය තුළ පවතින විභවීය ශක්තිය ඉහළ වූවක් යැයි විචාරාත්මක න්‍යායවේදීන් පෙන්වා දෙයි (Adorno & Horkheimer, 2002). ආර්ථික බලවේග පැවතියත්, සංස්කෘතික බලවේග අන් කවර සාධකවලටත් වඩා වැදගත් වන බව ඔවුහු තර්ක කරති.

මුල්කාලීනව මානව විද්‍යාඥයන් විසින් සංස්කෘතිය අර්ථකථනය කරන ලද්දේ සුවිශේෂීත්ව සමාජ අවකාශයක් වෙත මූලික ස්ථානයක් ලබා දීමෙන් ය. මානව කේන්ද්‍රණවාදී දෘෂ්ටිය බැහැර කරමින් සංස්කෘතික සාපේක්ෂකත්වය ඉස්මතු වූයේ කාලයට සහ අවකාශයට අනුව කිසියම් සමාජ ව්‍යුහයක සංස්කෘතිය ගොඩ නැගෙන්නේ එයට ම අනන්‍ය වූ සුවිශේෂීත්වයක් සහිතව බැවින් ය. එඩ්වර්ඩ් බී. ටයිලර් වැනි සංස්කෘතික මානව විද්‍යාඥයන් විසින් ''සංස්කෘතිය'' හඳුනා ගනු ලබන්නේ සමාජ ව්‍යුහයට සාපේක්ෂ වශයෙන් ය (Tylor, 1958). මැලිනොව්ස්කි වැනි මානව වංශවිද්‍යාත්මක ක්‍රමවේදය භාවිත කරමින් සංස්කෘතිය අධ්‍යයනය කළ මානව විද්‍යාඥයන් වුවත් ව්‍යුහය සහ කෘත්‍ය පදනම් කොට ගෙන සංස්කෘතිය අර්ථ දක්වයි (Ember & Ember, 2015). අප්‍රිකානු සමාජ ආශ්‍රයෙන් සංස්කෘතිය සහ දේශපාලනය අතර සම්බන්ධතාව පෙන්නුම් කරන එවන්ස් ප්‍රිචාර්ඩ්, ව්‍යුහීය තත්ත්ව ආශ්‍රයෙන් සමාජ පැවැත්ම සඳහා සංස්කෘතිය මගින් කෘත්‍යයක් ඉටු කරන ආකාරය පැහැදිලි කරයි (Fortes & Pritchard, 1940). මානව විද්‍යාත්මක වශයෙන් ඉදිරිපත් කොට තිබෙන ''සංස්කෘතිය'' පිළිබඳ බොහෝ අර්ථකථන, කිසියම් සුවිශේෂී කාලකයට සහ අවකාශකයට අනන්‍ය වූවක් වන අතර, ව්‍යුහයෙන් හෝ සන්දර්භයෙන් බැහැරව සංස්කෘතිය පිළිබඳ විශ්ලේෂණය කළ නො හැකි ය. සංස්කෘතික මානව විද්‍යාවෙහි දී සමාජ සන්දර්භයට විශේෂ වැදගත්කමක් ලබා දෙන්නේ එ බැවින් ය.

සමාජ සන්දර්භය හෝ ව්‍යුහය වෙත පවතින සුවිශේෂී අනන්‍යතාව, ගෝලීයකරණය තීව්‍ර වීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් අහිමි වෙමින් පවතියි. කාලය හා අවකාශය ඉක්මවා ගිය සන්දර්භයන් වර්තමාන සමාජ ක්‍රමය තුළ වර්ධනය වේ. එ පමණක් ද නොව, එකී නව ව්‍යුහවල ස්ථාවරභාවයක් ද දක්නට නො ලැබෙන අතර ඒවා අවශ්‍යයෙන් ම ගතික ප්‍රපංච වේ. එ බැවින් සන්දර්භයට සුවිශේෂී වූ සංස්කෘතික අනන්‍යතාවක් හඳුනා ගැනීම අපහසු වෙයි. එසේ ද වුවත්, සංස්කෘතිය මගින් සමාජය වෙත සිදු කරනු ලබන බලපෑම විපරිවර්තනය වෙමින් තව දුරටත් ක්‍රියාත්මක වෙයි. පුද්ගලයන්ගේ චින්තන රටාව සමග සංස්කෘතිය ඍජුව ම සම්බන්ධ වන

බැවින්, වෙනස් වුවත් කවර හෝ සංස්කෘතික වින්‍යාසයක් සමාජ ක්‍රමයක් තුළ පවතියි. මේ සම්බන්ධ පුළුල් විග්‍රහයක් ඉදිරිපත් කරන්නේ රිචර්ඩ් සෙනෙත් විසින් ය. ගෝලීය ආර්ථිකය හේතුවෙන් ව්‍යාප්ත වන බහුජාතික සමාගම් පදනම් කොටගත් නව ආර්ථික සංස්කෘතියක් බිහි වුවත්, එය දේශීය සම්ප්‍රදාය කෙරෙහි එතරම් යහපත් නොවේ. ගෝලීය වශයෙන් ප්‍රාග්ධන සංචයන ආයතන විසින් නව යටත් විජිතකරණයක් මෙ මගින් බිහි කිරීමේ ඉඩක් පවතින බැවින් ය (Sennett, 1998). එ පමණක් ද නොව, සමාජ ක්‍රමය පිළිබඳ ස්ථාවර සවිඥානකත්වයක් බිහි නොවන බව ද ඔහු තර්ක කොට තිබේ. නිදසුන් වශයෙන් ස්ථිර වෘත්තීය නව ධනවාදී සමාජ ක්‍රමය තුළ දක්නට නො ලැබේ. එ බැවින් පුද්ගලයන් එකිනෙකා පරයා වෘත්තීය වෙනුවෙන් තරග කරයි. මේ නිසා සංස්කෘතිකමය වශයෙන් තරගය පදනම් කරගත් නව සම්ප්‍රදාය බිහි වෙයි.

අන්තර්සම්බන්ධතාවන් ව්‍යාප්ත වූ ලෝකයක ජීවත් වුවත්, පුද්ගලයන්ගේ කුළුපග ඥාතී සම්බන්ධතාවන් බිඳ වැටෙන අතර එය චක්‍රාකාර වශයෙන් සංස්කෘතිය තුළ නව සම්ප්‍රදාය ඉස්මතු වීම කෙරෙහි බලපෑම් කරයි (Sennett, 2006). මේ නිසා සංස්කෘතිය, මූලික මානව විද්‍යාත්මක නිර්වචනවලට අනුව යමින් විග්‍රහ කළ නොහැකි අතර, ගෝලීය මූලධර්ම හා සමනුපාතිකව වෙනස් වන ගතික ප්‍රපංචයක් වශයෙන් සංස්කෘතිය විග්‍රහ කළ යුතු වේ. දැනුම, විශ්වාස, කලා සම්ප්‍රදාය යනාදිය සංස්කෘතියට අන්තර්ගත වුවත්, එහි ස්වභාවය ගෝලීයකරණය මගින් වෙනස් කොට තිබේ. මේ නිසා අනන්‍යතාවක් සහිත සංස්කෘතියක් පවත්වා ගෙන යාම ගැටලුවක් බවට ද පත්ව ඇත. කෙසේ වෙතත් ගෝලීයකරණය හේතුවෙන් සංස්කෘතිකමය වශයෙන් සිදු වන විපරිවර්තනයන් පුද්ගල චර්යා කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන බවක් පෙනේ.

ගෝලීයකරණය හේතුවෙන්, සංස්කෘතිය ද ධනේශ්වර ක්‍රමයේ ලාභෝත්පාදන උපාය මාර්ගයක් බවට පත් වී ඇත (Marcuse, 1964). නිෂ්පාදනයේ විවිධ උපක්‍රම තිබේ. නිෂ්පාදන ප්‍රකාරයේ ස්වභාවය සැලකිය යුතු මට්ටමකින් ගෝලීයකරණය හේතුවෙන් වෙනස් වන අතර එහි දී සංස්කෘතික නිෂ්පාදන ප්‍රධාන වේ. ආර්ථිකය මෙහෙයවීමෙහි දී සංස්කෘතිය කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු වන්නේ පාරිභෝගිකයා නෛසර්ගික වශයෙන් ම සංස්කෘතිය කෙරෙහි අවනත වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන බැවින් ය. විචාරාත්මක න්‍යායවේදීන් ගෝලීය සමාජයක පවතින සංස්කෘතිය ''ජන සංස්කෘතිය'' යනුවෙන් හඳුන්වයි.

''සංස්කෘතිය'' සහ ''ජන සංස්කෘතිය'' (Mass Culture) අතර යම් පැහැදිලි වෙනසක් තිබේ. සංස්කෘතික පර්යායක් සියලු සමාජයන් තුළ ම දක්නට ලැබේ. එසේ ද වුවත් ජන සංස්කෘතිය යනු නවීන ධනේෂ්වර සමාජයන් තුළ කෘත්‍රිම වශයෙන් නිර්මාණය කරන ලද සංස්කෘතික පර්යායකි. ජන සංස්කෘතියක් නිර්මාණය වන්නේ තාක්‍ෂණික වශයෙන් ඇති කරනු ලබන සමාජ පරිණතියෙහි ප්‍රතිඵලයක් වශයෙන් ය. විද්‍යා හා තාක්‍ෂණය වර්ධනය වීම මගින්, තොරතුරු ව්‍යාප්ත කිරීම පිළිබඳ ක්‍රමානුකූල ක්‍රමවේදයක් නිර්මාණය වෙයි. අතීත සමාජවලට සාපේක්‍ෂව නවීන සමාජවල තොරතුරු ගලා යාමේ ව්‍යාප්තිය ඉහළ මට්ටමක පවති යි. විශේෂයෙන් ම ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියාතික සමාජවල තොරතුරු ගලා යාමේ ප්‍රවණතාව ඉහළ මට්ටමක පවතින ආකාරයක් දක්නට ලැබේ. මෙහි කිසියම් සුබවාදී තත්ත්වයක් පැවතියත්, තොරතුරුවල පවතින ආවශ්‍යකතාව සම්බන්ධයෙන් යම් ගැටලුකාරී තත්ත්වයක් පැවතිය හැකි ය.

''තොරතුරු'' සම්බන්ධයෙන් යම් යෝග්‍ය ආවශ්‍යකතාවක් පැවතිය යුතු ය. තොරතුරක් තුළ පවතින වලංගුභාවය බොහෝ දුරට රඳා පවතින්නේ එය භාවිත කරන පුද්ගලයාගේ ස්වභාවය සහ සන්දර්භයෙහි ස්වභාවයට සාපේක්‍ෂව ය. වර්තමාන ශ්‍රී ලංකාවේ බොහෝ පාසල් සිසුන්, අයෝග්‍ය තොරතුරුවලට නිරාවරණය වෙයි. එ මතු ද නොව, ජනමාධ්‍ය මඟින් සාමාන්‍ය ප්‍රජාවට අයෝග්‍ය තොරතුරු ව්‍යාප්ත කරනු ලබයි. සන්දර්භගත නොවන සහ පුද්ගලයාගේ ස්වභාවයට අනුකූල නොවන, අයෝග්‍ය තොරතුරු ව්‍යාප්ත වීම තුළ අවිචාරවත්භාවයක් සහ අතාර්කිකත්වයක් පවති යි. සත්‍ය වශයෙන් ම පාසල් ශිෂ්‍යයෙකු විසින් විවෘත නොවිය යුතු ක්ෂේත්‍රයක් වෙත විවෘත වීමෙහි ප්‍රතිඵල හානිකර විය හැකි ය. ශ්‍රී ලංකා සමාජය තුළ බොහෝ බාල අපරාධ වැඩි වීමෙහි ප්‍රධාන හේතුවක් වශයෙන් ද අයෝග්‍ය තොරතුරුවලට විවෘත වීම පෙන්වා දිය හැකි ය. තොරතුරුවල ව්‍යාප්තිය මඟින් ද ධනේෂ්වර

ක්‍රමයක් තුළ ප්‍රාග්ධන හිමි පැළැන්තියට වැඩි වාසි හිමි වන ආකාරයක් දක්නට ලැබේ. වර්තමාන ශ්‍රී ලංකාවේ පළ කරනු ලබන බොහෝ පුවත්පත්වල ප්‍රධාන පරමාර්ථය වන්නේ ''පුද්ගලයාට සහ සමාජ ප්‍රගතියට යහපතක් වන තොරතුරු'' ලබා දීම නොවේ. බොහෝ දුරට වෙළෙඳ දැන්වීම් ප්‍රචාරණය කිරීමත්, පුද්ගලයාගේ ආකර්ෂණය දිනා ගත හැකි වන ආකාරයේ තොරතුරු ව්‍යාප්ත කිරීමත් ය. මෙ මඟින් සිදු වන්නේ මහජන මතය සැලකිය යුතු ආකාරයෙන් වෙනස් වීම ය. එය සාධාරණ සහ නිදහස් සමාජයක් කෙරෙහි යහපත් වන තත්ත්වයක් වශයෙන් සැලකිය නො හැකි ය.

තොරතුරු සම්බන්ධයෙන් ධනේශ්වර ක්‍රමය තුළ පවතින අභිනතිය හෝ ඒක පාක්ෂිකභාවය, ජන සංස්කෘතියක් නිර්මාණය කිරීමට හේතු වෙයි. විශේෂයෙන් ම අධිතාක්ෂණික උපකරණ සහ විද්‍යාත්මක ඥානය භාවිත කොට සකස් කරන ලද බහුජන මාධ්‍යය, ජන සංස්කෘතිය නිර්මාණය කිරීමට දායක වෙයි (Adorno & Horkheimer, 2002). ජන සංස්කෘතියෙහි පවතින ප්‍රධාන ලක්ෂණය වන්නේ සංස්කෘතිකමය වශයෙන් කර්මාන්තයන් පවත්වා ගෙන යාම ය. සංස්කෘතික ලක්ෂණයන් ප්‍රතිනිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්තශාලා පවත්වා ගෙන යනු ලැබේ. හර්බර්ට් මාර්ක්‍යුස් මෙය සංස්කෘතික කර්මාන්තයන් යනුවෙන් විග්‍රහ කරයි (Marcuse, 1964). සංස්කෘතික කර්මාන්තයන් ද ලාභ පරමාර්ථ කරගෙන ක්‍රියාත්මක වෙයි. මේ නිසා සංස්කෘතික කර්මාන්ත මඟින් සිදු කරනු ලබන්නේ පොදු ජන සමාජය පාරිභෝජන සමාජයක් වෙත අනුකූල කරමින් ප්‍රාග්ධනය ඒකරාශී කිරීම ය. එ මෙන් ම, ජන සංස්කෘතික කර්මාන්තයන් මහා පරිමාණ බහු ජාතික සමාගම්වලට අනුබද්ධ ආයතනයන් වශයෙන් ද ක්‍රියාත්මක වෙයි. බොහෝ දුරට ජන සංස්කෘතික කර්මාන්තයන් මඟින් පොදු ජනතාවගේ ආස්වාදය සඳහා යෝග්‍ය වන නිර්මාණයන් නිෂ්පාදනය කරයි. මෙම සංසිද්ධිය දකුණු ආසියානු සමාජයන් ආශ්‍රයෙන් විශේෂයෙන් පැහිදිලි කළ හැකි වෙයි.

ජන සංස්කෘතියක් යනුවෙන් හඳුන්වනු ලබන්නේ මහා පරිමාණ බහුජාතික සමගාම් විසින් නිෂ්පාදනය කරනු ලබන ජනප්‍රිය සංස්කෘතික නිර්මාණයන් සහිත අවකාශයකි. ''Entertainment Bussiness'' යනුවෙන් හඳුන්වනු ලබන නිෂ්පාදනයන්ට මේ තුළ ප්‍රධාන ස්ථානයක් හිමි වේ. ජනප්‍රිය සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා පොදු ජනතාව සංතෘප්තියට සහ විනෝදයට පත් කරනු ලබන නිර්මාණයන් බිහි කළ යුතු ය. ලාභ උපරිම කිරීම සඳහා නිශ්චිත වශයෙන් ම ජනතාව ඇද බැඳ තබාගනු ලබන සංස්කෘතිකමය නිර්මාණයන් වෙත අවධානය යොමු කළ යුතුව තිබේ. තාක්ෂණය මඟින් නිරන්තරයෙන් ම විපරමකට භාජනය කරනු ලබන සමාජ ක්‍රමයක් තුළ පීඩාවට පත් වන පුද්ගලයන්ට මානසික වශයෙන් සහනදායී පරිසරයක් ඇති කිරීම නමැති ව්‍යවහාරය යටතේ විවිධ ජනප්‍රිය සංස්කෘතික වැඩසටහන් නිෂ්පාදනය කරනු ලැබේ. මේ සඳහා රූපවාහිනී භාවිතයේ පවතින ව්‍යාප්තිය විශේෂයෙන් වැදගත් වී තිබේ. මෙ වැනි තත්ත්වයන් වඩාත් තීව්‍ර කරනු ලබන්නේ ගෝලීය සම්ප්‍රදායන්ගේ ව්‍යාප්තිය හේතුවෙන් ය.

පුද්ගල චර්යා සහ අන්තර්සම්බන්ධතා සම්බන්ධයෙන් රූපවාහිනිය මඟින් සිදු කරනු ලබන බලපෑම අතිශය ප්‍රබල මට්ටමකට පත් වී තිබේ. කර්මාන්ත ශාලාවන් හෝ රැකියා ස්ථානයන් තුළ කටයුතු කරන පුද්ගලයන්ගේ ජීවන චර්යාවෙහි කාල පරිභෝජනය අතිශය සීමා සහිත වුවත්, රූපවාහිනිය මඟින් ව්‍යාප්ත කරනු ලබන සංස්කෘතියට සමස්ත කාලය තුළ ම යටත් වන ආකාරයක් දක්නට ලැබේ. විචාරාත්මකභාවයක් ඇති කිරීමට වඩා ජනප්‍රීණනය සඳහා අවශ්‍ය වැඩසටහන් රූපවාහිනී මඟින් විකාශනය කරනු ලබන බවක් පෙනේ. සමාජගත පුද්ගලයන් ද කිසිදු විචාරයකින් තොරව මෙ වැනි වැඩසටහන් පිළිගනු ලැබේ. පුද්ගලයන්ගේ සමාජ චර්යාව හැඩ ගැසීම කෙරෙහි මෙ වැනි ජනමාධ්‍ය වැඩසටහන් තුළින් කරනු ලබන බලපෑම අති ප්‍රබල ය. විශේෂයෙන් ම වෙනත් රටවල නිෂ්පාදනය කරන ලද මාධ්‍ය නිර්මාණයන් ශ්‍රී ලංකාව තුළ විකාශනය කිරීමෙන්, අදාළ මාධ්‍ය ආයතන විශාල ප්‍රාග්ධනයක් ඒකරාශී කළත්, එයින් සමාජ ව්‍යුහයට සහ සංවිධානයට සිදු වන අයහපත් බලපෑම ඉහළ මට්ටමක පවතියි.

සාමාන්‍ය කර්මාන්තයක පවතින කාර්ය පරිපාටිය, ජනමාධ්‍ය නිෂ්පාදනය තුළ ද ඒ ආකාරයෙන් ම දක්නට ලැබේ. නිෂ්පාදනය, ඇසුරුම්කරණය, අලෙවිකරණය සහ බෙදා හැරීම යන සියලු අංග ඒ තුළ දැකිය හැකි ය. ජනමාධ්‍ය මඟින් නිෂ්පාදනය කරනු ලබන බොහෝ

නිර්මාණ සත්‍ය වශයෙන් ම භෞතික නිෂ්පාදන නොවේ. ඍජුව ම මානසික තත්ත්ව ආමන්ත්‍රණය කළ හැකි යම් මෘදු නිර්මාණ ය. වෙළෙඳ ප්‍රචාරණය ද වඩා පහසුවෙන් ජනමාධ්‍ය තුළින් සිදු කළ හැකි ය. ජනමාධ්‍ය නිෂ්පාදන ක්‍රියාවලිය තුළින් නව පරාධීනතාවක් උද්ගත වන අතර සමාජයක නිදහස ස්ථාපනය කිරීමට ද එ මගින් බාධාවක් ඇති කරයි.

ජන මාධ්‍ය භාවිතයෙන් ව්‍යාප්ත කරනු ලබන නිෂ්පාදන සහිත ජන සංස්කෘතිය, නූතන ධනේෂ්වර ක්‍රමය තුළ වඩාත් වැදගත් වන්නේ එ මගින් පොදු ජන සංස්කෘතියක් නිර්මාණය කරන බැවින් ය. ජන සංස්කෘතියෙහි සමස්ත ස්වභාවය, එක් සමාජයක් තුළ පොදු බවකට පත් කිරීමක් මෙහි දී සිදු වෙයි. ධනවාදී සමාජ ව්‍යුහය තුළ ස්ථාපනය කොට තිබෙන ජන සංස්කෘතිය, මහජනතාව අතරට ගෙන යාමෙහි දී කිසියම් පොදුභාවයක් නිර්මාණය කරනු ලැබේ. මෙය තරමක් සංකීර්ණ අර්ථ කථනයකි. සංස්කෘතිකමය පොදුභාවයක් නිර්මාණය කිරීම යනුවෙන් අදහස් කරනු ලබන්නේ, එක ම නිෂ්පාදනයක් මහා පරිමාණ වශයෙන් ව්‍යාප්ත කිරීමෙන් පුද්ගල චර්යාවල සමමිතියක් හෝ පොදුභාවයක් නිර්මාණය කිරීම ය. තාක්‍ෂණික උපකරණ භාවිතයෙන් එක ම භාණ්ඩය මහා පරිමාණ වශයෙන් නිෂ්පාදනය කළ හැකි වෙයි. අනෙක් අතට ඇතැම් සංස්කෘතිකමය නිෂ්පාදිත ජනමාධ්‍ය මගින් පහසුවෙන් ප්‍රචාරණය කළ හැකි බැවින් ද පුද්ගල චර්යා අතර ද පොදුභාවයක් නිර්මාණය වෙයි. පොදුභාවයක් නිර්මාණය කිරීම, සමාජාතීයකරණය යනුවෙන් හඳුන්වනු ලැබේ.

වර්තමානයෙහි බොහෝ පුද්ගලයන් විසින් භාවිත කරනු ලබන ජංගම දුරකථන සහ පරිගණක පිළිබඳ සංස්කෘතිය මෙ වැනි සමජාතීකරණ චර්යාවක් ඉස්මතු වූ අවස්ථාවකි. වෙළෙඳ නාම පදනම් කොට ගෙන පුද්ගල මතවාදීමය තත්ත්ව ද පොදුකරණයකට භාජනය වෙයි. ''Apple'' නමැති වෙළෙඳ නාමය සහිත බොහෝ සංස්කෘතික උපකරණවලට සමාජය තුළ අධික ගරුත්වයක් හිමි වෙයි. එකී වෙළෙඳ නාමය සහිත භාණ්ඩ භාවිත කිරීමෙන් නිරූපණය වන්නේ කිසියම් සමාජ පන්තියකි. එ පමණක් ද නොව, වෙනත් එවැනි වෙළෙඳ නාම සහිත සංස්කෘතික උපකරණ රාශියක් ශ්‍රී ලංකා සමාජය තුළ ව්‍යප්ත වී ඇත. පුද්ගල චර්යාවල පොදුභාවයක් නිර්මාණය කිරීමට හේතු වෙයි. එසේ ද වුවත්, මෙහි පවතින අවිචාරවත්භාවය වන්නේ පුද්ගලයා තුළ නෛසර්ගික වශයෙන් පවතින නිර්මාණශීලීත්වයට හානි සිදු වීම ය. සමාජ ක්‍රමය තුළ ව්‍යවහාර වන සංකල්ප පද්ධතිය ද ජනප්‍රිය සංස්කෘතියේ නිරූපණවලට සාපේක්‍ෂව සකස් වී ඇති ආකාරයක් දක්නට ලැබේ. ''මැසේජ් කිරීම, වයිබර් කෝල්ස්, ඉමේජ් සෙන්ඩ් කිරීම, ස්කයිප් කොල්ස්'' වැනි වචන සමුදායක් සිංහල භාෂාවට එකතු වී තිබේ. මෙ වැනි ව්‍යවහාර එකතු වීමෙහි ප්‍රතිඵලය වන්නේ, නිශ්චිත වශයෙන් ම පොදුවේ පිළිගත් පුද්ගල හැසිරීමක් වෙත පුද්ගල අවධානය යොමු වීම ය.

බුද්ධිමය ප්‍රජාවට සමාජ ක්‍රමය තුළ හිමි වන ස්ථානය නැති වී යාම ද මෙ තුළින් ඇති වන ප්‍රතිඵලයකි. ධනේෂ්වර ක්‍රමයක් තුළ බුද්ධිමතුන් ද ප්‍රාග්ධනය හිමි පැළැන්තියේ ග්‍රහණයට නතු වෙයි. විචාරවත් සමාජයක් ඇති කිරීම සඳහා විශේෂයෙන් දායක විය යුතු වන්නේ බුද්ධිමත් ප්‍රජාව ය. හබමාස් තර්ක කරන ආකාරයට, න්‍යායාචාර්යවරු හුදෙක් දැනුම ගොඩ නැගීමට පමණක් නොව, විචාරාත්මකව සමාජයක් වෙනස් කිරීමට ද දායක විය යුතු ය (Habermas, 1975). එසේ ද වුවත්, ධනේෂ්වර ගෝලීය සමාජ ක්‍රමයන් තුළ සමාජ වෙනසක් ඇති කිරීමට සමත් බුද්ධිමතුන් ධනේෂ්වර පන්තිය විසින් මිල දී ගනු ලැබේ. බුද්ධිමතුන් මිල දී ගැනීමේ ක්‍රියාවලිය විචාරාත්මක න්‍යාය තුළ විශේෂයෙන් සාකච්ඡාවට භාජනය වී තිබේ. පොදු ජන සංස්කෘතියෙහි පවතින වලංගුභාවය ස්ථාවර කිරීම සඳහා බුද්ධිමතුන් ද භාවිත කරනු ලැබේ. මෙහි ප්‍රතිඵලය වන්නේ අවිචාරාත්මක සමාජ චර්යා තාර්කික සහ විචාරාත්මක තත්ත්ව වශයෙන් සමාජය තුළට මුල් බැස ගැනීම ය.

බුද්ධිමතුන්, ප්‍රාග්ධන හිමි පැළැන්තිය විසින් මිලට ගැනීම පුළුල් වශයෙන් සාකච්ඡා කොට තිබෙන්නේ පශ්චාත් මාක්ස්වාදී චින්තකයන් විසින් ය. විශේෂයෙන් ම අන්තෝනියෝ ග්‍රාම්ස්චි මේ සම්බන්ධයෙන් විශාල විග්‍රහයක් ඉදිරිපත් කරයි. විචාරාත්මක සමාජ න්‍යායවේදීන්ට ද මෙහි ආභාසය ලැබී ඇති බවක් පෙනේ. රූපවාහිනී වැඩසටහන්, පුවත්පත් සහ සඟරා යනාදියෙහි පෙනී සිටින පොදු ජන බුද්ධිමතුන්, පොදු ජන සංස්කෘතියෙහි වලංගුභාවය සාධාරණීකරණය කිරීම සඳහා උත්සාහ කරනු ලැබේ. ඇතැම් අවස්ථාවල දී අතාර්කික මතවාද වුවත් තාර්කික යැයි ප්‍රකාශ කිරීම සඳහා මොවුන්ව භාවිත කරනු ලබන ආකාරයක් දක්නට

ලැබේ. අනෙක් අතට, ප්‍රාග්ධනය හිමි පන්තියට එරෙහිව කටයුතු කොට විචාරාත්මකභාවයක් සමාජ ක්‍රමය තුළ ස්ථාපනය කිරීමට උත්සාහ කරනු ලබන බුද්ධිමතුන්ට සමාජ ක්‍රමය තුළ පැවැත්මක් ස්ථාවර කර ගැනීම ද අපහසු වී තිබේ.

තාක්ෂණික ඒකාධිපතිවාදයක් ස්ථාපනය වීම තුළ පුද්ගල වගකීම් ස්වභාවයේ ද වෙනස්කම් උද්ගත වෙයි. සියලු සමාජ සංසිද්ධි තීරණය කිරීම සම්බන්ධයෙන් තාක්ෂණය ප්‍රමුඛ වන්නේ නම්, කිසියම් සාවද්‍ය තත්ත්වයක් වුව ද තාක්ෂණික ඒකාධිපතිවාදය හේතුවෙන් සාධාරණීකරණය කළ හැකි තත්ත්වයකට පත් කරනු ලබන බව ප්‍රතිගෝලීයවාදීන්ගේ විවේචනයකි. පුද්ගල වගකීම පිළිබඳ යථාර්ථය වියුක්ත වීම අවිචාරාත්මක සමාජයක් තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයකි. ධනේශ්වර සමාජ තුළ පුද්ගල වගකීම පැහැර හැරීම සඳහා තාක්ෂණික තථ්‍ය නිදහසට කරුණු වශයෙන් ඉදිරිපත් කරයි. ''විදුලිය අක්‍රීය වීම නිසා පරිගණකය ක්‍රියා නොකිරීමත් ඒ හේතුවෙන් මුදල් ගනුදෙනුව සිදු කිරීමට නො හැකි වූ බවත්'' යම් පුද්ගලයෙකු විසින් ප්‍රකාශ කරන්නේ නම්, ඒ තුළ තාක්ෂණයේ සාවද්‍යතාවක් වෙත වගකීම පවරා ඇති බව පෙනේ. මෙ වැනි සංසිද්ධි අතිබහුතරයක් වර්තමාන සමාජය තුළ ව්‍යාප්ත වී තිබේ. ජංගම දුරකථන භාවිතය ද වගකීම් පැහැර හැරීම සඳහා විශේෂයෙන් භාවිත කරනු ලැබේ. වගීකීම්වල ස්ථාවරභාවය පිණිස ද තාක්ෂණය හේතු වුවත්, වගකීම් පැහැර හැරීම සඳහා තාක්ෂණික තත්ත්ව භාවිත කිරීම වර්තමාන ශ්‍රී ලංකා සමාජය තුළ බහුල වශයෙන් ව්‍යාප්ත වී ඇත.

නූතන තාක්ෂණය මඟින් ව්‍යාප්ත කරනු ලබන විවිධ උපාය උපක්‍රම තුළ මෙම තත්ත්වය ප්‍රධාන වශයෙන් ම දක්නට ලැබේ. අන්තර්ජාලය භාවිත කරන ආකාරය මහා පරිමාණ සමාගම්වලට නිරීක්ෂණය කිරීමේ හැකියාවක් පවති යි. මේ නිසා එක් එක් පුද්ගලයාගේ රුචි අරුචිකම් හඳුනා ගෙන එයට යෝග්‍ය වන ආකාරයෙන් වෙළෙඳ ප්‍රචාරණ කටයුතු සහ වෙනත් සංස්කෘතිකමය නිෂ්පාදන හඳුන්වා දීමක් සිදු කරයි. Google, Yahoo, Windows වැනි මහා පරිමාණ බහුජාතික සමාගම්, සාමාන්‍ය පාරිභෝගිකයන්ගේ චර්යාව නිරන්තරයෙන් ම නිරීක්ෂණය කරයි. විද්‍යුත් තැපැල භාවිත කරන ආකාරයෙන් පුද්ගලයන්ගේ රුචි අරුචිකම් හඳුනා ගන්නා අතර එයට ගැළපෙන වෙළෙඳ දැන්වීම් ව්‍යාප්ත කරයි. මේ සඳහා පුද්ගලයාට එරෙහි විය නො හැකි ය. එයට හේතුව, අදාළ ආයතන සමග සම්බන්ධ වීමේ දී එකඟ විය යුතු කොන්දේසි මාලාව තුළට මෙ වැනි නිර්ණායක අන්තර්ගත කොට තිබෙන බැවින් ය. මුහුණු පොත භාවිත කිරීමේ දී වුවත්, බොහෝ වෙළෙඳ ප්‍රචාරණ කටයුතු සිදු කරනු ලැබේ. මේ නිසා, නො දැනුවත්ව ම පුද්ගලයා මහා පරිමාණ ආයතනවල බලපෑමට ලක් වෙයි. මෙය විචාරාත්මක සමාජ ක්‍රමයක් බිහි කිරීමට යෝග්‍ය තත්ත්වයක් නොවේ.

වර්තමාන සමාජ ක්‍රමය තුළ ගෝලීයකරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සංස්කෘතිය, නිෂ්පාදනය සහ තාක්ෂණය වැනි බහුවිධ ඒකකයන් ඒකාබද්ධ වූ ස්වභාවයක් පෙන්නුම් කරයි. මෙය සමාජයක සංවර්ධනයට හේතු වුවත් බොහෝ විට නිෂේධනාත්මක තත්ත්වයක් වර්ධනය කිරීමට හේතු වන ආකාරය ඉහත පෙන්වා දෙනු ලැබිණ. ගෝලීයකරණය හේතුවෙන්, සංස්කෘතිය ද ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයෙහි උපකරණයක් බවට විපරිවර්තනය වේ. එය අයහපත් තත්ත්වයක් යැයි කිව නොහැකි වුවත්, ශ්‍රී ලංකාව වැනි සමාජවල දීර්ඝකාලීන වශයෙන් පවත්වා ගෙන එනු ලබන සංස්කෘතික සම්ප්‍රදායට එයින් ඍණාත්මක බලපෑමක් ඇති වේ. ඇතැම් සංස්කෘතික ලක්ෂණ ඉවත්ව යන අතර, නව සංස්කෘතික ලක්ෂණ එකතු වෙයි. මෙ ලෙස එකතු වන සංස්කෘතික ලක්ෂණ කොතෙක් දුරට මෙතෙක් පැවති සම්ප්‍රදායට යෝග්‍ය වන්නේ ද යන ගැටලුව නැවත ඉස්මතු වෙයි.

### 3. සංස්කෘතික ගෝලීයකරණය සහ අද්‍යතන සංස්කෘතික අධිරාජ්‍යවාදය

ධනේශ්වර ආර්ථික සම්ප්‍රදායේ ප්‍රධාන උපාය මාර්ගයක් වශයෙන් ගෝලීයකරණය ව්‍යාප්ත වුවත් වර්තමානය වන විට එහි ආස්ථානයන් වෙනස් වී තිබේ. විද්‍යා හා තාක්ෂණයෙහි වර්ධනයත්, අන්තර්ජාල කටයුතු ප්‍රසාරණය වීමත් හේතුවෙන් සංස්කෘතික ගෝලීයකරණය වඩාත් පුළුල් වී ඇත. එහි දී ධනවාදී රටවල්, තුන්වන ලෝක සමාජ තව දුරටත් ප්‍රාග්ධන සංචයනයෙහි පර්යන්ත වශයෙන් රඳවා ගැනීමට ගෝලීයකරණය භාවිත කරන බව ඇතැම් සමාජ විද්‍යාඥයන් විසින් පෙන්වා දී තිබේ (Desai & Potter, 2011). විශේෂයෙන් ම පුද්ගල

චර්යාව කෙරෙහි සංස්කෘතික ව්‍යුහ විසින් සිදු කරනු ලබන බලපෑම අනවරත සාධකයක් වන බැවින්, නූතන අධිරාජ්‍යවාදය ගොඩ නැගී තිබෙන්නේ සංස්කෘතිය පාදක කොට ගෙන යැයි ජේම්ස් පෙට්‍රාස් නමැති ගෝලීයකරණ සමාජ විද්‍යාඥයා විසින් පෙන්වා දෙයි (Petras & Veltmeyer, 2001). ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝක සමාජවල නිෂ්පාදනය කරනු ලබන ප්‍රාග්ධනය වෙනත් ධනවාදී සමාජ විසින් සංචයනය කරනු ලබන්නේ සංස්කෘතික අධිරාජ්‍යවාදයක් ව්‍යාප්ත කිරීම මගින් ය. සංස්කෘතික ගෝලීයකරණයෙහි හැඟවුණු දිශානතියක් ''අද්‍යතන සංස්කෘතික අධිරාජ්‍යවාදය'' නමැති සංකල්පයෙන් ඉදිරිපත් කරයි. අතීත සමාජ ක්‍රමවල පැවති අනන්‍යතාවක් සහිත සංස්කෘතියෙන්, අද්‍යතන සංස්කෘතිය වෙනස් වන්නේ එය ගෝලීය සන්දර්භයක් මත ස්ථාපනය වී ක්‍රියාත්මක වන බැවින් ය.

සංස්කෘතික ගෝලීයකරණය සහ සංස්කෘතික අධිරාජ්‍යවාදය අතර පැහැදිලි සම්බන්ධතාවක් පවතියි. සංස්කෘතික ගෝලීයකරණය යනුවෙන් හඳුන්වනු ලබන්නේ කිසියම් සමාජ ක්‍රමයක පවතින සංස්කෘතික ගෝලීය මූලධර්ම අනුව සකස් වීමත්, ගෝලීය සංස්කෘති සමග සම්බන්ධතා ගොඩ නගා ගනිමින් සංස්කෘතික ජාල රටාවක් වර්ධනය කර ගැනීම ය. එසේ ද වුවත්, එහි දී භෞතික සංස්කෘතිය සහ අභෞතික සංස්කෘතිය අතර කිසියම් ගැටීමක් ඇති විය හැකි ය. බොහෝ දුරට භෞතික සංස්කෘතික අංග ලක්ෂණ ඉතා වේගයෙන් ගෝලීය සම්ප්‍රදායන් අනුව සකස් වුවත් අභෞතික සංස්කෘතික තත්ත්ව එසේ වේගයෙන් වෙනස් නොවේ. ඇඳුම් පැළඳුම්, ආහාර සම්ප්‍රදාය, ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම යනාදී භෞතික සංස්කෘතික තත්ත්ව ගෝලීය සංස්කෘති සමග සම්බන්ධතා ගොඩ නගා ගනිමින් වඩා යහපත් ආකාරයෙන් හෝ නව්‍ය සම්මත ආකාරයෙන් වෙනස්වීම්වලට භාජනය වේ. එසේ ද වුවත්, භෞතික සංස්කෘතිය හා සම්බන්ධ විශ්වාස පද්ධති, සදාචාර පද්ධති හෝ සමාජ සම්මත පිළිගැනීම් ඉතා පහසුවෙන් ගෝලීය සම්ප්‍රදාය සමග සම්බන්ධ නොවේ. මනෝමූලික වශයෙන් ගොඩ නැගී තිබෙන ඇතැම් ව්‍යුහ වෙනස් වීම සඳහා සැලකිය යුතු දිගු කාලයක් අවශ්‍ය වේ. මේ නිසා ගෝලීයකරණය හේතුවෙන් සංස්කෘතික තත්ත්ව අතර ගැටීමක් ඇති වේ. මෙය පුද්ගල චර්යා කෙරෙහි බලපෑම් කරයි. විශේෂයෙන් ම පරම්පරා අතර මනෝවිද්‍යාත්මක වශයෙන් පවතින දුරස්ථභාවය තවදුරටත් වැඩි වීමට මෙය හේතුවක් වේ. දෙමව්පියන් හෝ වැඩිහිටියන්, පැරණි සංස්කෘතික ආස්ථාන විශ්වාස කිරීමත්, අන්තර්ජාලය මගින් ලෝකයට සම්බන්ධ වන තරුණ පාර්ශ්ව නව සංස්කෘතික තත්ත්ව වෙත විවෘත වීමත් හේතුවෙන් පරම්පරාවන් අතර පවතින දුරස්ථභාවය ක්‍රමයෙන් පළල් වන බවක් පෙනේ.

එසේ ද වුවත් සංස්කෘතික ගෝලීයකරණයෙහි ඇතැම් වාසි සහගත ප්‍රතිඵල ද දක්නට ලැබේ. සංස්කෘතික වශයෙන් ගම සහ නගරය අතර පැවති දුරස්ථභාවය අවම වීම විශේෂයෙන් වැදගත් වෙයි. කලාපීය වශයෙන් පුද්ගලයන් අතර දුරස්ථභාවය වැඩි කිරීමට හේතුව වූයේ සන්දර්භයට සුවිශේෂී වූ සංස්කෘතිකයට අනුගත වීම ය. එසේ ද වුවත් වර්තමාන ශ්‍රී ලංකාවේ ගම සහ නගරය අතර ව්‍යුහමය වෙනසක් තිබිය දී ම, සංස්කෘතික වශයෙන් සමජාතීයභාවයක් වර්ධනය වෙමින් පවතියි. එ පමණක් ද නොව, ගෝලීය වශයෙන් පිළිගත් සංස්කෘතික මූලධර්ම ශ්‍රී ලංකා සමාජය වෙත ගලා එන ආකාරයක් ද දැකිය හැකි ය. බොහෝ දුරට බටහිර සංස්කෘතික ලක්ෂණ විසරණය වීම ගෝලීයකරණයෙහි මූලික සංරචකයකි. සංස්කෘතික ගෝලීයකරණය හේතුවෙන් මෙතෙක් පැවති අධ්‍යාපන ක්‍රමවේදයන්ගේ ස්වභාවය ද සැලකිය යුතු මට්ටමකින් වෙනස් වී තිබේ. අන්තර්ජාල අධ්‍යාපනය, ප්‍රමුඛ ආදායම් උත්පාදන මාර්ගයක් බවට පත් වී ඇති අතර ගුරු ශිෂ්‍ය සම්බන්ධතාවල ස්වභාවය ද වෙනස් වී තිබේ. විශේෂයෙන් ම ශ්‍රී ලංකාව තුළ බෞද්ධ ආගම පදනම් කොටගත් අධ්‍යාපන සදාචාරයක් ව්‍යාප්තව තිබිණ. එසේ ද වුවත්, ගෝලීයකරණය හේතුවෙන් දැනුම සංරක්ෂණය කිරීමේ අධ්‍යාපන සනදර්භයෙන් ඉවතට ශ්‍රී ලංකාව ද ගමන් කරමින් සිටියි. ගුරුවරුන් තව දුරටත් දැනුම ආරක්ෂා කර ගෙන ඉදිරියට පවත්වා ගෙන යා යුතු යැයි ගෝලීයකරණය විසින් අපේක්ෂා කරනු ලැබේ. වර්තමාන සමාජය අවශ්‍යයෙන් ම දැනුම පදනම් කරගත් සමාජයක් බැවින්, කිසිදු පුද්ගලයෙකුට දැනුමෙහි අයිතිකරුවෙකු විය නො හැකි ය. ගෝලීය වශයෙන් දැනුම ව්‍යාප්ත වන අතර, ඉලෙක්ට්‍රෝනික මාධ්‍යයක් තුළ දැනුම ගබඩා කොට තිබේ. අවශ්‍ය අවස්ථාවක දී එය භාවිතයට ගත හැකි ය. මේ නිසා පාසල් තුළ මෙන් ම උසස් අධ්‍යාපන ආයතන තුළ අධ්‍යාපන ක්‍රමවේද සැලකිය යුතු වෙනසකට භාජනය වී ඇති බවක් පෙනේ. එසේ නො වෙනස් වන්නේ නම්, ගෝලීය සම්ප්‍රදායට සම්බන්ධ වීමට නොහැකි වීමෙන් එහි සංවර්ධනය අඩපණ වේ.

විශ්වීය ඥානය කාලය සහ අවකාශය පිළිබඳ සවිඥානිකත්වයක් නොමැතිව ලොව පුරා ව්‍යාප්ත වෙයි. මෙය සමාජ සංවර්ධනයෙහි දී ද විශේෂයෙන් වැදගත් වෙයි. මානව හිමිකම්, නව තාක්‍ෂණය සහ විද්‍යාත්මක සොයාගැනීම් එක් රටකට පමණක් සීමා නොවන අතර, අඩු වැඩි වශයෙන් ලෝක සමාජ වෙත විසරණය වෙයි. මේ නිසා ජාතික රාජ්‍යවල පරාධීනතාව ද ක්‍රමයෙන් ඉහළ මට්ටමකට පැමිණෙයි. එ මෙන් ම, තොරතුරු තාක්‍ෂණය හේතුවෙන් ගෝලීය සංස්කෘති අතර පවතින විසමතාව ද අවම කරනු ලබයි. මෙය සංස්කෘතික සමජාතීයකරණය යනුවෙන් ද හඳුන්වනු ලැබේ. සමස්ත ලෝකය තුළ පොදු සංස්කෘතියක් ව්‍යාප්ත වීම මෙහි දී සිදු වේ. එසේ ද වුවත්, මේ හේතුවෙන් ඇතැම් සුවිශේෂී සංස්කෘති ලෝක සමාජයන්ගෙන් බැහැර වීම නිෂේධනාත්මක ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය හැකි ය. දකුණු ආසියානු සමාජයන් මෑත කාලීනව මුහුණු දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ ඇතැම් දේශීය භාෂා, මළ භාෂා බවට පත් වීම ය. භාෂාවක් විනාශ වීම හෝ භාවිතයෙන් ඉවතට යාම යනු දීර්ඝ කාලයක් පුරා විශේෂිත සංස්කෘතියක් විසින් පවත්වා ගෙන එනු ලබන දැනුම් පද්ධතියක් සහ අනන්‍යතාවක් ද විනාශ වීම ය. මෙය සංස්කෘතික ගෝලීයකරණය හේතුවෙන් ඉස්මතු වන අයෝග්‍ය ප්‍රතිඵලයකි.

සංස්කෘතික ගෝලීයකරණය හේතුවෙන්, සුළුතර ප්‍රජාව බල ගැන්වීමක් ද සිදු වේ. විශේෂයෙන් ම තොරතුරු තාක්‍ෂණය හේතුවෙන් පුද්ගලයන් අතර පවතින විසමතාවන් අවම කරනු ලැබේ. සමාජ අවස්ථා සඳහා විවෘත වීමේ අවකාශය ගෝලීයකරණය මගින් ඇති කරනු ලබන බැවින් ඇතැම් බැහැරකරණයට භාජනය වූ හෝ සුළුතර කණ්ඩායම් බලගැන්වීමක් ද සිදු වේ. ඕස්ට්‍රේලියාවේ ඇබොරිජින්ස් නමැති දේශීය ප්‍රජාව, ස්වකීය අයිතිවාසිකම් සුදු ජාතික ආණ්ඩුව වෙත ඉදිරිපත් කිරීම සඳහා මූලික වශයෙන් අන්තර්ජාලය භාවිත කළ අතර එය වඩාත් සාර්ථක විය. දශක කිහිපයකට පෙර පැවති බැහැරකරණ මානසිකත්වය ඔවුන් තුළින් ඉවත් වී සමාජ ප්‍රාග්ධනයක් වර්ධනය කර ගැනීමට ගෝලීය සම්ප්‍රදායන් බලපෑම් කරනු ලැබිණ (Gross, 2008, 2010). විශේෂයෙන් ම කාන්තාවන් බල ගැන්වීමේ කාර්යය ගෝලීයකරණය හේතුවෙන් වඩාත් සාර්ථක වී තිබේ (Shiva, 1991). පරිසරය ආරක්ෂා කර ගැනීම පිළිබඳ සමාජ ව්‍යාපාර බොහෝමයක් වර්තමානය තුළ සාර්ථක වී තිබෙන්නේ සංස්කෘතික ගෝලීයකරණය මගින් පරිසරවේදීන් බලගැන්වීමත්, සමස්ත සමාජය දැනුම්වත් කිරීම සඳහා අවස්ථාවක් ද ලැබෙන බැවින් ය. ගෝලීයකරණය හේතුවෙන් පාරිසරික වශයෙන් සිදු වන හානිය ඉහළ මට්ටමක පැවතියත්, ජෛව ගෝලය ආරක්ෂා කර ගැනීම පිළිබඳ කතිකාව වඩාත් ප්‍රශස්ත වශයෙන් ව්‍යාප්ත වන්නේ ගෝලීය සන්නිවේදන මාධ්‍යයන් මගින් ය (Shiva, 2005).

ගෝලීයකරණය හේතුවෙන් සංස්කෘතියක පවතින සුවිශේෂී සන්දර්භගතතාව අවම වෙමින්, මානව හිතවාදී සංස්කෘතික ලාක්ෂණිකයන් ව්‍යාප්ත වේ (Held, 2004; Sen, 1999). ඇතැම් සංස්කෘති තුළ සන්දර්භීය වශයෙන් අදාළතාවක් පැවතියත් මානව හිතවාදී නොවන සංස්කෘතික පුරුදු දක්නට ලැබේ. චර්ම ඡේදනය, බිලි දීම, සති පූජාව වැනි සංස්කෘතික චාරිත්‍ර අදාළ සංස්කෘතික සන්දර්භය අනුව අනුමත හා පිළිගත් සමාජ චාරිත්‍ර වුවත් එහි මානව හිතවාදීත්වයක් දක්නට නො ලැබේ. එසේ ද වුවත්, ගෝලීය සංස්කෘතික වින්‍යාස ලෝකය පුරා ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එ වැනි මානව හිතවාදී නොවන සංස්කෘතික පුරුදු අවම වීමක් සිදු වේ. කෙසේ වෙතත්, එ මගින් දීර්ඝ කාලයක් පැවති සංස්කෘතික අනන්‍යතාවලට හානියක් සිදු කරන බව ද අවධානයට ගත යුතු ය.

සංස්කෘතික ගෝලීයකරණය මගින් කලාත්මක රසවින්දනය පිළිබඳ පොදුභාවයක් ද ඇති කරනු ලැබේ. එක් සංස්කෘතියක තිබෙන ඇතැම් කලා උපාංග බොහෝ සංස්කෘති වෙතට ගමන් කළ හැකි ය. මේ හේතුවෙන් රස වින්දනය සම්බන්ධ සමතාවක් බිහි වීමෙන් ගෝලීය ප්‍රජාව අතර පවතින විසමතා අවම වී යයි. සෙන් බුදු සමය ආශ්‍රිත කලා සම්ප්‍රදාය ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබේ. යුරෝපානු සම්භවයක් සහිත කලා සම්ප්‍රදාය ද ලොව පුරා ව්‍යාප්ත වී ඇත. මේ නිසා පුද්ගලයන්ගේ රුචිකත්වයෙහි ද යම් යම් වෙනස්වීම් ඇති විය හැකි ය. රුචිකත්වය වෙනස් වීම යනු පුද්ගලයෙකුගේ සමස්ත චර්යාව කෙරෙහි ම බලපාන තත්ත්වයකි. පුද්ගලයන් තුළ පවතින රුචිකත්වය සමාජ ක්‍රමයත් සමග සම්බන්ධ වීමෙන් ගොඩ නැගෙන දෙයකි. මේ නිසා ගෝලීයකරණය හේතුවෙන් පුද්ගලයාගේ රුචිකත්වය වෙනස්වීම යනු, චින්තන සහ චර්යා පද්ධති ද වෙනස් වීමකි (Bourdieu, 1977, 1990). කලා සම්ප්‍රදාය ලොව පුරා ව්‍යාප්ත වීමත්, පුද්ගල රසවින්දනයේ බහුවිධතාවක් ඇති කිරීමත් යහපත්

ලක්ෂණයන් වුවත්, දේශීය වශයෙන් පැවති කලා සම්ප්‍රදාය විනාශ වීම හෝ ඒවායේ අනන්‍යතාව වෙනස් වීම යහපත් ලක්ෂණයක් වශයෙන් පිළිගත නො හැකි ය. නිදසුන් වශයෙන් ජන සාහිත්‍යය පෙන්වා දිය හැකි ය. ජන ගී සහ ජන කතා සම්ප්‍රදායෙහි ශ්‍රී ලංකාවට සුවිශේෂී වූ ලක්ෂණ පවතින අතර, එකී තත්ත්ව යුරෝපීය හෝ චීන ජන කතා සම්ප්‍රදායට වඩා වෙනස් වේ. එසේ ද වුවත් කලා සම්ප්‍රදායවල සුවිශේෂීත්වය වෙනස් වීම ගෝලීයකරණයෙහි ප්‍රතිඵලයකි. මෙහි පවතින ගැටලුව වන්නේ වෙනස් වන කලා සම්ප්‍රදායවල අනන්‍යතාව වෙනුවට අරෝපණය වන්නේ කුමක් ද යන්න ය. එහි දී යුරෝපීය සම්ප්‍රදායන් දේශීය සම්ප්‍රදාය අභිභවා ව්‍යාප්ත වීම ද ගැටලු සහගත ය (Held, McGrew, Glodblatt, & Perraton, 1999).

සංස්කෘතික ගෝලීයකරණයෙහි ධනාත්මක දිශානතිය මෙන් ම එහි සැඟවුණු නිෂේධනාත්මක තත්ත්වය ද අවධානයට ගෙන ජේම්ස් පෙට්‍රාස් විසින් සංස්කෘතික අධිරාජ්‍යවාදය පිළිබඳ න්‍යාය ඉදිරිපත් කරයි (Petras & Veltmeyer, 2001). මෙය ශ්‍රී ලංකා සමාජය හඳුනා ගැනීමට ද විශේෂයෙන් වැදගත් වෙයි. සංස්කෘතික ගෝලීයකරණයට භාජනය වන පුද්ගලයන් හෝ ශ්‍රාවකයන් සීමිත නොවන අතර, තොරතුරු ව්‍යාප්ත වීමේ ශීඝ්‍රතාව ද ඉහළ මට්ටමක පවතියි. මේ නිසා කැස්ටල්ස් පෙන්වා දෙනු ලබන දැනුම ඇතැම් ප්‍රභූන්ට පමණක් සීමා වීමේ තර්කය (Castells, 2010) පිළිගත නොහැකි ය (Petras & Veltmeyer, 2001). පරිගණකය සහ රූපවාහිනය නිසා දැනුම ඇති සහ දැනුම නැති යැයි සලකනු ලබන සියලු පාර්ශ්ව අඩු වැඩි වශයෙන් ගෝලීය සංස්කෘතියෙහි කොටස්කරුවන් බවට පත් වී ඇත. ස්වච්ඡන්දතාවකින් තොරව ගෝලීය වෙළෙඳ ප්‍රවාහයට පුද්ගලයා සම්බන්ධ වී ඇත. නවීන සමාජය සත්‍යයෙන් ම පාරිභෝගික සමාජ ක්‍රමයකි. පුද්ගලයා සාමාන්‍ය පුද්ගලයෙක් නොවන අතර පැහැදිලිව ම වෙළෙඳපොළ ක්‍රමයක් තුළ ජීවත් වන පාරිභෝගිකයෙකි. මේ නිසා පරිගණකය සහ රූපවාහිනිය භාවිතයෙන් ගෝලීය සංස්කෘතික ආයතන විසින් පාරිභෝගිකයන් ග්‍රහණය කර ගැනීමේ ක්‍රියාවලියක නියුක්ත වෙයි. රසවින්දනය වැනි කරුණු හුදෙක් රසාලිප්ත වාක්‍ය පමණක් වන අතර එහි පිටුපස තිබෙන්නේ වෙළඳ පරාමර්ථයන් ය (Petras & Veltmeyer, 2001).

ප්‍රෙට්‍රාස් තර්ක කරන්නේ ධනවාදී සමාජවල අධිරාජ්‍යවාදී පරමාර්ථ වසා තැබීමේ වඩාත් යෝග්‍ය ම මාධ්‍ය වන්නේ සංස්කෘතිය බව ය. මෙම තර්කය මුල් කාලීන ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය හෙවත් විචාරාත්මක න්‍යාය සම්ප්‍රදායේ කතිකයන් විසින් ද පෙන්වා දී තිබේ (Adorno & Horkheimer, 2002; Marcuse, 1964). එසේ ද වුවත්, පෙට්‍රාස් තර්ක කරන ආකාරයට වර්තමාන සමාජ ක්‍රමය තුළ දැනුමට අධිපති ප්‍රභූන් දක්නට නො ලැබෙන අතර එය නිදහසේ ලෝකය පුරා ව්‍යාප්ත වෙයි. එ නමුත්, පාරිභෝගිකයා නෛසර්ගික වශයෙන් විචාරාත්මක නොවන්නේ නම්, පවතින දැනුම ප්‍රභූ කණ්ඩායමක පැවැත්ම උදෙසා භාවිත කළ හැකි ය. ශ්‍රී ලංකා සමාජය තුළ මෙය තදින් ම දක්නට ලැබේ. සමාජ ස්තරායනය තීව්‍ර වී තිබීමත්, ආදායම් පරතරය ඉහළ මට්ටමක පැවතීමත් හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ දැනුම් පාදක සමාජයකට වඩා පරිභෝජනය පාදක කොටගත් සමාජ ක්‍රමයක් නිර්මාණය වීම සංස්කෘතික ගෝලීයකරණයෙහි ප්‍රධාන ප්‍රතිඵලයක් බවට පත් වී තිබේ.

සංස්කෘතික අධිරාජ්‍යවාදයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතික අනන්‍යතාව හීන වන අතර වෙළෙඳපොළ මිත්‍යාවන් සඟවා තැබීමට ද ජනප්‍රිය සංස්කෘතිය ඉදිරියට පැමිණෙයි. විශේෂයෙන් ම මෙගා වැඩසටහන් වැනි මහා පරිමාණ සංස්කෘතික ක්‍රියාකාරකම් වෙළෙඳපොළ පරමාර්ථ පදනම් කොට ගෙන ක්‍රියාත්මක කරනු ලබන අතර, එහි ග්‍රාහකයන්ට ඒ පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැත. හුදෙක් ම ආවේගාත්මක රසවින්දනයක් පමණක් එයින් ලැබේ. මේ නිසා වෙළෙඳපොළ ක්‍රමය තුළ පැවතිය හැකි නෛසර්ගික දුෂ්ටත්වය වසා තැබීම සඳහා සංස්කෘතිය උපකරණයක් වශයෙන් භාවිත කරයි. ශ්‍රී ලංකාවේ සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය ද මේ ආකාරයෙන් ම වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන සංස්කෘතික අංගයක් බවට පත් කොට ගෙන ඇති බවක් පෙනේ. පුද්ගලයා අවිචාරාත්මකව එකී සංස්කෘතික යථාර්ථවලට ගොදුරු වෙයි. උත්සව සමයවල දී විචාරයකින් තොරව භාණ්ඩ මිල දී ගැනීම සඳහා අධික වියදම් කිරීම වැනි චර්යා ආකෘති බිහි වී තිබෙන්නේ සංස්කෘතික අධිරාජ්‍යවාදයෙහි ප්‍රතිඵල වශයෙනි. මෙහි පවතින ගැටලුව වන්නේ, ශ්‍රී ලංකාව වැනි සමාජයක පවතින ව්‍යුහමය තත්ත්ව

සෙමෙන් වෙනස් වන අවස්ථාවක නව ආකෘති පිළිගැනීමෙහි දී අනපේක්ෂිත අවදානම් සහගත තත්ත්වයක් වර්ධනය විය හැකි බැවින් ය.

සංස්කෘතික ගෝලීයකරණය, ආර්ථික හා දේශපාලනික තත්ත්වවලින් වියුක්තව ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් නොවේ, නිශ්චිත වශයෙන් ම සංස්කෘතික ගෝලීයකරණය අනෙකුත් සමාජ ආර්ථික තත්ත්ව සමග ද සම්බන්ධ වී ඇත. මේ අනුව, ඉහත පෙන්වා දෙන ලද්දේ සංස්කෘතික ගෝලීයකරණය සහ ඒ මගින් ඇති විය හැකි සංස්කෘතික අධිරාජ්‍යවාදී තත්ත්ව ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම් කරන ආකාරය යි. එහි දී ධනාත්මක ප්‍රතිඵල කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කළ අතර, සංස්කෘතික අධිරජ්‍යවාදය සමස්තයක් වශයෙන් තුන්වන ලෝක සමාජ කෙරෙහි නිෂේධනාත්මකව බලපෑම් කරන ආකාරය පෙන්වා දෙනු ලැබිණ.

**4. සංස්කෘතික ගෝලීයකරණයෙහි නිෂේධනාත්මක ප්‍රතිඵල**

ගෝලීයකරණය සර්වසුබවාදී ක්‍රියාවලියක් නොවේ. සංස්කෘතික ගෝලීයකරණය හේතුවෙන් බොහෝ සමාජ ආශ්‍රිතව ව්‍යුහීය වෙනසක් ඉස්මතු වේ. එ පමණක් ද නොව, ව්‍යුහීය වෙනසට සාපේක්ෂ වශයෙන් පුද්ගලයන්ගේ චර්යාව කෙරෙහි එ මගින් ධනාත්මක බලපෑමක් ඇති කරයි. එසේ ද වුවත්, ගෝලීයකරණය හේතුවෙන් දේශීය අනන්‍යතාව හා සම්බන්ධ නිෂේධනාත්මක තත්ත්ව ද ඇති කරයි. ගෝලීයකරණය, බොහෝ දුරට ඌන සංවර්ධිත සමාජ කෙරෙහි සිදු කෙරෙන බලපෑම ප්‍රධාන ය. ගෝලීයකරණ ක්‍රියාවලියෙහි ප්‍රමුඛයන් වන්නේ ධනවාදී සම්භවයක් සහිත යුරෝපීය සමාජ ය. මේ නිසා ගෝලීය පද්ධතිය තුළ තුන්වන ලෝකය විසින් සිදු කළ හැකි බලපෑම සාපේක්ෂව අවම ය. සංස්කෘතික ගෝලීයකරණය හේතුවෙන්, බොහෝ දුරට යුරෝපානු සංස්කෘතිය යුරෝපානු නොවන සමාජ වෙත ගමන් කරන අතර, එය විශ්වීය සංස්කෘතියක් බවට පත් වේ. මෙය දේශීය සම්ප්‍රදායවලට සහ අනන්‍යතාවලට හානිකර ය. බටහිර සම්ප්‍රදාය ශ්‍රී ලංකාවෙහි ද ව්‍යාප්ත වන අතර එ මගින් ආහාර, ඇඳුම් පැළඳුම් සහ විනෝදාස්වාදය ලැබීමේ ආකෘති විශේෂයෙන් වෙනස් වේ. සංස්කෘතිකමය වශයෙන් ඇති වන වෙනස පිළිබඳව මානව කේන්ද්‍රණවාදීව ඇගයීමක් (Estimation) සිදු කළ නො හැකි වුවත්, සන්දර්භයට අනුකූල වූ පුද්ගල චර්යාවට නව සංස්කෘතික අංගයන් නිසා සිදු කෙරෙන බලපෑම පුද්ගල පැවැත්ම කෙරෙහි හානිදායක විය හැකි ය. විශේෂයෙන් ම පාරිසරික නියතිවාදීන් විසින් ප්‍රකාශ කරන පරිදි, සංස්කෘතිය යනු පාරිසරික තත්ත්ව සමාජමය වශයෙන් නිරූපණය කිරීමකි (Ember & Ember, 2015). මේ නිසා පාරිසරික තත්ත්වවලට නො ගැළපෙන සංස්කෘතික තත්ත්ව කිසියම් සමාජ ක්‍රමයක් තුළ ව්‍යාප්ත වීම පුද්ගලයන්ගේ පැවැත්ම කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරයි. නිදසුන් වශයෙන් ආහාර රටාවන්ගේ නව සම්ප්‍රදාය පෙන්වා දිය හැකි ය. ශ්‍රී ලංකාව සර්ම කලාපීය නිවර්තන දේශගුණයක් සහිත සමාජයකි. මේ නිසා ජෛවීය වශයෙන් ඉන්ද්‍රිය පද්ධතිය සකස් වී තිබෙන්නේ ශාඛ ආහාර ජීරණය කිරීම මූලික කොට ගෙන ය. එසේ ද වුවත්, යුරෝපීය ආහාර සම්ප්‍රදායක් වර්ධනය වීමෙන් සිදු වන්නේ ජෛවීය පැවැත්මට හානියක් සිදු වීම ය. මෙහි ව්‍යුත්පන්න ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා සමාජය ඓතිහාසික වශයෙන් අත් නොවිඳි රෝගී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුව ඇත.

ගෝලීයකරණ ක්‍රියාවලිය, ද්‍රව්‍යාත්මක සහ ද්‍රව්‍යාත්මක නොවන සංස්කෘතිය අතර අසමබරතාවක් නිර්මාණය කිරීම කෙරෙහි ද හේතු වේ. කිසියම් සමාජයක පවතින සංස්කෘතිය, සන්දර්භයට අනුකූලව ඓතිහාසිකව නිර්මාණය වූවකි. ද්‍රව්‍යාත්මක නොවන සංස්කෘතිය වශයෙන් පිළිගනු ලබන විශ්වාස, දැනුම් පද්ධති සහ සදාචාර මූලධර්ම කිසියම් සමාජයක් තුළ ඓතිහාසික ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. මේ නිසා ද්‍රව්‍යාත්මක නොවන සංස්කෘතිය ද්‍රව්‍යාත්මක සංස්කෘතියක් ගොඩ නැගීමට මූලික වෙයි. ශ්‍රී ලංකාවේ දේශීය වශයෙන් පැවති කෘෂිකාර්මික උපාය මාර්ග ද්‍රව්‍යාත්මක සහ ද්‍රව්‍යාත්මක නොවන සංස්කෘති අතර සමගාමීත්වයක් සහිතව ගොඩ නැගී තිබේ. කුල ක්‍රමය හා සම්බන්ධ වූ ශ්‍රම විභජන රටාව ද එ වැනි ම සංස්කෘතික තත්ත්ව අනුව සකස් වූවකි. එසේ ද වුවත්, ගෝලීයකරණය හේතුවෙන් ගෝලීය මූලධර්ම ව්‍යාප්ත වීමෙන් දේශීය වශයෙන් පවතින දැනුම් පද්ධතියට හානි සිදු වෙයි. මෙහි ප්‍රතිඵලය වන්නේ, ද්‍රව්‍යාත්මක සහ ද්‍රව්‍යාත්මක නොවන සංස්කෘතිය අතර අසමබරතාවක් ඉස්මතු වීම ය. දුගීභාවය වර්ධනය කිරීම, ජනවාර්ගික අර්බුද වැනි තත්ත්වයන් බොහෝ දුරට වර්තමාන ශ්‍රී

ලංකාව තුළ ඉස්මතු වෙමින් තිබෙන්නේ ගෝලීයකරණය නිසා ඇති වන සංස්කෘතික විපර්යාස හේතුවෙන් ය.

සංස්කෘතික ගෝලීයකරණය, නව යටත්විජිත සම්බන්ධතා නැවත ගොඩ නගන බව ද අයෙක් පෙන්වා දෙති (Frank, 1993; Held, 2004). 20 සියවස අවසන්භාගය වන විට බොහොමයක් යටත් විජිත සමාජයන් ස්වාධිපත්‍ය සහිත ජාතික රාජ්‍ය බවට පත් වුවත්, ගෝලීයකරණය හේතුවෙන් නැවතත් නව යටත් විජිතකරණයකට භාජනය වී සිටියි. විශේෂයෙන් ම යුරෝපය නිෂ්පාදනය කරනු ලබන දැනුම හා තාක්ෂණය මත රඳා පැවතීම, යුරෝපීය ආර්ථික උපාය මාර්ගවල ශාඛා වශයෙන් කටයුතු කිරීමට සිදු වීම වැනි හේතු මත පරාධීනතාව තවදුරටත් වර්ධනය වේ. ජාතික රාජ්‍යයේ ස්වාධීනත්වය ලිහිල් කොට, බටහිර නිෂ්පාදිත ආර්ථික, අධ්‍යාපනික හා සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රවලට යටත්ව කටයුතු කරන බවක් පෙනේ. තුන්වන ලෝකයේ ජාතික රාජ්‍යවලට ප්‍රාග්ධන සංචිත නොමැති වීම, විද්‍යා හා තාක්ෂණික දැනුම අවම වීම වැනි හේතු මේ කෙරෙහි මූලික වී තිබේ. ගෝලීයකරණ ක්‍රියාවලිය මගින් බහුවිධ ඍණාත්මක බලපෑම් ඇති කළත්, එයින් විමුක්ත වීමෙන් තුන්වන ලෝකය කෙරෙහි තව දුරටත් අහිතකර බලපෑම් එල්ල විය හැකි ය. මේ නිසා අහිතකර ප්‍රතිඵල තිබියදී ම ගෝලීය සංස්කෘතික සම්ප්‍රදායට යටත් වන ස්වභාවයක් දක්නට ලැබේ.

සංස්කෘතික අනන්‍යතා හීන කිරීම ද අවාසිදායක ප්‍රතිඵලයකි. සාම්ප්‍රදායික සමාජවල පැවති භූ ගෝලීය හුදෙකලාභාවය සුවිශේෂී වූ සංස්කෘතියක් නිර්මාණය කිරීමට හේතු විය. විශේෂයෙන් ම ශ්‍රී ලංකා සමාජයේ වාරිකර්මාන්තය හා සම්බන්ධ වූ සංස්කෘතිය ශ්‍රී ලංකාවට සුවිශේෂී වූවකි. ඒ සඳහා මෙරට පැවති භූගෝලීය හා දේශගුණික තත්ත්වයන් මෙන් ම, ඓතිහාසික වශයෙන් ගොඩ නගන ලද දැනුම් පද්ධති ද මූලික වූ බවක් පෙනේ (Wittfogel, 1957). පුද්ගලයාගේ ඇගයුම්, බලාපොරොත්තු සහ චින්තන රටා සංස්කෘතිය මගින් මෙහෙයවනු ලැබිණ. සංස්කෘතිය බිහි වූයේ සමාජ පැවැත්ම මූලික කොට ගෙන ය. එසේ ද වුවත්, සංස්කෘතික ගෝලීයකරණය හේතුවෙන් විශ්වීයත්වය ප්‍රමුඛ වන අතර සුවිශේෂීත්වය බැහැර කරයි (Parsons, 1937). මේ නිසි අනන්‍යතාවක් සහිත දේශීය සංස්කෘතියට ඍජු බලපෑමක් සිදු කළ හැකි අතර, සංස්කෘතිය පිළිබඳව පුද්ගලයා තුළ පවතින විශ්වාසය ද හීන විය හැකි ය. ස්වකීය සංස්කෘතිය පිළිබඳව පවතින විශ්වාසය අවම වූ අවස්ථාවක් තුළ ජාතික රාජ්‍යවල මානව සම්පත් ඵලදායීතාව හීන වන බවක් ද පෙන්නුම් කරයි. බොහෝ දුරට බුද්ධි ගලනය ද සංස්කෘතික ගෝලීයකරණයෙහි අයහපත් ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය හැකි ය.

ගෝලීයකරණය මගින් උනන්දු කරන්නේ ආර්ථික සහ භෞතික සංවර්ධනය යි. මුල් කාලීන යුරෝපානු ආභාසය ලැබීම හේතුවෙන් ගෝලීයකරණය, ආර්ථික සහ භෞතික වර්ධනය උනන්දු කරවනු ලැබිණ. ගෝලීය වශයෙන් සහසම්බන්ධතාවන් වර්ධනය කර ගැනීමේ ප්‍රමුඛාර්ථය වූයේ ද ආර්ථික සංවර්ධනය යි. ලෝක බැංකුව වැනි ගෝලීය ආයතන බිහි කිරීමේ ප්‍රධාන අභිමතාර්ථය වූයේ ද ගෝලීය වශයෙන් සමෘද්ධියක් වර්ධනය කිරීම ය. එහි දී බටහිර සමාජවල පැවති භෞතික වර්ධනය පිළිබඳ ඇගයුම් ඌන සංවර්ධිත රටවලට විසරණය කරනු ලැබිණ. මෙහි යම්කිසි ප්‍රගතිගාමී තත්ත්වයක් ද පවතියි. විශේෂයෙන් ම පසුගාමී සමාජයන් ඉදිරිගාමී කිරීම සඳහා උක්ත දෘෂ්ටිය සහ ඇගයුම් පද්ධතිය කිසියම් බලපෑමක් සිදු කරන ලදි. මෙයට සාපේක්ෂ වශයෙන් ශ්‍රී ලංකාව වැනි දීර්ඝ ඉතිහාසයක් සහිත සමාජවල පැවති ආධ්‍යාත්මික ඇගයුම් පද්ධතියට හානි සිදු වීම සංස්කෘතික ගෝලීයකරණයෙහි අයෝග්‍ය ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය හැකි ය. විශේෂයෙන් ම සමාජ සම්බන්ධතා, වැඩිහිටියන් රැක බලා ගැනීම, ශක්තිමත් පවුල් සම්බන්ධතා, පොදු හැඟීම වැනි සංස්කෘතික ඇගයීම් හීන වීම පුද්ගල චර්යා කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරයි. පෞද්ගලිකත්වය වර්ධනය වීම ද මේ කෙරෙහි මුල් වී තිබේ. එවැනි ප්‍රතිමානයන් දේශීය සංස්කෘතික සන්දර්භයට අනුකූල වන බවක් නො පෙනේ.

මේ අනුව, සංස්කෘතික ගෝලීයකරණය හුදෙක් සුබවාදී ක්‍රියාවලියක් වශයෙන් පමණක් සැලකිය නො හැකි බව පෙනේ. සංස්කෘතික ගෝලීයකරණය ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින සමාජවල දේශීය සංස්කෘතිය කෙරෙහි පුළුල් ඍණාත්මක බලපෑමක් ඇති කරයි. මේ පිළිබඳ විග්‍රහයක් ඉහත ඉදිරිපත් කරනු ලැබිණ.

**නිගමනය**

ලෝක සමාජ ජාතික රාජ්‍යයේ දේශ සීමාව අභිබවා එක ම ජාලයක් යටතේ සංවිධානය වීම ගෝලීයකරණය යනුවෙන් හඳුන්වනු ලැබේ. 20 වන සියවස අගභාගයෙහි ගෝලීය වශයෙන් ඉස්මතු වූ අර්බුද අවම කිරීම කෙරෙහි ඇමරිකාව ප්‍රමුඛ ධනවාදී රටවල් විසින් හඳුන්වා දෙන ලද දේශපාලන සහ ආර්ථික ප්‍රතිපත්ති පදනම් කොට ගෙන ගෝලීයකරණ ක්‍රියාවලිය බිහි වේ. කිසිදු සමාජයකට හුදෙකලාව සංවර්ධනය විය නො හැකි බවත් ඒ සඳහා අන්තර්ජාතික සහයෝගය අවශ්‍ය බවත් අවධාරණය කරන ලදි. ප්‍රාග්ධනය ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම ධනවාදී රටවල් විසින් ද උනන්දු කරවනු ලැබිණ. මේ නිසා ගෝලීයකරණය යනු දේශපාලන, ආර්ථික සහ සමාජ සංස්කෘතික වශයෙන් ව්‍යාප්ත වූ සංකීර්ණ ක්‍රියාවලියකි. ගෝලීයකරණය මගින් අන්තර්ජාතික සහයෝගීතාව ඉස්මතු කරන අතර එ මගින් අන්තර්පරායත්තතාවක් ද වර්ධනය කරයි. කෙසේ වෙතත්, සංවර්ධිත රටවලට සාපේක්ෂව සංවර්ධනය වෙමින් පවතින රටවලට ගෝලීයකරණය නිසා සිදු වන බලපෑම වඩා ප්‍රබල වූවක් බව ද ඇතැම් සමාජවිද්‍යාඥයන් විසින් පෙන්වා දී තිබේ. ගෝලීයකරණ ක්‍රියාවලිය විවිධ විද්වතුන් බහුවිධ ආකාරයෙන් නිර්වචනය කරනු ලබන අතර ඒ අතර සමානතාවක් ද දක්නට නො ලැබෙන බව ඉහත පෙන්වා දෙන ලදි.

ගෝලීයකරණයෙහි බහුවිධ ස්වභාවය පැවතියත්, පුද්ගල ජන ජීවිතය කෙරෙහි ඍජුව ම බලපෑම් කිරීමට සංස්කෘතික ගෝලීයකරණය හේතු වේ. සංස්කෘතික තත්ත්ව ආශ්‍රයෙන් ලෝක සමාජවල ජාලගත සම්බන්ධයක් වර්ධනය වීම සංස්කෘතික ගෝලීයකරණයෙහි මූලික ලක්ෂණයකි. සංස්කෘතික ගෝලීයකරණය, සමාජ සංවර්ධනයෙහි දී ධනාත්මක වශයෙන් බලපෑම් කරනු ලබන අතර, එයින් බොහෝ වාසි සහගත ප්‍රතිඵල ද ඉස්මතු වේ. විශේෂයෙන් ම විශ්වීය ඥානය ලෝකය පුරා ව්‍යාප්ත වීම, තොරතුරු තාක්ෂණය මගින් සංස්කෘති අතර පවතින විසමතා අවම කිරීම, ගෝලීය සමාජ අතර පැවති විසමතා අවම කිරීම, සුළුතර ප්‍රජාව බලගැන්වීම, මානව හිතවාදී සංස්කෘතික සම්ප්‍රදායන් ව්‍යාප්ත වීම මගින් අහිතකර සංස්කෘතික පුරුදු ඉවත් වී යාම වැනි බොහෝ යහපත් ප්‍රතිඵල සංස්කෘතික ගෝලීයකරණය මගින් ඇති කරනු ලැබේ.

එසේ ද වුවත්, සංස්කෘතික ගෝලීයකරණය පදනම් කරගත් අධිරාජ්‍යවාදයක් ස්ථාපනය වීම ද නො වැළැක්විය හැකි ප්‍රතිඵලයකි. සංස්කෘතික සමාජාතීයකරණය, ගෝලීයකරණයෙහි ප්‍රධාන ප්‍රතිඵලයකි. සියලු රටවල් ඒකීය සංස්කෘතික සම්ප්‍රදායක් යටතේ සංවිධානය වීම මෙහි දී සිදු වේ. එසේ ද වුවත්, මෙයින් සිදු වන්නේ පෙර පැවති යටත්විජිත සම්බන්ධතාවන් නව ආකාරයකින් ඉස්මතු වී නැවතත් ක්‍රියාත්මක වීම ය. ගෝලීය ධනවාදී වෙළෙඳපොළ තුළ පවතින දුෂ්ටත්වය සඟවා, පාරිභෝගික සමාජ ක්‍රමයක් තුළ ජීවත් වන පාරිභෝගිකයන් පාලනය කිරීම මගින් මෙකී අධිරාජ්‍යවාදය පවත්වා ගෙන යයි. ශ්‍රී ලංකාව ඇතුළු බොහෝමයක් දියුණු වෙමින් පවතින රටවලට නෛසර්ගික ප්‍රාග්ධන හැකියාවක් නොමැති බැවින්, නියත වශයෙන් ම දියුණු රටවල් මත රඳා පැවතීමට සිදු වේ. මේ සඳහා සංස්කෘතික නිෂ්පාදනයන් භාවිත කරනු ලබයි. අද්‍යතන සමාජ අවකාශය තුළ ලාභය උපරිම කිරීමේ ප්‍රධාන මාධ්‍යයක් ලෙස ද සංස්කෘතිය හඳුනා ගනු ලැබේ.

ගෝලීය වශයෙන් සංස්කෘතික සමාජාතීයකරණයක් සිදු වීම දේශීය සංස්කෘතික අනන්‍යතාව කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති කරයි. ගෝලීයකරණය යන නමින් බටහිරකරණයක් හෙවත් බටහිර නොවන සමාජයන් බටහිර ඇගයුම් පද්ධතියකට අනුගත කිරීමක් සිදු කෙරෙන බව ද ඇතැම් සමාජීය විද්‍යාඥයන් විසින් පෙන්වා දී තිබේ. විශේෂයෙන් ම ද්‍රව්‍යාත්මක සහ ද්‍රව්‍යාත්මක නොවන සංස්කෘති අතර අසමබරතාවක් ඇති කිරීමට ද ගෝලීයකරණය හේතු වෙයි. නව යටත්විජිත පාලන ක්‍රමයක් නැවතත් ස්ථාපනය වීමට ද මෙයින් කිසියම් බලපෑමක් එල්ල වේ. ආර්ථික සහ භෞතික අභිවෘද්ධිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම කෙරෙහි ගෝලීයකරණය මගින් උනන්දුවක් ඇති කරවන බැවින්, අවසාන විග්‍රහයෙහි දී ආධ්‍යාත්මික ඇගයුම්වලට හානි පැමිණවීම ද යෝග්‍ය තත්ත්ව වශයෙන් සැලකිය නො හැකි ය. එ මෙන් ම, දේශීය වශයෙන් පැවති සංස්කෘතික ලක්ෂණ සහ සංස්කෘතික අනන්‍යතාලට හානි සිදු වීම ද ගෝලීයකරණයෙහි අයහපත් ප්‍රතිඵලයක් වශයෙන් පෙන්වා දිය හැකි ය.

> The polar opposite of globalization would be persistent separatism and relentless autarky. It is interesting here to recollect the images of seclusion that was invoked with much anxiety in many old Sanskrit texts in India……This is the story of well frog- the kupamanduka- which lives its whole life within a well and is suspicious of everything outside it….The well frog has a world view that is entirely confined to that well. The scientific, cultural and economic history of the world would have been very limited had we lived like well frogs (Sen, 2002, p. 12).

නොබෙල් ත්‍යාගලාභී ඉන්දීය විද්වතෙකු වන අමර්ත්‍ය කුමාර් සෙන් පවසන ආකාරයට, ගෝලීයකරණය අනවරත ක්‍රියාවලියකි. ගෝලීයකරණයට විරුද්ධ වීම හෝ ප්‍රතික්ෂේප කිරීම යෝග්‍ය නොවේ. ගෝලීයකරණයට ප්‍රතිවිරුද්ධ වීම මගින් බෙදුම්වාදය ශක්තිමත් කළ හැකි අතර හුදෙක් ම නිර්දය ආර්ථික වර්ධනයක් වෙත ද අවධානය යොමු විය හැකි ය. එය සමබර සංවර්ධනයක් නොවේ. ගෝලීයකරණය නොවූ පුද්ගලයා ළිං මැඬියෙකු වැනි යැයි අමර්ත්‍යා සෙන් පූර්ව සංස්කෘත උපහැරණ දක්වමින් පෙන්වා දෙයි. එහි තිබෙන සුවිශේෂත්වය වන්නේ හුදෙක් ම පුද්ගලයා තමා ජීවත් වන කුඩා අවකාශය සත්‍ය යැයි විශ්වාස කරමින් ජීවත් වීමත්, සංවර්ධනය වූ ලෝක ආර්ථික, සෞඛ්‍ය, සමාජ සහ සංස්කෘතික තත්ත්ව පිළිබඳ අවධානය යොමු නො කිරීමත් ය. එය ගෝලීය සමාජයේ සත්‍ය හුදෙකලාභාවයකි. ගෝලීය පුද්ගලයා හුදෙකලාභාවය ප්‍රතික්ෂේප කරන අතර වර්ධනය වෙමින් පවතින ලෝක ප්‍රවණතා සමග ඉදිරියට ගමන් කිරීමට අපේක්ෂා කරයි. ගෝලීයකරණය සම්පූර්ණයෙන් ම නිෂේධනාත්මක ක්‍රියාවලියක් නොවන අතර, එහි ප්‍රතිජානාත්මක තත්ත්ව ද දැකිය හැකි ය. වර්තමාන ගෝලීය සමාජ අවකාශය තුළ ගෝලීයකරණ ක්‍රියාවලියෙහි බලපෑම සියලු සමාජ වෙත ම ව්‍යාප්ත වී ඇති බැවින් ඒ පිළිබඳ සවිඥානික වීම සියලු ජාතික රාජ්‍යවල මෙන් ම පුද්ගලයාගේ ද ප්‍රමුඛ පෙළ වගකීමක් බවට පත් වී ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ

Adorno, T., & Horkheimer, M. (2002). *The Dialect of Enlightenment* (E. Jephcott, Trans. G. S. Noerr Ed.). Stanford, CA: Stanford University Press.

Beck, U. (1992). *Risk Society: Towards a new modernity*. London: Sage.

Beck, U., Giddens, A., & Lash, S. (1994). *Reflexive Modernization: Politics, Tradition and Aesthetics in the Modern Social Order*. Stanford: Stanford University Press.

Bourdieu, P. (1977). *Outline of a theory of Practice*. Cambridge: University Press.

Bourdieu, P. (1990). *The Logic of Practice*. Lodon: Polity Press.

Castells, M. (2000). *The Rise of Network Society, The information age: economy, society and culture*. Cambridge (MA): Blackwell.

Castells, M. (2010). *End of Millennium*. Cambridge (MA): Balckwell Publishers.

Desai, V., & Potter, R. B. (2011). *The Companion to Development*. London: Hodder Education.

Dillon, M. (2014). *Introduction to Social Theory*. UK: Wiley Blackwell.

Durkheim, E. (1895). *The Rules of Sociological Method* (W. D. Halls, Trans. S. Lukes Ed.). New York: Free Press.

Eckes, A., & Zeiler, T. (2003). *Globalization and the American Century*. New York: Cambridge University Press.

Elliott, A., & Lemert, C. (2014). *Introducton to Contemporary Social Theory*. New York: Routledge.

Ember, C. R., & Ember, M. (2015). *Cultural Anthropology*. Boston: Pearson.

Fortes, M., & Pritchard, E. E. E. (1940). *African Political Systems*. New York: Oxford University Press.

Frank, A. G. (1993). The World System. London: Routledge.

Fuchs, C. (2008). *Internet and Society: Social Theory in the Information Age*. New York: Routledge.

Giddens, A. (1984). *The Constitution of Society*. Cambridge: Polity Press.

Giddens, A. (1991a). *The Consequences of Modernity*. Cambridge: Polity Press.

Giddens, A. (1991b). *Modernity and Self-Identity: Self and Society in the Late Modern Age*. Stanford, CA: Stanford University Press.

Giddens, A. (2003). *Runaway World: How Globalization is Reshaping our Lives*. New York: Routledge.

Gross, C. (2008). 'A measure of fairness: an investigative framework to explore perceptions of fairness and justice in a real-life social conflict. *Human Ecology Review, 15*(2), 130-140.

Gross, C. (2010). *Water under the bridge: fairness and justice in environmental decision-making.* (Doctor of Philosophy), The Australian National University, Canberra. Retrieved from http://dspace-prod1.anu.edu.au/handle/1885/49419

Habermas, J. (1975). *Legitimation Crisis*. Cambridge: Polity.

Harvey, D. (2007). *A Brief History of Neoliberalism*. Oxford: University Press.

Held, D. (2004). *Global Covenant: The Social Democratic Alternatives to the Washington Consensus*. Cambridge: Polity Press.

Held, D., McGrew, A., Glodblatt, D., & Perraton, J. (1999). *Global Transformation: Politics, Economic and and Culture*. Cambridge: Polity Press.

Luckman, T. (1978). *Phenomenology and Sociology*. England: Penguin Books.

Luxemburg, R. (1951). *The Accumulation of Capital* (A. Schwarzschild, Trans. W. Stark Ed.). London: Routledge and Kegan Paul.

Mann, M. (1997). Has globalization ended the rise of the nation-state ? *Review of International Political Economy, 4*(3), 472 - 496.

Marcuse, H. (1964). *One-Dimension Man: Studies in the Ideology of Advanced Industrial Society*. Boston Beacon Press.

Marx, K., & Engels, F. (1967). The Communist Manifesto *Karl Marx : Collection of Writing*. London: Penguin.

Mayo, M. (2005). *Global Citizens: Social Movements and the Challange of Globalization*. London: Zed Books.

Parsons, T. (1937). *The Structure of Social Action*. New York: Free Press.

Parsons, T. (1971). *The System of Modern Societies*. NJ: Prentice Hall.

Petras, J., & Veltmeyer, H. (2001). *Globalization Unmasked*. Noâ Soctia: Fernwood.

Sen, A. (1999). *Development As Freedom*. Oxford: University Press.

Sennett, R. (1998). *The Corrosion of Character: The personal consequences of work in the new capitalism*. New York: Norton.

Sennett, R. (2006). *The Culture of New Capitalism*. New Heaven (CT): Yale University Press.

Shiva, V. (1991). *Ecology and the Politics of Survival: Conflicts over natural Resources in India*. New Delhi: Sage.

Shiva, V. (2005). *Earth Democracy*. London: Zed Books.

Stiglitz, J. (2002). *Globalization and its Discontents*. New York: WW Norton & Company.

Stiglitz, J. (2004). Capital market liberalization, Globalization and the IMF. *Oxford Review of Economic Policy, 20*(1), 57 - 71.

Tylor, E. B. (1958). *Primitive Culture*. New York: Harper.

Weber, M. (1949). *The Methodology of the Social Sciences* (E. A. Shils & H. A. Finch, Trans. E. A. Shils & H. A. Finch Eds.). New York: Free Press.

Wittfogel, K. A. (1957). *Oriental Despotism : A Comparative Study of Total Power*. New Tork: Random House.

ආඛ්‍යාන narrations
**Volume 06 | Issue 01 | January - June 2021 | Article 03**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

# Community Studies - An analysis in the identification of the marginalised communities, and the need for equitable treatment

M.S.M. Hussain[3]
msmhuss@gmail.com
Mohamed Aslam[4]
H.J. De Costa[5]

## Abstract

This research **focused** on the study in analysing definitions for the term 'marginalised communities and to distinguish and identify, persons, fallen into "marginalised communities" as a whole all the time permanently, and some person or persons not within the "marginalised communities", but fallen into isolation and remaining temporarily or permanently due to inability in seeking justice. Analysing the literature in brief advocates for the necessity of defining "MC" broadly to include both the permanent and temporarily marginalised persons, in consideration of taking measures in the advancement of the position of both categories. This empirical study is on descriptive research design applying a qualitative **method** and deductive design grounded on the existing definitions founded on the source of secondary data and examining subject-related documents, books, published research papers, websites including the legal provisions and case law mainly in Sri Lanka and in the foreign jurisdictions, and invoking a content analysis to test the value of the prevailing definitions and understanding. As a **result, and discussion**, it categorised marginalisation as permanent and temporary for future programmes. In **conclusion**, it is emphasised that all the organs of the government and other fields such as sociology and political science, that in explaining defining or identifying the persons of "Marginalised Community", without restricting only the people who are as a whole and all the time or long time being marginalised, it is for them to add to the end of the text, "including the person or persons fallen once or from time to time marginalised due to whatever the reasons, conditions, or process, in a given situation." Further, in the advancement of the position, there must be the employment of the legal norms as permanent measures as well as temporary measures. More, this paper **concludes** the need for legal research based on the sociological base to find alternatives to remove the barriers by temporary marginalisation, and it

---

[3] President's Counsel, Corresponding and Main author

[4] Professor, Department of Tourism Management at the Sabaragamuwa University of Sri Lanka

[5] President Counsel, former Principal of the Sri Lanka Law College

**suggests** comprehensive research on the advancement of the effective enjoyment of rights of the temporary marginalised community persons while insisting on the need of legislative measures for the advancement of the persons or communities of both type of marginalised communities, by using foreign experience as in Kenya.

**Keywords:** Marginalised Community, Equality, Equity, Constitution

# Introduction

"*Injustice anywhere is a threat to justice everywhere*"

- King, Martin Luther Jr., 16th April 1963,

Community of people were living as different groups or communities due to historical factors and would have got strengthen their grouping on the practical base of the religion and/ or similarities in the custom or culture including on the reason being in the neighbourhood, until the development into the avenue of urbanisation where the people belonging into various communities got mixed up with and led to live either as able people or advantageous people or as a community of people with a variety of inabilities or disadvantageous due to various factors, compared with the majority communities and resulting as found gone to the edge of the mainstream and appeared as marginalised. In this paper, it is argued that the changing pattern is not the only marginalisation of a particular community that prevailed permanently, but also some times a person or persons may become marginalised temporarily due to the reasons of barriers in access to the law and justice in a practical sense. This may be sometimes due to insufficient legal provisions of law to protect the rights of such persons, and consequently, even a single person may become marginalised for a short or long period, and he has to be treated as a member in a 'marginalised community.'

Thus, community studies are understood as an academic stream focused on research on sociology and anthropology in wider scope which has a link with access to justice. The purpose of Community Studies is to find ways and means to support each other and share the experiences with finding in identifications, life struggles with causes for the struggles, because of finding solutions for their advancement into the mainstream of better lifestyle and enjoying legally recognised rights. The community studies may be on their existing isolated country life or even it may be within the urban, suburbs, slums, shelters, or dowelling houses. It may be based on individual studies as well as group studies, with the object of contributing to this particular field as well as in building theory and methods in sociological studies as done globally (Bell, 1971).

In the community studies it is expected to obtain answers to questions about how a specific matter in the society works, which may be taken to develop an understanding of the larger how of social systems in general (Stacey, Margaret, 1969), and further, as Stacey says,

"In a community study it should be to focus answers (a) are there propositions that

> can be tested in this context selected for the analysis, (b) is it a stream that can be tested in a particular discussion, is it a context in which one can explore for hypotheses and if it is so, of what kind and (c) is this a particular aspect of society the workings of which it is reasonable or even possible to isolate to examine the 'how' questions. In a complex society the crisis of community studies answer 'no' to the last question but if they are right to question (a) and (b) has no value. So, (c) is the point of departure" (p.134).

Therefore, in understanding this guideline in finding the point of departure, it is quite clear that the existing propositions on 'marginalised community' alone cannot find solutions for the issues of the communities when he or they are fallen into different categories even temporarily. Thus, this is the point of departure, because such definition has fallen short (Summers, 2001; Robinson et al., 2011) and thus, it has excluded a category of a community person or persons who fall into marginalisation, which may be due to affirmative action by the government.

Thus, the objective of this article is to critically analyse and distinguish, the person, fallen into a "marginalised community" as a whole all the time or long time permanently, and also the person or persons brought or fallen into isolation from time to time, and focusing necessity for further studies for finding the type of treatments that they are in need. Accordingly, the key objectives of the study are to identify the persons of "Marginalised Community" people who are as a whole all the time or long time has fallen into marginalisation, and a person once or from time to time becoming marginalised due to whatever the reason, and also to ascertain the type of treatment that they are in need through the legal process.

This article will attempt to seek possible explanations for the above-mentioned key objectives, through a mixed reference to legal, sociological, and political apparatus, in proposing improvement of their conditions, and also suggestions for policy changes and further research.

**Literature Review**

There is very rare literature available on the study of MC in Sri Lanka except for the availability of the considerable number of pieces of literature on the Indigenous community studies who are also fallen into the category of the MC (UNO, Department of Economic and Social Affairs Indigenous Peoples, Aug. 2021). Even though there are some pieces of literature found globally argued to look into the grievances of the MC, including the UNO and other world organisations temporarily or a sudden marginalisation, there is no sufficient discussion has taken place among the researchers as well policymakers in deliberation.

The term “Marginalised Communities”, have been used in many types of research (Brutschy & Zachary, 2014) and such persons have been used in other descriptions such as “oppressed populations”, “vulnerable populations”, “underrepresented populations”, or “undercounted populations”, in community indicator projects and peer-to-peer research (Brutschy & Zachary, 2014). In identifying persons as “Marginalized Community” (MC) in major studies advocate considering the sample size and measurements such as the purpose, conditions, or factors including geographical and economic matters in the inclusion (Minnesota Psychological Association. [n.d.]).

Individual Scholars (Minnesota Psychological Association, [n.d.]) and world funding projects used the term “Marginalized Communities” in their object of the research without considering factors such as social, economic, cultural, environmental, finance and funding affairs or self-confinement (Peter Leonard, [n.d.]; Nathaniel Granger, April 05, 2013). He says,

> “The marginal man … is one whom fate has condemned to live in two societies and in two, not merely different but antagonistic cultures…. his mind is the crucible in which two different and refractory cultures may be said to melt and, either wholly or in part, fuse.”

Accordingly, it is on the assumption that fate has forced the man into marginalisation from one society into the other. However, it is evident in practice the method that they used to define ‘MC’ cannot be accepted summarily for any type of study in specific objects, and it has to be done prudentially as said by the Chief justice of India Krishnaiyer, in the case of *Mumbai Kamgar Sabha, Bombay v. M/S Abdulbhai Faizullabhai & Ors,* 1976) considering the position of the welfare of the working classes.

Sakseena (2014) defines ‘MC’ as “(O)vert actions or tendencies of human societies, where people who they perceive to undesirable or without useful function, are excluded, i.e., marginalized” and says, the definitions are “slippery and multi-layered perception”. Peter Leonard, (1984, p.180 as cited in Sakseena, 2014) defines social marginality as 'being outside the mainstream of productive activity and/or social reproductive activity'.

According to the available evidence, there are many persons have been listed as persons to be treated as a marginalized community members (UNO, 2019; Pannilage, 2015; Heaney et al., 2011; Juarez & Brown, 2008; Jen Couch, & Steve Francis,2006;

James, 1990; Yash & Cottrell, 2020). This variety of persons has been arranged in the table given under the subheading 4.2.1 below.

Though, even though there are several types of research found defining or explaining who the persons of ‘MC’, no research has attempted to define, the persons who have become marginalised community persons due to difficulties in access to court seeking justice through third parties without their participation. For example, Niupouen (2005) on ‘Access to justice for the poor and role for bar associations’, has studied the community only. WJP (2019) on “Measuring the justice gap - A people-centered assessment of unmet justice needs around the world”, done detailed research in finding the justice gap using the population of 228 countries using the people as the unit of analysis, and concluded that (at p.13 citing Sandefur & Rebecca 2008), still people are facing barriers to meeting legal needs. In the study of Achariya (2018) on “Including the excluded: Marginalised poor communities and development practices in rural Nepal” and Daniel (2019) in his work on “Access to what? Legal Agency and Access to Justice for Indigenous Peoples in Latin America” called for a community-based legal system to secure the benefit for legal agencies indigenous and other disadvantaged groups. Mizanie et al. (2017) in their article on “Advancing Access to Justice for the Poor and Vulnerable through Legal Clinics in Ethiopia: Constraints and Opportunities” criticised the provision of law. Twaib (2017) in his thesis worked on, Legal empowerment of the poor: Access to justice and rule of law. Shahar (2016) studied “paradoxically, access justice often benefits various leaders while paid for directly by taxpayers and indirectly by weaker groups” focussing on consumer interest. Pannilage (2015) on the title of, “Excluding the Worthy: The Need of Marginalized Groups in the Decision-Making Process” say, “governance is working to the process of decision making and the process of implementing or not implementing those decisions, without giving attention to the litigations on behalf of the MC rights. Sakseena (2014) in the article titled, Problems of Marginalized Groups in India, has explained the definition, meaning of the word marginalization, and historical base under the context of India and explain certain sections of the society that have faced marginalization and discrimination.

Heaney et al. (2011) in the article titled “Use of Community-Owned and -Managed Research to Assess the Vulnerability of Water and Sewer Services in Marginalized and Underserved Environmental Justice Communities”, deals on the matters as described in the heading only. Ghai & Cottrell (2010) discussing on “Access to land and justice, The Movement of landless rural workers in Brazil and their struggles

for access to law and justice, access to justice and indigenous communities in Latin America, seeking justice for the historical claims of indigenous people in Aotearoa New Zealand including about access to justice in Kenya, Central and Eastern Europe, Pakistan, China. J

Juarez & Brown (2008) in the article titled "Extracting or Empowering? A Critique of Participatory Methods for Marginalized Populations" has dealt with citizen participation in landscape architectural work. Jen & Francis (2006) in their work titled "Participation for All? Searching for Marginalized Voices: The Case for Including Refugee Young People Children, Youth, and Environments," on the problems of refugees, children youth on environmental matters. Schetzer & Henderson (2003) in their article titled "Access to justice and legal needs, a project to identify legal needs, pathways, and barriers for disadvantaged people in NSW try to identify how are MC and suggest reforms. Schetzer et al. (2002) in their article on "Access to Justice & Legal Needs A project to identify legal needs, pathways and barriers for MC people in NSW" studied the problem of delays in litigation and cost of cases. Twaib, (2017) in his article titled "Legal empowerment of the poor: access to justice and rule of law" suggested law reforms in this area for alternative mechanisms.

However Indian jurists and judges have made some attempts to define marginalized persons without a complete list but the limited scope of application into fundamental rights only (Baxi, 1980; Bhagwati, 1984–85; KrishnaIyer, 1985). In advancing this concept, Rajora (2015) advocates by the article on Public Interest Litigation, Social Action Litigation & Private attorneys at law promoted to have a tool of private attorney-at-law to conceptualise the Public Interest Litigations. Justice Bhagwatie *in Bandhua Mukti Morcha v. Union of India* (1984) conceptualised a new approach for the third party to stand up certain person fallen to the marginalisation as,

> "When a person or class of persons to whom the legal injury is caused by violation of a fundamental right is unable to approach the Court…".

This is evidence that in practice some people become marginalised temporarily.

According to the existing evidence, there is a point of departure as to conducting a research project in finding a definition or a description adjacent to the term MC in categorising and also in defining persons who seek justice in the court of law on behalf of certain persons who are unable to do by themselves. However, by this article, it can

be explained that the concept used as marginalised population is not accurate, and it needs to understand in another precept too with a study following an appropriate methodology.

## Methodology

In that object, a systematic literature review was carried out through the documents available in the world jurisdiction in general in identifying and defining the persons said fallen as "Marginalised Communities" ('MC'), all the times, and some case law in Sri Lanka and India in brief about access to justice by them. Further, an attempt was made to compare a sample provision in the constitution of other countries and their experience which suggests the advancement of 'MC' but has been disregarded in Sri Lanka. In this instance, the important consideration is to assess factor-oriented research on a single variable. It is important to note that descriptive research brings better results in identifying practical problems of any investigation or case study in analysing the existing theories or definitions (Hancock et al., 2009; Bickman & Rog, 2009, pp.3-43; Bickman & Rog (Eds.); Merriam, 2009, p.13; Parkinson & Drislane, 2011). Thus, exploratory qualitative case study research design adopting systematic documentary review method for content analysis (Stemler, 2001; Harten, 2012; Maryam, 2008, pp.34-42) on the given propositions of the study based on the interpretivism (Anol, 2012, p.103) have been adopted for the conceptualisation.

Therefore, to meet the object, the performance of the results and discussion on the research findings are provided in the following section.

## Results and Discussion

Thus, the discussion in achieving the results of this paper is done, on the background of the key objectives mentioned above.

### Identification of the persons of 'Marginalised Community' (MC):

As a result, it is clear that in case of inclusion or exclusion of a person into the category of MC depends on the purpose of the study or examination (Heritage Bulletin, April 2018). Marginalisation specifies that both a process, and a condition, that prevents individuals or groups from full participation in social, economic, and political life (Defining marginalized: DFID's leave no one behind agenda-2017- Department for International Development of the UK), and this paper argues that it should be added

'including access to justice' as seen in categorising them in their nature of prevalence and continuation as permanent or temporary.

There are two categories of people who can be identified as persons of MC within the object of this article. Category 'A' is, group of persons fallen into, as a whole all the time or long time, and the category 'B' is, persons, become marginalised once or from time to time.

In considering a necessity of categorising as two groups, under the Category 'A' people are taken as persons fallen into as a whole in the group, all the time or long time. The reason for marginalisation has been studied by many scholars for their respective objects of the projects as mentioned above.

Accordingly, in identifying the first category, on the line of the definition given by the Cambridge Dictionary 'marginalized community' is 'to treat someone or something as if they are not important,' while the Dictionary com defines it as, 'to place in a position of marginal importance, influence, or power:' However the Oxford Lexico Dictionary defines as, "of a person, group, or concept treated as insignificant or peripheral." Danaher et al. (2013, p.52) in 'Researching Education with Marginalized Communities, say,

> 'More broadly, it is clear from the published literature that no single research method is inherently more or less likely to prove to be effective, efficient and ethical when mobilized with members of a particular marginalized community'.

As far as the UNO, 2019, under the title, The Rule of Law refers to access to justice for all, while 'Inability and Young African Leaders Initiative [YALI], 2021) refers to MC as,

> "Inability may be due to social, political and economic factors because of unequal power relationships across economic, political, social and cultural dimensions".

සිලෝ විරිත් යනුවෙන් හඳුන්වන්නේ **ම, න, බ, ය, ජ, ර, ස** සහ **ත** යන ගණ අට සහ ලඝු - ගුරු වර්ණ විවිධාකාරයෙන් සංයෝජනය වී සැකසෙන වර්ණ ඡන්දසට අයත් විරිත් සම්ප්‍රදාය වේ (සම්පත්, 2015). අඩංගු අක්ෂර සංඛ්‍යාව අනුව නාට්‍යශාස්ත්‍රකරු උක්ත, අත්‍යුක්ත, මධ්‍ය, ප්‍රතිෂ්ඨා, සුප්‍රතිෂ්ඨා, ගායත්‍රී, උෂ්ණික්, අනුෂ්ටුප්, බෘහති, පඞ්ක්ති, ත්‍රිෂ්ටුප්, ජගතී, අතිජගතී, ශක්වරී, අතිශක්වරී, අෂ්ටි, අත්‍යෂ්ටි, ධෘති, අතිධෘති, කෘති, ප්‍රකෘති, ආකෘති, විකෘති, සංකෘති, අතිකෘති, උත්කෘති ආදි ලෙසින් ඡන්දස් 26 ක් පෙළගස්වා තිබේ (මාරසිංහ, 2005). පසන් ගායන ප්‍රබන්ධ ලක්ෂණ විමසීමේ දී  නාට්‍යශාස්ත්‍රයෙහි ඇතුළත් ඡන්දස් ලක්ෂණ රැසක් ඇතුළත් බව අනාවරණය විය. ඒවා පහත පරිදි පෙළගස්වා තිබේ.

### උෂ්ණික් ඡන්දස

අක්ෂර සතකින් යුක්ත ඡන්දස වනුයේ උෂ්ණික් ඡන්දසයි (මාරසිංහ, 2005). මීගමුව දූව සහ පිටිපන ප්‍රදේශවල ප්‍රචලිත ඉරසඳ පසන් ගායනයට අදාළ ගේය පද විමසීමේ දී මේ විරිතට පද කිහිපයක් දැක ගත හැකි වේ. මුල් පේළි දෙක සහ අවසන් පේළිය බ, න, ජ සහ ස ගණ අනුව පිහිටා ( ∪ - -I - - - I – ∪ – ∪ ) අවසන ගුරු අක්ෂරයක් සමඟ යෙදීම මෙහි ඇති විශේෂතාවකි.

දෙව් පුත අප  නිසා  ( ∪ - -I - - - I ∪ )
විඳි තද දුක්  රැසා  ( - - - I – ∪ – I ∪ )
සුමිතුරු මෙලෝ  බැසා  ( - - - I - - ∪ I - ∪ )
පවසමි කොයි  ලෙසා  ( - - - I – ∪ – I ∪ )

ඒ පසන් ගායනය ඇතුළත් තවත් කොටසක ඉහත බ, න සහ ජ ගණ සමඟ ගුරු අක්ෂරයක් යෙදී ඇති අයුරු මුල් පේළිය සහ අවසන් පේළි දෙක විමසීමෙන් හඳුනාගත හැකි ය.

මේ පැය  පියාණනි  ( ∪ - -I – ∪ – I ∪ )
ඔබ කැමති නම් අනේ  ( - - - I - - ∪ I -∪ )

---

[7] ගයාත්‍රී - අක්ෂර 6, උෂ්ණික් - අක්ෂර 7, අනුෂ්ටුප් - අක්ෂර 8, බෘහතී - අක්ෂර 9, පඞ්ක්ති - අක්ෂර 10, ත්‍රිෂ්ටුප් - අක්ෂර 11 ආදි වශයෙනි.

[8] ∪ ∪ ∪ ,  –  – – ,  ∪  –  –,  – ∪ ∪ ,  – ∪ – ,  ∪ – ∪ ,  – – – ,  ∪ ∪ –

මා මුදවනු මැනේ ( ∪ - -I - - - I ∪ )
ඇඬුව ද ජේසුනේ ( - - -I – ∪ – I ∪ )

දූව ප්‍රදේශයේ දී ශ්‍රවණය කළ ශෝකයෙන් හඬ හඬා නම් වූ අත් අකුරු පසන් ගායනයේ දී උෂ්ණික් ඡන්දසට අයත් වන ලක්ෂණ පෙන්නුම් කරන්නකි. පළමු, දෙවැනි සහ සිවුවැනි පද පේළි න ගණය හා ර ගණය සමඟ ගුරු මාත්‍රාවක් යෙදෙන සේ ප්‍රබන්ධ වී තිබේ.

ශෝකයෙන් හඬ හඬා (∪- ∪I - - - I ∪ )

කුරුසෙ කර තබා ( - - -I - - - I ∪ )
ගෙන ගියේ මගෙ පුතේ ( - - -I ∪ - - I - ∪ )
කළ වරද කිමා ( - - -I - - - I ∪ )

ඉහත දැක් වූ ගායනාවන්හි පාද තුනක උෂ්ණික් ලක්ෂණ පෙන්නුම් කරයි. එක් පාදයක් ඊට වැඩි අක්ෂරයකින් සමන්විත බව පෙනී යයි (මාරසිංහ, 2005). එබැවින් මෙකී ගායනා භුරික් උෂ්ණික් ඡන්දස් ලක්ෂණ පෙන්නුම් කෙරෙයි.

**අනුෂ්ටුප් ඡන්දස**

අනුෂ්ටුප් ඡන්දස නම් පාදයක් අක්ෂර අටකින් යුක්ත වන ඡන්දසකි (මාරසිංහ, 2005). පසන් ගේය කාව්‍ය අධ්‍යයනයේ දී අක්ෂර අටකින් යුක්ත ගායන කොටස් ඇති බව හඳුනාගත හැකි ය. දූව සහ පිටිපන භාවිත වන "ඉර සඳ පසන් ගීතයේ"ස්ථායි කොටස එසේ ප්‍රබන්ධ වූවකි. ( - - - I - - - I - - ) න ගණ දෙකක් සහ ලඝු දෙකක් සමඟ එය රචනා වී තිබේ.

ඉර සඳ සහ තරු ( - - - I - - - I - - )
පොළොව ද විසිතුරු ( - - - I - - - I - - )
මැව් සුර තෙද දැරු ( - - - I - - - I - - )
සරණය ලැබ ගරු ( - - - I - - - I - - )

මාතලේ වහකෝට්ටේ ග්‍රාමයේ දී හඳුනා ගත් පසන් කාව්‍යයන්හි ද මේ අනුෂ්ටුප් ඡන්දසින් බැඳි ප්‍රබන්ධ ලක්ෂණ පෙන්නුම් කරයි. ත, ද ගණ දෙකක් සමඟ අවසානයට ලඝුවක් සහ ගුරක් යෙදෙන පරිදි ( ∪ ∪ – I – ∪ – I – ∪ ) පළමු පේළි තුන රචනා වී තිබේ. ම ගණය සහ න ගණය සමඟ අවසානයට ලඝුවක් හා ගුරක් යෙදෙන පරිදි (∪ ∪ ∪ I - - - I – ∪ ) අවසාන පේළිය ද නිර්මාණය වී තිබීම මෙහි දැකගත හැකි විශේෂත්වයක් වේ.

මාතා තුරුලෙන් කුමරා ( ∪ ∪ – I – ∪ – I – ∪ )
දෝතා වැරයන් උදුරා ( ∪ ∪ – I – ∪ – I – ∪ )
බීතා කර ගොස් ගුගුරා ( ∪ ∪ – I – ∪ – I – ∪ )
ඒ තා නෙත් ඇද නොහැරා ( ∪ ∪ ∪ I – – – I – ∪ )

**බෘහති ඡන්දස**

පාදයක් අක්ෂර නවයක් වන සේ යෙදෙනුයේ බෘහති ඡන්දසයි (මාරසිංහ, 2005). පහත සඳහන් ප්‍රබන්ධ රචනා වී ඇත්තේ එක් පාදයකට අක්ෂර නවය බැගින් වන බෘහති ඡන්දස අනුව ය.

නසා එවන් අපෙ පාපවල් ( - ∪ – I ∪ - - I ∪ – ∪ )
නසා මුලින් සිඳ ඒ සියල් ( - ∪ – I ∪ - - I ∪ – ∪ )
පිසා චිත්ත කළ හොත් ලකල් ( - ∪ ∪ I - - - I ∪ – ∪ )
එසාමි දරුවන් ගේ උදුල් ( - ∪ – I - - ∪ I ∪ – ∪ )

ඉහත පද්‍යයෙහි පූර්වාර්ධය ජ, බ සහ ර ගණ තුන ඇසුරින් ( - ∪ – I ∪ - - I ∪ – ∪ ) රචනා වී තිබේ. අපරාර්ධය ය, න, ර, ජ සහ ස ගණ ඇතුළත් වේ. වහකෝට්ටේ ග්‍රාමයේ දී ගැයෙන පසම් ගායනාවන්හි බෘහති ඡන්දසින් රචිත තවත් කාව්‍යයකට නිදර්ශනයක් මෙසේ ය. ඒ, කාව්‍යයේ පූර්වාර්ධය

න, ජ සහ ය ගණ තුන ( - - - l – ∪ – l – ∪ ∪ ) අනුව රචනා වී තිබේ. අපරාර්ධය න ගණ දෙකත් සමඟ ම ගණය ( - - - l - - - l ∪ ∪ ∪ ) එක් ව රචනා වී ඇති ආකාරය මෙහි දී කැපී පෙනෙන විශේෂත්වයකි.

කඳුළෙන ශ්‍රී ගත නාවා ( - - - l – ∪ – l – ∪ ∪ )
සිටි තැන මවු පුතු ගාවා ( - - - l – ∪ – l – ∪ ∪ )
රොසයෙන රුදු ඒ සේවා ( - - - l - - - l ∪ ∪ ∪ )
ජුද දන කපෙමින් බෝවා ( - - - l - - - l ∪ ∪ ∪ )

වහකෝට්ටේ දී පහත කාව්‍ය අක්ෂර නවයක් බැගින් නිර්මාණය වී තිබීම විශේෂත්වයකි. පළමු පාද දෙකෙහි මේ ලක්ෂණය භරතමුනි පෙන්වා දෙන්නේ මධුකරී වෘත්තය ලෙසිනි (මාරසිංහ, 2005).

ගුණ ඇති සතුරෝ හොල්ලා (- - - l - - - l ∪ ∪ ∪ )
වද කර මැරුවේ එල්ලා (- - - l - - -l ∪ ∪ ∪ )
දකිමින් මෙහැම සියල්ලා (- - ∪ l - - - l – ∪ ∪ )
වැවෙනු බැරි වියවුල්ලා (∪ - - l - - - l – ∪ ∪ )

ඉහත කාව්‍යයේ පළමු පේළි දෙක න ගණ දෙකක් හා ම ගණයක් ලෙස නිර්මිත ය. සෙසු පාද ස, න, ය සහ බ ගණ මිශ්‍රිත ව ද නිර්මිත ය. පූර්වාර්ධයෙහි අවසන් මාත්‍රා තුන ගුරු අක්ෂර අනුව යෙදේ. අපරාර්ධය අවසන් මාත්‍රා දෙක ගුරු අක්ෂරයකි. බෘහතී ඡන්දස් ලක්ෂණයට තවත් නිදර්ශනයක් වහකෝට්ටේ පසන් කාව්‍ය මඟින් දැකිය හැකි වේ.

කන්‍යා මවු කුස ඔත් කලා (∪ ∪ – l - - - l ∪ – ∪ )
පෙන්නා තම යස උන් කලා (∪ ∪ – l - - - l ∪ – ∪ )
අන්නා ජුදයෝ වද කලා (∪ ∪ – l - ∪ - l - – ∪ )
දුන්නා හදවත ඒ බලා (∪ ∪ – l - - - l ∪ – ∪ )

මෙහි පළමු, දෙවැනි සහ සිවුවැනි පාද ත න, ර ගණ පිළිවෙළින් නිමවී තිබේ. තෙවැනි පාදය ත, ජ සහ ස යන ගණ ඇසුරින් ද නිර්මාණය වී ඇත.

**පඞ්ක්ති ඡන්දස**

පාදයක් අක්ෂර දහයකින් යුක්ත වනුයේ පඞ්ක්ති ඡන්දස යි (මාරසිංහ, 2005). මීගමුව - දූව ප්‍රදේශයේ දී මේ ඡන්දසට අනුව 'බෝ රුදුරු' පසන් ගීතය ප්‍රබන්ධය වී තිබේ. එකී ගේය කාව්‍යයේ පළමුවැනි හා දෙවැනි පේළිය අයත් කොටස බ, න සහ බ ගණ අවසානයට ගුරු අක්ෂරයක් යෙදෙන සේ රචනා වී ඇත. (∪ - - l - - -l ∪ - -l ∪ ) තුන්වැනි හා සිවුවැනි පේළි දෙක බ ගණ තුනක් අවසානයේ ගුරු අක්ෂරයක් බැගින් (∪ - - l ∪ - - l ∪ - -l ∪ ) යෙදී තිබේ.

බෝ රුදුරු විද මල් උයනේ (∪ - - l - - -l ∪ - -l ∪ )
වී සිදුරු හද පව් බරිනේ (∪ - - l - - -l ∪ - -l ∪ )
ශ්‍රී කුමරා යති දෝ දුකිනේ (∪ - - l U - - l ∪ - -l ∪ )
දීමට දී දිවි ශ්‍රී සර නේ (∪ - - l U - - l ∪ - -l ∪ )

මේ පසන් ගායනයෙහි දෙවැනි කොටස රචනා වී ඇත්තේ පඞ්ක්ති ඡන්දසට ය. එහි පාදයක අක්ෂර දහය බ ගණ තුනක් අවසානයේ ගුරු අක්ෂරයක් යෙදෙන පරිදි නිර්මාණය වී තිබේ. (∪ - -l ∪ - - l ∪ - - l ∪ )

ආඅද රෑ බර වැල් දමිනේ (∪ - -l ∪ - - l ∪ - - l ∪ )
දෑත වෙලා ඇණලා තදිනේ (∪ - -l ∪ - - l ∪ - - l ∪ )
ජේසු මරා දමනා ලෙසිනේ (∪ - -l ∪ - - l ∪ - - l ∪ )
කෲර ජුදා එනවා ද අනේ (∪ - -l ∪ - - l ∪ - - l ∪ )

පාදයක් අක්ෂර 10 වන සේ යෙදෙන පඞ්ක්ති ඡන්දස ප්‍රසිද්ධ පසන් ගායනාවක ද දැකගත හැකි වේ.

සුරලොවිනේ බැස මෙදිනේ (- - - I - ∪ – I - - - I ∪ )
මවුකුසිනේ බිහි වෙමිනේ (- - - I – ∪ – I - - - I ∪ )
කුඹු දෙතනේ කිරි බොමිනේ (- - - I – ∪ – I - - - I ∪ )
මිනි ලෙසිනේ වැඩුණු තැනේ ( - - - I – ∪ – I - - - I ∪ )

ඉහත කාව්‍යයේ න ගණය, ජ ගණය සහ ත ගණයෙන් පරව ගුරක් පිහිටන සේ ( - - - I – ∪ – I - - - I ∪ ) රචනා වී තිබේ. මේ පැදියේ ලඝු මාත්‍රා හතරකට පසු ගුරු අක්ෂරයක් යෙදී තිබීම විශේෂතාවකි. වහකෝට්ටේ පසන් ගායන විමසීමේ දී පඞ්ක්ති ඡන්දසට අනුව රචිත පසන් කාව්‍ය කිහිපයක් හඳුනාගත හැකි වේ. නිදර්ශන කිහිපයක් පහත දැක්වේ.

මෙලෙසින් මවු අඬන තැ නා (- - ∪ I - - - I - - - I ∪ )
නොලසින් රැ වෙන සෙයි නා (- - ∪ I ∪ - - I - - ∪ )
එලෙසින් තැන්පත් කර නා (- - ∪ I ∪ ∪ - I – ∪)
විගසින් අවසර රැගෙ නා ( - - ∪ I - - - I - - - I ∪ )

ඉහත කාව්‍යයෙහි පළමු පාදය සහ සිව්වැනි පාදය ස ගණයක් සහිතව න ගණ දෙකකින් පරව ගුරක් ලෙස ( - - ∪ I - - - I - - - I ∪ ) යෙදී ඇත. දෙවැනි හා තෙවැනි පාද අක්ෂර නවය, අට බැගින් යෙදී තිබේ.

දයා සිතැති ගෝල දෙදෙ න ( - ∪ – I - - ∪ I - - - I - )
සොයා ගොසින වැනසූ තැන ( - ∪ – I - - - I - ∪ – I - )
තියා තෙරපු කුරුසේ ඇ න ( - ∪ - I - - - I - ∪ - I - )
භයානිකව අරවන මෙන ( - ∪ - I - - - I - - - I - - )

ඉහත පසන් කාව්‍යයේ පළමු වැනි පාදය ( - ∪ – I - - ∪ I - - - I - ) ජ, ස, ත ගණ පරව ලඝුවක් ලෙසින් ද දෙවෙනි හා තෙවැනි පාද ( - ∪ – I - - - I – ∪ – I - ) ජ, න සහ ජ ගණ පරව ලඝුවක් ලෙසින් ද යෙදී තිබීම එයට අනන්‍යවූවකි. සිව්වැනි පාදය ජ, න ගණ දෙකක් පරව ලඝු දෙකක් ලෙස අක්ෂර 11 කින් යෙදී තිබේ. මෙවැනි කාව්‍ය ලක්ෂණයක් භුරික් පඞ්ක්ති ලෙස නාට්‍යශාස්ත්‍රයෙහි දක්වා තිබේ (මාරසිංහ, 2005).

**ත්‍රිෂ්ටුප් ඡන්දස**

පාදයකට අක්ෂර 11 බැගින් යෙදෙන්නා වූ ඡන්දස ත්‍රිෂ්ටුප් ඡන්දස නම් වේ (මාරසිංහ, 2005). වහකෝට්ටේ පසන් ගායනාවන්හි මේ ඡන්දස් ලක්ෂණය දැකිය හැකි ය. එකී කාව්‍යය රචනා වී ඇත්තේ බ ගණ සහ න ගණ දෙකක් අවසානයේ ලඝුවක් හා ගුරු අක්ෂරයක් ( ∪ - - I - - - I - - - I – ∪ ) ලෙසිනි.

සේසත සිරි පිරි සැම දැනී ( ∪ - - I - - - I - - - I – ∪ )
ලෝ සත රකිනට ඇවිදි තී ( ∪ - - I - - - I - - - I – ∪ )
ඒ සත කළ වද පෙනි පෙ නී ( ∪ - - I - - - I - - - I – ∪ )
ජීවිත නොතිබෙයි මෙදුකි නී ( ∪ - - I - - - I - - - I – ∪ )

පහත සඳහන් වන කාව්‍යයේ දෙවැනි පේළිය හැර සෙසු පාද ත්‍රිෂ්ටුප් විරිතට අනුව ප්‍රබන්ධිත ය. එහි ස ගණය, න ගණ දෙකක් සමඟ ලඝුවක් හා ගුරු අක්ෂරයක් ( - - ∪ I - - - I - - - I – ∪ ) මිශ්‍ර වී තිබේ. දෙවැනි පාදයෙහි අක්ෂර දහයකි. ත්‍රිෂ්ටුප් විරිතෙහි මෙකී ලක්ෂණය නිචෘත් තිෂ්ටුප් ඡන්දස ලෙස නාට්‍යශාස්ත්‍රයෙහි දක්වා තිබේ. (මාරසිංහ, 2005)

ඉරුසේ තෙද ඇති සුනිමලා ( - - ∪ I - - - I - - - I – ∪ )
කුරුසෙහි ඉන්නා සැටි බලා ( - - - I - ∪ ∪ I - - - I ∪ )

මතුසේ ඇවිලිය ගිනි ජලා ( - - ∪ | - - - | - - - | – ∪ )
කෙලෙසේ සැනසෙමි උදකලා ( - - ∪ | - - - | - - - | – ∪ )

**ජගතී ඡන්දස**

ජගතී ඡන්දස යනු පාදයක් අක්ෂර දොළහකින් යුක්ත වූවකි (මාරසිංහ, 2005). එම ඡන්දසට අදාළ වන කාව්‍ය කිහිපයක් ද පසන් ගායනයෙහි ඇතුළත් වේ. පාදයක අක්ෂර දොළොස සැකසී ඇත්තේ න ගණය, ස ගණය, ර ගණය හා ජ ගණය සම්මිශ්‍රිත ව ය. දෙවෙනි පාදය අක්ෂර 11 කි. පසන් කාව්‍යයෙහි වන මේ ඡන්දස නිවෘත් ජගතී ලෙස සැලකිය හැකි වේ.

දිගු නීල වරල මුදමින් ඉසා ( - - ∪ | - - -| - - - | ∪ – ∪ )
තුගු මුල කරා ලෙහි අත් ගසා ( - - - | - - ∪ | - - ∪ | – ∪ )
ගගු ලැල්ල සේම කඳුළැලි ඉසා ( - - ∪ | – ∪ – | - - - | - - ∪ )
රගු කුල බිසව ඇඬු මේ ලෙසා ( - - - | - - - | - - - | ∪ – ∪ )

දූව පසන් ගායනාවන්හි ද ජගතී ඡන්දසින් බැඳි ගේය කාව්‍ය හමු වේ. එය න ගණය, ත ගණය සහ ර ගණ දෙකක් වන පරිදි ( - - - | ∪ ∪ – | ∪ – ∪ | ∪ – ∪ ) රචනා වී තිබේ.

හැකිලිලා නිල්වෙලා ලෙයින් නෑ විලා ( - - - | ∪ ∪ – | ∪ – ∪ | ∪ – ∪ )
පුතු බලා ඉන්න මා කෙසේ වැ විලා ( - - - | ∪ ∪ – | ∪ – ∪ | ∪ – ∪ )

වහකෝට්ටේ ඇතැම් පසන් ගායනාවන්හි මෙම ඡන්දස ලක්ෂණ දැකිය හැකි වේ. යථෝක්ත නිදසුනෙහි පළමුවැනි සහ සිවු වැනි පාද න ගණ තුනක් සහ ය ගණයත් (- - - | - - - | - - -| - - ∪) සමඟ ජගතී ඡන්දස අනුව රචනා වී ඇත. විරාට් ජගතී සහ නිවෘත් ජගතී ලක්ෂණ මෙ මඟින් පෙන්නුම් කරයි.

මවු සහ සිය සත වක ලෙසේ ( - - - | - - - | - - - | - - ∪ )
ලැවු සෝ වක සමුදුර බැසේ ( - - ∪ | - - - | - - - | - ∪ )
දැවු එ ගිනි දෙදෙනා කුසේ ( - - - | - - - | - ∪ - | ∪ )
නිවුමට කෙලෙස ද උපදෙසේ (- - - | - - - | - - - | - - ∪ )

දුසිරිත හැර හැම දින කලා (- - - | - - - | - - - | - - ∪ )
නිසි ලෙස ලබනට මොක් පලා (- - - | - - - | - - ∪ | - ∪ )
හැසිරි බියපත් දුක් වෙලා (- - - | - - ∪ | ∪ - ∪ )
ජේසුසුර වඳිනට යමු බලා (- - - | - - - | - - - | - - ∪ )

**අතිජගතී ඡන්දස**

අක්ෂර දහ තුනකින් යුක්ත වන ඡන්දස අතිජගතී නම් වේ (මාරසිංහ, 2005). දූව ප්‍රදේශයේ දී ගායනා වන ශෝකයෙන් හඬ හඬා නම් වූ අත් අකුරු පසන් ගායනයේ අතිජගතී ඡන්දසින් රචිත ගායනාවන් හමු වේ. එය ර ගණය, න ගණය, ර ගණය, න ගණය පර ව ගුරක් (∪ – ∪ | - - - | ∪ – ∪ | - - - | ∪ ) වන ලෙසින් ප්‍රබන්ධිත ය. මෙය නිවෘත් අතිජගතී ලක්ෂණ පෙන්නුම් කරයි.

වේගයෙන් ඇවිදිමින් බොහෝ දුක් දැරු (∪ – ∪ | - - - | ∪ – ∪ | ∪ - ∪ )
මැණියෝ නොවෙද මා කුසේ පිළිසි ඳු (∪ – ∪ | - - - | ∪ – ∪ | - - - | ∪ )

වහකෝට්ටේ ප්‍රදේශයේ දී ගැයෙන ඇතැම් පසන් කාව්‍යයක දී ද අක්ෂර දහතුනකින් සමන්විත ලක්ෂණ දැකගත හැකි වේ. පහත සඳහන් කාව්‍යයේ පළමුවැනි තෙවැනි හා සිව්වැනි පාද අතිජගතී ඡන්දසින් රචනා වී ඇත්තේ න ගණය, බ ගණය, න ගණ දෙකක් පර ව ගුරක් ( - - - | ∪ - - | - - -| - - - | ∪ ) වන පරිද්දෙනි. මෙකී ඡන්දස් ලක්ෂණය නිවෘත් අතිජගතී ලෙස හඳුනාගත හැකි වේ.

තළ තළා කුමරුහට කළ වදේ ( - - - | ∪ - - | - - -| - - - | ∪ )

බල බලා එ මවු ඉස අත් බැඳේ (- - - I ∪ - - I - - - I∪ - ∪ )
සල සලා කඳුළු ඉකි බිඳ විදේ (- - - I ∪ - - I - - -I - - - I ∪ )
පුල පුලා අඬති මවු වැද තදේ (- - - I ∪ - - I - - -I - - - I ∪ )

**ශක්වරී ඡන්දස**

ශක්වරී ඡන්දස අක්ෂර දහ හතර බැගින් යුක්ත ව රචනා වූවකි (මාරසිංහ, 2005). දූව, පිටිපන, වහකෝට්ටේ යන ප්‍රදේශ ත්‍රිත්වයේ ම භාවිත වන පසම් ගායනාවක එක් කොටසක ශක්වරී ඡන්දසින් රචිත ප්‍රබන්ධයක් හමු වේ.

මේ වදන් දේව මව් තුම ඒ ඇස, සැනෙ දී
( ∪ –∪ I ∪ - ∪ I - - ∪ I – ∪ – I – ∪ )
ඊය වන් නාසෙවු ළැම සෝක ගින්න වැ දී
( ∪ –∪ I ∪ - ∪ I - - ∪ I – ∪ – I – ∪ )
ලාසුසුන් අහස ගුගුරණ බෝ විලාප දි දී
( ∪ –∪ I - - - I - - - I – ∪ – I ∪- - I ∪ )
මුහුලයන් ලා උනා ඕගා අඬා රැව් දි දී
( ∪ –∪ I ∪ - ∪ I - - ∪ I – ∪ – I – ∪ )

උක්ත කාව්‍යයේ පූර්වාර්ධය ශක්වරී ඡන්දසට අනුව රචනා වී ඇත්තකි. ර ගණ දෙකක්, ස ගණයක් හා ජ ගණයක් පරව ලඝුවක් හා ගුරක් වන පරිදි එය රචනා වී තිබේ. ( ∪ –∪ I ∪ - ∪ I - - ∪ I – ∪ – I – ∪ ) එකී කාව්‍යයේ සිව්වැනි පාදය ශක්වරි ඡන්දස අනුව රචනා වී ඇති අතර, න ගණය, ත ගණය, ම ගණය සහ ය ගණය අවසානයේ ලඝුවක් හා ගුරු අක්ෂරයක් ලෙසින් ප්‍රබන්ධ වී තිබේ. තෙවැනි පාදය අක්ෂර 16 කින් රචනා වූවකි. මේ කාව්‍යයෙහි ස්වරාට් ශක්වරී ඡන්දස් ලක්ෂණය ද ගැබ් ව පවතින බව හඳුනාගත හැකි වේ. ස්වරාට් ශක්වරී ඡන්දස් ලක්ෂණය වහකෝට්ටේ තවත් පසන් ගායනාවක ද දක්නට තිබේ. එකී කාව්‍යයෙහි පාද තුනක් අක්ෂර 14 ඡන්දසින් බැඳී තිබේ. සිව්වැනි පාදය අක්ෂර 16 කි.

දැත බිම පෙරළී ඕගා මේ ලේ කාගේ දෝ
( - - - I - - - I ∪ ∪ ∪ I ∪ ∪ ∪ I ∪ ∪)
මගෙ කුමාරෙනි මගේ ගර්භයෙන් ගත් ලේ දෝ
(- - - I ∪ - - I – ∪ ∪ I – ∪ ∪ I ∪ ∪)
ඔබතුමාගේ ශ්‍රී ගත තිබුණ ලේ මේ දෝ
(- - - I ∪ ∪ ∪ I – - - I – - ∪ I ∪ ∪)
අද හවා මෙලෙස පාරේ වැනි වට උනා දෝ
(- - - I ∪ - - I - ∪ ∪ I - - - I - - ∪ I ∪)

මෙහි පළමු පාදය - - - I - - - I ∪ ∪ ∪ I ∪ ∪ ∪ I ∪ ∪ න ගණ දෙකක් සහ ම ගණ දෙකක් පර ව ගුරු දෙකක් ලෙස ද, දෙවෙනි පාදය - - - I ∪ - - I – ∪ ∪ I – ∪ ∪ I ∪ ∪ න ගණයක්, බ ගණයක් සහ ය ගණ දෙකක් පර ව ගුරු දෙකක් ලෙස ද, තෙවෙනි පාදය - - - I ∪ ∪ ∪ I – - - I – - ∪ I ∪ ∪ න ගණයක්, ම ගණයත්, න ගණයත් සහ ස ගණයත් පසු ගුරු දෙකක් ලෙස යෙදී තිබීම ද විශේෂත්වයකි. මෙහි ස්වාරාට් ශක්වරී ඡන්දස් ලක්ෂණය පෙන්නුම් කර තිබේ.

**අතිශක්වරී ඡන්දස**

අක්ෂර පහළොසකින් යුක්ත ඡන්දස අතිශක්වරී ඡන්දසයි (මාරසිංහ, 2005). පිටිපන අත් අකුරු පසමක් රචනා වී ඇත්තේ ද අතිශක්වරී ඡන්දසට අයත් ලක්ෂණ ද සමගිනි. බ ගණය, න ගණය, ස ගණය, බ ගණය, ප ගණය, ර ගණය, ආදියෙන් ඒ පාද රචනා වී තිබේ.

නින්දේදෝ මගෙ පුතේ පිබිදෙනු ලෙන තුළේ
(∪ ∪ ∪ l - - - l ∪ - - l - - - l- - ∪ )
නව මාසක් මගෙ කුසේ ගාර්බවුන් පුත මාගේ
( - - ∪ l ∪ - - l - ∪ ∪ l - ∪ -l- ∪ ∪ )
මන් කුසේ නව මසක් නුඹ තබා උන්නෙ මී
( ∪ - ∪ l - - - l ∪ - - l - ∪ ∪ l – ∪ )
දුක් ලෙසින් ඔබව රන් ගවලෙනේ බිහි වුනේ
(∪ - ∪ l - - - l ∪ - - l - ∪ - l- - ∪ )

මෙහි පාද තුනක අක්ෂර 15 බැගින් යෙදෙයි. පළමුවැනි පාදය (∪ ∪ ∪ l - - - l ∪ - - l - - - l- - ∪ ) ම ගණය, න ගණය, බ ගණය, න ගණය සහ ස ගණයෙන් යුතු ව රචනා වී තිබේ. දෙවැනි පාදය ( - - ∪ l ∪ - - l - ∪ ∪ l - ∪ - l - ∪ ∪ ) ස ගණය, බ ගණය, ය ගණය සහ ජ ගණයෙන් යුතු ව රචනා වී තිබේ. තෙවැනි පාදය සඳහා අක්ෂර 14 කින් (∪ - ∪ l - - - l ∪ - - l - ∪ ∪ l – ∪ ) සමන්විත වේ. සිවු වැනි පාදය (∪ - ∪ l - - - l ∪ - - l - ∪ - l- - ∪ ) ර ගණය, න බ ගණය, ජ ගණය සහ ස ගණයෙන් යුක්ත ය. මේ පසන් ගායනාවෙහි දක්නට ඇත්තේ නිවෘත් අතිශක්වරී ඡන්දස් ලක්ෂණය බව හඳුනාගත හැකි වේ. වහකෝට්ටේ ද එවැනි නිවෘත් අතිශක්වරී ඡන්දස් ලක්ෂණ යෙදුණු අවස්ථාවකට නිදර්ශන ගායනාවක් මෙසේ දැක්විය හැකි ය. එහි පාද තුනක දක්නට ලැබුණේ අක්ෂර 15 බැගිනි. පළමුවැනි පාදයේ අක්ෂර 13 කි. නාට්‍යශාස්ත්‍ර කෘතියේ පෙන්වා දෙන පරිදි නිවෘත් අතිශක්වරී ලක්ෂණය මෙ මඟින් පෙන්නුම් කෙරෙයි.

ඉන්ප්‍රීලේ දිලිනි තිවුණු වුව මේ දෝ
(∪ ∪ ∪ l - - - l - - - l - - ∪ l ∪ )
චන්දුසු රිසා පරදා තිවුණු මුව මේ දෝ
(∪ - ∪ l - ∪ - l -∪ - l - - - l- ∪ ∪ )
මණ්ඩලේ මොක් දනන් තුටු කරපු වුව මේ දෝ
(∪ - ∪ l ∪ - ∪ l - - - l - - - l- ∪ ∪ )
පෙම් වඩා මාව නිති දැන පැවු මුව මේ දෝ
(∪ - ∪ l ∪ - - l - - - l ∪- - l- ∪ ∪ )

මෙහි දෙවෙනි පාදය - ∪ ∪ l - ∪ - l -∪ - l - - - l- ∪ ∪ ය ජ ගණ දෙකත්, න ගණය හා ස ගණයෙන් යුතු ව රචිත ය. තුන්වැනි පාදය ∪ - ∪ l ∪ - ∪ l - - - l - - - l- ∪ ∪ ර ගණ දෙකක් හා න ගණ දෙකක් පරව ය ගණයක් ලෙසින් ද, සිවු වැනි පාදය ∪ - l - - l - - - l ∪- - l- ∪ ∪ ර ගණය, ම ගණය, න ගණය, බ ගණය සහ ය ගණය යුතු ව රචනා වී තිබේ. දූව ප්‍රදේශයේ ගැයෙන පසන් ගායනයක මේ ප්‍රබන්ධ ලක්ෂණය දිස් වූ අතර, එය පහත දක්වා තිබේ.

දිව්‍ය සත්ප්‍රසාද වූ රක්සාදි සුන්ද්‍ර දේවනේ
ත්‍රිත්වවත් ශ්‍රී ශුද්ධ වූ අත්‍යාහු දේව තුමනේ

**අෂ්ටි ඡන්දස**

පාදයකට අක්ෂර 16 බැගින් යෙදෙනුයේ අෂ්ටි ඡන්දසයි (මාරසිංහ, 2005). එය පසන් ගායනයෙහි උපයෝගී කර ගෙන තිබේ. ඉහත කාව්‍යයෙහි පළමු පාදය – – -l ∪ – – l - ∪ - l - - ∪ l - - ∪ l ∪ න, බ, ජ සහ ස ගණ දෙකක් පර ව ගුරක් ලෙසින් ද, දෙවන පාදය – – - l ∪ ∪ – l - - - l - - - l - ∪ ∪ l ∪ න, ත, න ගන දෙකක් සහ ය ගණය පරව ගුරක් ලෙසින් ද, සිවු වැනි පාදය – – - l ∪ ∪ – l ∪ - - l - - - l ∪ - ∪ l ∪ න, ත, බ, න සහ ර ගණ පසු ව ගුරක් ලෙසින් ද යෙදෙයි. තෙවැනි පාදයේ අක්ෂර 15 කි. එබැවින් මෙකී ගායනයෙහි නිවෘත් අෂ්ටි ඡන්දසින් සමන්විත වේ.
අනෙ අනේ මගෙ කුමාරෙනි කොසෝමද අයියෝ

සැලසුණේ දැන් මෙනුඹහට මොකද මේ    අයියෝ
දෙතනේ මගෙ කිරි බී ඉනුදු ලේ    අයියෝ
මෙලෙසිනේ වෑහෙන කොට පණ තිබේද    අයියෝ

පිටිපන හා වහකෝට්ටේ ප්‍රදේශ දෙකේ දී ම ගායනා කරන පසන් ගායනාවක පළමු හා සිවු වන පාදයන්හි අක්ෂර 16 කින් යුත් අෂ්ටි ඡන්දස දිස්වූයේ මෙලෙසිනි.

හාර තාර සේම චාප බෝම පැපු මිහි    තලේ
සූර වීර දේව රාජ මේ කුමක්ද දැන්    කලේ
ගෝර මාර නේක බෝම සේනාවක් වද    කලේ
නැර වැර දීපු පාර ඉන්ද ගියේ පණ    නලේ

පළමුවැනි පාදය ∪ –∪ I - ∪ – I ∪ - ∪ I - ∪ - I - - - I ∪ ර, ජ, ර, ජ සහ න ගණ පර ව ගුරක් ලෙසින් ද, සිවු වැනි පාදය ∪ –∪ I - ∪ – I ∪ - ∪ I - ∪ - I ∪ - - I ∪ ර, ජ, ර, ජ සහ බ ගණය පරව ගුරු අක්ෂරයක් ලෙසින් යෙදේ.

**අත්‍යෂ්ටි ඡන්දස**

පාදයකට අක්ෂර 17 බැගින් එක් වීමෙන් අත්‍යෂ්ටි ඡන්දස සෑදේ (මාරසිංහ, 2005). පිටිපන සහ වහකෝට්ටේ දී ගැයෙන පසමක මේ ඡන්දස් ලක්ෂණය විදහා දැක්වෙන්නේ මෙලෙසිනි.

සූර සිරින් අග දරා කන්‍යා මරිය කුස දරා
කන්‍යාමරිය මවු කුසින් බිහිවූ පුතු ජේසුනි
සත්පත්ති දේව පුත් කුමරාට ස්තුති ගායනා වේවා
සත්පත්ති දේව පුත් කුමරාට ස්තුති ගායනා වේවා

එකී කාව්‍යයේ පළමුවැනි පාදය - - - I ∪ - - I - ∪ ∪ I - - - I - - - I - ∪ දෙවැනි පාදය ∪ - - I - - - I - - ∪ I - - - I - - ∪ I - - තෙවැනි පාදය ∪ ∪ - I ∪ - ∪ I - - ∪ I - ∪ - I ∪ - ∪ I ∪ ∪ සිවු වැනි පාදය ∪ ∪ - I ∪ - ∪ I - - ∪ I - ∪ - I ∪ - ∪ I ∪ ∪ ලෙස යෙදේ. දූව ප්‍රදේශයේ ලෙව් තුළටා පසන් ගායනය ආරම්භ කෙරෙනුයේ මේ ඡන්දසිනි.

ලෙව් තුළටා සව් සිරියෙන් ප්‍රමානන්ද  සුරාධිපති
දෙව් නදනා පව් දනයන් ගලවන්ඩ   මනාපයිනි

ඉහත කාව්‍යයෙහි පළමුවැනි පාදය ව ගණය, ත ගණය, ජ ගණ දෙකක් සහ ය ගණය පර ව ලඝු දෙකක් ලෙසින් රචනා වී ඇති අතර ∪ – -I ∪ ∪ – I - ∪ - I - ∪ - I - ∪ ∪ I - - දෙවෙනි පාදය බ ගණය, ත ගණය සහ ජ ගණ තුනක් පර ව ලඝු දෙකක් ලෙස යෙදේ. ∪ – - I ∪ ∪ – I - ∪ - I - ∪ - I - ∪ - I - - එම පසන් ගායනාවේ වෙනත් පද්‍ය පේළි කීපයක දී ද අත්‍යෂ්ටි ඡන්දස දක්නට ලැබේ. එම කාව්‍ය බ ගණය, ත ගණය සහ ජ ගණ තුනක් අවසන ලඝු දෙකක් ලෙසින් බැඳී තිබේ.

වූ පසු දෝ බාහු මුදාගෙන ඒ ජුදයෝ   නපුරු
මේ විලසේ කෝප  බසක් පවසාලන වී නුදුරු

'ලෝකයේ සෑම දේට' ලෙසින් හැඳින්වෙන දූව පසන් ගායනයෙහි පාදයකට අක්ෂර දා හත බැගින් යෙදී ඇති අත්‍යෂ්ටි ඡන්දස දැකගත හැකි වේ.
දේවනි  දේවනි රාජ රාජී වූ තුමා අපෙ පව් නිසා
මේ දිනේ කය හානි වූ අට දේශනාවේ කීම මේ ”

ඉහත පළමු පාදය ර ගණය, ස ගණ දෙකත් පරව ලඝුවක් හා ගුරක් ∪ –∪ I - - ∪ I - ∪ - I - - ∪ I - - ∪ I - ∪ ලෙසින් ද, දෙවෙනි පාදය ර ගණය, ස ගණය, ජ ගණ දෙකක් සහ ම ගණය පර ව ලඝුවක් හා ගුරු අක්ෂරයක් ලෙසින් ද යෙදී තිබේ. දූව, පිටිපන හා වහකෝට්ටේ ප්‍රදේශත්‍රයෙහි ම ඇසිය හැකි පසමක

එක් කාව්‍යයක පළමු වැනි සහ සිවු වැනි පාදයේ අක්ෂර දා හත බැගින් නිර්මිත ය. ස්වරාට් අත්‍යෂ්ටි ඡන්දස ලක්ෂණ මේ ප්‍රබන්ධයෙන් ධ්වනිත ය.

එහෙම නම් ඒ ලසෝ ගිනි කොහොම උසුලනු දෝ
කී දනන් දේව මව් දැක ඇසුව කොයි යනු දෝ
මේ මගින් පුත්‍රයා මගෙ ගෙවා ගියා දුටු දෝ
කීවොතින් යහපතැයි මට නිවා ගින්න මේ දෝ

එකී ස්වරාට් අත්‍යෂ්ටි ඡන්දසෙහි ස්වරූපය අනුව රචනා වූ පසන් ගීයක් හමු වේ. එහි පළමු පාද තුන අක්ෂර 17 කින් රචනා වී තිබේ. එක් පාදයක අක්ෂර 15 කි. නිදර්ශන කාව්‍යයක පහත දැක්වේ.

නව මස ගොසින් වදාලා වැඩුනේ රන් කිරි බීලා
( - - - | - -∪ | - ∪ ∪| - - ∪ | ∪ - - | ∪ ∪ )
මුබයෙන් රස බස් දීලා තුතිවන සුරතල් පාලා
( - - ∪ | - - ∪ | ∪ ∪ - | - - - | - - ∪ | ∪ ∪)
මේ ලෙස වද කරවාලා සොඳදෝ දැන් මරවාලා
(∪ – - | - - – | - ∪ ∪ | – ∪ ∪ | ∪ - - | ∪ ∪)
මසිතට තද දුක් දීලා පව් අරගති ජුද යාලා
(- - - | - - - | ∪ ∪ ∪ | ∪ - - |- - - | - ∪ ∪)

පළමු පාදය න, ස, ය, ස සහ බ ගණ අවසන ගුරු දෙකක් - - - | - -∪ | - ∪ ∪| - - ∪ | ∪ - - | ∪ ∪ ලෙසින් ද, දෙවෙනි පාදය ස ගණ දෙකක්, ත ගනය, න ගණය සහ ස ගණය පරව ගුරු දෙකක් - - ∪ | - - ∪ | ∪ ∪ - | - - - | - - ∪ | ∪ ∪ ලෙසින් ද, තෙවැනි පාදය බ ගණය, න ගණය, ය ගණය, ස ගණය සහ බ ගණය පරව ගුරු මාත්‍රා දෙකක් ∪ – - | - - – | - ∪ ∪ | – ∪ ∪ | ∪ - - | ∪ ∪ ලෙස ද නිර්මිත ය. පහත පද්‍යයෙහි ද ස්වරාට් අත්‍යෂ්ටි ඡන්දස් ලක්ෂණ පෙන්නුම් කර තිබේ. පාද දෙකක් එනම් දෙවැනි, තෙවැනි සහ සිව්වැනි පාද අක්ෂර 17 කින් යුතු ව රචනා වී ඇති බව පෙනේ.

තෙද අනසක නොදනී දෝ වද කළ අත් නොදනීදෝ
කුරුසෙ කර තිබුවා දෝ මා හැර කොයි වැඩියාදෝ
ඔබවත් මේ සැප වේ දෝ මේ ගිය පණ නල ඒදෝ
දුක දීලා මැරුවා දෝ වැදු මගෙ සිත වැවේදෝ

දෙවෙනි පාදය - - ∪ | - - - | - ∪ ∪ | ∪ - - | ∪ - - | ∪ ∪ ස, න, ය සහ බ ගණ දෙකක් පරව ගුරු දෙකක් ලෙස ද, තෙවැනි පාදය ස, බ, ම ගණ හා න ගණ දෙකක් පරව ගුරු දෙකක් - - ∪ | ∪ - - | ∪ ∪ ∪ | - - - | - - - | ∪ ∪ ලෙස ද යෙදෙයි. සිව්වැනි පාදය - - ∪ | ∪ - - | ∪ ∪- | - - - | - - ∪ | ∪ ∪ ය, බ, ත, න සහ ස පරව ගුරු දෙකක් ලෙස තිබේ. පළමුවැනි පාදය අක්ෂර 19 කින් සමන්විත වේ.

**ධෘති ඡන්දස**

පාදයකට අක්ෂර දහ අට බැගින් යෙදෙනුයේ ධෘති ඡන්දසයි (මාරසිංහ, 2005). වහකෝට්ටේ පසන් ගායනයක පළමු වැනි සහ තෙවැනි පාදයෙහි එකී ඡන්දස් ලක්ෂණ දිස්වූයේ මෙලෙසිනි.

වරලස රන් කෙඳි වැන්නේ ඔප වඩමින් දිලිසෙන්නේ
- - - | - ∪ - | - ∪ ∪ | - - - | - ∪ - | - ∪ ∪
තුන් ලොව සියලු සතුන්නේ මෙත් සිත් ලොබ වඩන්නේ
∪ - - | - - - | - ∪ ∪ | ∪ ∪ - | - - - | ∪ ∪
කටු ඔටුනුත් ගෙන උන්නේ සිරස වසා ගවසන්නේ
- - - | - ∪ - | - ∪ ∪ | - - - | - ∪ - | - ∪ ∪
මේ දුක් දැක කුමරුන්නේ කෙලෙස ද මම වැවෙන්නේ
∪ ∪ - | - - - | ∪ ∪ - | - - - | - - ∪ | ∪ ∪

ඉහත ප්‍රබන්ධය තුළ න ගණය, ජ ගණය සහ ය ගණ යෙදී ඇති බව - - - I - ∪ - I - ∪ ∪ I - - - I – ∪ - I - ∪ ∪ පෙනෙයි. එකී පැදියේ 5 වැනි, 8, 9, 14,17 18 වැන්නේ ගුරු අක්ෂර යෙදී ඇති බව ද පද්‍යාවසානයේ ගුරු මත් දෙකත් යෙදී ඇති බවත් හඳුනාගත හැකි ය. පළමුවැනි සහ තෙවැනි පාද සමාන අක්ෂර සංඛ්‍යාවකින් ද දෙවැනි සහ සිව්වැනි පාද සමාන අක්ෂර සංඛ්‍යාවකින් ද යුතු ය. මේ පසන් කාව්‍යය නිචෘත් අතිධෘති ඡන්දසට අයත් බව හඳුනාගත හැකි ය. යථෝක්ථ කාව්‍ය පද ද මේ ඡන්දස ලක්ෂණය පෙන්නුම් කරයි.

**සිය හස්තත් වැටි රුව අඬා වාවු සත්තු බැද වාදේ**
එම හස්නෙන් ඇන ගැසූ හොබා දුදන බසින් කරවූදෝ
**මේ වැන්නේ තෙදනෙස සුබා ඔබටම කළ අවලාදෝ**
කී සත්තේ මතුවෙයි සැබෑ වෙන් නද දුන්මස් වූදෝ

පළමුවැනි පාදය - - ∪ I ∪ - - I - - - I ∪ ∪ - I ∪ - - I - ∪ ∪ ස, බ, න, ර, බ සහ ය ගණවලින් ද, දෙවැනි පාදය - - ∪ I ∪ - - I - ∪ - I ∪ - - I - - ∪ I - - ∪ I ∪ තෙවැනි පාදය ∪ ∪ ∪ I - - ∪ I - ∪ - I - - - I - - - I - ∪ ∪ ව, ස, ජ, න ගණ දෙකත් සහ ය ගණයත් සමඟ යෙදී තිබේ. සිව්වැනි පාදය ∪ ∪ ∪ I - - ∪ I - ∪ ∪ I - - ∪ I ∪ ∪ ∪ ලෙස ද වේ.

කුරුසේ ඇණ ගස්සමිනේ උනුන් කළෝ වද නොදැනේ
විඳිනා තද දුක් මෙදිනේ කාට කියමුදෝ ඉතිනේ

පළමු පාදයේ ස ගණ තුනත් පරව ජ සහ බ ගණ යෙදී නැවත ස ගණයක් - - ∪ I - - ∪ I - - ∪ I - ∪ - I ∪ - - I - - ∪ යෙදීම ද, දෙවනි පාදය ස ගණ තුනක් පරව බ ගණයක් සහ ස ගණ දෙකක් යෙදීම ද - - ∪ I - - ∪ I - - ∪ I ∪ - - I - - ∪ I - - ∪ දැක ගත හැකි ය.

**අතිධෘති ඡන්දස**

පාදයකට අක්ෂර දහනවය බැගින් යෙදෙනුයේ අතිධෘති ඡන්දස වේ. (මාරසිංහ, 2005) වහකෝට්ටේ පසන් ගායනාවක මෙකී අතිධෘති ඡන්දස අනුව බැඳී පවතී.

රන් ගිරසේ දෙරන රුසේ තොස දිලිසේ නිතර දිසේ
ගුවන් කුසේ දිලි සඳසේ හැම දවසේ සමඟ වැසේ
රන් රසසේ නොම වෙනසේ එන පනසේ සැම දවසේ
මපනලසේ ගිය විලසේ දැක මෙලෙසේ වාමි කෙසේ

මෙහි පළමු පාදය ∪ - - I ∪ - - I - - ∪ I - - - I - ∪ - I - - - I ∪ බ ගණ දෙකත්, ස ගණය, ත ගණය, ජ ගණය සහ න ගණයත් පරව ගුරක් ද, දෙවෙනි පාදය - ∪ - I ∪ - - I - - ∪ I - - - I - ∪ - I - - - I ∪ ජ, බ, ස, ත, ජ සහ න ගණය පරව ගුරක් ලෙසින් ද, තෙවන පාදය ∪ - - I ∪ - - I - - ∪ I - - - I - ∪ - I - - - I ∪ බ ගණ දෙකක්, ස, ත, ජ, න පරව ගුරක් ද, සිව්වන පාදය - - - I - ∪ - I - - - I ∪ - - I - - ∪ I ∪ - - I ∪ න, ජ, න, බ, ස, බ පරව ගුරක් ලෙසින් ද භාවිත වේ. පහත දැක්වෙන්නේ ද අක්ෂර 19 කින් බැඳි ඇති අතිධෘති ඡන්දසට නිදසුනකි.

මවු බිසො ඇඬුවේ දුකලා අඬන ලෙසින් රෑ කිරළා
කුමරුනි මා තනි කරලා වැඩියේ කිම අත් හැරලා

මෙහි පළමු පාදය න ගණ දෙකත්, බ ගණ දෙකත්, ස ගණයත්, බ ගණයෙන් පසු ගුරක් - - - I - - - I ∪ - - I ∪ - - I - -∪ I ∪ - - I ∪ ලෙසින් ද, දෙවෙනි පාදය න ගණයත්, ජ, න, බ ගණ තුනක් පසු

ව ගුරක් ලෙසින් ද - - - |- ∪ - |- - -|∪ - - |∪ - -| ∪ - -|∪ යෙදෙයි. දූව සහ වහකෝට්ටේ පසමක පහත කාව්‍යයේ පාද තුනක එකී ඡන්දස දිස්වේ.

රන් කෙඳිසේ වරල දිසේ රන් රඹසේ ගගන රැසේ
නිල්මිණි සේ සොබන ඇසේ සවන දිසේ විදුලිය සේ
රන් රුවයේ ගතවෙනසේ රුසරු මෙසේ අසන ලෙසේ
මෙපන ලෙසේ ගිය විලසේ හැම දවසේ වාම් කෙසේ

ඉහත කාව්‍යයෙහි දෙවෙනි හා තෙවැනි පාදයන්හි බ ගණ දෙකක්, ස ගණයක්, න ගණයක්, ජ ගණයක් සහ න ගණයක් පරව ගුරු අක්ෂරයක් ∪ - - |∪ - - |- - ∪|- - - |- ∪-| - - -|∪ ලෙස ද, සිව් වැනි පාදයේ න ගණයත් ජ, න, බ, ස සහ බ පරව ගුරු අක්ෂරයක් ලෙස ද - - - |- ∪ - |- - -|∪ - - |- -∪| ∪- -|∪ භාවිත වේ. පළමුවැනි පාදයෙහි අක්ෂර 18 කි. මෙය නිවෘත් අතිධෘති ඡන්දසට නිදසුනකි. තවත් කාව්‍යයක් අපරාර්ථයෙහි දැක්වෙන්නේ අතිධෘති ඡන්දස ය. එය මෙසේ ය.

දිලෙන රනේ රුව ලෙසිනේ මල් උයනේ සිටිය දිනේ
මේ මරණේ ඔබට උනේ කිමද අනේ සුර රජුනේ

පළමුවන පාදය න, ජ, න, ත, ජ සහ න ගණය පර ව ගුරක් ලෙසින් ද - - - |- ∪ - |- - -|∪ ∪ - |- ∪ - | - - -|∪ දෙවැනි පාදය බ ගණ දෙකක්, ස ගණය, න ගණය, ජ ගණය, න ගණය අවසන ගුරක් ලෙසින් ∪ - - |∪ - - |- - ∪|- - - |- ∪-| - - -| යෙදෙයි.

කුමරුන් රුසිරු විසාලා මෙලොවට සොඳ ගුණ පාලා
ඇති සෙනෙහසෙන් වාලා වන අය දී වත නාන පාලා

මෙහි පළමු පාදය තුළ ස, න, ය, න ගණ දෙකක් සහ ස ගණය පරව ගුරක් - - ∪ |- - - |- ∪ ∪|- - - | - - -| - - ∪ |- ලෙසින් ද, දෙවැනි පාදය න ගණ දෙකත්, ම ගණය, න ගණ දෙකක්, ස ගණය පරව ගුරක් ලෙස ද - - - |- - - |∪ ∪ ∪|- - - |- - -| - - ∪|∪ යෙදේ.

**කෘති ඡන්දස**

කෘති ඡන්දසෙහි පාදයකට අක්ෂර විස්සක් බැගින් භාවිත වේ (මාරසිංහ, 2005). නිති සොබනා රුසිරු මෙනා මෙඔබ විනා කවුද වෙනා කවිය අක්ෂර 20 කින් යුත් කෘති ඡන්දස අනුව රචිත ය.

නිති සොබනා රුසිරු මෙනා මෙ ඔබ විනා කවුද වෙ නා
දිවි දලිනා ඔබ වඩනා දිලෙන රනා රුව ලෙසි නා
සියලු දනා සතුටු වනා මියුරු වනා රස බසි නා
සුර වරනා දිවි රැගෙනා පව් බිඳිනා ගියෙ මෙදි නා

මෙහි පද හතරම න, ප, න, බ, ස සහ න ගණය පරව ලඝුවක් හා ගුරු අක්ෂරයක් ලෙසින් - - - |- ∪ - |- - -|∪ - - |- - ∪| - - -|- ∪ යෙදී තිබීම විශේෂතාවයකි. තව ද ලුහු මාත්‍රා හතරකට පසු ගුරු - මාත්‍රාවක් යෙදීම ද - - -∪ - - - - ∪ - - - -∪- - - - විශේෂත්වයකි. පහත සඳහන් කාව්‍යයේ පාද තුනක් අක්ෂර විස්සක් අනුව න, බ සහ ස ගණ අනුව ප්‍රබන්ධ වී ඇති ආකාරය දිස් වේ.

සෙනෙහස කර රන් රසසේ වෙනස නොවි වන පන සේ
තද බද වද කොට බෝසෝ නොවී රුසිරු ගත පෙර සේ
නන් පසතුන් ඉද කුරුසේ පණනල සැඟවුනි මෙලෙ සේ

කුමරුන් දැන දැන සියසේ මවු බිසො ඇඬුවේ මෙලෙසේ

පළමු පාදය - - - | - - - | ∪ - - | ∪ - - | - - ∪ | - - - | - ∪ න ගණ දෙකක්, බ ගණ දෙකක්, ස ගණය හා න ගණය පසු ලඝුවක් හා ගුරක් ලෙස යෙදෙයි. දෙවෙනි පාදය - - - | - - - | - - ∪ | ∪ - ∪ | - - - | - - - | - ∪ න ගණ දෙකක්, ස ගණයක්, ර ගණයක්, න ගණ දෙකක් අවසන ලඝුවක් හා ගුරක් ලෙසින් ද, තෙවැනි පාදය ∪ - - | ∪ - - | - - ∪ | - - - | - - - | - - - | - ∪ බ ගණ දෙකක්, ස ගණයක්, න ගණ තුනක් අවසන ලඝුවක් හා ගුරක් ලෙසින් ද, සිව්වැනි පාදය - - ∪ | - - - | - - - | ∪ - - | - - - | - ∪ - | - ∪ ස ගණයක්, න ගණ දෙකක්, බ ගණයක්, න ගණයක්, ජ ගණයත් පරව ලඝුවක් හා ගුරක් ලෙසින් ද යෙදෙයි.

**ප්‍රකෘති ඡන්දස**

ප්‍රකෘති ඡන්දස යනු අක්ෂර විසි එකකින් රචනා වූවකි (මාරසිංහ, 2005). ද්වූව ප්‍රදේශයේ පසන් ගායනාවක මෙලෙස දැක්වෙයි.

සව්ලෝනාතා වන මෙ අපෙ දෙවි සුරණා කුරුසේ සිරි කරින්
උසුලාගෙන යමිනා ව බරිනා හති කැක්කුම් පිපාසාදියෙන්

මේ පසන් ගායනයෙහි පළමු පාදය නිර්මිත ව ඇත්තේ ම ගණය, බ ගණය, න ගණ දෙකක් සහ ජ ගණ දෙකක් අවසන ස ගණය ∪ ∪ ∪ | ∪ - - | - - - | - - - | - ∪ - | - ∪ - | - - ∪ ලෙසිනි. දෙවෙනි පාදය ස, න, ය සහ ස ගණ දෙකක්, ර ගණ දෙකක් - - ∪ | - - - | - ∪ - | - - ∪ | - - ∪ | ∪ - ∪ | ∪ – ∪ ලෙසින් යෙදී තිබේ. වහකෝට්ටේ තවත් පසම් ප්‍රබන්ධයක අක්ෂර 21 කින් යුත් ප්‍රකෘති ඡන්දස පාද තුනක සඳහන් වූයේ මේ ආකාරයට ය.

සරණවෙලා සැම සව්සතා රකිනට වැඩි දෙව් මේදියතා
උරණවෙලා සත නොනාවනා කරන් වදය දොඩමින් මැතා
කිරණ දිලිසෙන ශ්‍රී ගත දැක දැක වද වෙද මගෙ සිතා
දෙරණ ඉතිරි කඳුළැලි ගතා අඬන් වැනෙන් මවු දස අතා

ඉහත කාව්‍යයේ පළමු පාදය - - - | - ∪ - | - ∪ - | ∪ - - | - - - | - ∪ - | - - ∪ න, ජ ගණ දෙකක්, බ ගණය, න ගණය, ජ ගණය හා ස ගණය ලෙසින් යෙදෙයි. දෙවැනි පාදයේ අක්ෂර විසි එකකි. තෙවැනි පාදය - - - | - ∪ - | - ∪ - | ∪ - - | - - ∪ | - - - | - - ∪ න ගණය, ජ ගණ දෙකක්, බ ගණය, ස ගණය, න ගණය සහ ස ගණය ලෙසින් යෙදී තිබේ. සිව්වැනි පාදය අක්ෂර විසි දෙකකි. මෙය ස්වරාට් ප්‍රකෘති ඡන්දසින් බැඳී තිබේ.

**ආකෘති ඡන්දස**

ආකෘති ඡන්දස යනු අක්ෂර විසි දෙකකින් රචිත වූවකි. (මාරසිංහ, 2005) පාද කිහිපයකින් රචිත ගායනා සොයා ගැනීම මෙහි දී දුර්ලභ වුවක් බැවින් එම ලක්ෂණ පෙන්නුම් කරන එක් පාදයක ලක්ෂණ මෙසේ දැක්විය හැකි ය.

"රකින ලෙස මනු වෙසින් බුවිතල පාමින තිස්තුන් බසසටා"
- - - | - - - | - - ∪ | - - - | - - - | - ∪ ∪ | - - - | ∪
" එදින දෙවියෝ කරපු මෙකරුණ දැක දැකත් ඒ ජුදයෝ "
- - - | - -∪ | - - - | - - - | - - - | - ∪ ∪ | - - - | ∪
කොඳ නද කරවන ඒ රුවේ වදකොට කරවති මැරුවේ
- - - | - - - | - - ∪ | -∪ - | - - - | - - - | - - - | ∪
පෙර වෛරක් පහ කළ ලෙසේ තද කොට වද කරවති රොසේ

- - ∪ |∪- - | - - - | ∪ - - | - - - | - - - | - - - | ∪
උරණ වෙලා සත නොතැවෙනා කරති වදය දොඩමින් මැතා
- - - | - ∪ - | - - - | -∪ - | - ∪- | - - - | – ∪ – | ∪

**විකෘති ඡන්දස**

පාදයකට අක්ෂර විසි තුනක් වන සේ යෙදෙනුයේ විකෘති ඡන්දස යි (මාරසිංහ, 2005). දූව, පිටිපන සහ වහකෝට්ටේ ප්‍රදේශයන්හි ඇසෙන පළමුවැනි පසන් ගායනයෙහි මෙකී ප්‍රබන්ධ ලක්ෂණ අන්තර්ගත ව ඇත. එහි පළමු පාදය න ගණය, ස ගණය, න ගණය, බ ගණය, න ගණය, ස ගණය, න ගණය පරව ගුරු දෙකක් - - - | - -∪ | - - - | ∪ - - | - - - | - - ∪ | - - - | ∪ ∪ වන පරිදි නිර්මිත ය. දෙවැනි පාදය න ගණ දෙකක්, ජ ගණය, න ගණ දෙකක්, ජ ගණය, න ගණය අවසානයේ ලඝුවක් හා ගුරු අක්ෂරයක් වන පරිදි රචනා වී ඇති බව පෙනී යයි.

අණැන දනයන් පහදවාගෙන ඉපදු දෙවියන් අඳුනවා දී
පමණ නැති ලෙස රෝග සුවකර මළවුනුත් පන පිහිටලා

**සංකෘති ඡන්දස**

සංකෘති ඡන්දස යනු අක්ෂර විසි හතරකින් යුක්ත වූවකි. (මාරසිංහ, 2005) පිටිපන පසන් ගායනාවක පාද කිහිපයක් මේ ඡන්දසින් නිර්මාණය වී ඇත.

දකිමින පිලාත්තු රජ සිත බෝසේ දුක උන වෙත ගෙන ආ ස්වා මි
යදමින බැඳි බැමි ඇල් එැදා සිට එම මෙන තව නුමුදා තිබු නේ
තදයෙන මස් යට වැද නෙපෙනී ගත තැළුහෙන ඉදිමිලා ස්වා මි
එලෙසින නෙත පාවා සියලුම ගත රතු උන ලේ කඳ සේ ආ හා

පිටිපන, ඉහත ප්‍රබන්ධයේ පළමුවැනි පාදය - - - | - - ∪ | - - - | - - ∪ | ∪ - - | - - - | - - - | ∪ ∪ ∪ තුන් වැනි පාදය - - - | - ∪ - | - - - | - - ∪ | - - - | - - - | - - - | ∪ ∪ ∪ සිවු වැනි පාදය - - - | - - - | ∪ ∪ - | - - - | - - - | - - - | ∪ - - | ∪ ∪ ∪ ලෙසින් අක්ෂර 24 යුක්ත ව සංකෘති ඡන්දසෙහි ලක්ෂණ දැක ගත හැකි වේ. මෙහි දෙවැනි පාදය අක්ෂර 22 කින් රචනා වී තිබේ. එබැවින් මේ කාව්‍යය නිවෘත් සංකෘති ඡන්දස් ලක්ෂණ පෙන්නුම් වන්නකි.

## මාත්‍රා ඡන්දස් ලක්ෂණ

පෙර සඳහන් සිලෝ විරිත සකස් වී ඇත්තේ වර්ණ ඡන්දසෙහි එන **ම, න, බ, ය, ජ, ර, ස** සහ **ත** යන ගණ අට සහ ලඝු - ගුරු අක්ෂර විවිධාකාරයෙන් සංයෝග වීමෙනි. වෘත්තරත්නාකරය වැනි සංස්කෘත ඡන්දස් ග්‍රන්ථවල වර්ණ ඡන්දසට සම්බන්ධ උක්ත ගණ අට දක්වා ඇති පරිදි ම මාත්‍රා ඡන්දසට අදාළ සර්ව ගුරු ගණය ∪ ∪ , සර්ව ලඝු ගණය - - - -, ආදි ගුරු ගණය හෙවත් බ ගණය ∪ - - , මධ්‍ය ගුරු ගණය හෙවත් ජ ගණය - ∪ - , අන්තර් ගුරු ගණය හෙවත් ස ගණය - - ∪ යන ගණ පහ ඉදිරිපත් කොට තිබේ (විජේතුංග,1999:9). මාත්‍රා හතරක් ඇති ඡන්දස ප්‍රස්තාර කිරීමේ දී ප්‍රභේද 16 ක් දැකගත හැකි වේ (විජේතුංග,1999:11). එකී ප්‍රභේද පිළිබඳ භරතාදීන් පවා පෙන්වනු ලැබ ඇත (මාරසිංහ, 2005:158). පසන් ගීත අතර ද එකී මාත්‍රා ඡන්දසට අනුගත වෙමින් ලියැවී ඇති ප්‍රබන්ධ ද දැකගත හැකි වේ. මාත්‍රා ඡන්දසට අයත් **සර්ව ලඝු** ගණයට අනුව රචිත ගායනාවන් දූව ප්‍රදේශයේ පසන් ගේය කාව්‍ය විමසීමේ දී හඳුනාගත හැකි වීම විශේෂත්වයකි.

ඉර සඳ සහ තරු ( - - - - | - - - - )
පොළවද විසිතුරු ( - - - - | - - - - )

මැවූ සුර තෙද දැරූ ( - - - - | - - - - )
සරණය ලැබ ගරූ ( - - - - | - - - - )

සර්ව ගුරු ගණයට පමණක් අයත් වන පසන් ගායනාවක් හමු නොවුණ ද සර්ව ගුරු පාදාරම්භයේ, පාද මධ්‍යයේ, පාදාවසානයේ පෙදෙනු දක්නට ලැබේ. එය පහත පරිදි ය. වහකෝට්ටේ පසන් ගායනාවක මාත්‍රා ඡන්දසට අයත් ගායනාවක් මෙලෙස ය. එය මාත්‍රා ඡන්දසට අනුව සර්ව ගුරු, අන්තර් ගුරු, ආදි ගුරු ගණවලින් සමන්විත ය. **පද්‍යාරම්භය සර්ව ගුරු** ගණයෙන් ද, පද්‍යාවසානය අන්තර ගුරු ගණයෙන් ද යුක්ත වේ.

මාතා තුරුලෙන් කුමරා ∪ ∪ | - - ∪ | - - ∪
දෝතා වැරයන් උදුරා ∪ ∪ | - - ∪ | - - ∪
බීතා කර ගොස් ගුගුරා ∪ ∪ | - - ∪ | - - ∪
ඒකානෙන් ඇද නොහැරා ∪ ∪ | - - ∪ | - - ∪

පහත කාව්‍ය සර්ව ලඝු ගණයෙන් ආරම්භ වී, **මධ්‍යයේ සර්ව ගුරු ගණය** හා අන්තර් ගුරු ගණයෙන් සමන්විත ලෙස ඉදිරිපත් වී තිබේ.
එම පුර වාසල් කඩෙනා - - - - | ∪ ∪ | - - ∪
යන ශර යෙන් අද්දමිනා - - - - | ∪ ∪ | - - ∪
ගිනි ජල වන් තාපන සේ - - - - | ∪ ∪ | - - ∪
හද තුළ වේලි එම සේ - - - - | ∪ ∪ | - - ∪

වහකෝට්ටේ තවත් පසන් කාව්‍යයක ආරම්භය මාත්‍රා ඡන්දස සර්ව ලඝු ගණයෙන් ද **අවසානය සර්ව ගුරු** ගණයෙන් ද පවතී. පූර්වාර්ධයෙහි ආදි ගුරු ගණය ද, අපරාර්ධයෙහි අන්තර් ගුරු ගණය ද යෙදී ඇති ආකාරය දිස් වේ. මාත්‍රා හතරෙන් හතරට විරාමය යෙදෙන සේ රචනා වී තිබේ.

කඳුළෙන ශ්‍රී ගත නාවා - - - - | ∪ - - | ∪ ∪
සිටි තැන මව් පුතු ගාවා - - - - | ∪ - - | ∪ ∪
රොසයෙන රුදු ඒ යේවා - - - - | - - ∪ | ∪ ∪
ජුද දන කිපෙමින් බෝවා - - - - | - - ∪ | ∪ ∪

ආරම්භය සර්ව ලඝු ගණය ද පාද මධ්‍යයේ සහ අවසානයේ අන්තර ගුරු ගණය ද යෙදෙන අවස්ථාවකට නිදසුනක් වහකෝට්ටේ පසන් මඟින් පැහැදිලි වේ.

සුරවර අපගේ දෙරනා - - - - | - - ∪ | - - ∪
කරතුර බරයෙන් වැටුනා - - - - | - - ∪ | - - ∪

ඉසුළුන කුරුසේ බරෙනුත් - - - - | - - ∪ | - - ∪
වැටෙමින යට වූ බැව්නුත් - - - - | - - ∪ | - - ∪

ඉහත සඳහන් මාත්‍රා ගණ කිහිපයකින් සැදි පසන් ගායන ක්ෂේත්‍රයේ දී හඳුනා ගත හැකි ය. ගණ තුනක් හෝ හතරක් යෙදෙන අවස්ථා රැසක් විය. පහත උදාහරණ එයට නිදසුනකි. සර්ව ලඝු ( - - - - ) ආදි ගුරු (∪ - -) අන්තර් ගුරු ( - - ∪ ) මාත්‍රා ඡන්දස් තුන පිළිවෙළින් යොදා ගෙන පද්‍ය පේළි හතරේ එක ම ලෙසින් දැක්වෙන පසන් ගායන පහත පරිදි ය.

නිති සොබනා රුසිරු මෙනා මෙ ඔබ විනා කවුද වෙ නා
- - - - | ∪ - - | - - ∪ | - - - - | ∪ - - | - - ∪
දිවි දලිනා ඔබ වඩනා දිලෙන රනා රුව ලෙසි නා
- - - - | ∪ - - | - - ∪ | - - - - | ∪ - - | - - ∪
සියලු දනා සතුටු වනා මියුරු වනා රස බසි නා
- - - - | ∪ - - | - - ∪ | - - - - | ∪ - - | - - ∪
සුර වරනා දිවි රැගෙනා පව් බිඳිනා ගියෙ මෙදි නා

- - - - | ∪ - - | - - ∪ | - - - - | ∪ - - | - - ∪

සුර ලොව්නේ බැස මේදිනේ මවු කුසිනේ බිහි වෙමි නේ
- - - - | ∪ - - | - - ∪ | - - - - | ∪ - - | - - ∪
කුඹු දෙතනේ කිරි බොමිනේ මිණි ලෙසිනේ වැඩුණු තැ නේ
- - - - | ∪ - - | - - ∪ | - - - - | ∪ - - | - - ∪
දිලෙන රනේ රුව ලෙසිනේ මල් උයනේ සිටිය දි නේ
- - - - | ∪ - - | - - ∪ | - - - - | ∪ - - | - - ∪
මේ මරනේ ඔබට උනේ කිමද අනේ සුර රජු නේ
- - - - | ∪ - - | - - ∪ | - - - - | ∪ - - | - - ∪

සර්ව ලඝු, සර්ව ගුරු, ආදි ගුරු **ගණ තුන** පමණක් යෙදෙන පසන් ගායන ද වේ.

අතට අසුව යමයාගේ වද කරවන සැටි වේ ගේ
- - - - | - - - - | ∪ ∪ | - - - -| ∪ ∪
තුටු කර සිත යමයාගේ දැන්විය මේ අවලා ගේ
- - - - | - - - - | ∪ ∪ | ∪ - - | ∪ - - | ∪ ∪
බස අදහා ජුදයාගේ වද කරවති තද වේ ගේ
- - - - | ∪ - - | ∪ ∪ | - - - - | - - - - | ∪ ∪
ස්වාමි දරුවනි මාගේ කෙලස ද වැවෙන ලා ගේ

∪- - | - - - - | ∪ ∪ | - - - - | ∪ - - | ∪ ∪

සර්ව ලඝු, අන්තර් ගුරු, සර්ව ගුරු ගණ තුන යෙදෙන කෙටි කාව්‍යයකට නිදසුන් මෙසේ ය.

ලෙවු සත රැක වැඩ ඉඳ ලා - - - - | - - - - | - - ∪
දෙවු වදයට අසුසේ ලා - - - - | - - - - | ∪ ∪
මවුවෙනි මට දුක් දී ලා - - - - | - - - - | ∪ ∪
පව් ගත්තුව ජුදයා ලා ∪ ∪ | - - - - | ∪ ∪

සර්ව ලඝු, සර්ව ගුරු, ආදි ගුරු, අන්තර් ගුරු යන **ගණ හතර** අයත් වන පද්‍ය කාව්‍ය පසන් ගායනාවන්හි විද්‍යමාන වේ.

තෙද අනසක නොදනී දෝ වද කළ අත් නොදනී දෝ
- - - - | - - - - | ∪ ∪ | - - - - | ∪ - - | ∪ ∪
කුරුසේ කර තිබුවා දෝ මා ඇර කොයි වැඩියා දෝ
- - ∪ | - - - - | ∪ ∪ | ∪ - - | ∪ - - | ∪ ∪
ඔබටත් මේ සැටි වේ දෝ මේ ගිය පණ නල ඒ දෝ
- - ∪ | ∪ - - | ∪ ∪ | ∪ - - | - - - - | ∪ ∪
දුක් දීලා මැරුවා දෝ වැදූ මගෙ සිත වැවේ දෝ
∪ ∪ | ∪ - - | ∪ ∪ | - - - - | - - ∪ | ∪ ∪

ඔබ නම දැන් පරදානේ සිහි කර තොත් රූපානේ
- - - - | ∪ - - | ∪ ∪ | - - - - | ∪ ∪ | ∪ ∪
උන් ගිය ගිය හැම තානේ කිසි උවදුරකුත් නැනේ
∪ - - | - - - - | ∪ ∪ | - - - - | - - ∪ | ∪ ∪
විඳිනා දුක් අවමානේ රූ දුටුවා වැනි සීනේ
- - ∪ | ∪ - - | ∪ ∪ | ∪ - - | ∪ - - | ∪ ∪
මේ පොළොවේ වැලි ගානේ ඇඬුවත් මසිත නොවානේ
∪ - - | ∪ - - | ∪ ∪ | - - ∪ | - - - - | ∪ ∪

ඔබ සිය රුව විදුලිය සේ දිලිසෙයි පෙර දිනිඳා සේ
- - - - | - - - - | - - ∪ | - - ∪ | - - - - | ∪ ∪

මුනිවරයොත් සිය දහසේ උවනත දැක සන්තෝ සේ
- - - - | ∪ - - | - - ∪ | - - - - | - - ∪ | ∪ ∪
සියොලඟ රූප විලාසේ නැත කැඩුණා බිඳුණා සේ
- - - - | ∪ - - | ∪ ∪ | - - - - | ∪ - - | ∪ ∪
මට මේ දුක් සිතුනා සේ තොර නැත කඳුළුත් දෑ සේ
- - ∪ | ∪ - - | ∪ ∪ | - - - - | - - ∪ | ∪ ∪

කුමරුන් රුසිරු විසාලා මෙලොවට සොඳ ගුණ පෑ ලා
- - ∪ | - - - - | ∪ ∪ | - - - - | - - - - | ∪ ∪
ඇති සෙනහසයෙන් වාලා වන අය වෙන නැත සෑ ලා
- - - - | - - ∪ | ∪ ∪ | - - - - | - - ∪ | ∪ ∪
ම සිතට තද දුක් දීලා පව් ගත්තුව ප්‍රිදයා ලා
- - - - | - - ∪ | ∪ ∪ | ∪ ∪ | - - - - | ∪ ∪
මව් මේ විලාප කියාලා ඇඬුවේ සුසුමුත් ලා ලා
∪ - - | ∪ - - | ∪ ∪ | - - ∪ | - - ∪ | ∪ ∪

මුතු මිණි රන් විමනේ වැඩ ඉඳලා සුර බව නේ
- - - - | - - ∪ | – - ∪ | - - ∪ | - - - - | ∪ - - | - - ∪
දේවති දෙවියෝ එදිනේ වැඩියයි නරලොව මේදි නේ
∪ - - | - - ∪ | - - ∪ | - - ∪ | - - - - | - - ∪
කුරුසේ ඇන ගස්සමිනේ උනුත් කළෝ වද නොදැ නේ
- - ∪ | - - ∪ | - - ∪ | – ∪ - | ∪ - - | - - ∪
විඳිනා තද දුක් මේදිනේ කාට කියමුදෝ ඉති නේ
- - ∪ | - - ∪ | - - ∪ | ∪ - - | - - ∪ | - - ∪

මාන උතුම් දෙවි සුරනා පාන යසස් බල නොදැ නා
∪ - - | ∪ - - | - - ∪ | ∪ - - | ∪ - - | - - ∪
ඊන ප්‍රදෙව්වෝ මේදිනා කරණ වදය දැක තදි නා
∪ - - | ∪ ∪ | - - ∪ | - - - - | - - - - | - - ∪
වාන දුකක් නො ව මේදිනා කෙසේ ඉඳම් දිවි රැගෙ නා
∪ - - | ∪ - - | - - ∪ | – ∪ - | - - - - | - - ∪
දාන එමවු කුස දුකිනා අඬති පෙරළෙමින් දෙර නා
∪ - - | - - - - | - - ∪ | - - - - | - - ∪ | - - ∪

උකුළට පිනවු කුමරා ගේ මළ කඳ බලමි න්නේ
- - - - | - - ∪ | - - ∪ | ∪ - - | - - - - | ∪ ∪
දුකු ලෙන මවු ඇඬු අයුරා කොහොම ද සකි පවස න්නේ
- - - - | - - - - | - - ∪ | - - - - | - - - - | ∪ ∪
වැකු අය සහ මේ සසරා අහසේ උඩ සිටි ය න්නේ
- - - - | - - ∪ | - - ∪ | - - ∪ | - - - - | ∪ ∪
ලොකු සැප නොබලා එවරා කම්පා උනයි කිය න්නේ
- - - - | - - ∪ | - - ∪ | ∪ ∪ | – ∪ - | ∪ ∪

උවනත බඳුව ද දුල්ලා දැක වඩවන සිත ලො ල්ලා
- - - - | - - - - | ∪ ∪ | - - - - | - - - - | ∪ ∪
එවෙනි සුබාවත නිල්ලා වැගිරෙයි ලේ ගඟුලැ ල්ලා
- - - - | ∪ - - | ∪ ∪ | - - ∪ | ∪ - - | ∪ ∪
ගුන ඇති සතුරෝ ගොල්ලා වදකර වැරුවේ එ ල්ලා
- - - - | - - ∪ | ∪ ∪ | - - - - | - - ∪ | ∪ ∪
දකිමින් මෙහැම සියල්ලා වෑවෙනු බැරි විය වු ල්ලා
- - ∪ | - - - - | ∪ ∪ | ∪ - - | - - - - | ∪ ∪

වරලස රන් කෙඳි වැන්නේ ඔප වඩමින් දිලිසෙ න්නේ
- - - - | ∪ - - | ∪ ∪ | - - - - | ∪ - - | ∪ ∪
තුන් ලොව සියලු සතුන්නේ මෙත් සිත් ලොබ වඩව න්නේ
∪ - - | - - - - | ∪ ∪ | ∪ ∪ | - - - - | ∪ ∪
කටු ඔටුනුත් ගෙන උන්නේ සිරස වසා ගවස න්නේ
- - - - | ∪ – - | ∪ ∪ | - - - - | ∪ - - | ∪ ∪
මේ දුක් දැක කුමරුන්නේ කෙලෙස ද මම වැවෙ න්නේ
∪ ∪ | - - - - | ∪ ∪ | - - - - | - - ∪ | ∪ ∪

පෙර ඇති රුසිරු සබාවේ දිලිහෙන රන් රුව බෝ වේ
- - - - | - - – - | ∪ ∪ | - - - - | ∪- - | ∪ ∪
පාර වැරදි මොබ ආවේ සියොළඟ කැලලත් බෝ වේ
∪ - - | - - – - | ∪ ∪ | - - - - | - - ∪ | ∪ ∪
ඒ දුටු නෙත ළැය කෝවේ උනුවෙන ලෝදිය සේ වේ
∪ - - | - - – - | ∪ ∪ | - - - - | ∪- - | ∪ ∪
කඳ ඇර ගිය පන නා වේ මිදිදෝ මට කරුණා වේ
- - - - | - - – - | ∪ ∪ | - - ∪ | - -- - | ∪

සුර විමනේ වැඩ ඉඳලා සව් සත රකිනට ලොබ ලා
- - - - | ∪ – - | - - ∪ | ∪ - - | - -- - | - - ∪
නරලොව සපැමින එකලා නොයෙක් අරුම යස පා ලා
- - - - | - - – - | - - ∪ | – ∪ - | - -- - | ∪ ∪
තර කොට කුරුසේ බැඳලා කරණ වදට සිත සැක ලා
- - - - | - - ∪ | - - ∪ | - - - - | - -- - | - - ∪
මරණට පත් රඟ දැකලා අඬති දිනිති දුක් වැදි ලා
- - - - | ∪ – - | - -∪ | - - - - | - - ∪ | - - ∪

රන් කෙඳි සේ වරල දිසේ රන් රඹසේ ගහන රැ සේ
∪ - - | ∪ – - | - - ∪ | ∪ - - | ∪ - - | - - ∪
නිල් මිනි සේ සොබන ඇසේ සවන දිසේ විදුලිය සේ
∪ - - | ∪ – - | - - ∪ | - - - - | ∪ - - | - - ∪
රන් රුවසේ ගත වෙනසේ රුසිරු මෙසේ අසන ලෙ සේ
∪ - - | ∪ – - | - - ∪ | - - - - | ∪ - - | - - ∪
මෙපණ ලෙසේ ගිය විලසේ හැම දවසේ වාමි කෙ සේ
- - - - | ∪ – - | - - ∪ | - - - - | ∪ ∪ | - - ∪

සර්ව ලඝු, සර්ව ගුරු ගණ සමඟ අන්තර් ගුරු හෙවත් ස ගණය බහුල ව යෙදෙන, මධ්‍ය ගුරු යන ගණ හතර යෙදෙන කාව්‍යයක් පහත දැක්වේ.

අතත් පයත් වෙන් කරලා කුරුසේ ඇන තද කර ලා
- ∪ - | ∪ ∪ | - - ∪ | - - ∪ | - - - - | - - ∪
තළමින් තදකොට වැරලා එවිගස මළ සැටි දැක ලා
- - ∪ | - - - - | - - ∪ | - - - - | - - - - | - - ∪
මවු බිසො ඇඬුවේ දුකුලා අඬන ලෙසින් රැ කිර ළා
- - - -| - - ∪ | - - ∪ | - - - - | ∪ ∪ | - - ∪
කුමරුනි මා තනි කරලා වැඩියේ කිම අත් හැර ලා
- - - - | ∪ - - | - - ∪ | - - ∪ | - - ∪ | - - ∪

මාත්‍රා ඡන්දසට අයත් ප්‍රභේද හතරක් යෙදෙන පසන් කවි කීපයක් ද වහකෝට්ටේ දී හඳුනාගත හැකි වීම විශේෂත්වයකි. පහත පද්‍යවල එකී ලක්ෂණ දැකිය හැකි ය.

මෙලෙසින් මවු අඬන තැ නා - - ∪ | - - - - | - - ∪
නොලසින් රැ වෙන සෙයි නා - - ∪ | ∪ - - | - - ∪
එලෙසින් තැන්පත් කර නා - - ∪ | ∪ ∪ | - - ∪
විගසින් අවසර රැගෙ නා - - ∪ | - - - - | - - ∪

පැවැත්තු දෙවු ගෝල නම් න - ∪ - | - - ∪ | - - - -
ඇමැත්තු දෙදෙනෙක් සමඟි න - ∪ - | - - ∪ | - - - -
පිලාත්තුගෙන් අවසර ගෙ න - ∪ - | ∪ - - | - - --
සපැත්තු විගසින් එම දි න - ∪ - | - - ∪ | - - - -

දයා සිතැති ගෝල දෙදෙ න - ∪ - | - - ∪ | - - --
සොයා ගොසින් වැනසූ තැ න - ∪ - | ∪ - - | ∪ - -
තියා තෙරපු කුරුසේ ඇ න - ∪ - | - - - - | ∪ - -
භයානිකව අරවන මෙ න - ∪ - | - - - - | - - --

සුර කුමරුන් හට මා ගේ - - - - | ∪ - - | ∪ ∪
මරණට පත් කළ වේ ගේ - - - - | ∪ - - | ∪ ∪
පෙර වයිරක් ජුදයා ගේ - - ∪ | ∪ - - | ∪ ∪
තදකොට වද කළ වේ ගේ - - - - | - - - - | ∪ – ∪

මාත්‍රා ඡන්දසට අයත් සර්ව ලඝු, සර්ව ගුරු, ආදි ගුරු, මධ්‍ය ගුරු, අන්තර් ගුරු යන ගණ **පහ** අයත්වන කාව්‍යය ද දැකිය හැකි ය.

නව මස ගොසින් වදාලා වැඩුනේ රන් කිරි බී ලා
- - - - | - ∪ - | ∪ ∪ | - - ∪ | ∪ - - | - -∪ ∪
මුඛයෙන් රස බස් දීලා තුතිවන සුරතල් පෑ ලා
- - ∪ | - -∪- | ∪ ∪ | - - - - | - - ∪ | ∪ ∪
මේ ලෙස වද කරවාලා සොඳ දෝ දැන් මරවා ලා
∪ - - | - - - - | ∪ ∪ | - - ∪ | ∪ - - | ∪ ∪
මසිතට තද දුක් දීලා පව් අරගති ජුදයා ලා
- - - - | - - ∪ | ∪ ∪ | ∪ - - | - - - - | ∪ ∪

සතහට සෙනෙහස බැන්දෝ වද වින්දේ දැන් ඉන්දෝ
- - - - | - - - - | ∪ ∪ | - - ∪ | ∪ ∪ | ∪ ∪
දෙකංස දිලි සටහන් දෝ රුවුලට සිත ලොබ බැන්දෝ
- ∪ - | - - - - | ∪ ∪ | - - - - | - - - - | ∪ ∪
රුවුල අවුල් කොට සින්දෝ නුවණ නොමැති සරකුන් දෝ
- - - - | ∪ - - | ∪ ∪ | - - - - | - - - - | ∪ ∪
දෙවියෝ ඉවසුවෙ මන්දෝ මමත් කෙසේ වැවෙන් දෝ
- - ∪ | - - - - | ∪ ∪ | - ∪ - | ∪ ∪ | ∪ ∪

සිය රුසිරෙන් වැඩි මෝරා ගුණ නුවණින් සරු සා රා
- - - - | - - - - | ∪ ∪ | - - - - | ∪ - - | ∪ ∪
තෙද අනසක ඇති දිරා මරණය ගත්තේ තෝ රා
- - - - | - - - - | ∪ ∪ | - - - - | ∪ - - | ∪ ∪
තද කොට දුන් දුක් පාරා ඉන් සියොලඟ ගියෙ නෑ රා
- - - - | ∪ ∪ | ∪ ∪ | ∪ - - | - - - - | ∪ ∪
ඇරලා මේ සුර කුමරා කෙසේ ඉඳිමී පන නෑ රා
- - ∪ | ∪ - - | - - ∪ | - ∪ - | - - - - | ∪ ∪

සොබන විලේ මල් උපුලේ කමළු පුලේ දෙනෙත දි ලේ
- - - - | ∪ ∪ | - - ∪ | - - - - | ∪ - - | ∪ ∪
සිත ඇතුළේ ලොබ නොකළේ මෙනුඹ ලොලේ මෙවියවු ලේ
- - - - | ∪ - - | - -∪ | - - - - | ∪ - - | - - ∪
මෙ සක්වලේ තෙදන බලේ පැපු කලේ පෙර එක ලේ
- ∪ - | ∪ - - | - - ∪ | ∪ - - | ∪ - - | - - ∪
දැන් මෙකලේ මෙපනනලේ නැති අසලේ කින්ද ප ලේ
∪ - - | ∪ - - | - - ∪ | - - - - | ∪ ∪ | - - ∪

## නිගමනය

නාට්‍යශාස්ත්‍රකරු පෙළගස්වා ඇති ඡන්දස් 26 කින් 18 කට අදාළ ප්‍රබන්ධ ලක්ෂණ එනම් උෂ්ණික්, අනුෂ්ටුප්, බෘහති, පඞ්ක්ති, ත්‍රිෂ්ටුප්, ජගතී, අතිජගතී, ශක්වරී, අතිශක්වරී, අෂ්ටි අත්‍යෂ්ටි, ධෘති, අතිධෘති, කෘති, ප්‍රකෘති, ආකෘති, විකෘති, සංකෘති යන ඡන්දස් ලක්ෂණ මෙම අධ්‍යයනය ඇසුරෙහි විද්‍යමාන විය. එසේ වුව ද ඒකාක්ෂර, ද්වයක්ෂර, ත්‍ර්‍යක්ෂර, චතුරක්ෂර, පංචාක්ෂර හා ෂඩක්ෂර සංඛ්‍යාවෙන් යුත් උක්ත, අත්‍යුක්ත, මධ්‍ය, ප්‍රතිෂ්ඨා, සුප්‍රතිෂ්ඨා, ගායත්‍රී, අතිකෘති, උත්කෘති යන ඡන්දස්වලින් රචිත පසන් ගායන දූව, පිටිපන හා වහකෝට්ටේ ක්ෂේත්‍ර නිරීක්ෂණයන්හි දී දැකිය නොහැකි වූවකි. තව ද සර්ව ලඝු, සර්ව ගුරු, මධ්‍ය ගුරු, ආදි ගුරු සහ අන්තර්ගුරු ආදි මාත්‍රා ඡන්දසින් ද පසන් ගායන ප්‍රබන්ධ රචනා වී ඇති බව හෙළි විය. ඉහත කරුණු අනුව කතෝලික උප සංස්කෘතියේ අංගයක් වන පසන් ගායන සම්ප්‍රදායෙහි ඡන්දස් ලක්ෂණ දැකිය හැකි බව ප්‍රබන්ධ ලක්ෂණ විමසීමේ දී අනාවරණය වූවකි. ඒ අනුව පසන් ගීත 'ඡන්දස් ලක්ෂණවලින් සුපෝෂිත වී ඇති කලාංගයකි.

පසන් ගායන සම්ප්‍රදාය කතෝලික සමාජයට විධිමත් ව හඳුන්වාදෙන ලද්දේ ලන්දේසි පාලන සමයේ දී ය. එසමයෙහි කතෝලික දහම ඇදහූ ජනයාට මෙන් ම පූජකවරුන්ට අනේකවිධ දුක් පීඩාවන්ට මුහුණපෑමට සිදු වූයේ ලන්දේසි පීඩනය හේතුවෙනි. ඔරතෝරියානු නිකායික පූජකවරුන් ගේ සම්ප්‍රාප්තියත් සමඟ කතෝලික සාහිත්‍යය මෙන් ම ජන වන්දනා නාට්‍ය සහ ජන වන්දනා සංගීතය වෙනස් ම හැඩතලයක් ගත් බව පෙනෙයි. විශේෂයෙන් "සිංහල ක්‍රිස්තියානි සාහිත්‍යය වංශයෙහි ආදි කර්තෘවරයා" යන විරුදවලියෙන් පිදුම් ලද ඉන්දියානු පූජකවරයකු වූ ගොන්සාල්වේස් පියතුමා ගේ දායකත්වය මෙහි දී කැපී පෙනෙන්නකි. කොන්කණි බ්‍රාහ්මණ වංශික තෝමස් ගොන්සාල්වෙස් වසර 1676 දී ගෝවේ දිවාරි නම් ග්‍රාමයෙහි උපත ලැබ, ගෝවේ ජේසු නිකායික ශුද්ධ පාවුළු විද්‍යායතනයෙන් සිය උසස් අධ්‍යාපනය හදාරා අවසන ශාස්ත්‍රවේදී උපාධිය ලැබ තිබේ. අනතුරු ව පූජකවරය සඳහා පුහුණු වීමේ අභිලාෂයෙන් ගෝවේ තෝමස් ඇක්විනාස් ධර්මායතනයට බැඳී දෙව් දහම හදරා, වර්ෂ 1700 දී ඔරතෝරියානු නිකායේ සාමාජිකත්වය ලැබ පූජකවරයකු බවට පත් වීය. පාසල් අවදියේ සිට සංගීතයට දක්ෂ වූ හෙතෙම පසු කලක ධර්මායතනයේ ඕගන් වාදක තනතුරෙහි කටයුතු කළ බව ද කියැවේ. ලන්දේසින් විසින් දියත් කරන ලද කතෝලික ආගමික පීඩනය තුළ වර්ෂ 1705 මැයි 09 දින ගමනාරම්භ කර, 1705 අගෝස්තු 30 වැනි දින තලෙයිමන්නාරමට ගොඩබට මෙකී පියනම මන්නාරම සහ යාපනය ආශ්‍රිත ව සේවය කිරීමේ දී දෙමළ බස මනාව ප්‍රගුණ කර තිබේ (ෆොන්සේකා,1924). එමෙන් ම ලක්දිවට ගොඩ බැසීමට පෙර සිය මව් බස වූ කොන්කනි බස ද සිය ආගමික බස වූ ලතින් ද යටත් විජිතවාදීන් ගේ බස වූ පෘතුගීසි බස ද ඒ හා සමීප ස්පාඤ්ඤ බස ද මනාව හදරා තිබේ (Perniola,1983). මහනුවර මල්වත්ත පාර්ශ්වයේ භික්ෂූන් වහන්සේ ඇසුරේ සහ බෞද්ධ පොතපත පරිශීලනය කිරීමෙන් ලක්දිව බහුතරයක ගේ බස වූ සිංහල භාෂාව ඉගැනීමට සමත් වීම විශේෂයෙන් සඳහන් කළ යුක්තකි. ලාංකිකයන් ගේ ජන විඥානය මැනවින් හඳුනාගත් ගොන්සාල්වේස් පියතුමා සිංහල භාෂාව කතාකරන, මෙරට භාවිත සංස්කෘත කාව්‍ය රීති අවබෝධයක් සහිත ජන ප්‍රජාවකට වෛදික ගායන ඇසුරෙහි සුපෝෂිත වූ ඡන්දස් ලක්ෂණ මෙරට කතෝලික ආගමික ගායන සම්ප්‍රදායක් ලෙසින් සමාජගත කිරීමට යත්න දරා ඇති බව පෙනී යන්නකි. එලෙස හඳුන්වාදුන් පසන් ගායන ප්‍රබන්ධයන්හි

භාෂා සංස්පර්ශීය ලක්ෂණ ද විද්‍යමාන වූවකි. ගොන්සාල්වේස් පියනම ගේ භාෂා ඥානය, සාහිත්‍යික කුශලතාව ද මෙම පසන් ප්‍රබන්ධ හරහා මැනවින් හඳුනාගත හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


ආරියරත්න, සුනිල්. 1987.***කැරොල් පසන් කන්තාරු,*** කොළඹ:සීමාසහිත සුපසන් අධ්‍යාපන සේවා (ප්‍රකාශන) සමාගම

ඉඳුනිල් සිත්දු, *සිංහල භාෂාවේ සම්භවය පරිණාමය සහ සිදත් සඟරාව,* නිර්මාණි ප්‍රකාශකයෝ, 2017

කුලතිලක,සී.ද.එස්. 1972. ***සිංහල සංගීත පර්යේෂණ වාර්තා-අංක 01.*** කොළඹ:ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව.

කුලතිලක,සී.ද.එස්. 1981. ***ජන සංගීත සිද්ධාන්ත.*** බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ගොන්ස්ල්වේස්, ජාකෝමේ. 1948. (සත්වැනි). ***දේශනා නවයේ පසන් පොත.*** බොරැල්ල : කතෝලික සභාව.

පීරිස්, එඩ්මන්ඩ්. (සංස්.). 1979. ***දුක්ප්‍රාප්ති ප්‍රසඞ්ගය.*** මග්ගොන: ශාන්ත වින්සන් කාර්මික පාසැල් මුද්‍රණාලය.

පීරිස්, එඩ්මන්ඩ්. (සංස්). 1979. ***වේද කාව්‍ය.*** කොළඹ: කතෝලික මුද්‍රණාල ප්‍රකාශනය.

මාරසිංහ, වොල්ටර්. 2005. (පරි.). ***භරතමුනිප්‍රණීත නාට්‍යශාස්ත්‍ර ද්විතීය භාගය,*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

රත්න විජේතුංග, ***ඡන්දස් හා සිංහල පද්‍ය සම්ප්‍රදාය,*** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

වැලිවිටියේ සෝරත හිමි, ***එලු සඳැස් ලකුණ,*** අභ ප්‍රකාශකයෝ, ගල්කිස්ස, 1969

වීරක්කොඩි, අයි.එස්., 2017, **චතාරික සමය හා බැඳි සාම්ප්‍රදායික පසන් ගායන සම්ප්‍රදාය,** දර්ශනසූරි උපාධි නිබන්ධනය, නුගේගොඩ:ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

සම්පත්, බි. අයි. 2015. ***සිංහල ගීතයේ ඡන්දස් හා අලංකාර.*** නුගේගොඩ:සරසවි ප්‍රකාශකයෝ.



**ස්තූතිය**

දූව, පිටිපන, වහකෝට්ටේ ග්‍රාමයන්හි කතෝලික ප්‍රජාවට සහ ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා දායක වූ සැමට

ආඛ්‍යාන narrations
**Volume 06 | Issue 01 | January - June 2021 | Article 05**
**ISSN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

# විෂ්ණු දේව වන්දනය හා බැඳුණු චේෂ්ටා පිළිබඳ සමාජ හා මානව විද්‍යාත්මක අධ්‍යයනයක්: තම්මැන්නාගල ශ්‍රී විෂ්ණු දේවාලය ඇසුරෙන්

එම්.ඒ.දිශාන් මදුශංඛ [9]

තිඹිරිවැව සිරි සුමන[10]

නාලක ජයසේන[11]

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ බුදුසමය හා අනුකලනය වූ විවිධ දේව විශ්වාස අතර විෂ්ණු දේව වන්දනයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. සිංහල බෞද්ධ දේව ධුරාවලියට විෂ්ණු දෙවියන් අන්තර්ග්‍රහණය වීම සම්බන්ධ වඩාත් විස්තෘත මානව විද්‍යාත්මක හා ජනශ්‍රැති සාහිත්‍යක් ගොඩනැඟී තිබේ. එහෙත් ශ්‍රී ලංකාවේ  ග්‍රාමීය සැකැස්මේ විෂ්ණු දේව වන්දනය ස්ථානගතව ඇති ආකාරය සම්බන්ධයෙන් වන අධ්‍යයන විරල වේ. මෙම පර්යේෂණය උක්ත පර්යේෂණ අවකාශය ආමන්ත්‍රණය කිරීමේ අභිලාෂයෙන් සිදුකරනු ලබන අධ්‍යයන ක්‍රියාවලියකි. මෙම පර්යේෂණයේ ප්‍රධාන සිද්ධි අධ්‍යයනය වන්නේ තම්මැන්නාගල පුරාණ රාජමහා විහාරස්ථානය ආශ්‍රිත විෂ්ණු දේවාලය යි. අධ්‍යයනයේ ප්‍රථම අදියරේ  ප්‍රධාන පර්යේෂණ ගැටලුව බවට පත්කරගන්නා ලද්දේ විෂ්ණු දේවාලය හා සබැඳි බැතිමතුන්ගේ චේෂ්ටාවන් කවරේද? යන්නයි. මෙහිදී දත්ත රැස්කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ගැඹුරු සම්මුඛ සාකච්ඡා විධික්‍රමය යොදාගත් අතර දේවාලයේ ප්‍රධාන සටහන් පුස්තකය ප්‍රධාන දත්ත පඨිතයක් ලෙස යොදාගනු ලැබිණ. විෂ්ණු දේව වන්දනය ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව ඇත්තේ දකුණු ඉන්දීය ආගමික ආභාසය හේතුවෙනි. විෂ්ණු දේව වන්දනයේ මූලාකෘත ලබ්ධිය වන වෛෂ්ණවවාදය ඇතුළුව පොදුවේ විෂ්ණු දේව ඇදහිල්ල ඈත අතීතයේ සිට මෙරට පැවති බවට වන පුරාවිද්‍යාත්මක සහ ජනශ්‍රැති මූලාශ්‍රය රැසකි. විෂ්ණු දෙවියන් පශ්චාත්කාලීනව උපුල්වන් ලෙස දේශීයකරණය කරගෙන ඇති බවට ද වන විවාදාභිමුඛ මතයක් ශාස්ත්‍රිය ලෝකයේ ගොඩනැඟී තිබේ. එහෙත් බෞද්ධයෝ කතරගම, පත්තිනි ආදි දෙවිවරුන් මෙන් විෂ්ණු දෙවියන් ද බුදුසමයට අනුග්‍රහ සපයන දෙවියෙකු ලෙස පිළිගනිති. තම්මැන්නාගල විෂ්ණු දේව වන්දනාව ආශ්‍රිත සොයාගැනීම්වලට

[9] සහකාර කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

[10] කථිකාචාර්ය (ආධුනික), භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය

[11] ස්වාධීන දර්ශනපති පර්යේෂක, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

අනුව එම දේවාලය සිංහල බෞද්ධ ජනයා ඇතුළුව දෙමළ හා මුස්ලිම් බැතිමතුන්ගේද ආකර්ෂණය දිනාගත් ග්‍රාමීය දේවාලය අවකාශයක් වී තිබේ. දරුඵල ලබාගැනීම, නඩු ආරවුල් සඳහා විසඳුම් ලබාගැනීම, විදේශගත රැකියා සඳහා පිහිටාධාර ලබාගැනීම, ව්‍යාපාර කටයුතුවල සඵලත්වය අත්පත්කරගැනීම හා ග්‍රහදොස් නිවාරණය වැනි ලෞකික ජීවිතයේ මුහුණපාන අභියෝග හා ගැටලු ගණනාවක් ඉෂ්ටසිද්ධ කරගැනීමේ අරමුණෙන් යුතුව බැතිමත්හු මෙම දේවාලයේ බාරහාරවෙති. පූජාවිධික්‍රමයන්ගේ ඇති සරලත්වයත්, එහිලා අනුගමනය කරන යාතිකාවන්හි සුවිශේෂ බවත් හා චේෂ්ටාවන් සාධනය වූ බැතිමතුන් කරන ප්‍රකාශනත් හේතුවෙන් මෙම දේවාලය කෙරෙහි ඉහළ විශ්වාසයක් ගොඩනැගී තිබේ. එම අර්ථයෙන් තම්මැන්නාගල විෂ්ණු දේවාලය ප්‍රධාන වශයෙන් උතුරුමැද පළාතේ වෙසෙන ගැමියන්ගේ ලෞකික ජීවිතය කියවාගත හැකි ආගමික අවකාශයක් ලෙස අවධාරණය කළ හැකිය.

**මුඛ්‍යය පද;** උපුල්වන් දෙවි, ග්‍රාමීය විශ්වාස, චේෂ්ටාවන්, තම්මැන්නාගල පුරාණ විෂ්ණු දේවාලය

## 01. හැඳින්වීම

ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික බෞද්ධ සමාජ අධ්‍යයනය කිරීමේ මානව හා සමාජ විද්‍යාත්මක කතිකාව ආරම්භ වන්නේ 1950 දශකයේදී පමණ වේ. විශේෂයෙන්ම ලාංකේය සන්දර්භයට යටත්ව සාකච්ඡා කිරීමේදී බුදුදහමේ විවිධ දිශානතීන් හා එහි සමාජ මුහුණුවරයන් පිළිබඳ පෘථුල පර්යේෂණ සාකච්ඡාවක් ගොඩනැගී තිබේ. ශ්‍රී ලංකාවේ පවතින ථෙරවාද බුදුදහම සියවස් ගණනාවක් තිස්සේ පවත්වාගෙන ආ ප්‍රධාන ආගමික සම්ප්‍රදාය විය. එහිදී ථෙරවාද බුදුදහම, හින්දු දේව සම්ප්‍රදාය තුළ නිරූපිත දේව, ග්‍රහ, ජ්‍යොතිෂය සහ යක්ෂ ආදී විවිධ ස්වරූපයන්ගෙන් අනූන සෙසු ආගමික භාවිතා සමග ද සහපැවැත්මෙන් යුතුව කටයුතු කර ඇත (**සිල්වා, 2008**). කෙසේ වෙතත් මානව විද්‍යාඥයන් පෙන්වාදෙන්නේ, ථෙරවාද බුදුදහම එහි දාර්ශනික ස්වභාවය අනුව සෙසු ජනප්‍රිය ආගමික වත්පිළිවෙත්වලින් වෙනස් වන බවයි. එනම් දේව හා අධිභෞතික බලවේග සම්බන්ධයෙන් දරන විශ්වාස-යාතුකර්ම ථෙරවාද බුදුදහමේ අනුඅංග ලෙස සාමාන්‍යකරණය කිරීමට ඉක්මන් නොවිය යුතු බවයි (**Obeysekere, 1962**).

කෙසේ වෙතත් මානව විද්‍යාඥයන් පෙන්වාදෙන්නේ දේව විශ්වාස ඇතුළු අධිභෞතික බලවේග කෙරෙහි බෞද්ධයන් වඩාත් ආශක්තව ඇති බවයි. එනම් නිර්මල බුදුදහමේ දාර්ශනික හරයන් සංස්ථාපනය කරගනු වෙනුවට ඒ ඒ ජනසමාජයන්ට ආවේණික බුදුදහමක් නිර්මාණයව පවත්නා බවයි. **Obeysekere (1962)** සිංහල බෞද්ධ සමාජයට අනුගතව ගොඩනැගුණු බුදුදහම "සිංහල බුදුදහම" ලෙස අර්ථකථනය කරන්නේ ඒ අනුවය. එහිදී ලෞකික ජීවිතයේ යම් අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා නිර්මල බුදුදහම මගින් දැක්වූයේ අල්ප දායකත්වයකි. එහි ප්‍රතිඵලය වූයේ බෞද්ධයන් විවිධ දේව ලබ්ධි ඇතුළු අධිස්වභාවවාදී බලවේග කෙරෙහි දැඩි විශ්වාසයක් ගොඩනගාගැනීම හා ඒවා පුරුදු පුහුණු වීම සඳහා යාතුකර්ම සම්ප්‍රදායක් ගොඩනංවාගැනීමයි (**සිල්වා, 2008**). එම අර්ථයෙන් සමස්තයක් ලෙස දේව වන්දනය ඇතුළු අධිභෞතික බලවේග අබෞද්ධ ලෙස විස්තර කළ නොහැකි අතරම ජනප්‍රිය බුදුදහමේ ආභාසය

ලත් බලි, තොවිල්වලින් අනූන ජන ආගමික වත්පිළිවෙත් යන ප්‍රවර්ගය තුළට ද එය ඇතුළත් කළ නොහැකිය (**සිල්වා**, 2008).

මෙම සන්දර්භය යටතේ  සිංහල බුදුදහම තුළ විවිධ දේව විශ්වාස අන්තර්ග්‍රහණයව ඇති ආකාරය සම්බන්ධයෙන් ශාස්ත්‍රීය අවධානය යොමුවේ. එහිදී ප්‍රාග් බෞද්ධ දේව විශ්වාස සම්බන්ධ අධ්‍යයනද කැපී පෙනේ. එනම් යකුන් පිළිබඳ විශ්වාස පසුකාලීනව දේව ලබ්ධි ලෙස මතු වීම එහි එක් ස්වරූපයකි. උදාහරණ වශයෙන් සමන්තකූඨ අධිපති සුමන් සමන් දෙවිඳු බුදුන් සරණ ගිය යක්ෂ ගෝත්‍රිකයෙකු විය හැකිය යන මතය අවධාරණය කළ හැකි වේ (**Paranavitana**, 1958). මෙලෙස සිංහල බෞද්ධ ජන සමාජයෙහි වන්දනාමානයට ලක්වන්නා වූ සුමන සමන්, කතරගම, පත්තිනි, නාථ වැනි දේව ලබ්ධි ආශ්‍රිත මානව හා සමාජ විද්‍යාත්මක අධ්‍යයන රාශියක් හඳුනාගත හැකිය.

උක්ත සඳහන්ව ඇති ආකාරයට සමන් දෙවි වන්දනාවේ සුවිශේෂී බව **සිල්වා** (2008) විසින් අධ්‍යයනය කර ඇති අතර පත්තිනි යාතුකර්මය **ඔබේසේකර** (1984) විසින් අධ්‍යයනය කර තිබේ. එමෙන්ම ස්කන්ද කුමාර කතරගම දෙවියන් ලෙස ස්වදේශීයකරණයට ලක්ව වන්දනාමාන කිරීම සම්බන්ධ අධ්‍යයනද මෙම ශාස්ත්‍රීය ප්‍රවාද අතර වේ (**Obeysekere**, 1977). මීට පරිබාහිරව ඔබේසේකර පෙන්වාදෙන්නේ, දේව ධූරාවලියේ වඩාත් කාරුණික දෙවිවරු ලෙස ස්ථානගතව සිටින නාථ හා විෂ්ණු දෙවියන් අක්‍රීය ආස්ථානයකට පත්වෙමින් සිටින බවයි. ඔවුන් වෙනුවට කතරගම, සූනියම් සහ කාලි වැනි දෙවිවරුන්ගේ මතුවීම ආදේශ කර ඇත. මෙම දෙවිවරුන් මිනිසුන්ට උදව් කිරීමට මැදිහත් වීම මගින් සිංහල බෞද්ධ දේව ධූරාවලියේ වඩාත් ජනප්‍රිය වී ඇත (**Obeysekere**, 1977). මෙහිදී ඔබේසේකර විසින් ඉදිරිපත් කරන මතය යම්තාක් දුරකට නිවැරදි වේ. එනම් පශ්චාත් යටත්විජිත ශ්‍රී ලංකාව තුළ කතරගම, සූනියම් සහ කාලි වැනි දෙවිවරු සිංහල බෞද්ධ ලබ්ධිකයන් අතර වඩාත් ආකර්ශනය වී ඇති අතර මෙමගින් එම දෙවිවරු ඔවුන්ගේ මුල් ස්ථානයෙන් විතැන්ව සිංහල බෞද්ධ දේව ධූරාවලියේ ස්ථානගතව ඇත (**Silva**, 2008).

එහිදී  විෂ්ණු දේව වන්දනය පිළිබඳ සුවිශේෂව සැලකීමේදී ඒ සම්බන්ධ ශාස්ත්‍රීය විවාදය මතභේදයට තුඩු දුන්නකි. එනම් විෂ්ණුගේ දේවානුභාවය **ඔබේසේකර** (1962) තර්ක කරන ආකාරයට සැබෑ ලෙසම අක්‍රීය ආස්ථානයකට පත්වෙමින් තිබේ නම් විෂ්ණු වන්දනය ග්‍රාමීය දේව විශ්වාස පද්ධතියෙන් වියැකී තිබේද? යන පැනය මතුකළ හැකිය. මෙහි අනෙක් සංරචකය වන්නේ විෂ්ණු දෙවියන් ස්වදේශීකරණය වීම සම්බන්ධ ප්‍රවාදයයි. එනම් විෂ්ණු සිංහල බෞද්ධ දෙවියකුද යන පැනයයි. එමෙන්ම ඉහත අවධාරිත දේව ලබ්ධීන්ට සාපේක්ෂව සමකාලීනව විෂ්ණු වන්දනය හා බැඳුණු ග්‍රාමීය අධ්‍යයනවල ඇති විරලත්වයද මෙහිලා අවධාරණය කළ හැකිය.

එබැවින් මෙම අධ්‍යයනය උක්ත මානව විද්‍යාත්මක ප්‍රවාද ආමන්ත්‍රණය කිරීමේ අභිලාෂයෙන් සිදුකරන ලද පර්යේෂණයකි. විෂ්ණු දේව වන්දනය යම් ආකාරයක ශ්‍රී ලංකාවේ සිංහල හා හින්දු ජාතිකත්වය අතර පවත්නා ආගමික හිතෛෂීභාවය කියවාගත හැකි මානයක්ද වී තිබේ. මන්ද හින්දු දේව විශ්වාසයන්ට අනුව බුදුන් යනු විෂ්ණුගේ අවතාරයකි. බෞද්ධයන් විෂ්ණු සංජානනය කරගෙන ඇත්තේ බුදුසමය ආරක්ෂා කරන, බුදුන් අනුදැන වදාළ මග අනුගමනය

කරන බෝසත් දෙවියෙකු වශයෙනි **(Holt, 2000)**. එබැවින් ප්‍රකාශනාර්ථයෙන් සිංහල හා හින්දු ජාතිකත්වයන් අතර විෂ්ණු සම්බන්ධයෙන් ඇත්තේ එකිනෙකට වෙනස් ලබ්ධීන් වුවත්, හරයාත්මකව එහි අනුකලනාත්මක දෘෂ්ටි ද හඳුනාගත හැකිවේ.

මෙම පර්යේෂණ ලිපිය මගින් සමකාලීන ග්‍රාමීය විෂ්ණු වන්දනාවේ ස්වරූපය පිළිබඳව සාකච්ඡා කර ඇති අතරම විෂ්ණු දෙවියන් වඩාත් කාරුණික දෙවියෙකු ලෙස හඳුනාගැනීම තුළ පවත්නා චේෂ්ටාවන් අවධාරණය කර තිබේ. එහිදී තම්මැන්නාගල පුරාණ රජමහා විහාරස්ථානයට අයත් විෂ්ණු දේවාලය ප්‍රධාන සිද්ධි අධ්‍යයනය වශයෙන් යොදාගැනු ලැබූ අතර ලිපිය තුළ විෂ්ණු දේව වන්දනය සම්බන්ධ මානව විද්‍යාත්මක කතිකාව ඇතුළුව සිංහල බෞද්ධ දේව ධුරාවලියේ ස්වරූප සාකච්ඡාවට ලක්කර තිබේ.

### 02. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ප්‍රධාන වශයෙන් ගුණාත්මක පර්යේෂණ විධික්‍රම මත පිහිටා සිදුකරනු ලබන අධ්‍යයනයකි. ශ්‍රී ලංකාවේ ග්‍රාමීයව පිහිටි විෂ්ණු දේවාලය රාශියක් ඇතත් මෙම අධ්‍යයනය සඳහා පාදක කරගන්නා ලද තම්මැන්නාගල පුරාණ විෂ්ණු දේවාලය පිහිටියේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උලගල්ල කෝරළයේය. ග්‍රාමීය විෂ්ණු වන්දනය සහ එහි ගතිකත්වයන් අළලා වඩාත් සාකල්‍ය ගවේෂණයක් සිදුකළ යුතු වුවත්, පවත්නා සීමිත තත්ත්වයන් හේතුකොටගෙන මෙම අධ්‍යයනයට අයත් ක්ෂේත්‍ර කටයුතු ඉහත සඳහන් දේවාලයට පමණක් ලඝු කරන ලදි.

මෙම දේවාලය ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ඉහළ පර්යේෂණාත්මක විභවයක් සහිත ග්‍රාමීය විෂ්ණු දේවාලවලින් එකකි. එනම් තම්මැන්නාගල පුරාණ විෂ්ණු දේවාලය බහුවිෂයික අධ්‍යයන සඳහා වන අවකාශයක් ලෙස හඳුන්වාදීමේ වරදක් නැත. එහි පුරාවිද්‍යාත්මක අක්ෂය හෙවත් මහනුවර යුගය දක්වා දිවෙන ඓතිහාසික මූල පිළිබඳ ගවේෂණයක් සිදුකළ හැකිය. ජනශ්‍රැති අධ්‍යයන ධාරා ඔස්සේ විමර්ශනය කිරීමේදීද මෙම විෂ්ණු දේවාලය හා බැඳුණු කතිකා රාශියකි[12]. සමාජ විද්‍යාත්මකව ගත්කල දේවාල භූමිය තත්කාලීනව උසුළන සමාජ භූමිකාව හා නූතනත්වය හමුවේ එහි සිදුව ඇති සමාජ විපර්යාස විමර්ශනය කළ හැකිය.

තම්මැන්නාගල පුරාණ විෂ්ණු දේවාලය පිළිබඳ මෙම අධ්‍යයනය එම අර්ථයෙන් උක්ත බහුවිධ ප්‍රවේශ අනුක්‍රමිකව ගවේෂණය කරන අධ්‍යයනයක් ලෙස අවධාරණය කළ හැකිය. එනම් මෙම පර්යේෂණය අදියර ගණනාවක් යටතේ සිදුවේ. එහෙත් මෙම අධ්‍යයන පත්‍රිකාවෙන් පාඨකාවතීර්ණ කරනුයේ එහි පළමු අදියරේ සොයාගැනීම් පිළිබඳව වේ. පළමු අදියරය තුළ ප්‍රධාන පර්යේෂණ ගැටලුව බවට පත්කරගන්නා ලද්දේ විෂ්ණු දේව වන්දනය හා බැඳුණු පරමාර්ථ හෙවත් චේෂ්ටා කවරේද? යන්නයි. එමෙන්ම උක්ත පරමාර්ථ හෙවත් චේෂ්ටාවන්හි ඇති සමාජ හා මානවවිද්‍යාත්මක සුවිශේෂී බව ගවේෂණය කිරීම මෙහි ප්‍රධාන අරමුණ බවට පත්කරගන්නා ලදි. මෙම පළමු අදියරය ප්‍රධාන වශයෙන් පාදක වන ලද්දේ ද්විතීයික දත්ත මූලාශ්‍රය මත වේ. එනම් විෂ්ණු දේවාලය භාරකාර මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන දේවාලය පුස්තකය ප්‍රධාන දත්ත මූලාශ්‍රය ලෙස යොදාගන්නා ලදි. එය දෛනිකව දේවාලය

---

[12] තම්මැන්නාගල විෂ්ණු දේවාල පුස්තකයේ වන පූර්විකාමය තොරතුරු, 2015

සඳහා පැමිණෙන ලබ්ධිකයන්ගේ අභිලාෂ හා මුදුන්පත් කරගැනීමට බලාපොරොත්තු වන චේෂ්ටා සංගෘහිත කරන ලද විධිමත් ලේඛනයකි.

එමෙන්ම ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ දේවාලය වෙත පැමිණෙන ලද බැතිමතුන් 10 දෙනෙකු පමණ අධ්‍යයනයට යොදාගන්නා ලදි. එනම් අදාළ ප්‍රතිචාරිකයන් සමඟ ගැඹුරු සම්මුඛ සාකච්ඡා විධික්‍රමයට යටත්ව දත්ත රැස් කරන ලදි. මෙම මූලික අදියරයේ දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණය කිරීමේ ප්‍රධාන ප්‍රවර්ගයක් වන තේමා අන්තර්ගත විශ්ලේෂණ විධික්‍රමය යොදාගෙන ඇත.

## 03. සාහිත්‍ය විමර්ශනය

### 3.1 ශ්‍රී ලංකාවේ දේව වන්දනා පිළිබඳ මානවවිද්‍යාත්මක කතිකාව

ශ්‍රී ලංකාවේ බුදුසමය හා බැඳුණු කතිකාවන්හි අවියෝජනීය තේමාවක් ලෙස විවිධ දේව විශ්වාස පිළිබඳව පවත්නා මානව විද්‍යාත්මක ප්‍රවාද අවධාරණය කළ හැකි ය. එනම් විවිධ දේව ලබ්ධි විමර්ශනය කර ඇත්තේ බුදුදහමේ සමාජීය ස්වරූප හා සමගාමීවය. නිර්මල බුදුදහම තුළ දේව විශ්වාස සඳහා හිමිව පැවතියේ ද්විතීයික ආස්ථානයකි. එනම් දේව විශ්වාස ප්‍රතිපත්තිය බුදුසමයෙන් බහිෂ්කරණයව පැවති බව නොවේ. දෙවියන්ගේ පිහිටාධාර පැතීම සඳහා වූ අවකාශය යම් ආකාරයක සීමිත එකක් වූ බවයි **(කාරියවසම්, 1991).** එහිදී ජීවිතයේ යම් යම් අවශ්‍යතා පූරණය කරගැනීම සඳහා විවිධ විශ්වාස හා ලබ්ධීන්හි නියුතුව සිටි හුදී ජනයා හට නිර්මල බුදුදහමෙන් හිමිවූයේ ස්වල්පාධාරයකි.

එහෙයින් ජනයා අතර බුදුදහම තවදුරටත් පැතිරයත්ම ඔවුන්ගේ ලෞකික අවශ්‍යතාවලට අනුකූල විවිධ දේවමය ලබ්ධි හා විශ්වාස අන්තර්ග්‍රහණය වීම සිදුවේ. මෙය සිංහල බුදුදහම ලෙස **Obeysekere** (1962) පෙන්වා දේ. සිංහල බුදුදහමෙහි විවිධ දේවමය ලබ්ධි ස්ථානගත වුවද කර්මය, දුක හා පුනර්භවය පිළිබඳ විශ්වාසය එහි මූලික හරය වී ඇති බව **Obeysekere (1962)** තවදුරටත් පෙන්වා දේ. මුල්කාලීන මානව විද්‍යාත්මක අධ්‍යයන බොහොමයක වස්තු විෂය වූයේ මෙම දේව ලබ්ධි ඇතුළු සිංහල බුදුදහමේ ස්වරූපය හා සමාජය අතර සම්බන්ධතාවය ගවේෂණය කිරීමයි. එමෙන්ම සිංහල බුදුදහම තුළ ධූරාවලිගත දේවමණ්ඩලයක් පවතී. මානව විද්‍යාඥයෝ මෙම ධූරාවලිගත දේව මණ්ඩලය ඇසුරෙන් දෙවියන්ගේ අධිකාරය පිළිබඳව අධ්‍යයන සිදුකළහ.

**රූප සටහන් අංක-01-සිංහල බුදුදහමේ වන ධූරාවලිගත දේව මණ්ඩලය**




**(මූලාශ්‍රයඃ Obeysekere: 1962)**

මෙම ධූරාවලිගත දේව මණ්ඩලයේ ඉහළම සහ උත්තරීතරම ආස්ථානය හොබවන්නේ බුදුරජාණන් වහන්සේය. බුදුන්ගේ වරම හෙවත් අවසරය මත දේව ධූරාවලිය ස්ථානගතව තිබේ. **Obeysekere** (1962)ට අනුව දෙවිවරුන් විසින් ක්‍රියාවට නංවන බලය වනාහි ඔවුන්ගේ ආධ්‍යාත්මික ගුණාංගයන්ගෙන් උත්පාදනය වන ආනුභාවය සහ භෞතික ගුණාංගයන්ගේ එකතුවකි. සමන් ඇතුළු සියලුම ප්‍රධාන දෙවිවරුන් සතුව මෙම ගුණාංග පවත්නා නමුදු ඔවුන් විසින් එම ගුණාංග ඒකාකාරීව බෙදාහරිනු නොලැබේ. උදාහරණ වශයෙන් විෂ්ණු, සමන් සහ නාථ දඬුවම් කිරීමට වඩා කාරුණික වන අතර එම හේතුව මත ඔවුන් ස්ථානගතව ඇත්තේ බුදුන්වහන්සේට සමීප ආස්ථානයකය (**Obeysekere**, 1962).

මෙලෙස ධූරාවලිගත දේව මණ්ඩලයක ඇති සමාජ ප්‍රකාශන කවරේද? ඉහතින් අවධාරිත ආකාරයට එක් එක් දෙවියන් අදහන සමාජ ස්ථර මෙහිලා හඳුනාගත හැකි වේ. එනම් පත්තිනි දේව වන්දනය ප්‍රධාන වශයෙන් ග්‍රාමීය සන්දර්භයක ස්ථානගතව වර්තමානය වනවිට නාගරික හා අර්ධ නාගරික කලාප කරා ද ප්‍රසාරණයව තිබේ(**Obeysekere**, 1984). සමන් දේව වන්දනයේ අවම විමක් හඳුනාගත නොහැකි වුවත් එය මහ සමන් දේවාලය හා සමන් දෙවි වැඩවසන ශ්‍රී පාදය-රත්නපුර ආශ්‍රිත ප්‍රධාන වන්දනාවක් වී තිබේ (**Silva**, 2008). කතරගම වන්දනය වඩාත් ජනප්‍රිය වන්දනයක් ලෙස සැලකෙන අතර මිනිස් ලෝකය හා සම්බන්ධ කාරණාවලට කතරගම දෙවියන්ගේ වන ආනුභාවය අවධාරණය වී තිබේ(**Obeysekere**, 1977). මීට පරිබාහිරව කාලි හා සූනියම් වන්දනයේ මෑතකාලීන මතු වීමද අවධාරණය කළ හැකිය. පොදුවේ අර්ධ නාගරික හා ග්‍රාමීය පහළ සමාජ ස්ථර සූනියම් දෙවි කෙරෙහි ආකර්ෂණය වී තිබේ. ඊට සමාන්තරව කාලි වන්දනය නාගරික හා අර්ධ නාගරික ස්ථරයන්ගේ නපුරු වේශ්‍යා පමුණුවාලන, සමාජ යුක්තිය ප්‍රක්ෂේපනය කෙරෙන දේව ලබ්ධිය වී තිබේ (**Silva**, 2006).

එහිලා විෂ්ණු දෙවියන් ස්ථානගතව ඇත්තේ කිනම් ආකාරයෙන්ද ? ග්‍රාමීය සමාජ සන්දර්භයෙහි උපුල්වන් ලෙසත් අනෙක් අතට හින්දු එහෙත් බුදුදහමෙහි සුපිළිපන් ආරක්ෂයා ලෙසත් විෂ්ණු

දෙවියන් වන්දනාමානයට ලක් වේ (**Paranavitana**, 1958). විෂ්ණු දඬුවම් කිරීමේ භූමිකාවෙන් වියුක්තව පිහිටි දේවතාවෙකු වශයෙන් හඳුනාගන්නා අතර, මෙම හේතුව මත ග්‍රාමීයව විෂ්ණු දේව වන්දනය අක්‍රීය ආස්ථානයකට පත්වෙමින් තිබේද යන ප්‍රවාදය ගැඹුරින් විභාග කිරීම අවශ්‍යය.

## 3.2 විෂ්ණු දෙවියන් පිළිබඳ හින්දු ආගමික ප්‍රවාදය

හින්දු ආගමේ ප්‍රධාන ආගමික ලබ්ධීන් ත්‍රිත්ත්වයක් හඳුනාගත හැකිය. එනම් ශිව වන්දනය ප්‍රමුඛ කරගත් ශිවවාදය, විෂ්ණු වන්දනය ප්‍රමුඛ කරගත් වෛෂ්ණවවාදය හා මාතෘ දෙවඟන ප්‍රමුඛ කරගත් ශක්තිවාදයයි. විෂ්ණු දෙවියන් එහිලා ස්ථානගතව ඇත්තේ වෛෂ්ණවවාදයේය. එනම් වෛෂ්ණවවාදයේ ශ්‍රේෂ්ඨතම දෙවියා ලෙස විෂ්ණු දෙවියන් නම් කර ඇත (**බෝගොඩ සීලවිමල, 2001**). විෂ්ණු දෙවියන් හැඳින්වීම සඳහා පර්යාය පද රාශියක් ව්‍යවහාර කෙරේ. නිදසුන් වශයෙන් විෂ්ණු දෙවියන් නාරායන හෝ හරි ලෙස හඳුන්වන අතර ඉන් අදහස්වන්නේ ධර්මයේ ආරක්ෂකයා යන්නයි. මීට පරිබාහිරව වාසුදේව, රාම, ජගන්නාථ, ගෝවින්ද, සත්‍යනාරායන හා පෙරුමාල් වැනි නාමයන් ද හින්දු වේද මූලාශ්‍රයවල දැක්වේ (**Javalgekar, 2012**).

විෂ්ණු දෙවියන් අත දරා සිටින මෙම සුදර්ශන් චක්‍රය හුදෙක් ආයුධයක් පමණක් නොවේ. එනම් ඉන් සංකේතවත් කර ඇත්තේ චක්‍රයක් ලෙස පවත්නා ස්වභාව ධර්මයේ නියාමනයයි. සුදර්ශන් යන්නෙහි සරල අරුත යහපත් දර්ශනය යන්නයි. එනම් මෙම සුදර්ශන් චක්‍රය සැප-දුක යන ගුණාංග කැටි වූ සනාතන දහම විදහාපාන කැඩපතක් ලෙස ද අර්ථකථනය කර තිබේ (**Javalgekar, 2012**).

## 3.3 විෂ්ණු දෙවියන්ගේ  බාහිර ස්වරූපය

විෂ්ණු දෙවියන් තද නිල්පැහැති සමකින් යුත්, අත් සතරක් ඇති දේවතාවකු වශයෙන් නිරූපණය කර තිබේ. එමෙන්ම නෙළුම් මලක්, යගදාව හෙවත් ජයකොන්තයක්, හක්ගෙඩියක් සහ සුදර්ශන් චක්‍රයක් අත්සතරෙහි දරා සිටියි. එමෙන්ම විෂ්ණු දෙවියන් මහානුභාව සම්පන්න මැණිකක් වන කෞස්තුභ මාණික්‍ය ගෙළ පැලඳ සිටී. පපුවේ ශ්‍රී වත්ස නම් කෙස් රොදක් වෙයි. පතිනිය වන උතුම් ශ්‍රී ලක්ෂ්මී දේවිය උරයේ වාසය කරයි. විෂ්ණු දෙවියන්ගේ වාහනය ලෙස නිරූපණය කර ඇත්තේ ගුරුලෙකි (**හෙට්ටිආරච්චි, 1970**).

එමෙන්ම හින්දු වේද නිරුක්තිවල සඳහන් වන ආකාරයට විෂ්ණු සතුව අවතාර 10ක් පිහිටා තිබේ. මෙහි අවතාර යනුවෙන් අදහස් වන්නේ සාමාන්‍ය ජන ව්‍යවහාරයේ පවත්නා අවතාර පිළිබඳ අදහස නොවේ. එනම් මනුලොව උපත ලබා ඇති විවිධ ස්වරූපය. ඉන් අවතාර 09 දැනට පහළ වී ඇති බවත් කලියුගය අවසානයේදී අවසාන අවතාරය හෙවත් කල්කී අවතාරයෙන් විෂ්ණු දෙවියන් කටයුතු කරන බවත් එහි සඳහන්ය (**Javalgekar, 2012**). මෙම නව ආකාරයේ අවතාර වන්නේ මත්ස්‍ය අවතාරය, කූර්ම අවතාරය, වරාහ අවතාරය, නරසිංහ අවතාරය, වාමන අවතාරය, පර්ශුරාම අවතාරය, රාමාවතාරය, ක්‍රිෂ්ණාවතාරය හා බුද්ධාවතාවරයයි. මෙම සෑම අවතාරයක් හා බැඳුණු වීර කාව්‍යයන් නිර්මාණය වී ඇත. එහිදී හින්දු වේද නිරුක්තිවලට අනුව ගෞතම බුදුන් වහන්සේද විෂ්ණුගේ අවතාරයකි (**කෝට්ටගොඩ, 2019**).

මෙලෙස විෂ්ණු දෙවියන් පිළිබඳ හින්දු ආගමික ප්‍රවාදයත්, විෂ්ණු දෙවියන්ගේ බාහිර ස්වරූපය හා අවතාරමය ස්වරූප පිළිබඳවත් දළ අවබෝධයක් ලබාගත හැකිය. විෂ්ණු දේව වන්දනය ලාංකේය සමාජයේ තුළ ප්‍රචාරය වූ ආකාරය සහ ඒ සම්බන්ධයෙන් පවත්නා පුරාවිද්‍යාත්මක හා ජනශ්‍රැති සාහිත්‍ය පිළිබඳ මීළඟට විමසා බලමු.

### 3.4 විෂ්ණු දේව වන්දනය හා බැඳුණු පුරාවිද්‍යාත්මක සාධක

ශ්‍රී ලංකාවේ විෂ්ණු දේව වන්දනය ආරම්භ වූ ආකාරය විමසීමේදී දැනට අනාවරණය කරගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධක[13] මඟින් සපයන්නේ කදිම ශාස්ත්‍රාලෝකයකි. ඉහත සඳහන් වන ආකාරයට විෂ්ණු දෙවියන් එහිලා හඳුනාගෙන ඇත්තේ හින්දු දේව සමූහයේ එන දෙවියකු වශයෙනි. එනම් විෂ්ණු වන්දනය දකුණු ඉන්දියාවේ වඩාත් ප්‍රචලිත වීමෙන් අනතුරුව ලංකාවේ ද එය සුපතල වන්දනාවක් බවට පත්ව ඇති බවයි **(බෝගොඩ සීලවිමල, 2001)**.

එහෙත් ලංකාවේ වෛෂ්ණවවාදයේ මූලාකෘත ලබ්ධි යම් පමණකට ව්‍යාප්තව තිබූ බවට සාධක අනාවරණය කරගෙන තිබේ. දකුණු ඉන්දීය ආභාසය සහිත වාසුදේව හා නාරායන වන්දනය වෛෂ්ණවවාදයේ මූලාකෘත ස්වරූපය ලෙසද සැලකේ. වෛෂ්ණවවාදය ප්‍රධාන ආගමික ධාරාවක් ලෙස ප්‍රභවය වී ඇත්තේ ඉන්දියාවේ ගුප්ත පාලන අවධියේය. එය හින්දු ආගමික දෘෂ්ටිවාදයක් ලෙස පෝෂණය කිරීමෙහිලා රාමනුජම් වැනි හින්දු පූජකයන් විසින් සුවිශේෂී දායකත්වයක් සපයා තිබේ. පශ්චාත්කාලීනව නාරායන වන්දනය වෛෂ්ණවවාදයේ හරයාත්මක ලබ්ධිය බවට පත්වේ **(බෝගොඩ සීලවිමල, 2001)**. මෙම නාරායන ලබ්දිය සහිත වෛෂ්ණවවාදය මෙරට දී විකාසනය වීමෙන් විෂ්ණු දේව වන්දනය බිහි වූ බවට පිළිගැනේ. ශ්‍රී ලංකාවේ ද වාසුදේව වන්දනය සහ නාරායන වන්දනය පැවති බවට අනාවරණය කෙරෙන පුරාවිද්‍යාත්මක සාධක කිහිපයකි. ඒ අතර ක්‍රි.පු 10 වන සියවසේදී පමණ හමු වූ ශිලා ලිපියක සඳහන්ව ඇත්තේ වාසුදේව වන්දනයේ සුපිළිපන් මහාදේමි නමැති පූජකයෙකු වැඩවාසය කර ඇති බවයි **(බෝගොඩ සීලවිමල, 2001)**.

වෛෂ්ණවවාදය පැවති බවට අනාවරණය කෙරෙන මෙම පුරාවිද්‍යාත්මක සාධකවලට පසුව විෂ්ණු දෙවියන් පිළිබඳව පවත්නා ඓතිහාසික සහ ජනප්‍රවාදාත්මක මූලාශ්‍රය රැසක් හමුවේ. ප්‍රධාන වශයෙන් මහාවංසයේ දැක්වෙන්නේ බුදුරදුන් වදාළ මෙහෙවරින් ශක්‍ර දේවේන්ද්‍රයා විසින් ශ්‍රී ලංකාව ආරක්ෂා කිරීම භාරදී ඇත්තේ විෂ්ණු දෙවියන්ට බවයි. එමෙන්ම ශක්‍ර දේව අණ පරිදි පරිබ්‍රාජක වෙසින් මෙහි පැමිණි විෂ්ණු දෙවියෝ විජය ඇතුළු පිරිසට පිරිත් පැන් ඉස ආරක්ෂාව පිණිස ඔවුන්ගේ අත්හි පිරිත් නූල් බැඳ ඇති බව කියවේ **(කෝට්ටගොඩ, 2019)**. එසේම තවත් ජනප්‍රවාදාත්මක මතයක් වන්නේ, බුද්ධත්වය ලබා ගන්නා මොහොතේ එය වැළැක්වීම සඳහා පැමිණි මාර සෙනඟ දුටු අනෙකුත් දෙවිවරු පැන දුවද්දී ඔවුනට නොබියව මුහුණදී ආරක්ෂාව සපයාදී ඇත්තේ විෂ්ණු දෙවියන් බවයි **(හෙට්ටිආරච්චි, 1970)**.

එමෙන්ම 11 සහ 12 වන සියවස්හි එනම් පොළොන්නරු පාලන සමයේදී විෂ්ණු දෙවියන්ගේ යැයි සැලකෙන පිළිම සහ අභිචාර විධි අනාවරණය කරගෙන තිබේ. ඉපැරණි මහියංගන ස්තූප කුටියේ බුදුන්වහන්සේ බුද්ධත්වයට පත්වීම නිරූපණය කෙරෙන සිතුවමක් දක්නට ලැබෙන

[13] ක්‍රි.පු 05 වන සියවසේ විරචිත පාලි අට්ඨකථා

අතර එහි පසෙකින් බුදුන් වහන්සේට මල් පූජා කිරීම සඳහා සූදානම් වන විෂ්ණු දෙවියන්ගේද සිතුවමක් නිරූපණය කර තිබේ. මේ හා සමානව පොළොන්නරුවේ ඇති විජ්ජාධර ලෙනෙහි සිතුවමක විෂ්ණු දෙවියන් විසින් බුදුන් වහන්සේ සඳහා අනුග්‍රහ සපයමින් අත් යුගලකින් වන්දනාමාන කරන ආකාරයත්, අනෙක් අත් යුගලකින් එක් අතක චක්‍රයක් සහ සෙසු අතින් කොන්තයක් දරා සිටිනා ආකාරයත් නිරූපණය කර තිබේ **(බෝගොඩ සීලවිමල, 2001)**.

මෙලෙස වෛෂ්ණවවාදයේ මූලාකෘත ලබ්ධි ඔස්සේ වර්ධනය වූ විෂ්ණු වන්දනය 13 හා 16 වන සියවස් අතර කාලයේදී මෙරට පැවති සෙසු දේව වන්දනා අතරින් ප්‍රමුඛ වන්දනාවක් ලෙස මතුව තිබේ. හින්දු ආගමික ධාරා වඩාත් බලවත්ව මතුවීමෙහිලා තුඩු දුන් ප්‍රධාන හේතුව වූයේ දකුණු ඉන්දීය ආගමික හා සංස්කෘතික භූමිකාවයි. එහි ආභාසය හේතුකොටගෙන බෞද්ධ සිද්ධස්ථානයන්හි විෂ්ණු දෙවියන් ද ඇතුළුව සෙසු හින්දු දෙවියන් වන්දනාමාන කිරීම උදෙසා අවකාශයක් වෙන්වීම සිදුවේ. විෂ්ණු දෙවියන් එහිලා නිරූපණය කර ඇත්තේ බුදුන්වහන්සේට ආරක්ෂාව සපයන දේවතාවකු ලෙසය **(බෝගොඩ සීලවිමල හිමි, 2001)**.

විෂ්ණු දේව වන්දනය සම්බන්ධයෙන් මීළගට වැදගත් සාධක ගණනාවක් හමුවන්නේ 17 සහ 18 වන සියවසේදී පමණ කෝට්ටේ රාජධානිය බිඳවැටී එය මහනුවර රාජධානිය දක්වා විතැන්වීමෙන් අනතුරුවය. මහනුවර රාජධානි සමයේදී දකුණු ඉන්දියාව සමඟ ඉතා සමීප වාණිජ, සංස්කෘතික හා දේශපාලන සම්බන්ධතා පවත්වා තිබේ. එනම් මහනුවර රාජධානිය පාලනය කළ නායක්කාර් වංශික රජවරු දකුණු ඉන්දියාවෙන් සිය අගමෙහෙසියන් ගෙන්වාගෙන ඇති බව කියවේ**(බෝගොඩ සීලවිමල හිමි, 2001)**. මෙලෙස නායක්කාර් වංශික කුමරියන්, වෙළෙන්දන්ගේ සම්ප්‍රාප්ත වීමට අනුරූපව හින්දු ආගමික බලපෑම් ද ව්‍යාප්ත වී තිබේ. මෙලෙස විෂ්ණු දෙවියන් ඇතුළු අවශේෂ හින්දු දේව ලබ්ධි බෞද්ධ සිද්ධස්ථානයන්හි අන්තර්ග්‍රහණය වත්ම සිංහල බෞද්ධ ජාතිකවාදයේ විෂ්ණු දේව වන්දනය අවශෝෂණය වී ඇත්තේ කෙසේද යන්න විමසා බැලීම වැදගත්ය.

## 3.5 විෂ්ණු දේවියන් පිළිබඳ සිංහල බෞද්ධ කතිකාව

විෂ්ණු දේවියන් පිළිබඳ සිංහල බෞද්ධ කතිකාව ශාස්ත්‍රීය වශයෙන් මතභේදාත්මක විෂය පථයකි. එහි මූලික කතිකා ස්වරූප ද්විත්වයක් හඳුනාගත හැකිය. ඉන් පළමු ස්වරූපය වන්නේ විෂ්ණු දෙවියන් බුදුසමයට පරිබාහිර ආගමික ස්වරූපයක් ලෙස අර්ථකථනය කිරීමයි. විෂ්ණු දේවියන් සිංහල බෞද්ධ කතිකාවට අන්තර්ග්‍රහණය කරගැනීම එහි දෙවන ස්වරූපය විය **(ධර්මදාස සහ තුන්දෙණිය, 2015)**. සැබෑ ලෙසම විෂ්ණු දෙවියන් පිළිබඳ ග්‍රාමීය කතිකාවේ විෂ්ණු යනු බ්‍රාහ්මණ වෛදික සහ හින්දු පුරාණ සම්භවයක් ඇති දෙවියෙකුය යන අදහස නොමැති තරම්ය. එනම් විෂ්ණු දෙවියන් ග්‍රාමීය බුදුදහමේ ස්ථාපනය වී ඇත්තේ බුදුන් අනුදැන වදාළ මාර්ගයේ ගමන් කරන ඉතා උසස් දෙවියෙකු වශයෙනි. තමාගේ පිහිටාධාර පතන අය වෙනුවෙන් විෂ්ණු දෙවියන් කරන අතිමහත් කුසලකර්මයන් හේතුවෙන් බෝධිසත්ව දෙවියෙකු ලෙස හඳුනාගැනේ. එමෙන්ම පූර්වයේ අවධාරණය කර ඇති ආකාරයට විෂ්ණු ධූරාවලිගත දේව මණ්ඩලයේ ස්ථානගතව ඇත්තේ සතරවරම් දෙවියන්ගෙන් එක් අයකු වශයෙනි **(Obeysekere, 1962)**.

එබැවින් මෙම දෙවන ස්වරූපයේ ඉදිරිපත්ව ඇති මූලික අදහස වන්නේ විෂ්ණු දෙවියන් හින්දු දෙවියෙකු වුවත් ස්වදේශීය දෙවියකු ලෙස දේශීයකරණය කරගෙන ඇති බවයි. නිදසුනක් වශයෙන් පෙන්වා දෙන්නේ නම් ස්කන්ධ කුමරු හින්දු දෙවියෙකු වුවත්, සිංහල බෞද්ධ ජාතිකවාදය තුළ දේශීයකරණය වී ඇත්තේ කතරගම දෙවියන් ලෙසය (**Obeysekere**, 1962). එලෙස විෂ්ණු දෙවියන් ද උපුල්වන් දෙවිඳු ලෙස දේශීයකරණය කරමින් බෞද්ධ දෙවියෙකු ලෙස පවරාගෙන ඇති බවයි.

විලියම් ගයිගර් වැනි පුරාවිද්‍යාඥයන් මෙම මෙම අදහස මත පිහිටා තර්කකරනුයේ සක්‍ර දෙවියන්ගේ ඇවැමෙන් බුදුසමයත්, ලක්දිවත් ආරක්ෂා කිරීමේ වගකීම පවරා ඇත්තේ ඉහත කී උපුල්වන් දෙවියන්ට බවයි. එහිදී විෂ්ණු හෙවත් පාලියෙන් **උප්පලවණ්ණා** ලෙස අවධාරණය කර ඇත්තේ මහනෙල් වැනි වර්ණයක් සහිත තැනැත්තා යන අදහස මතුකිරීමට බවයි (**කෝට්ටගොඩ**, 2019).

කෙසේ වෙතත් ඉහත අදහසට ප්‍රතිපක්ෂව උපුල්වන් යනු ස්වදේශීය දෙවියකු වේය යන මතයද ඉදිරිපත්ව ඇත. එනම් උපුල්වන් ලෙස සිංහල බෞද්ධ දේව ධුරාවලියේ අන්තර්ග්‍රහණය කර ඇත්තේ විෂ්ණු දෙවියන් නොවන ස්වදේශීය දෙවියකු බවයි (**Paranavitana**, 1958). එනම් වරුණ දෙවියන් බෞද්ධත්වයට පත්කොට උත්පලවර්ණ යනුවෙන් පුදපූජා පවත්වන බවයි (**Paranavitana**, 1958). එහෙත් මෙම ස්වදේශියකරණය වූ ස්වරූපය විෂ්ණු දේව වන්දනය සම්බන්ධයෙන් පවත්නා හින්දු පුරාණෝක්තිවල සඳහන් නොවේ. විෂ්ණු දෙවියන් පිළිබඳව පවත්නා ශාස්ත්‍රීය කතිකාව මතභේදාත්මක වුවත්, විෂ්ණු බෞද්ධ දෙවියකු ලෙස සංකල්පගත කිරීම හා ස්ථානගතකිරීම වඩාත් සංවිධිත තත්ත්වයට පත්වූයේ බෞද්ධ සිද්ධස්ථානයන්හි විෂ්ණු දේවාලය සඳහාද අවකාශයක් වෙන් වීමෙනි. එනම් විෂ්ණු දෙවියන් වන්දනාමාන කිරීම සඳහා සුවිශේෂී දේවාලය අවකාශ ඇතුළු විවිධ අභිචාර ක්‍රම හඳුන්වාදී තිබේ. නිදසුන් වශයෙන් මහනුවර, හඟුරන්කෙත, දඹුල්ල, ලංකාතිලක හා ගඩලාදෙණිය වැනි බෞද්ධ සිද්ධස්ථානයන්හි විෂ්ණු දේව ප්‍රතිමා සහිත දේවාලය ස්ථාපනය කර තිබේ. එමෙන්ම දේවාලයවල පැවැත්ම සඳහා ඉඩම් පවරා ඇති අතර දෛනික සහ වාර්ෂික යාතුකර්ම ස්ථාපනය වීම ද එහිදී සිදුව ඇත. ඒ අතරින් මහනුවර වාර්ෂික ඇසළ පෙරහැර අද දක්වාම පවත්වාගෙන එන පූජාකර්මයකි (**බෝගොඩ සීලවිමල හිමි**, 2001). මෙලෙස ප්‍රධාන සිද්ධස්ථාන ඇතුළුව බොහෝ ග්‍රාමීය බෞද්ධ සිද්ධස්ථානයන්හි පවා විෂ්ණු දේවියන් වන්දනාමාන කිරීම සඳහා අවකාශයක් වෙන්ව තිබේ. එමෙන්ම විෂ්ණු දෙවියන්ට පරිවාර සහ අනුග්‍රාහක දේවතා පිරිසක් ද මහනුවර රාජධානි සමයයේදී වන්දනාමාන කිරීමට ලක්වේ. ඒ දැඩිමුණ්ඩ දෙවියන් සහ සූනියම් දෙවියන් වේ (**ධර්මදාස**, 2005).

මෙලෙස විෂ්ණු දේව වන්දනය ඓතිහාසිකව ස්ථානගත වී ඇති ආකාරය පිළිබඳ දළ සාකච්ඡාවක් ගොනුකළ හැකිය. ඈත අතීතයේ සිටම බෞද්ධයන් ආශීර්වාද ලබාගැනීම උදෙසා මෙන්ම සිය දෛනික ජීවිතයේ ගැටලු සමනය කරගැනීම උදෙසා විෂ්ණු දෙවියන් කෙරෙහි ද වන්දනාමාන කිරීමට යොමු වී ඇති බව මෙම ඓතිහාසික මූලාශ්‍රයන්ගෙන් අවබෝධ කරගත හැකිය.

## 3.6 තම්මැන්නාගල පුරාණ රජමහා විහාරස්ථානයේ හා විෂ්ණු දේවාලයේ පසුබිම

තම්මැන්නාගල පුරාණ රජමහා විහාරස්ථානය උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උලගල්ල කෝරළයේ පිහිටා ඇති ඉපැරණි විහාරස්ථානයකි. තම්මැන්නා නමැති ශාකය මෙම ගල් පර්වත අවට ප්‍රදේශය බහුලව වැවී තිබුණු නිසා තම්මැන්නාගල යනුවෙන් ප්‍රචලිත වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. තත් විහාරස්ථ සඟ පරපුර වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජයන් වහන්සේ දක්වාම දිවයයි. සියම් නිකායේ වනවාසී නිකායට අයත් විහාර පරපුරක් ලෙස මෙම විහාර පරපුර හඳුනාගත හැකිය. විහාර පරපුරේ ආදි කර්තෘ ලෙස සඳහන් වන්නේ **කාගම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේය.** තම්මැන්නාගල රජමහා විහාරය ඓතිහාසික මෙන්ම පුරාවිද්‍යාත්මක වටිනාකම්වලින් හෙබි විහාරස්ථානයකි. මහා විහාරස්ථානය පුරාණ වෛද්‍ය ශාස්ත්‍රය හා සම්බන්ධ දක්ෂ යතිවරුන් විසූ විහාරස්ථානයක් ලෙසත්, පැරැණි පුස්කොළ පොත් එකතුවකින් සමන්විත විහාරස්ථානයක් ලෙසත් හඳුනාගත හැකිය.

මෙම විහාරස්ථානය ලෙන් විහාර සංකීර්ණයකින් යුක්තය. එහි ලෙන් තුනක් දක්නට ලැබේ. විහාරස්ථානයේ ඉතිහාසය වළගම්බා රජ සමයට සමයට අයත් බව මූලාශ්‍රයවල සඳහන් නොවෙතත් බොහෝ ජනයා විශ්වාස කරන්නේ වළගම්බා රජතුමා මෙම ලෙන් විහාරවල සැඟවී සිටි බවයි. ඔහු තමන්ට අත්වූ අභාග්‍යසම්පන්න කාලය අවසන් වීමෙන් පසුව මෙම ලෙන් විහාර මහා සංඝරත්නය විෂයෙහි විහාර කර්මාන්ත කොට පූජා කළ බව ජනප්‍රවාදවල සඳහන් වේ. එමෙන්ම විහාරස්ථානය ආශ්‍රිතව ගිරි ලිපි දෙකක්ද සොයාගෙන තිබේ. රජමහා විහාරස්ථානයට අනුබද්ධ විෂ්ණු දේවාලයේ ඉතිහාසය මහනුවර රාජධානිය දක්වා විහිදේ. විහාරස්ථාන දේවාලය සම්බන්ධ ඉතිහාසය ඍජුවම ඊට පෙර යුගය දක්වා පැතිර තිබූ බවට සාධක නොලැබෙන අතර ඉහත අවධාරිත පළමුවන ගල්ගුහාවේ දක්නට ලැබෙන විෂ්ණු ප්‍රතිමාව මහනුවර යුගයේ ඉදිකරන ලද එකක් බව නිගමනය කළ හැකිය. එහි දක්නට ලැබෙන බුද්ධ ප්‍රතිමා චිත්‍ර හා අනෙකුත් කර්මාන්ත සියල්ලම මහනුවර යුගයට අදාළ ලක්ෂණ පිළිබිඹු කරයි. එම අර්ථයෙන් මෙම දේවාලයද මහනුවර යුගයේ ඇති වූ හින්දු ආගමික බලපෑම් හේතුවෙන් ප්‍රභවය වූ දේවාලයක් ලෙස හඳුනාගෙන තිබේ.

## 3.7 තම්මැන්නාගල විෂ්ණු දේවාලය ආශ්‍රිත ප්‍රාථමික පූජා විධි කිහිපයක්

තම්මැන්නාගල පුරාණ රජමහා විහාරස්ථ විෂ්ණු දේවාලයට පැමිණෙන බැතිමතුන් බොහෝ දෙනෙකු පැමිණෙන්නේ තමාගේ අභිමතාර්ථ සාධනය කර ගැනීම සඳහා දෙවියන්ට බාරහාර වීමටය. එලෙස බාරහාර සඳහා පැමිණෙන මුල්ම දිනයේ දී දේවාලයට පැමිණෙන බැතිමතා මල් වට්ටියක් ද දැහැත් වට්ටියක් ද සකස් කරනු ලබයි. මල්වට්ටියට යොදාගන්නේ නිල්මල් පමණකි. යමෙක් නිල් මල් හැර වෙන මල් වර්ගයක් රැගෙන ආවේ නම් එය බුදුන්ටම පමණක් පුදයි. දැහැත් වට්ටිය සකස් කරනු ලබන්නේ වට්ටියක බුලත් කොල අතුරා පුවක් ගෙඩි කිහිපයක් සුද්ද කොට එහි තැබීමෙනි. එහිදී එක් පුවක් ගෙඩියක් ඉතා හීනියට ලියා තබනු ලබයි. එසේම ඇතැමෙක් හුනු තබන අතර තවත් සමහරෙක් හුනු ස්වල්පයක් බුලත් කොළයක ආලේප කොට තබති. ඒ හැරුණු කොට එම දැහැත් වට්ටියට හඳුන්කූරු කිහිපයක් හෝ ඉටිපන්දම් කිහිපයක්ද, කපුරු කීපයක්ද, පහන් තිරද, ඊට අමතරව පඬුරු හෙවත් කාසිද මුදල් නෝට්ටුද සිය අභිමතය පරිදි තබනු ලබයි. ඒ හැරුණු කොට තමන් විසින් සකස්කරගත් නිල්

මල් වට්ටියක් හා සුදුපාට නූල් පන්දුවක්ද මේ සඳහා රැගෙන යනු ලබයි. එහිදී නිල් මල් වට්ටිය හා දැහැත් වට්ටිය රැගෙන යන බැතිමතා ඒවා කපු මහත්මා ගේ අතට ලබාදී තමාගේ අරමුණ පැහැදිලිව ඉදිරිපත් කරයි. ඉන්පසුව නිල් මල් වට්ටිය සහ දැහැත් වට්ටිය නිල් තිරයෙන් වැසුණු දේව ප්‍රතිමාව ඉදිරියෙන් තබා දෙවියන්ට යාතිකා කරයි. එනම් බාරය වන අවස්ථාවේදී සිදු කරනු ලබන යාතිකාව සිදුකරනු ලබයි.

බාරය සිදු කිරීමෙන් අනතුරුව තමාගේ අභිමතාර්ථය සඵල වූ පසු පමණක් බැතිමතා නැවතත් එම ස්ථානයට පැමිණි තමන් දෙවියන්ට පොරොන්දු වූ ආකාරයෙන් පුද පූජාවන් සකස් කරනු ලබයි. ඇතැමෙක් නිල් මල් වට්ටි හතක්ද මේ සඳහා පිළියෙල කරයි. නිල් තිරයක්, හඳුන්කූරු, පහන් තිර ආදියත් මේ සඳහා සකස් කරනු ලබන අතර දෙවියන්ට පඬුරු ලෙසට තමන් පොරොන්දු වූ පඬුර දැහැත් වට්ටියක තබා දෙවියන්ට පූජාකරන අතර එහිදී කැපකළ පලතුරු වට්ටිය බැතිමතුන්ට ලබාදීමක් සිදු නොවේ. මුල් අවධියේදී එම දී එම පළාතට පමණක් ආවේණික වූ පලතුරු වට්ටිය බහුලව දක්නට ලැබුණත් වර්තමානය වන විට ආනයනය කරනු ලබන පලතුරුවලින්ද පලතුරු වට්ටිය සකස් කරනු ලැබේ. ඒ සියල්ල රැගෙන යන බැතිමතා කපු මහතාගේ අතට ඒ සියල්ල ලබා දෙයි. කපුමහතා දෙවියන් ඉදිරියේ ස්තෝත්‍ර කියවමින් දෙවියන්ගේ තෙදබල නිසා එම පුද්ගලයා විසින් සිදුකරන ලද ඉල්ලීම සාර්ථක වූ බවත් දෙවියන්ට එම පුද පූජාවන් සිදු කරන බවත් කියා දෙවියන්ගේ පිහිට ආරක්ෂාව බැතිමතාට ලබාදෙයි.

## 04. පර්යේෂණ සොයාගැනීම් සහ සාකච්ඡාව

### 4.1 තම්මැන්නාගල විෂ්ණු දේවාලය පොදු වාර්ගික අනන්‍යතා කැටි වූ අවකාශයක් ලෙස

ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ආගමික කතිකාවේ බහු වාර්ගික අනන්‍යතා ඒකාබද්ධ වූ සිද්ධස්ථාන ගණනාවක් හඳුනාගත හැකිය. ශ්‍රී පාදස්ථානය, කතරගම, මඩු දේවස්ථානය එහිලා ප්‍රධාන වේ. මෙම සිද්ධස්ථාන බහුතරයක් සිංහල-බෞද්ධ ජාතිකවාදයේ දෘෂ්ටිමය ආධිපත්‍ය යටතේ පවත්නා එහෙත් සෙසු ජනවාර්ගික අනන්‍යතා සඳහාද ඉඩක් ලබාදී ඇති සිද්ධස්ථාන ලෙස ද අර්ථකථනය වී තිබේ **(Silva, 2008)**. කෙසේවෙතත් ජනප්‍රිය ආගමික කතිකාවෙහි එම සිද්ධස්ථාන ස්ථානගතව ඇත්තේ හුදෙක් සිංහල ජනයාගේ වන්දනාමානයට පාත්‍රවන සිද්ධස්ථාන වශයෙන් නොවේ.

එමෙන්ම මෙම ජනප්‍රිය ආගමික ධාරාව නියෝජනය නොකරන එහෙත් සෙසු වාර්ගික අනන්‍යතාද කැටි වූ ග්‍රාමීය සිද්ධස්ථාන හා දේවාල ගණනාවකි. තම්මැන්නාගල විෂ්ණු දේවාලය අයත් වන්නේද මෙම ජනප්‍රිය නොවන ග්‍රාමීය දේවාල ප්‍රවර්ගයටය. මෙම දේවාලය සංකීර්ණය හුදෙක් ප්‍රසිද්ධව ඇත්තේ දෙමළ ජනයා අතරේ පමණක් නොවේ. එනම් ලංකාවේ විවිධ දිස්ත්‍රික්ක නියෝජනය කරන විවිධ වාර්ගික අනන්‍යතාවන් සහිත ලබ්ධිකයෝ විෂ්ණු දෙවියන්ගේ පිහිටාධාර ලබාගැනීම සඳහා දේවාලයට පැමිණෙති.

ඉන් බහුතරය සිංහල බෞද්ධයන් වන අතර දෙමළ හා මුස්ලිම් බැතිමත්හුද මෙම දේවාලය සඳහා පැමිණෙති. දෙමළ බැතිමත්තු විෂ්ණු සිය හින්දු දේවතා සමූහයේ අග්‍රගණ්‍ය දෙවියකු ලෙස සලකමින් මෙම දේවාලය වැඳ පුදා ගැනීම සඳහා පැමිණෙති. එලෙස දේවාලය වෙත පැමිණෙන දෙමළ බැතිමත්තු මූලිකව උතුරු හා උතුරු මැද පළාත්හි වසන ලබ්ධිකයෝ වෙති.

එහෙත් කොළඹ වැනි නාගරික කලාපවල ජීවත්වන දෙමළ බැතිමතුන්ද මේ අතර වේ. විෂ්ණු දෙවියන්ගේ ආශීර්වාදය ඔවුන් මූලිකව ලබාගනුයේ සිය ව්‍යාපාරික කටයුතුවල සඵලත්වය සඳහාය. ඒ හැරුණුවිට සිය පෞද්ගලික ජීවිතයේ ග්‍රහදෝෂ දුරුකරගැනීමේ අභිලාෂයෙන්ද මොවුහු බාරහාර වෙති.

දේවාලය වෙත පැමිණෙන ඉස්ලාම් ලබ්ධිකයන් දෙමළ ලබ්ධිකයන්ට සාපේක්ෂව කුඩා පිරිසකි. එහෙත් වාර්ෂිකව ඔවුහු නිශ්චිත කාල පරාසයක විෂ්ණු දෙවියන් වන්දනාමාන කිරීම සඳහා මෙහි පැමිණෙති. ඉස්ලාම් ලබ්දිකයන් ග්‍රහදෝෂ නිවාරණය කරගැනීම උදෙසා විෂ්ණු දේවාලය වෙත නොපැමිණෙන අතර ඔවුහුද සිය ව්‍යාපාරික කටයුතුවල යම් ප්‍රගතියක් අත්පත් කරගැනීම සඳහා විවිධ පුද පූජා පවත්වති. මෙම පිරිස් සුළු හා මධ්‍ය පරිමාණ වෙළඳ ව්‍යාපාරවල නිරතවන්නෝ වෙති. එමෙන්ම ඉන් නොනැවති ඔවුහු ගමනාරක්ෂාව සඳහාද විෂ්ණු දෙවියන්ගේ පිහිටාධාර පතති. එමෙන්ම මෙහිලා අවධාරණය කළ යුතු විශේෂම කරුණ වන්නේ, දරුඵල අපේක්ෂාවෙන් පැමිණෙන ග්‍රාමීය මුස්ලිම් කාන්තාවන්ද වීමයි.

බහුතරය වන සිංහල බෞද්ධයන්ගේ ආගමනයද විවිධත්වයෙන් අනූන වේ. එනම් උතුරු මැද පළාත නියෝජනය කරන සිංහල ගැමි ස්ථරය මෙහි බහුතරය වේ. එහෙත් බස්නාහිර හා දකුණු පළාත් නියෝජනය කරන සිංහල බෞද්ධ මැද පාන්තික පිරිස්ද මෙහි බැතිමතුන් වේ. දකුණෙන් පැමිණෙන සිංහල බෞද්ධයන්ගෙන් බහුතරයක් මෙම විෂ්ණු දේවාලය දෙවිනුවර වසන උපුල්වන් දෙවියන්ගේම දේවාලයක් ලෙස අදහති. එහෙත් මීට පරිබාහිරව ඇතැම් සිංහල බෞද්ධ ලබ්ධිකයෝ දෙවිනුවර ඇත්තේ මෙහි සඳහන් විෂ්ණු දෙවියන්ගේම ස්වරූපයක් බව පිළිගනිති. ඒ කෙසේ වෙතත් මෙම සිංහල බෞද්ධ බැතිමතුන්ගෙන් සමහරක් දකුණේ ධීවර ග්‍රාමයන් නියෝජනය කරන්නෝ වෙති.

ඒ අනුව තම්මැන්නාගල විෂ්ණු දේවාලය බහු වාර්ගික අනන්‍යතා කැටි වූ දේවාල අවකාශයක් ලෙස සහේතුකව නිගමනය කළ හැකිය. එහි පිහිටාධාර පතන ලබ්ධිකයන් බහුතරය ග්‍රාමීය කෘෂි සමාජ තලය නියෝජනය කළද ඊට නොදෙවෙනි ආකාරයට බස්නාහිර හා දකුණේ වෙළෙඳ සමාජ තල නියෝජනය කරන්නන්ගේද ආකර්ෂණයට එය නතුව තිබේ. විෂ්ණු දෙවියන් පිළිබඳ කවරාකාරයේ දෘෂ්ටිවාදීමය අදහස් හා විශ්වාස පැවතියත් බැතිමතුන් අතර පොදු සහම්තිකභාවය ගොඩනංවන අවකාශයක් ලෙස තම්මැන්නාගල විෂ්ණු දේවාලය සඳහන් හඳුනාගත හැකිය.

## 4.2 තම්මැන්නාගල විෂ්ණු දේවාලය වෙත පැමිණෙන බැතිමතුන්ගේ චේෂ්ටාවන්

ඉහතින් අවධාරණය කර ඇති ආකාරයට දේවාලය වෙත පැමිණෙන බැතිමත්තු සිය දෛනික ජීවිතයේ ගැටලු සමනය කරගැනීම සඳහා සුලභව මෙහි බාරහාර වීම් සිදුකරති. එලෙස සිදුවන බාරහාරවීම් නිසියාකාරව ඉටුවන්නේය යන විශ්වාසය පොදුවේ ඔවුන් අතර වේ. මෙහිදී විශ්ලේෂණයට නතුකර ඇත්තේ එලෙස බාරහාර වීමට තුඩු දුන් සුලභ හේතු කිහිපයකි.

දරුඵල ලැබීම හෝ නොලැබීම වෛද්‍යකරණය වූ සංසිද්ධියක් ලෙස හඳුනාගනු ලැබුවද ඒ පිළිබඳව වන ආගමික විශ්වාසයන්ගේ අඩුවීමක් නූතනයේ දක්නට නොලැබේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ දකුණු හා නිරිතදිග සිංහල සමාජවල පත්තිනි වන්දනාව මෙහිලා සුවිශේෂයෙන් අවධාරණය කළ හැකි වේ. පත්තිනි දේවතාවියට බාරහාර වෙමින් දරුඵල අපේක්ෂාවෙන්

පිහිටාධාර පතන බැතිමත්හු පිළිබඳ මානව විද්‍යාත්මක සාහිත්‍යයක් පවතී (**Obeysekere**, 1984). මෙහිදී පත්තිනි මෑණියන් මාතෘත්ව භූමිකාවක පිහිටා සංජානනය කරනු ලැබේ. එහෙත් විෂ්ණු දෙවියන් සම්බන්ධ මෙම අත්දැකීම ඉහත පත්තිනි මෑණියන් සම්බන්ධ කතිකාවෙන් ඉඳුරාම වෙනස් වේ. එනම් බාරහාර වන කතුන් විෂ්ණු දෙවියන් සංජානනය කරගනු ලබන්නේ පීතෘත්ව භූමිකාවක පිහිටාය.

එමෙන්ම මෙහි ඇති අනෙක් සුවිශේෂී සංසිද්ධිය වන්නේ පුරුෂයන්ද තම බිරින්දෑවරුන්ට දරුඵල පිහිටීමට ආශීර්වාද ලබාගැනීමෙහිලා විෂ්ණු දෙවියන්ට බාරහාර වීමයි. එබැවින් දරුඵල ලබාගැනීම සඳහා බාරහාර වීම හුදෙක් ස්ත්‍රීකරණය වූ සංසිද්ධියක්ම නොවේ. මෙලෙස දරුඵල අපේක්ෂාවෙන් බාරහාර වන ස්ත්‍රීන් බහුතරය ග්‍රාමීය කෘෂි සමාජ පසුබිමට අයත් අතර දරුඵල අපේක්ෂාවෙන් කපු මහතා ලවා යාතිකා කරගැනීම සිදුවේ. එහිදී බාරහාර වීමේදී දෙවියන්ට ප්‍රදානය කරනා දෑහි යම් ධුරාවලියක් දැකිය හැකි වේ. එනම් පලතුරු පූජා කිරීමේ සිට භෞතික වස්තු ප්‍රදානය කිරීම දක්වා එය සිදු වේ.

එමෙන්ම බහුතර සිංහල බෞද්ධ ලබ්ධිකයන් ප්‍රමාණයක් මෙම විෂ්ණු දේවාලයේ පිහිටාධාර පැතීමට හේතුවක් වන්නේ නඩු ආරවුල් විසඳාගැනීම සඳහා ආශීර්වාද ලබාගැනීමයි. ඉඩම් නඩු ආරවුල් සහිත සිංහල බෞද්ධ ලබ්ධිකයන් බහුතරයක් අයත් වන්නේද උතුරුමැද පළාතේ ග්‍රාමීය සන්දර්භයට වේ. මෙම දිගැසුණු ඉඩම් නඩු හේතුවෙන් ඔවුහු වෙහෙසටත්, විවිධ ආර්ථික අගහිඟතාවන්ටත් ලක්ව සිටිති. එබැවින් ඔවුන් බහුතරයකට ඉඩම් ආරවුල් සම්බන්ධ කඩිනම් යුක්තියක් සාක්ෂාත් වී නොමැත. එහි ප්‍රතිඵලය වී ඇත්තේ ඉඩම් ආරවුල් විසඳාගැනීම සම්බන්ධයෙන් පවත්නා නෛතික යන්ත්‍රණය කෙරෙහි ඔවුන් එතරම් සැලකිල්ලක් නොදැක්වීමයි. නොඑසේ නම් ඉඩම් ආරවුල් විසඳාගැනීම සම්බන්ධයෙන් පවත්නා නීති පද්ධතිය පිළිබඳ විශ්වාසය දුර්මුඛව පැවතීමයි. එබැවින් එහි ප්‍රතිඵලය වී ඇත්තේ, උක්ත ඉඩම් ආරවුල් සම්බන්ධ නඩු කටයුතුවලින් ජයග්‍රහණය අත්පත් කරගැනීම සඳහා විෂ්ණු දෙවියන් උදෙසා බාරහාර වීමයි. මෙහිදී නඩුවලින් ජයග්‍රහණය අත්පත් කරගැනීම ප්‍රධාන අභිලාෂය වුවත්, නඩු ක්‍රියාවලියේ ඇති මන්දගාමීත්වය දුරු කිරීම හා තමාට උපරිම සාධාරණයක් අත්පත් කරගැනීමට බාරහාර වීම වැනි පරමාර්ථද හඳුනාගත හැකිය. ඉඩම් නඩුවලට පරිබාහිරව යම් වන්දි නඩු හා කුටුම්භාශ්‍රිත ගැටලු ඔස්සේ පැනනැගී ඇති නඩුද මෙහිලා අවධාරණය කළ හැකිය. මෙලෙස නීතිමය ක්‍රියාවලියක් හරහා ආමන්ත්‍රණය විය යුතු කාරණා දෙවියන් අභියසට පැමිණීමේ සමාජ සාධක පිළිබඳ සාකච්ඡා කිරීම වැදගත් වේ.

පළමු කොටම බැතිමතුන් විෂයෙහි පවත්නා අචල විශ්වසනීයත්වය මෙහිලා අවධාරණය කළ හැකි වේ. එලෙස නඩුහබවලින් ජයග්‍රහණ අත්පත්කරගත් ඇතැම් ගැමියන්ගේ බාරහාර ඔප්පු කිරීමේ ක්‍රමෝපායන් එවැනි විශ්වාසයක් ජනිත කිරීමෙහිලා හේතු සාධක වී තිබේ. එනම් තමා ජයග්‍රහණය කළ ඉඩම් ඔප්පුව විෂ්ණු දෙවියන්ට බාර කරමින් එහි සුරක්ෂිතතාවය අඛණ්ඩව අපේක්ෂා කිරීම සුලභ සංසිද්ධියකි. මෙහිලා අවධාරණය කළ හැකි දෙවන සංරචකය වන්නේ විෂ්ණු දෙවියන්ගේ යුක්තිය පසිඳලීම පිළිබඳ භූමිකාවයි. විෂ්ණු දෙවියන් දැහැමි දේවතාවකු ලෙස හඳුනාගෙන තිබුණද අයුක්තිසහගත ක්‍රියාවන් හමුවේ විෂ්ණු දෙවියන්ගේ තේජෝ බල පරාක්‍රමය සඳහන් වීමයි. එය කාලි දෙවඟන අබියස සිදුකරන පළිගැනීමේ කන්නලව්වකට සමාන කළ නොහැකිය. එහෙත් ඉන් වෙනස්ව වඩාත් යුක්ති සහගතව විෂ්ණු දෙවියන්ගේ

පිහිටාධාර අපේක්ෂා කිරීමයි. තෙවන සංරචකය ආර්ථික ස්වරූපයක් උසුලයි. එනම් මෙලෙස නඩු ආරවුල් පාදක කරගනිමින් විෂ්ණු දෙවියන්ගේ පිහිටාධාර පැතීමට එන්නේ නඩුකීමට තරම් තවදුරටත් ආර්ථික ශක්තියක් නොමැති ග්‍රාමීය ලබ්ධිකයන් වේ. මෙම ලබ්ධිකයන්ගේ මූලික ස්තර දෙකක් හඳුනාගත හැකිය. එක් පිරිසක් කිසිදු ආකාරයකින් නඩු ක්‍රියාවලියේ ඉදිරියට යෑමට තරම් ආර්ථිකව ශක්තිමත් වූවන් නොවීමයි. දෙවන පිරිස නඩු ක්‍රියාවලිය සඳහා මුදල් ආයෝජනය කර එහෙත් ඉන් ඉච්ඡාභංගත්වයට පත්වූවන් වීමයි. එබැවින් නඩුහබ උදෙසා බාරහාර වීමේ ස්වභාවයත්, එහි සමාජ-ආර්ථික මූලයන් මෙලෙස විභාග කළ හැකිය.

තම්මැන්නාගල විෂ්ණු දේවාලය සඳහා බාරහාර වන තවත් චේෂ්ටාවක් වන්නේ, විදේශසේවා රැකියා සඳහා පිටත්වීමේදී රැකවරණය පැතීමයි. විශේෂයෙන්ම මැදපෙරදිග රැකී රක්ෂා අපේක්ෂාවෙන් දේවාලය වෙත පැමිණෙන සිංහල ගැමි කතුන් මේ අතරින් බහුතරය වේ. ඊට සාපේක්ෂව දෙමළ පහළ මධ්‍යම පාන්තික කතුන්ද වේ. එහිදී මැදපෙරදිග ඇතුළු විදේශ රැකියාවන්වන් සඵල කරගැනීම සඳහා බාරහාරවීම මුඛ්‍ය අභිලාෂය වුවත්, විදේශ රැකියා සඳහා පිටත්වීමේදී ගමනේ ආරක්ෂාව පැතීමටද මෙම කාන්තා බැතිමත්හු අමතක නොකරති. පොදුවේ මෙම කතුහු ග්‍රාමීය ආර්ථිකයේ අධෝව්‍යුහය නියෝජනය කරන්නෝ වෙති. සිය කුටුම්භගත ආර්ථික අවශ්‍යතා ඉටුකරගැනීමේ අරමුණෙන් යුතුව විදේශගත වීමට තීරණය කරන මෙම කතුන්, එම අරමුණු සඵල කරගැනීමෙහිලා විෂ්ණු දෙවියන්ගේ පිහිටාධාරය අත්‍යවශ්‍ය බව අදහති. මෙහි ඇති වඩාත් සුවිශේෂී පැතිකඩ ද්විත්වයක් අවධාරණය කළ හැකිය. එනම් විදේශගත වීම ප්‍රධාන කෘත්‍යාත්මක අභිලාෂය වුවත්, තමා විදේශගත වීමෙන් අනතුරුව ස්වාමියා ඇතුළු දරුවන් විෂ්ණු දෙවියන් උදෙසා බාරහාර කිරීම සුවිශේෂී සංසිද්ධියකි. එමෙන්ම අදාළ විදේශගත රැකියා සඵල වූ පසු එහිදී ලබන පළමු වැටුපෙන් සිය බාරය නිදහස් කිරීමට යොමුවීම එහි අනෙක් පැතිකඩයි. එබැවින් දේවාලයට අනුබද්ධිතව විෂ්ණු දෙවියන්ගේ පිහිටාධාර පතන්නේ හුදෙක් ස්වදේශිය, ග්‍රාමවාසීන් පමණක් නොවේ. ඊට සමගාමීව විදේශගතවූවන් ද ඒ අතර වේ. ඔවුහු ඍජුව විෂ්ණු දෙවියන් කෙරෙහි බාරහාර වීමට නොහැකි තැන සිය පවුලේ සාමාජිකයන් ලවා ආශීර්වාද ලබාගැනීමට යොමුවෙති.

ග්‍රහදෝෂයන්ගෙන් වැළකී ආශීර්වාද ලබාගැනීම ද මෙම දේවාලය ආශ්‍රිත සුලභ සංසිද්ධියකි. එනම් විවිධ ග්‍රහ අපල දුරුකරගැනීමේ අභිලාෂයෙන් තම්මැන්නාගල විෂ්ණු දේවාලය වෙත ඇදෙන ලබ්දිකයන් ප්‍රමාණය සුළුපටු නොවේ. මෙම ලබ්ධිකයන් අතර කොළඹ සිට පැමිණෙන්නෝද වෙති. එහිදී ප්‍රධාන වශයෙන් සෙනසුරු අපල දුරු කරගැනීම සුලභ තේමාවක් වී තිබේ. සෙනසුරු අපල දුරුකරගැනීමේ අභිලාෂයෙන් පහන් දැල්වීම ඇතුළු විවිධ යාතුකර්ම පැවැත්වීමක් දැකිය නොහැකි වුවත්, පොදුවේ ඉහත කී ආකාරයට කපු මහතුන් ලවා යාතිකා කියවමින් සෙත් පැතීම සිදුකරගනු ලැබේ. එමෙන්ම විවිධ රෝගාබාධ ඇතිවන්නේද මෙම ග්‍රහ අපලවල විපර්යාස හේතුවෙන් බව සිතන බැතිමත්හු සෙත් ශාන්ති ලබා ගැනීමෙන් නොනැවතී විවිධ පඬුරු පූජා කිරීමද සිදුකරති. මෙය ඉතාමත් සුවිශේෂී චේෂ්ටාවක් ලෙස අවධාරණය කළ හැකිය. එනම් උතුරුමැද පළාතේ තම්මැන්නාගල ග්‍රාමවාසී ජනයා සෙනසුරු අපල ආදී අපල දුරුකරගැනීම සඳහාත් විෂ්ණු දෙවියන් අබියස බාරහාර වීමයි.

ඒ අනුව තම්මැන්නාගල විෂ්ණු දේවාලය හා සබැඳි බැතිමතුන්ගේ මුඛ්‍ය චේෂ්ටාවන් පිළිබඳ සාකච්ඡාවක් ඉදිරිපත් කළ හැකිය. මීට පරිබාහිරව විභාග සමත්වීම, උසස් රැකී රක්ෂා සාර්ථක

කරගැනීම, විවාහ කටයුතු සාර්ථක කරගැනීම හා විවිධ ලෙඩරෝගවලින් සුවපත් වීම වැනි ලෞකික අභිලාෂ ගණනාවක් තෘප්ත කරගැනීමේ පරමාර්ථයෙන් බාරහාර වෙති.

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ හින්දු දේව විශ්වාස සම්බන්ධ කතිකාව අත්‍යන්තයෙන්ම සිංහල බුදුදහම සමඟ අනුකලනයව පවතියි. දුරාතීතයේ සිටම බෞද්ධයෝ බුදුන්වහන්සේට පුදපූජා පැවැත්වීමෙන් පසුව දෙවියන්ට පින් අනුමෝදන් කොට පිහිටාරක්ෂාව පැතීමට පුරුදුව සිටියහ. විෂ්ණු දෙවියන්ද එහිලා බෞද්ධයන්ගේ නිති වන්දනාමානයට ලක් වූ දේවතාවෙකි. විෂ්ණු දේව වන්දනය ශ්‍රී ලංකාවේ ප්‍රසාරණය වීමෙහිලා දකුණු ඉන්දීය හින්දු දේව ආභාසය ප්‍රබලව බලපෑම් කර තිබේ.

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක හා ජනශ්‍රැති සාහිත්‍ය විමර්ශනය කිරීමේදී විෂ්ණු දේව වන්දනයේ ප්‍රකෘත ස්වරූපයන් හා විෂ්ණු දේව වන්දනය දුරාතීතයේ සිටම පැවති බවට වන මූලාශ්‍රය රැසක් හමුවේ. සැබැවින්ම විෂ්ණු දෙවියන් පිළිබඳ කතිකාව මෙතරම් සිංහල බෞද්ධ මනසේ ස්ථාපනය වීමෙහිලා මහාවංසය වැනි ඉතිහාස ග්‍රන්ථයකින් සපයා ඇති දායකත්වය සුළුපටු නොවේ. සිංහල බෞද්ධයන් විෂ්ණු දෙවියන් හඳුනාගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේද බුදුදහමේද චිරස්ථායි පැවැත්ම උදෙසා කටයුතු කරන ආරක්ෂක දෙවියා වශයෙනි. එමෙන්ම විෂ්ණු දෙවියන් උපුල්වන් ලෙස දේශීයකරණය කරමින් වන්දනාමාන කිරීමද සිදුවේ. නොඑසේ නම් විෂ්ණු හා උපුල්වන් යනු දෙදෙනෙකු ලෙස වන අර්ථකථනය කිරීමද පවතී. ඒ කෙසේවෙතත් සිංහල බෞද්ධ මනසෙහි විෂ්ණු දෙවියන් පිළිබඳ සංකල්ප චිත්‍රය බුදුසමයට අනුගත වූවකි.

මෙම බහුවිධ කතිකා ශාස්ත්‍රීය තලයේ පැවතිය ද සාමාන්‍ය හින්දු හා සිංහල බෞද්ධ ජන විඥානයේ විෂ්ණු දෙවියන් සම්බන්ධයෙන් ඇත්තේ යම් ආකාරයක සහමිතික දෘෂ්ටිවාද වේ. එනම් විෂ්ණු බෝසත් දෙවියකු ලෙස සංකල්පනය කිරීම සිංහල බෞද්ධයන් අතරත් බුදුන් විෂ්ණුගේම ස්වරූපයක් ලෙස හඳුනාගැනීම හින්දූන් අතරෙත් ව්‍යාප්ත මතවාදයකි. එහෙත් එය විෂ්ණු වන්දනය අනුකලනාත්මකව සිදුකිරීමට මෙම ජනවර්ග ද්විත්වයටම බාධාවක් වී නොමැත. ග්‍රාමීය තලයෙහි මෙවැනි දෘෂ්ටිවාදීමය ගැටුම් විරල වේ. ඒ බව මෙම පර්යේෂණයේ ප්‍රධාන සිද්ධි අධ්‍යයනය වූ තම්මැන්නාගල පුරාණ විෂ්ණු දේවාලය ඇසුරෙන් පසක් විය. එනම් එහි ලබ්ධිකයන් වී ඇත්තේ සිංහල බෞද්ධයන් පමණක්ම නොවේ.

තම්මැන්නාගල විෂ්ණු දේවාලය වැනි ග්‍රාමීය දේවාල මේ ආකාර බිම්මට්ටමින් පැතිර පවත්නා ආගමික-වාර්ගික සහමිතිකභාවය කියවාගත හැකි අවකාශයකි. අනෙක් අතට මෙවැනි දේවාල ගැමි ජනයාගේ ජීවන ගැටලු කියවාගත හැකි මානයක්ද වී තිබේ. දරුඵල අපේක්ෂාව, විදේශගත රැකියා සඳහා පිටත්වීම, ග්‍රහදොස් සමනය හා නඩුහබවලින් මිදීම වැනි එදිනෙදා ජීවිතය හා බැඳුණු අභියෝග ගා ගැටලු මෙම දේවාලය හමුවේ ඉදිරිපත් කෙරේ. එබැවින් නූතනත්වයේ විපරීත තත්ත්වයන්ට ගොදුරුවන ග්‍රාමීය සමාජ සැකැස්මෙහි තවදුරටත් විෂ්ණු වැනි දේව වන්දනා සඳහා අවකාශයක් වෙන්ව ඇත්තේ ඇයි යන ගැටලුවලට උක්ත අභියෝග විසින් සපයන්නේ තවදුරටත් ගවේෂණය කළ යුතු පිළිතුරකි.

තම්මැන්නාගල විෂ්ණු දේවාලය නාගරික මැදපාන්තික හා ධීවර ජන සමාජ කණ්ඩායම් අතර යම් ප්‍රසිද්ධයක් අත්පත් කරගෙන තිබුණද, එය තවමත් උතුරුමැද පළාතේ වසන ග්‍රාමීය ජනයාගේ වන්දනාමානයට හා විශ්වාසයට ලක් වූ දේවාල සංකීර්ණයක් ලෙස අවධාරණය කළ හැකිය. ඒ අනුව විෂ්ණු දෙවියන් සම්බන්ධ කතිකාව ග්‍රාමීය දේව ප්‍රවාදයන්ගෙන් සම්පූර්ණයෙන්ම වියැකී නොගොස් එහි භාවිතාත්මක වෙනස්කම් සිදුව ඇති ආකාරය හඳුනාගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


කාරියවසම්, ටී, 1991. ***සිරිලක දෙවිවරුඃ හියු නෙවිල් කාව්‍යාවලිය ආශ්‍රයෙන්.*** කොළඹඃ තරන්ජී ප්‍රින්ටර්ස්

කෝට්ටගොඩ, ජේ.එච්, 2019. ***දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය ආශ්‍රිත පුද සිරිත් සහ සමාජය.*** දර්ශනසූරි උපාධි නිබන්ධය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයඃ සංස්කෘතික අධ්‍යයන කවය

ධර්මදාස බී, ඩී.කේ. 2005. ***ඉපැරණි සිංහලේ ලාංකේය දෙවි දේවතෝවෝ.*** කොළඹ-10ඃ රත්න පොත් ප්‍රකාශකයෝ

ධර්මදාස, කේ.එන්.ඕ සහ තුන්දෙණිය, එච්. එම්.එස්. 2015. ***සිංහල දේව පුරාණය.*** කොළඹ-10ඃ ගොඩගේ ප්‍රකාශකයෝ

බෝගොඩ සීලවිමල හිමි, 2001. ***ක්‍රි.ව දාහත්වෙනි හා දහඅටවැනි ශතවර්ෂයන් ගැන විශේෂ අවධානය යොමුකරමින් ශ්‍රී ලංකාවේ විෂ්ණු දේව වන්දනය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්.*** පේරාදෙණිය විශ්වවිද්‍යාලයඃ ශාස්ත්‍රපති උපාධි අංශය.

ලක්මාල්, ඇ. 2015. ***ශ්‍රී ලංකාවේ පූජනීය දෙවිවරු හා දේවාල.*** කොළඹඃ මසිත ප්‍රකාශකයෝ.

සිල්වා, පී, 2008. ***බුදුදහම, රාජ්‍යය  සහ භික්ෂු සමාජයඃ සමාජ විද්‍යාත්මක අධ්‍යයන.*** කොළඹඃ සමාජ විද්‍යාඥයන්ගේ සංගමය

හෙට්ටිආරච්චි, ඩී. ඊ. 1970. ***සිංහල විශ්වකෝෂය-සිව්වන කාණ්ඩය.*** කොළඹඃ සංස්කෘතික දෙපාර්තමේන්තුව

Holt, J.C. 2000. ***The Hindu Buddha and the Buddhist Visnu: Religious Transformations in India and Sri Lanka***. Alberta: The University of Calgary

Javalgekar, A. 2012. ***The Rise of God Krishna: Myhthological and Historical Evoluction of Krishna Worship in Hinduism***. New Delhi: M.D Publication

Obeysekere, G, 1962.  'The Sinhalese Buddhist Pantheon and Its Extensions' in M.Nash (ed), ***Proceedings of the Conference Theravada Buddhism***. New Haven: Yale University.

Obeysekere, G, 1977. ***'Social Change and Deities: The Rise of Kataragama Cult in Modern Sri Lanka***' Man,12, 377-396

Obeysekere, G, 1984. ***The Cult of Goddess Pattini.*****Chicago**: Chicago University Press

Paranavitana, S, 1958**. *The God of Adam's Peak***. Ascona, Switzerland: Artibus Asiae Publishers

Silve de, P, 2008. ***God of Compassion and Divine Protector of 'Sri Pada': Trends in Popular Buddhism in Sri Lanka***. The Sri Lankan Journal of the Humanities xxxiv (1&2)